**2020 මැයි මස 05 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව**

**<u>සහභාගිත්වය</u>**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝහිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී.ජී. ආර්. පේෂලා කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්. ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| රාහුල ලලිත වික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්.එම්.සරත් චන්ද්‍ර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |

- **පන්සිල් සමාදන් විමෙන් අනතුරුව පෙ.ව.9.35 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී**

**( 01 )** සභා රැස්වීම් වාර්තා සම්මත කිරිම

**01.01** 2020.03.03වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව හා 2020.04.12 පැවති විශේෂ සභා රැස්වීම් වාර්තා සම්මත කිරිම

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.03.03 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව හා 2020.04.12 පැවති විශේෂ සභා රැස්වීම් වාර්තා සම්මත කිරිම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

2020.03.03 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව හා 2020.04.12 පැවති විශේෂ සභා රැස්වීම් වාර්තා සම්මත කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම වාර්තා මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මා කැමතියි පොඩි අඩුපාඩු ටිකක් පෙන්වා දෙන්න. 64 පිටුවේ. අපේ වාර්තාව සකස් කරන මහත්මිය ලොකු ආමාරු කාර්යයක් ඉටු කරන්නේ. නමුත් මා එහි අඩුපාඩුවක් පෙන්වා දෙනවා. මෙහි මා කතා කරපු එකේ අම්බලන්ගොඩ වෙළඳ ප්‍රජාව විය යුතුයි. නමුත් එහි සඳහන්ව ඇත්තේ විවිධ ප්‍රජාව ලෙසයි. එය කරුණාකර හදන්න. නැවත 79 පිටුවේ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය සංශෝධනයක් වශයෙන් ඇතුල් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

79 පිටුවේ තිබෙනවා අවසාන පේළියේ ගරු මන්ත්‍රීවරු දේපළ ප්‍රකාශ කිරිමක් කියා සඳහන්ව තිබෙනවා. එය දෙපල වශයෙන් සඳහන් විය යුතුයි. පොඩි දේවල් තමයි. ඇය ලොකු උත්සාහයක් ගන්නවා . නමුත් මා එම අඩුපාඩුව පෙන්වා දෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

79 පිටුවේ අවසාන පේළියට උඩ පේළියේ. දේපළ දෙපල ලෙස සංශෝධනය විය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මා මෙය අසන්නේ අනිත් කාරණය . 59 පිටුවේ මා අර විරෝධතාවයක් දැක්වුවා අනුමත කිරිමට. එයට ඔබතුමා එකමතිකව ඡන්දයෙන් සම්මත වුණා කියා තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කොහේද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

59 පිටුවේ. එම යෝජනාවට මා විරෝධතාවය පැවා. එම සිද්ධිය නෙමේ වැදගත් . එයට විරෝධතාවය පැවාම එයට එකමතිකව ඡන්දයෙන් අනුමත වුණා කියා දැම්මට බැරිද පුළුවන්ද කියන එක මා අසන්නේ දන්නේ නැති නිසා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විරෝධය පැවාට බෙදීමක් ඉල්ලනවා. එයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළහොත් තමයි එය සඳහන් වෙන්නේ. නැතිනම් ඒකමතික ඡන්දයෙන් සම්මත ලෙස සඳහන් වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාගේ පොඩි එකක් තිබෙනවා. 54 පිටුවේ අන්තිම ඡේදයේ අපටත් කතා කර විදුහල්පතිතුමා කතා කළා. ගරු උප සභාපතිතුමා , ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කියා තිබෙනවා. එහි නම වැටෙන්න හොඳ නැහැ. එහි කියා ඇත්තේ මා ඇතුළුව කියා සංශෝධනය විය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඇතුළත් කරන්න. වෙනත් සංශෝධන තිබෙනවා ද? සංශෝධන නැතිනම් 2020.03.03 පැවති මාසික සභා රැස්වීමේ වාර්තාව ද 2020.04.12 පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාවද සම්මත ලෙස සලකනවා.

**තීරණය**

2020.03.03 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවද 2020.04.12 පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඉහත සංශෝධන සහිතව සභා සම්මත විය.

**( 02)** සභාපතිවරයා විසින් නිකුත් කරන විශේෂ නිවේදන

නැත

**( 03)** ලැබී ඇති පැමිණිලි , පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 අම්බලන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය අංශයේ සේවයේ නියුතු සේවකයින් සඳහා ආරක්ෂිත නිල ඇඳුම් ලබාදෙන ලෙස ඉල්ලා සෞඛ්‍ය පරිපාලක නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සෞඛ්‍ය පරිපාලක නිලධාරි, සෞඛ්‍ය අංශය. Overall kit සෞඛ්‍ය අංශ නිල ඇඳුම් ලබා ගැනීම. 2018 වසරේදි එක් පුදගලයෙකුට එකක් බැගින් ලබා දෙන ලද තැඹිලි පැහැ ආරක්ෂිත නිල ඇඳුම (Overall kit) මේ වන විට ඉතා අබලන් තත්ත්වයේ පවතින අතර එහි ආයු කාලය වසර 02ක් ඉක්මවා ගොස් ඇත. රාත්‍රි වැඩ මුරය සඳහා මෙම ඇඳුම ඉතා ප්‍රයෝජනවත් වන බවත් , සේවකයින් හඳුනා ගැනීම පහසු වන බවත් ඒ හා සමඟම ආරක්ෂාව අතින්ද මෙම ඇඳුම ඉතා වටිනා බව අපගේ විශ්වාසයයි. විෂබීජනුරහරණය සිදු කිරීමේදි මෙම Overall kit එක සුදුපැහැති දුර්වර්ණ වුයේ එම විෂබිජ නාශක තැවරීම හේතුවෙනි. එබැවින් මේ පිළිබඳව සලකා බලා එක් සේවකයෙකු සඳහා Overall kit 02ක් බැගින් ලබා දීමට කටයුතු කරන්නේ නම් ඉතා අගේකොට සලකන බව පවසා සෞඛ්‍ය පරිපාලකවරයා විසින් ඉල්ලීමක් කර තිබෙනවා. ඒ සම්බන්ධව මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා එය නිර්දේශ කර තිබෙනවා. එයට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , එය ලබා දෙන්න. මේ ව්‍යසනය පැමිණි පසුගිය කාලයේ දිගටම අම්බලන්ගොඩ නගරය වෙනුවෙන් සහ අම්බලන්ගොඩ නගරයට එන පිටස්තර අය වෙනුවෙන් කිසිම කෙනෙකු එළියට බසින්නේ නැති කාලයක තමයි එම සේවකයන් එම කාර්ය ඉටු කරනු ලැබුවේ. ලොකු සේවයක් අම්බලන්ගොඩ නගරය වෙනුවෙන් එම සේවකයන් කළා. එම සේවකයන්ට එම ඇඳුම ලබාදීම ඉතාමත් සුදුසු කියා මා විශ්වාස කරනවා. විශේෂයෙන්ම අපට හැකියාවක් තිබෙනවා නම් එම සේවකයන්ට දිරි දීමනාවක් හරි ලබාදෙන්න කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. මොකද විශේෂයෙන්ම මේ සේවකයන් තමයි මේ නගරය ආරක්ෂා කළේ. විශේෂයෙන්ම සෞඛ්‍ය සේවකයන් සහ කර්මාන්ත සේවකයන් යන දෙපලම. එදා සිට මේ රට ඇඳිරි නීතිය පැනවූ කාල සීමාවේ සිට මේ නගරය වෙනුවෙන් විශාල කාර්ය භාර්යයක් ඉටු කළා. එමනිසා එම සේවකයන්ට අපේ ස්තුතිය කළගුණ සැලකිය යුතුයි. අපේ ගෞරවය මේ අවස්ථාවේ එම සේවකයන්ට පුද කළ යුතුයි. ඒ ලබාදිය යුතු සියළුම දේ ලබාදීමට අවශ්‍ය කටයුතු කරන්න. එම සේවකයන්ට දිරි දිමනාවක් ලබා දීමට කටයුතු කරනවා නම් අපි සභාව එයටත් එකඟතාවය පල කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අංශයේ සේවකයන්ගේ ඉල්ලීම පිළිබඳව අපි දෙවරක් සිතා බැලිය යුතු නැහැ. මොකද අපට ඔවුන් කළ සේවය එදා වගේම නුතන මේ වසංගතයේදිත් අපට දකින්නට ලැබුණා. එමනිසා වාද විරහිතව මෙය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ පලමුවෙන්ම තිබෙන්නේ අපේ අම්බලන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය සේවකයන් සම්බන්ධව. ඒ ආරක්ෂිත නිල ඇඳුම් සම්බන්ධව. මෙය ඉතාමත් වැදගත් වෙන්නේ පසුගිය දින වකවානුවල කුණු එකතු කරන උදවියත් තමන්ගේ අවධානම ගැනවත් නොතකා මේ වැඩය කරන්න කටයුතු කළා. එම වැඩය ආරම්භ කරන අවස්ථාවේ මා විමසුවා මාක්ස් එහෙම හම්බ වෙනවාද කියා. ඒවා මුකුත් ඒ වෙනකොට ලැබිලා නැහැ. එගොල්ලන් පුද්ගලිකව සොයා ගෙන තමයි එම වැඩ කටයුත්ත කළේ. කොහොම හරි රාජකාරිය ඒ අය අකුරටම ඉටු කළා. දෙන්න පුළුවන් සියළුම දේ ඒ මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා ඇතුළු සියළු දෙනාටම ඒවා ලබා දෙන්න. මොන ප්‍රශ්න ගැටළු තිබුණත් නගරය එම කොට්ඨාශ සියල්ලම පිරිසිදුව තබා ගත්තා. අපිත් ඉල්ලා සිටිනවා එයට දිමනාවක් ලබා දෙන්න පුළුවන් ද කියා බලන ලෙස. ගරු උප සභාපතිතුමා යෝජනා කළා. හැකිනම් බලා එය ගරු මන්ත්‍රීවරු හැටියට ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය අංශයේ සේවයේ නියුතු සේවකයින් සඳහා ආරක්ෂිත නිල ඇඳුම් ලබාදෙන ලෙස ඉල්ලා සෞඛ්‍ය පරිපාලක නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ආරක්ෂිත නිල ඇඳුම් ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.02 කාර්යාලීය සනීපාරක්ෂක කටයුතු සඳහා රු.10000/=ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීම සඳහා සෞඛ්‍ය විෂය නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

කාර්යාලයීය සනීපාරක්ෂක කටයුතු සඳහා අත්තිකාරම් ලබා ගැනීම. කොරෝනා වසංගතය තත්වය හමුවේ කාර්යාලයීය සේවක මණ්ඩලයේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරිම ඉතා අත්‍යවශ්‍ය කටයුත්තක් වන බැවින් ඒ සඳහා පහත ද්‍රව්‍යයන් මිලදි ගැනිමට අවශ්‍ය වී ඇත. අත් අවරණ පැකට් 02 ක් රු.2000/= ක්ද , මුඛ ආවරණ - 60 ක් රු.7000/= ක් ද , විෂබීජ නාශක අත්සේදුම් බෝතල් 2 ක් රු.1000/= ක් ලෙස සහා අනුමැතියට යටත්ව රු.10000/= නිකුත් කර තිබෙනවා. එයට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය -**

කාර්යාලීය සනීපාරක්ෂක කටයුතු සඳහා රු.10000/- ක අත්තිකාරම් මුදලක් ලබාගැනීම සඳහා සෞඛ්‍ය විෂය නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම අත්තිකාරම් මුදල ලබාදීම

සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

### 03.03 පටබැඳිමුල්ල සායනයට සහභාගි වන ප්‍රතිලාභින්ට අත් සේදීමේ පහසුකම් සකස්කර දෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පටබැඳිමුල්ල සායනය සඳහා අත්සේදිමේ පහසුකම් ලබා දීම . දැනට පවත්නා වසංගත තත්ත්වය පාලන කටයුත්තක් ලෙස පටබැඳිමුල්ල සායනය සඳහා සහභාගිවන ප්‍රතිලාභින්ට අත් සේදිමේ පහසුකම් ලබා දීම සඳහා පාදයෙන් ක්‍රියාත්මක කළ හැකි අත් සේදිමේ ඒකකයක් සකස් කර දීමට පියවර ගන්නා ලෙස ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටින ලෙස වෛද්‍ය පී.ආර්.එන්.ද සිල්වා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමිය විසින් ඉල්ලිමක් කර තිබෙනවා. සභා අනුමැතියට යටත්ව මෙය ඉටු කර දෙන්න කියා තිබෙනවා. මේ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

එය අවශ්‍ය දෙයක්නේ . ලබා දෙන්න.

**තීරණය -**

පටබැඳිමුල්ල සායනයට සහභාගී වන ප්‍රතිලාභීන්ට අත්සේදීමේ පහසුකම් සකස්කර දෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් එවා ඇති ලිපිය අනුව එම පහසුකම් සකස් කර දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

### 03.04 2020.03.17 දින සිට 2020.04.25 දින දක්වා නිවාඩු ලබාදෙන ලෙස ඉල්ලා නාගරික මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභාවේ විපක්ෂනායක සහ නාගරික මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ වන මා අත්‍යවශය කරුණක් මත 2020.03.17සට 2020.04.25 දින දක්වා නිවාඩු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු යොදන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා . නැවතත් ලිපියක් එවා තිබෙනවා . නිවාඩු ලබා ගැනීම. ඉහත යොමු කර ඇති ලිපිය මඟින් මා 2020 මාර්තු 17 වන දින සිට 2020 අප්‍රේල් 25 දින දක්වා නිවාඩු අයදුම් කර සිටියේ පසුගියදා පැවැත්වීමට තිබූ මහා මැතිවරණය සඳහා තරඟ කිරිමට වන අතර, රටේ පවතින තත්ත්වය මත මහා මැතිවරණය කල්දමා ඇති

බැවින් මැතිවරණය පවත්වා ප්‍රතිඵලය නිකුත් කරන දිනය තෙක් නිවාඩු ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ අනුව නිවාඩු ලබා දීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය -**

නාගරික මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් නිවාඩු ලබාදෙන ලෙස ඉල්ලා 2020.03.17 දිනෙන් එවා ඇති ලිපියටත් , 2020.03.17 දින සිට 2020.04.25 දින දක්වා නිවාඩු අයදුම් කර තිබුණත් පැවැත්වීමට තිබූ මහ මැතිවරණය සඳහා තරඟ කිරිමට රටේ පවතින තත්ත්වය මත මහ මැතිවරණය කල්දමා ඇති බැවින් මැතිවරණය පවත්වා ප්‍රතිඵල නිකුත් කරන දිනය තෙක් නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලා 2020.05.04 දිනෙන් එවා ඇති ලිපියටත් අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.05 මහජන ක්‍රිඩාංගණයේ ජල පොම්පාගාරය සඳහා අම්පියර් 63ක් ඇති තෙකලා විදුලි සැපයුම් ලබාගැනිමට අවශ්‍ය උපාංග ලබාදීම සඳහා රු 20000/= ක අත්තිකාරම් මුදලක් ලබාදෙන ලෙස ඉල්ලා සැපයුම් නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නගර සභා ක්‍රීඩාංගණයේ ජල පොම්ප කුටීරය සඳහා ඇම්පියර් 63, තෙකලා විදුලි සැපයුම ලබා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය කඩිනමින් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. ඒ සඳහා මිළ ගණන් කැඳවා භාණ්ඩ මිලදි ගැනිමට දින කිහිපයක් ගත වි යන බැවින් අවශ්‍ය ද්‍රව්‍ය මිලදි ගැනීමට මා හට රු.20000/= ක අත්තිකාරම් මුදලක් ලබා දිමට කාරුණික අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සැපයුම් නිලධාරි මදූෂා මහත්මිය විසින් ඉල්ලිමක් කර ඇත. සභා අනුමැතියට යටත්ව එම මුදල ලබා දි තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය -**

මහජන ක්‍රීඩාංගනයේ ජල පොම්පාගාරය සඳහා ඇම්පියර් 63 ක් ඇති තෙකලා විදුලි සැපයුම ලබාගැනීමට අවශ්‍ය උපාංග ලබාදීම සඳහා රු.20000/- ක අත්තිකාරම් මුදලක් ලබාදෙන ලෙස ඉල්ලා සැපයුම් නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම මුදල සභා අනුමැතියට යටත්ව ලබා දීම අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.06 පුරාණ නන්දාරාම විහාරස්ථානයේ පැවැත්වෙන ජංගම සේවයක් සඳහා අවශ්‍ය උපකරණ භාණ්ඩ හා සේවා ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාවේ ලේකම් විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාව. විජී පහන් අංශයේ වාහන සහ සේවක මහතුන් ලබා ගැනීම. උක්ත කරුණ සම්බන්ධයෙන් 2020.03.02 වන දින පුරාණ නන්දාරාම විහාරස්ථානයේදි

පැවැත්වීමට නියමිත ජංගම සේවය හා බැදේ. ඒ අනුව 2020.03.02 දින පුරාණ නන්දාරාම විහාරස්ථානයේදි පැවැත්වීමට අපේක්ෂා කරනු ලැබූ ජංගම සේවයේ කටයුතු වලට අවශ්‍ය උපකරණ , භාණ්ඩ හා සේවාවන් නොමිලේ ලබා දිමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. ප්ලාස්ටික් පුටු 200, පාට කොඩි 40, විජි පහන් අංශයේ රථ වාහනය සහ විදුලි කාර්මික මහතා හා සහායක මහතා ඇතුළු සේවක මහතුන් පස්දෙනකු , කැනපි 05. ඉල්ලා සිටිනවා. මෙම සභාව මගින් සංවිධානය කරනු ලබන ජංගම සේවයේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට ඔබගන්නා වූ සහාය ඉතා අගය කොට සලකනවා. එය ලබා දි තිබෙනවා. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

කවදාද ?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මෙය ඉල්ලා තිබෙන්නේ නම් 2020.03.02 දින. කලින් පැමිණි ලිපියක් . එදා සභාව තිබුණේ නැති නිසා අද තමයි ඉදිරිපත් කරන්න වෙලා තිබෙන්නේ.

**තීරණය -**

පුරාණ නන්දාරාම විහාරස්ථානයේ පැවැත්වෙන ජංගම සේවයක් සඳහා අවශ්‍ය උපකරණ, භාණ්ඩ හා සේවා ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් එවා ඇති ලිපිය අනුව එම සේවාවන් හා භාණ්ඩ ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

- ❖ පෙරවරු 10.20 ට පමණ ටෙන්ඩර් විවෘත කරන ලදී.

**03.07 වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය එක්ව සිදුකරන මාදම්පවිල අභය භූමියේ සත්ව හා ශාක විනාශය පිළිබඳව සොයා බලන්න යන මැයෙන් තෙත්බිම් උරුමයේ ලේකම් විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

තෙත් බිම් උරුමය . ශ්‍රී විජයාරාමය , කළුවඩුමුල්ල , අම්බලන්ගොඩ . වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය එක්ව සිදුකරන මාදම්පවිල අභය භූමියේ සත්ව හා ශාක විනාශය පිළිබඳව සොයා බලන්න. ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ විහිදි ඇත. මාදම්පා අභය භූමිය පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මේ දිනවල මහ පරිමාණයෙන් පවිත්‍ර කිරිම් සිදු කෙරෙමින් පවති. මිට කිහිප වතාවක්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙම අභය භූමියේ ඇළ මාර්ගයේ තැන්පත් කර ඇති රොන්මඩ ඉවත් කර ඇළ මාර්ග ඉවුරේ ගොඩ ගසා දැමුවත් වර්ෂාව සමඟ එම මඩ තට්ටු නැවතත් ඇළ මාර්ගය තුළ තැන්පත් වී ඇත. අවසාන වශයෙන් මිට මාස තුනකට පෙරද සංවේදි පරිසර පද්ධතිය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඇළ මාර්ග පවිත්‍ර කිරිම ඇරඹූ අතර

හින්ඇළ දෙපස දෙපස කුරුලු කැදලි සහිත ගස්වැල් කඩොලාන සහ ආශ්‍රිත කඩොලාන වනසමින් මේ කටයුත්ත කරනු ලබන විනාශය නිසා ප්‍රදේශවාසින් සහ සංවේදි කොටස් වලින් විරෝධය එල්ල විණි. ඉන්පසු වනජිවි දෙපාර්තමේන්තුව විසින් වනජිවි අධික්ෂණය සහිතව ඇළ මාර්ග පවිත්‍ර කිරිම සිදු කරන ලෙස හික්කඩුව ජාතික උද්‍යාන පාලක විසින් උපදෙස් දෙන ලදී. ඒ අතර දින කිහිපයක අධික්ෂණයෙන් ඇළ මාර්ග පවිත්‍ර කිරිම සිදු කරනු අතර ඉන්පසු ප්‍රදේශයේ සංවර්ධන කමිටු හරහා ඔබතුමන්ලාගෙන් ලැබුණු අනුමැතිය පිට නැවතත් ඉතා විනාශ කාරි ලෙස ගස්වැල් ජලජ සතුන්ගේ සුවැදි බිම් ගොදුර බිම් වනසමින් ක්‍රියාත්මකව පවති . නිසියාකාරයෙන් බලන්නේ නම් මෙම වන සත්වයන් මෙන්ම වෘක්ෂ ලතා ආර්ථික පණත උල්ලංඝණය වේ. මේ කටයුතු ඉදියට මාදම්පා ජලාශ සිමාවට පැමිණි නිසා දැවැන්ත හානියක් සිදු වෙමින් පවති. එමනිසා වහාම ක්‍රියාත්මක වන පරිදි කුරුල්ලන් බොහොමයක් පදිංචි කූඩු තනන බොහොමයක් ගොදුරු බිම් ලෙස යොදා ගන්නා කිරල , කඳුරු , දං මා කඩොල් මල් , කඩොල් වැනි ශාක පමණක් නොව එම ශාක නිසිලෙස විනාශ නොකරන ලෙස ලිඛිතව ලබා දෙන ලෙසත් පවිත්‍ර කිරිමට පෙර වනජිවි දෙපාර්තමේන්තුව ලවා අදාළ වටිනා ශාක හඳුනාගෙන ඔවුන් ඉදිරියේදි කටයුතු කරන ලෙසත් මඩ දැම්ම සඳහා සඳහා එක් ඉවුරක් යොදා ගන්නා ලෙසත් ඉල්ලා සිටිනා බවට එහි ලේකම් කැලුම් තුෂාර මහතා විසින් ඉල්ලිමක් කරනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මාදම්පා අභය භූමියට වඩා අපට අපේ නගරයේ ජනතාව වටිනවා. මේ ඇළ මාර්ග සුද්ද කළේ නැතිනම් ඔය කවුරුවත් ඇවිත් බලන්නේ නැහැ. අඩුම ගණනේ බත් එකක්වත් දෙන්නේ නැහැ. මේ ගරු මන්ත්‍රිවරු තමයි වතුරේ බැහැලා බත් එකක් වත් දුන්නේ. ගං වතුර ආපු වේලාවේ. ඔබතුමා කියන්න දැන් ඔය තියෙන ශාක ටිකයි කුරුල්ලෝ ටිකයි ඉන්නේ කොහේද කියා පෙන්වන්න කියන්න. ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා . වනජිවි එකත් කැඳවා වනජිවි එකට මේ මායිම් පෙන්වන්න කියන්න. මිනිසුන්ට දැඩි සේ හිරිහැර කරනවා. මෙතුමාගේ කොට්ඨාශයේ ඇළ මාර්ග සුද්ද කරන කොට ඔබතුමාගේ මැදිහත් වීමෙන් මැෂින් එක ආවේ. එය බොහොම ආමාරුවෙන් ගෙන්වා ගත්තේ ඒක නැවැත්තුවා. නවත්තලා ඔය කියන පුද්ගලයන් ඒ අයට ගහන්න ගියා. එම නිසා මේක විභිළුවකට ලක් කරන්න දෙන්න එපා. මොන කුරුල්ලාද මෙහි ඉන්නේ. මේකේ ඉන්නවා විසකුරු සත්තු ටික නම්. මිනිසුන් අල්ලන. ඔවුන් ගිහින් අර පාලම ළඟයි පුංචි පාලම ළඟයි අතහරින්නේ. වෙන මොකෙක්වත් සතෙක් මෙහි නැහැ. කබරගොයෙකුයි ඔය ටික විතරයි ඉන්නේ. වෙන මොකෙක් වත් සතෙක් මෙකේ නැහැ. කුරුල්ලෝ ටිකකුයි. මේ සංවිධානය මා හිතන්නේ එන්.ජී.ඕ. එකක්. රාජ්‍ය නොවන සංවිධානයක් නිසා මෙයින් ගරාගෙන කන්න ඕන නිසා කිහිප දෙනෙකු එකතු වෙලා තිබෙන්නේ. මා අසන්නේ ඔය සංවිධාන එකක්වත් ආවාද මිනිසන්ට ගංවතුර ගලපු වේලාවේ. එකක්වත් ආවේ නැහැ. මේ නගරයේ සිටින ජනතාවයි, මේ මන්ත්‍රිවරු ටිකයි , මේ සභාවේ සිටින සේවකයෝ ටිකයි එකතු වෙලා කෑම ටික හදාගෙන ගිහින් ජනතාවට දුන්නේ. ඔය ඇළ මාර්ග කැපුවේ නැතිනම් වතුර බසින්නේ නැහැ. දැන් පසුගිය රජයේ කාලයේ ඕක නැවැත්තුවා. පුංචි පාලම ළඟ කපන්න ගිහින්. නැවැත්තුවා පසුගිය කාලයේ ඔබතුමා කතා කරලා මැෂින් එක ගෙන්වාගෙන ඔය ඇළ මාර්ග ටික කැපුවේ. එක නවත්වලාම දැම්මා. මා හිතන්නේ ඒ මිනිසුන්ට ගහන්න ගියා. මා හිතන්නේ ගරු නගර සභා මන්ත්‍රි ධනසේන මාදුවගේ මහතා මට කතා කර කිවුවා. බලන්න ගරු සභාපතිතුමාත් නැහැ. ඇවිල්ලා විසඳන්න කියා. නමුත් දිගින් දිගටම මේකට ඉඩ දෙන්න බැහැ. එමනිසා කරුණාකරලා මේ අය ගෙන්වන්න. මේ අය දන්නේ නැතිද මේ බස්නැවතුම්පොළයි ,

දුම්රියපොළයි ඔක්කොම තිබෙන්නේ වනජීවි කලාපයේ. මේ අයට මේවා පෙන්වා දෙන්න. මේ අය ගෙන්වා. කරුණාකරලා මේ අය ගෙන්වා දෙන්න. වනජීවි එකත් ගෙන්වන්න. මේ මායිම් මොනවාද කියා පෙන්වන්න. මෙහි සිටින සත්තු මොනවාද ? මෙහි සිටින කුරුළු වර්ග මොනවාද? අපි කැමතියි බලන්න. අපිත් එක්ක ගිහින් මේ වනජීවි කලාපයට ගිහින් මෙහි සිටින සත්තු කුරුල්ලෝ මොනවාද කියා පෙන්වන්න කියන්න. ඔය කියන සංවිධානයට කියන්න. අපට පෙන්වන්න ඔය කියන සත්තු. අන්න එමනිසා කරුණාකරලා ඒ දෙය කරන්න කියන්න. එම ඉල්ලීම කරනවා. මොකද ජනතාවට ගංවතුරක් ආවොත් එහෙම මේ පහත්බිම්වල කෙරමිණිය ,පින්නදූව, තල්ගස්ගොඩ, පෝරඹ පනියන්දූව මහ අම්බලන්ගොඩ කියන ප්‍රදේශ යටවෙනවා. දැන් විශේෂයෙන්ම මෙම මාර්ග වල කෙරමිණිය, පින්නදූව , තල්ගස්ගොඩට වඩා වැඩියෙන්ම යටවෙන්නේ පනියන්දූවයි, පොරඹයි. ගරු සභාපතිතුමා කරුණාකරලා මෙයට විසඳුමක් සොයන්න. අපි දිගින් දිගටම කතා කළා. අපි සියළුම ගරු මන්ත්‍රීවරු එකඟ වුණා. මෙය වනජීවි අමාත්‍යාංශයට ගිහින් විසඳන්න.එමනිසා එම ක්‍රියා මාර්ගය ඉතා ඉක්මනින් ගන්න කියනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, වාරිමාර්ගය ගලන්නේ අපිට ඕන විදියට නෙමේ. පහත් තැනින් ගලන ජලය වෙනස් කරන්නට මේ තෙත්බිම් උරුමය නැමති සංවිධානයට නොහැකියි. එමනිසා අපේ ගම්වල ජනතාව විපතට පත්වන්නට ඇති අවකාශ වලක්වන එම ඇළ මාර්ග කපන වැඩ පිළිවළ කරගෙන යා යුතුයි. මේ සත්ව විශේෂ පිළිබඳව කතා කරද්දි මා නම් දැක තිබෙනවා රන් කිතලා කියන කුරුල්ලෙකු සිටිනවා මේ අකුරළ හරියේ. ඒ හැර වෙන කුරුල්ලෙකු දැක නැහැ ඔය ඇළ මාර්ග වල. ඒ වගේම මේ ඇළ මාර්ග කැපූ නිසා අපි පින්නදූව වෙල්යාය අක්කර 4ක් 5ක් විතර වපුරනවා මේ දිනවල . මෙය නොකෙරුවා නම් අපේ ගොවියන්ට මේ ගොවිතැන කළ නොහැකිව තිබුණා. මේ කියන සැඟවුණු සංවිධානයේ නියෝජිතයෝ අපිත් කැමතියි ඔවුන් සමඟ කතිකා කරලා මෙන්න මේ අවශ්‍ය විසඳුම් වලට යන්න. නමුත් මේ පරිසරයට අපිත් ආදරය කරනවා මේ ගහට කොළට. නමුත් මෙවැනි සැඟවුණු ගුප්ත චරිත නිසා අපේ ජනතාවට ජලයේ ගිලෙන්නට නොහැකියි. කෙරමිණිය , පින්නදූව වැසියෝ, පනියන්දූව පෝරඹ වැසියෝ වැටෙන විපත ඇළ මාර්ග නොමැති නම් ඔබතුමා හා අප සියළු දෙනා දන්නවා. නමුත් මේ කියන පුද්ගලයින් ඒ පිළිබඳව අත්දැකීම් නැති උදවිය. එමනිසා ඇළ කපන එක දිගටම කපාගෙන යන්න. ඇත්තටම අපි දැක තිබෙන්නේ වෙල් අනෝදා ගස පමණයි ඔය වෙල ආශ්‍රිතව. කිරල ගහක් දෙකක් තිබෙනවා. ඒවා අපි දැක තිබෙන්නේ කඩින් කඩ. ඒ කඩොලාන ශාක වශයෙන් කිරල ගස් තිබෙනවා. එමනිසා තත්ත්වය වටහාගෙන අපි මුහුණ දිය යුතුයි මේ ප්‍රශ්නයට. මෙවැනි නිර්නාමික ලිපි වලට නොසැලී අපි අපේ ගමන යන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ මාදම්පාගම අභය භූමියේ ශාක හා සත්ව විනාශය පිළිබඳවයි කතා කරන්නේ. මා පලමුවෙන්ම කියනවා මේ තෙත්බිම් උරුමයේ ලේකම් විසින් එවා ඇති ලිපියට ඔබතුමා විසින් ලිපියක් යවන්න. ඒ අයට කියන්න ඔබතුමලා දැන් ලිපියක් එව්වාට

අම්බලන්ගොඩ නගරයේ ගං වතුර ගලන කාලයට විශාල විනාශයක් වෙනවා. මොකද මේ සියළුම දේවල් වලට මැදිහත් වෙන්න වෙන්නේ සභාවට. මේ සිටින සත්තු වර්ගත් මේ තිබෙන විනාශ වි යන ශාක වර්ගත් පිළිබඳවත් සාකච්ඡාවක් දෙන්න කියා. මොකද සභාව වශයෙන් සාකච්ඡාවක් ඉල්ලන්න. එම නිලධාරින් පැමිණෙවි. එතකොට සභාව වශයෙන් ඔබතුමාට අපිට වගකීමක් තිබෙනවා. ඒ එන අදාල නිලධාරින් සමඟ මේ පිළිබඳ සාකච්ඡා කරන්න. සාකච්ඡා කර ඒ අය පෙන්වන කුරුලු විශේෂ . මොකද ජායරූප කර හරිපෙන්වන්න එපැයි. ඒ අය ජායාරූප කර පෙන්වන්න ඕන මෙච්චර ශාක විනාශ වෙනවා කියා. ඒ අවශ්‍ය දේවල් බලා සොයා තීරණයක් ගත යුතුයි. එමනිසා ඔබතුමා විශේෂයෙන්ම කියන්න මේ විනාශ වන සත්තු පරිසරය සුරකෙන්න ලෑස්ති වෙන්න ඕන. ඒ කියන්නේ සත්තු සුරකින්නත් අපි සූදානම් වෙන්න ඕන. නමුත් මේ ව්‍යාජ ලෙසින් පෙන්නුම් කරන ඒවාට රැවටෙන්න ඕන නැහැ. එමනිසා ඔබතුමාට තියෙන්නේ මේ සභාවේ තීරණය මේකයි කියා මේ තෙත් බිම් එකේ ලේකම්තුමාට ලිපියක් යවන්න. මුළු සභාවම ඒකමතිකව තීරණය කළා කියා. මා හිතන්නේ අපේ ගරු මන්ත්‍රිවරු සියළු දෙනාම මේකට කැමති වෙයි. සාකච්ඡාවක් දෙන්න කියා. එතුමන්ලාට පැමිණ මේවා පෙන්වා විග්‍රහ කර දෙන්න කියන්න. අපේ පරිසරයේ සිටින ශාකයි සත්වයනුයි අපේ ගරු මන්ත්‍රිවරු දන්නේ නැතිනම් පෙන්වන්න එපැයි ගෙනත්. අපිට එය නිශ්ප්‍රභා කරන්න පුළුවන් කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඔබතුමා එයට අවශ්‍ය සාකච්ඡාවක් ඉල්ලා සිටින ලෙස මා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සම්බන්ධව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය එක්ව මාදම්පා ගඟ අභය භූමිය විනාශ කිරිම පිළිබඳව තමයි මේ ලිපිය ඉදිරිපත් කර තිබෙන්නේ. අපිත් කුඩා කල සිට ඔය කියන ප්‍රදේශ වල ජිවත් වන පුද්ගලයන්. මේ ලියපු ලේකම් අමුතුම එකක්. තෙත් බිම් එකේ ලේකම්. මේක ව්‍යාපෘතියක්ද මොකක්ද දන්නේත් නැහැ. මේ වගේ ලිපි අපි කතා කරන විටත් හරි පරිස්සම් විය යුතුයි. මොකද මේවා රකින්න ඉන්න කට්ටිය තමයි. ඇළ රකින්න ඉන්නවා වාරිමාර්ග දෙපාර්තමේන්තුව. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය තුළ තමයි සම්පූර්ණ පරිපාලනය තිබෙන්නේ. මේ අය මේවා දැන දැන වැරදි කරන්නේ නැහැනේ. එමනිසා මේ කොහේවත් සිටින ලේකම් කියා දමාගෙන ලිපියක් එව්වාට අපි මේවා සාකච්ඡා කළ යුතුත් නැහැ. වැඩකුත් නැහැ. මොකද ඒ අදාල නිලධාරින් ඒ රජයේ වගකිව යුතු නිලධාරින් හැටියට තමයි කටයුතු කරන්නේ. මොකද අපි දන්නවා ඔය ඇළවල් තිබුණේ කොහොමද ? ඔය ඇළවල් මේවා වුනේ කොහොමද කියා. අපෙත් ගම්බිම් ප්‍රදේශනේ. මා හිතන්නේ මේ මනුස්සයා මේ ඇළකවත් ගිහින් නැතුව ඇති ලේකම් කිවුවාට. එමනිසා මේ සම්බන්ධව ප්‍රශ්න ගැටළු ඇතිවන්නේ එහේ ජිවත්වන පුද්ගලයන්ට. මේ ඇළ ගොඩවුණාම. වතුර ගැලීම් සිදු වුණාම ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රිවරු ප්‍රකාශ කළ පරිදි . එමනිසා මේ වාරිමාර්ගයේ ඇළවල් මේවා සුද්ද කළ යුතුයි. ඒවා නිත්‍යානුකූලයි. දැන් මේ කියන්න වගේම මේ සමිතියේ ලේකම් කවුද කියා සොයා බලා , මේ සමිතියේ කියක්ද ඉන්නේ කියා සොයා බලන්න. ඒ තුළ ගෙන්වා බලා සාකච්ඡාවකට කැඳවන්න. මොකද මෙහි ප්‍රාදේශිය ලේකම් හා වනජිවි දෙපාර්තමේන්තුව කියන්නේ රජයේ ආයතන. එම ආයතන වලට ලිපි දමනවා කියන්නේ ලොකු ප්‍රශ්නයක් නිසා මෙයට අපිත් මැදිහත්වෙලා අනිත් එක මේ ව්‍යාජ සංවිධාන තිබෙනවා. මෙහි ව්‍යාජ ලේකම්කියා දමාගෙන පවුලේ උදවිය හරි දමාගෙන මෙය කරනවා. එමනිසා අපි දැඩිසේ මේ ලිපියට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මෙහි සිටින්නේ පවුලේ උදවිය. දැන් බැලුවාම ගරු නගර සභා මන්ත්‍රි කොඩිකාර මහතාත් සිටිනවාද

දන්නේ නැහැ. කළුවඩුමුල්ලේ කිවුවාම . අපි මෙයට දැඩි විරුද්ධත්වයක් ප්‍රකාශ කරනවා. මොකද රජයේ ආයතන දෙකකට විරුද්ධව. මෙයට දෙන එක කිසිම ප්‍රශ්නයක් නැහැ කියන එක අපේ ගම්වල ඇවිදින උදවිය හැටියට අපේ ගම්වල විස්තර දන්න උදවිය හැටියට මේ පිළිබඳව විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ පිළිබඳව මා යම් පැහැදිලි කිරීමක් කරන්නම්. මේ ඇළ මාර්ග සුද්ද පවිත්‍ර කරන එක ජනතාවගේ අවශ්‍යතාවයක් ඇත්තටම. ඒ වගේම දිගින් දිගටම තෙත් බිම් කියන සංකල්පය යටතේ දැනට අම්බලන්ගොඩ , රත්ගම ආසනය , කරන්දෙණිය ආසනය, බලපිටිය ආසනය යන ඒවා මෙවැනි ආසන අභය භූමියක් වශයෙන් ප්‍රකාශයට පත් කර තිබෙනවා. අක්කර 60 ක වගේ ලොකු වපසරියක්. එම වපසරිය සෑදීම නිසා ඇත්තටම තෙත්බිම් කලාපයක් ලෙස සංවර්ධනය විය යුතුයි කියන සංකල්පයක් ඇතිවෙලා තිබෙනවා. ඒ වගේම මේවා සුද්ද කරනවා වගේම මෙය තෙත්බිමක් වශයෙන් ආරක්ෂා කිරීමේ යෝග්‍යතාවයක් තිබෙනවා කියන දෙපැත්ත ගැනම අපට කල්පනා කර බලන්න වෙනවා සභාවක් වශයෙන්. මොකද මේවා ගොඩකළහොත් එහෙම අපිට ගංවතුර කියන එක මීට වඩා ඉක්මනින් ළඟා විය හැක. එමනිසා සභාව මෙය කල්පනා කරලා අපි අම්බලන්ගොඩ අක්කර 60ක විතර වපසරියක අපි ව්‍යාපෘතියක් ලියා ගෙන යනවා. නගර සභාවෙන් කඩොලාන උද්‍යානයක් බවට පත් කිරීමට. අපි එම තිබෙන රක්ෂිත භූමියම ආරක්ෂා කරමින් ඒ වගේම ඒ සඳහා අධ්‍යනය කරන පුද්ගලයන්ට යන්න ඕන මාර්ගයක් තිබෙනවා නම් ඇත්තටම නගරයට ලොකු අඩුවක් විවේක සුවයෙන් ගත කිරීමට නගරයේ වෙරළ ඇරුණාම වෙනත් තැනක් නැහැ. එමනිසා දැනට අපි සකස් කරමින් යනවා මෙවැනි පුද්ගලයන් සඳහා මෙය ආරක්ෂා කිරීම සඳහා කොටසක් ඇතිකිරීමට අපි බලාපොරෝත්තු වෙනවා. එමනිසා එම කඩොලාන සම්බන්ධයෙන් උද්‍යානයක් ඇති කිරීමට අපේ බලාපොරෝත්තුවක් තිබෙනවා. නමුත් ඒ වටේම තිබෙන ඇළ මාර්ග කියන්නේ ඒවා සුද්ද නොකර තිබුණොත් ජනතාව නිරන්තරයෙන් ගංවතුරට යටවෙන දෙයකි. එමනිසා අපි එය සුද්ද කිරීම අනිවාර්යෙන්ම කළ යුතු දෙයකි. ඒ වගේම මේ තැනැත්තන්ගේ අදහසත් අපට සභාවට ඕන නම් අපට ආරක්ෂා කර දිලා ඒ ආරක්ෂා වන පරිසර පද්ධතිය ජනතාවට දැක බලා ගැනීමේ ක්‍රමවේදයක් ඇති කළ හැකියි. එක ආකාරයකින් අපි පරිසරය පැත්තෙන් අපි පරිසරය සංරක්ෂණය පැත්තත් ඉටු කරනවා. ඒ වගේම අපේ ජනතාවගේ පැත්තෙන් විවේක ගතකරන කාලය ඉතා වැදගත් විදියට යම් ආකාරයක ක්‍රමයක් ඇති කර තිබෙනවා. මා මෙවැනි යෝජනාවක් මා දුටුවේ මා මීට ප්‍රථම දකුණු කොරියවේ සංකුචින් කියන නගරයට අපි ගියා. එම නගරයත් මෙවැනිම ආකාරයේ වගුරු බිමක් සහිත නගරයක්. එම වගුරු බිම එම නගාරාධිපතිතුමා එය අවුරුදු හයක් ඇතුළත උද්‍යානයක් බවට පත් කර තිබෙනවා. එම උද්‍යානයක් බවට පත්කරලා බලන්න ඕන ගස්කොළන් බලන හැටි ඒ පරිසරයේ ජීවත්වන පොඩි පොඩි කුරුල්ලන් . අපි බලන්න මා දැන් අපේ ගෙවත්තේ වගා කරමින් සිටිනවා. වෙනදා වැඩියේ කුරුල්ලෝ එනවා ඇත්තටම වගා කරන විට. කැළේ වෙලා තිබෙන කොට කුරුල්ලෝ යම්කිසි කොටසක් එනවා. එවැනි දෙයක් මහජනතාවත් ආරක්ෂා කරමින් දෙපැත්තම පරිසරයත් මහජනතාවත් ආරක්ෂා කරමින් කළ හැකි ක්‍රමවේදයකට අන්තර්ගත වීම වඩා යෝග්‍ය බවට මා සිතනවා. මොකද යම්කිසි විදියකින් ගංවතුරක් ආවොත් එහෙම මේ කොටසින් පිරී තමයි අනිත් කොටසට එන්නේ. ඉතිං අපි මේ කොටස අපි ආරක්ෂා කර ගත යුතු ජලාශ්‍රිත ප්‍රදේශයකි. එවැනි යෝජනාවක් අපි අලුතෙන් ඉදිරියට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. අපි දැන් අක්කර 248ක් අම්බලන්ගොඩ නගර සභාව අත්පත් කරගෙන තිබෙනවා. එම අත්පත් කර ගත් කොටසේ ජනතාව බලා සිටිනවා තමන්ට හිමි වන්දි මුදල් ලබා දෙන්න කියා. එතකොට අපි මේ මුදල් ලබා දෙන්නේ

නැතිව 1989 සිට යම්කිසි කාලයක් ගත වෙලා තිබෙනවා. එතකොට අපි සාධාරණ මුදලක් ලබා දෙනවා නම් අර ඉතුරු කොටස් ටික අපි සංවර්ධන වැඩකටයුතු සඳහා යොදා ගන්නවා නම් අපි ඒ වෙනුවෙන් කඩොලාන පද්ධතිය ආරක්ෂා කර ගැනීමේ ක්‍රමවේදයකුත් ඇති කිරිම සුදුසුයි. වනජීවි කලාපයේ . දැනට අපි යනවිදයට කරලා එය අපි සුරක්ෂිත කර වනජීවි කියන යෝජනාවත් අපි අන්තර්ගත කළ යුතුයි. එතකොට අපිට අක්කර 248ක් අක්කර 60ක් අපි පරිත්‍යාග කළහොත් අපට අක්කර 175ක් හරි අපේ සංවර්ධන කටයුතු සඳහා ඉතිරි වෙනවා. එමනිසා අපි මෙය කල්පනා කරලා මේ දෙයට සභාව ඉස්සරහාට යොමු වන එක හොඳයි. මේ කියන අයගේ අදහසත් අපි ඇත්තටම ක්‍රියාත්මක කළ යුතුයි. පොළොවේ ක්‍රියාත්මක කරන්නම්. මා මේ දැනුම් දිම කරනවා. මේ ව්‍යාපෘතියේ ජායා පිටපත් හැම මන්ත්‍රිවරයෙකුටම ලබා දෙන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙකට විරුද්ධව නෙමේ. මෙය හොඳ යෝජනාවකි. එය ක්‍රියාත්මක කරන්න. මේවා තමයි ක්‍රියාත්මක කරන්න ඕනේ. හැබැයි ඊට ඉස්සර වෙලා ඔය සංවිධානය විසින්නේ හිටපු ඇමතිවරයෙකුට කියලා ඕක වනජීවි සංවිධානයක් කළේ. මේ කරන්දෙණියේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ දේශපාලන උවමනාවක් මත කළ දෙයකි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එක ක්‍රියාත්මක කර ගන්න ඕනනේ ඕක්කොටම ඉස්සරවෙලා. එකට ලැහැස්ති වෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් මගේ නමත් කිවුවා . එහෙන් මෙහෙන්. මේ ලිපියේ මගේ කිසිම සම්බන්ධයක් නැහැ. මා දන්නෙත් අද මෙහෙම ලිපියක් එව්වා කියා. මේ ලිපියේ හැබැයි කොහේවත් කියා නැහැ ඇළ සුද්ද කරන්න එපා කියා. ඇළවල් හරන්න එපා කියලත් නැහැ. ඔය ලිපියේ කියා තිබෙන්නේ යම්කිසි ක්‍රමවේදයකට කරන්න කියා විතරයි. ඉතිං මා ඔබතුමාගේ කතාවත් එක්ක සියයට සියයක් එකඟ වෙනවා. මෙය වෙන්න ඕනේ. දැන් මේවත් ආරක්ෂා වෙන්න ඕනේ. ඔබතුමාගේ කතාවත් එක්ක අපි සියයට සියයක් එකඟ වෙනවා. අපි මේ අය ගෙන්වලා කතා කළ යුතුයි. ඔබතුමාලාට බැරිනම් මා ගිහින් පන්සලෙන් අහන්නම් මොකක්ද මේ කියා. මට පුළුවන් එක කතා කරන්න. නැහැ පන්සලේනේ මෙහි ලිපියනය දමා තිබෙන්නේ. මට ගිහින් අහන්න පුළුවන්. මා කියන්නේ ඔබතුමාගේ කතාවත් එක්ක සියයට සියයක් එකඟයි. සම්පූර්ණයෙන් බැහැර කරන්න එපා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමා, මේ වැඩ කරන සේවකයන්ට ඇළ කපන්න නොදි ගහලා එලෙව්වා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එවා මා දන්නේ නැහැ. ඒ අතිතය  ගැන. ගරු සභාපතිතුමා කිවු ආකාරයට සියයට සියයක් බැහැර කරන්න හොඳ නැහැ. එහෙම වෙන්න ඕනේ. අපේ ගමට ආවේනික දෙයක්නේ. එමනිසා අපි සාකච්ඡා කරන්නම්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අපිත් පරිසරයට ආසයි. අපි පරිසරය විනාශ කරන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

අපිට ඕන විදියට ඒ අය හරවාගෙන අපි වැඩය කළ යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ඒ අය ගෙන්වා සාකච්ඡා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, මාදම්පාවිල කියා කතා කරන කොට මාදම්පාවිල සංසදය කියා එකක් තිබෙනවා. මොකද මා තමයි එහි සභාපතිව ඉන්නේ. ඇත්තටම අපි එයින් ඉල්ලීම් කරලා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අපි රුහුණු සංචාරක ව්‍යාපාරය මඟින් අපි ඇළවල් කපා ඒ වැඩ කොටසක් කළා. මා හිතන විදියට මේ සංවිධානය මොනවාද කළේ කියන එක අපිට හරි ප්‍රශ්නයකි. ඔබතුමා ඇහුම් කන් දෙන්න. ඔබතුමා මේ සංවිධානය සමඟ සාකච්ඡා කර සැලසුම් කර තමයි මෙය සභාවට දමා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය සංවිධානයත් එක්ක මගේ ගනුදෙනුවක් නැහැ. මා ඔය මහාචාර්යතුමා සමඟ කොහොත්ම නැහැ ගනුදෙනුවක්. ස්වාමින් වහන්සේ එක්කම නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

මොකද මේ සංසදය ගැන කතා කරන කොට ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ අම්බලන්ගොඩ නගර සභාවට වංචා කරන ලද දෙදෙනායි සිටින්නේ. එක්කෙනෙක් ධර්මාශෝකේ විදුහල්පතිතුමා, අනිත් කෙනා ඔය මහාචාර්ය ස්වාමින් වහන්සේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ඔය සංවිධානය ගැන පැහැදිලි නම් අපිට වෙන්න ඕනේ එකයි. ඔය සංවිධානය මඟින් අපේ මාදම්පා ගඟේ සංවර්ධනය සඳහා මොනවාද ඒ අය කර තිබෙන්නේ කියන එක විශාල

ප්‍රශ්නයකි. ඇත්තෙන්ම මේ සංවිධානයට කිව යුතුයි. අද උදයේත් මට කෙනෙක් පැමිණ කිවුවා . මානිම්මුල්ල ප්‍රදේශය ගොඩ කරනවා. ගල් ගෙනවිත් දමා දිගටම ගොඩ කරගෙන යනවා. අන්න එවාට විරුද්ධව ඒ අය ඔබතුමාව දැනුවත් කර තිබෙනවාද? මානිම්මුල්ල නිවාස යෝජනා ක්‍රමය පැත්තේ ගල් ගෙනවිත් සැහෙන්න ප්‍රදේශයක් ගොඩ කර තිබෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ පැත්තේ නම් ඔබතුමිය නොදෙන ඉන්න විදියක් නැහැ. ඔබතුමිය නොදනුවත්ව කරන්න බැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

මා දැනුවත්ව කියන එක නෙමෙ. ඔබතුමා හදන්නේ අර බෝලය පාස් කරන්න. නිතරම එයට ඔබතුමා හරි දක්ෂයි. නිතරම අපි ප්‍රශ්නයක් යොමු කරන විට එයට ඔබතුමා වෙනත් පැත්තකට අවධානය යොමු කරන්න හදනවා. නමුත් ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ වගේ සංවිධානයක් කරනවා ගොඩහේනේ ප්‍රදේශයේ ලාල් එමානුවෙල් කියා පුද්ගලයෙක්. එතුමා ඇත්තටම  අපි දුටුවා එම පරිසරය අභය කරලා . අපි එම පරිසරයට ගිහින් තිබෙනවා. මාදම්පා ගඟේ සංචාරය කරන කෙනෙක් වශයෙනි. මා මාදම්පා ගඟේ ගොඩක් සංචාරය කර තිබෙනවා බෝට්ටු මඟින්. හොඳට ඒ සම්බන්ධව දන්නවා. දැනගෙන අත්දැකීම් සහිතව තමයි මා කතා කරන්නේ. එමනිසා අර අපේ ගරු උප සභාපතිතුමා කිවු පරිදි සත්තු කුරුල්ලෝ නැත්තේත් නැහැ. කිසි ප්‍රමාණයකට ඉන්නවා. ඉතිං ඒවා රැකගෙන. එතුමා කියන්නෙත් නැහැ ඒවා විනාශ කරන්න කියා. මේ සියළුම ගරු මන්ත්‍රිවරු සභාවට කියන්නෙත් නැහැ ඒවා විනාශ කරන්න කියා. මොකද අපේ ප්‍රධානම දෙය වන්නේ මහජනතාව ජීවත් කරවීම. එමනිසා ඇළවල් කපන එක කළ යුතුම දේ. ගංවතුර ආවාම අපි දන්නවා ජනතාව කොතරම් දුරකට පත්වෙනවාද කියා. එමනිසා මේ සංවිධානය ඇත්තෙන්ම කැඳවන්න. මේ ස්භාව ධර්මයාට ආදරය නැති කෙනෙක් නැහැ. ස්භාව ධර්මයට ආදරය කරන සියළු දෙනා තමයි මේ සභාවේ ඉන්නේ. එමනිසා ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරන්න. මේ පුද්ගලයන්ට ඕන විදියට ඒ දේවල් කරන්න දෙන්න බැහැ. එමනිසා අපිව දැනුවත් කරලා මොකද අපි මාදම්පා ගඟ සංවර්ධනය කිරිමේ ව්‍යාපාරික සංසදයක් පිහිටුවා ගෙන ඒ කටයුතු වලට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචිය ලබාගෙන යම්කිසි සේවයක් කරමින් කටයුතු කරනවා. එමනිසා අපට ඕනේ අපේ නගරයේ ස්භාව ධර්මය රැක ගනිමින් සංවරධනය කරන්න. එමනිසා ඔබතුමා මේ සංවිධානය පිළිබඳව මීට වඩා අපිව දැනුවත් කරලා ඒ සම්බන්ධව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

- **ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා පෙරවරු.11.15ට පමණ සභාවට පැමිණීම**

<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා  කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ තෙත් බිම් පිළිබඳව ලේකම්තුමිය ඉදිරිපත් කළ ලිපිය සම්බන්ධවයි. මෙහි දෙපැත්තක් තිබෙනවා . අපිට ඔබතුමා කිවු පරිදි තෙත්බිම් ආරක්ෂා කර ගත යුතුයි. කඩොලාන ආරක්ෂා කර ගතයුතුයි. අපේ තිබෙන ජෛව විවිධත්වය අනුව අපේ තිබෙන කුරුළු උද්‍යාන ආරක්ෂා කර ගත යුතුයි. මෙහි සතුන් සිටිනවා. නැතිව නෙමේ.  කියන තරම් සතුන් නැහැ. මේ කඩොලාන ශාක ආරක්ෂා කර ගැනීම වැදගත් වගේම ඇළවල් සුද්ද කිරිම

ඊට වඩා වැදගත්. තව ටික කාලයකින් වහිනවා. ගංවතුර ඇතිවන කාලයට ගරු සභාපතිතුමනි, ඇළ වල් සුද්ද කරලා එම ගංවතුර පාලනය කරන එක අනිවාර්යෙන් කළ යුතුයි. කඩොලාන ශාක ළඟදි ඕක නැවැත්තුවා. වනජීවි එකෙන් නැවැත්තුවා. කඩොලාන ලෙස වල් අනෝදා , කඳුරු , කිරල වගේ ගස්. එවා ආරක්ෂා කරගෙන කපන්නත් අමාරුයි. තව එකක් එක පැත්තකට ගොඩකිරිමේ පොඩි ප්‍රශ්නයකුත් තිබෙනවා. එමනිසා මේ දෙපිරිසම ආරක්ෂා කිරිම වැදගත්. මේ දෙපලම ඉතා වැදගත් . අපේ තිබෙන ජල මූලාශ්‍ර . විශේෂයෙන්ම ඒවා ආරක්ෂා කර ගත යුතුයි. විශේෂයෙන්ම වැදගත් වෙන්නේ මා සිටින පෝරඹ කොට්ඨාශය, ඒ වගේම පනියන්දුව කොට්ඨාශය වර්ෂා කාලවලදි යටවෙනවා. තව එකක් කොච්චර ඇළ මාර්ග සුද්ද කළත් වැඩක් නැහැ. අන්තිමේදි අතන හිරවෙනවා. මෝය කට සුද්ද කරන්නේ නැතිව. එහි දොරවල් ඔක්කොම වැහිලා තිබෙන්නේ. සුනාමි දිනවල හිරවූ රේල්පිලි තිබෙනවා, වාහන තිබෙනවා. මේ ගංමෝය ළඟ ව්‍යාපාරයක්ද මන්දා සිදුවන්නේ. මෙතැන හැමදාම ඇවිත් ගල්ටික විතරක් සුද්ද කරනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ ගැන කතා කරලා දැන් අලුත් එකක් ඉදිරියට යනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

එමනිසා ඔබතුමාගේත් සියළු දෙනාගේත් අවධානය යොමු කර ගත යුතුයි. මේ දෙපැත්තම අපි ආරක්ෂා කර ගත යුතුයි. මොකද තෙත් බිම් තිබෙන්නත් ඕන. මේ කුරුලු උද්‍යාන කඩොලාන ශාක ආරක්ෂා කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ මෙතුමා මතු කරන ලද කාරණය ගැන පැහැදිලි කරන්නම්. මේ මෝය කට දමා තිබෙන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අවශ්‍ය විදියට තමයි දමා තිබෙන්නේ.1969 වර්ෂයේදි. නමුත් අපි ළඟදි රැස්වීමක් තිබ්බා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ. අපි කිවුවා මෝය කටේ ගල් වසරකට පාරක් පෙරලෙනවා ගඟට. ඒ කියන්නේ දමන ලද ගල්වැටිය. එය නැවත සුද්ද කරන්න මුදල් යනවා. ජනතාව කියනවා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහතාගේ සාක්කුවට දෛනිකව ගණනක් යන වැඩ පිළිවළක් කියා මෙහි තිබෙන්නේ. එමනිසා අපි කිවුවා මේ සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහත්වරුත් , වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහත්වරුත් දෙපාර්ශවය එකතු වෙලා මේ වැටිය වෙනස් කරලා අලුතින් දැමීම සඳහා නිර්දේශයක් දෙන්න කියා. දැන් ඔවුන් එකතුවෙලා අපට නිර්දේශයක් දෙන්න පොරොන්දු වෙලා තිබෙනවා. ඒ වගේම මා විසින් පොරොන්දු වුණා රජය මුදල් වෙන්කිරිමක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට කර නැතිනම් පළාත් සභාව විසින් හෝ අදාළ යන්ත්‍ර ටික දෙන්න අපි තෙල් ටික දෙන්නම් නගර සභාවෙන් සියළුම ඇළ මාර්ග ටික සුද්ද කරන්න ඕන. නැතිනම් මේ වැඩ සටහන කිරිමට අවශ්‍යයි. නැතිනම් මෙයින් නගර

වැසියන් අනිවාර්යෙන්ම ගංවතුරට යට වෙනවා කියා. එමනිසා ඔය ගංමෝය කට සම්බන්ධව ප්‍රශ්නය දැනට සාකච්ඡා කර තිබෙන්නේ. මේ කඩොලාන උද්‍යානයක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධව විස්තර ටික කවුරුත් බලන්න. මේ වගේ වැඩසටහනකට විශාල මුදලක් යනවා. සංසිචි නගරයට විදේශයන්ගෙන් පැමිණෙන සංක්‍රමික කුරුල්ලන් 600කට පමණ තමයි ඔය කෝටි ගණන දී තිබුණේ. එමනිසා මෙහි මීට වඩා වැඩිවෙච්ච දේවල් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා හරියට ටෙලිනාට්‍යයක් බැලුවා වගේ සුරංගනා කතාවකට ගියා වගේ. කමක් නැහැ. එහෙත් සාර්ථක වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. එතකොට මේ ප්‍රදේශයේ ඇළ මාර්ග ලෝකය බිහිවූ දා සිට ඕවා පවතින දේවල් . එතකොට යම් ආකාරයකින් ඒවා දිනපතා ගොඩ වෙනවා. එතකොට මේ ඇළ මාර්ග නැවත සුද්ද කරන්න ඕන. එතකොට එහි කුරුලු කූඩුව කැඩුනාය. සතා එහා මෙහාට වුණා කියා ඒවා නතර කරන්න බැහැ. මොකද ජනතාවට එක එල්ලලේ බලපාන සාධක මේවා. අනිත් කාරණය තමයි කුරල්ලන් අපි මේ ගෙවල් හැදුවා වගේ හැමදාම එකම තැන ගෙවල් හදාගෙන ඉන්නේ නැහැ. මේ අවුරුද්දේ හැදුවා . එහෙම නැතිනම් මාස හයකින් වෙනත් ගසකට ඉගිල්ලි යනවා. මා මේ සත්තුන්ට කරුණාව නැතුව නෙමේ. මා ගෙදර කැරපොත්තෙක් වත් මරන්නේ නැහැ. එක වෙනම දෙයක්. නමුත් මේ මහජනයාගේ මූලික අවශ්‍යතාවයන් තමයි නගර සභාව වශයෙන් කළ යුත්තේ. අනිත් එක තමයි ජල ගැල්ලමක් හට ගත්තොත් බිම සිටින ඔය පුංචි මුවෝ වගේ අනිත් සතුන්ට යන්න තැනක් නැහැ. එහෙම නම් එම සතුන්ගේ යහපතක් වෙනවා මේ ඇළ මාර්ග සුද්ද කිරීම. අනිත් කරුණු තමයි මේ ඇළ මාර්ග සුද්ද කිරීමට විරුද්ධ වෙන අනිත් අය තමයි මේ ඇළ මාර්ගවල මායිම්වල සිටින උදවිය. ඇළ මාර්ග අල්ලාගෙන ඉන්නේ. ඒවා සුද්ද කරන විට මේ ඇළ මාර්ග සුද්ද කිරීම ඒ අයට හානිකරයි. මේ සංවිධාන සියල්ල ගොඩනැගෙන්නේ තමන්ගේ බඩවියත ගොඩ නඟා ගන්න. එමනිසා මේ ඇළ මාර්ග සුද්ද කිරීම මොනම හේතුවක් නිසාවත් නතර කරන්න බැහැ. උදාහරණයක් හැටියට දැන් දූව ප්‍රදේශය ගොඩ කරලා ගොඩනැඟිලි ගැහුවා. අපි ඒවාට පැමිණිලි කළා. එවාට නගර සභාවෙනුත් නිසියාකාරයෙනුත් ක්‍රියාත්මක වුණා කියා මා නම් දුටුවේ නැහැ. ඒවා කඩලා අයින් කළේ නැහැ. නඩු දැම්මේ නැහැ. ඒ මොකක් වත් වුණේ නැහැ. ඔන්න ඔයවගේ පුද්ගලික එන්.ජී.ඕ එක හරහා තමයි මෙය සිදු කරන්නේ. ඒ අය එක පැත්තකින් මුදල් උපයා ගන්නවා. අනිත් පැත්තෙන් තමන්ගේ බඩ වියත රැක ගන්න තමයි මේ සංවිධාන ගොඩ නඟා ගන්නේ. ඒවාට පූජ්‍ය පක්ෂයෙන් අවසර ලැබෙනවා ඇති සමහර වේලාවට. අනුග්‍රහය ලැබෙනවා ඇති. මුදල් ඉපියීම චේතනාව කර ගත් අද වගේ ලෝකයක සමාජයක මේ වගේ සංවිධාන ගොඩ නැගෙන එක අරුමයක් නෙමේ. එමනිසා මහජනතාවගේ අවශ්‍යතාවය මූලික ලෙස සලකා මේ ඇළ මාර්ග සුද්ද කරන්න . මට තව ප්‍රශ්නයක් තිබෙනවා ගරු සභාපතිතුමා සමඟ. මේ අක්කර 60 ක භූමි භාගයක් තිබෙනවා.

එතකොට ඉතිරි අක්කර ගණන වෙල් කුඹුරු . එතකොට මේවාට මොකද වෙන්නේ. ඔබතුමලා මේවා ගොඩ කරනවා කියන්නේ නැවත ජල ගැලීම් ඇති වෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගොඩ කරන්නේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මා සතුටු වෙනවා එම සහතිකය පිළිබඳව. වගුරු බිමක් නම් ඒක කුඹුරක්. එක අස්වද්දන්න ඕන. එහෙම නැතිව මේ සංවර්ධනය කියන වචනය උපයෝගී කරගෙන මේවා ගොඩ කරලා පසුගිය කාලයේ සිදු වුණා. නගර සභාවෙන්ම වුණා. ඉතාම හොඳට තිබුණ කුඹුරු ගොඩ කරලා විනාශ කරලා දැන් ඒ හරහා ජලගැලීම් වලට උදවු වෙලා තිබෙනවා එම ගොඩ කිරීම්. එමනිසා ජනතාවට හානිකර සංවර්ධනයක්. එම ගොඩ කිරීම් වලට යොදා ගන්නේ නැතුව යහපතක් වන ආකාරයෙන් යොදා ගනි කියා මා බලාපොරෝත්තු වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, තෙත් බිම් උරුමයේ ලේකම්තුමා විසින් එවන ලද මේ ලිපිය මා නම් දැක නැහැ මේ නගරයට මේච්චර කාලයකට මේ ලේකම් කෙනෙකු. මේ වගේ ලේකම්වරයෙකු මේ රැස්වීමකට හෝ යම්කිසි උත්සවයකට යම්කිසි දෙයකට සහභාගී වෙලා නැහැ. එක් පුද්ගලයෙක්වත් මේ නගරයේ යටවෙනවා. සාමාන්‍යයෙන් එක දිගට දිනක් වැස්සොත් එහෙම මේ අම්බලන්ගොඩ නගරයේ ¼ පමණ යටවෙනවා. මේ කියන කිසිම පුද්ගලයෙක්වත් එක බත් පාර්සලයක්වත් එක වතුර බෝතලයක්වත් ගෙනත් දෙන්නේ නැහැ. මේ අපේ පනියන්දුව , මහ අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ වගේ මේ අපේ ගම් ගංවතුරෙන් යටවෙනවා. එම යටවෙන නිසා තමයි අපි ඉල්ලා සිටියේ මේ ඇළවල් සුද්ද කර දෙන්න කියා. එම ඉල්ලීම කරලා අපි වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් තමයි මේ මැෂිම ඉල්ලා ගත්තේ. අනිත් එක ඉල්ලුවේ නගර සභාවෙන් තෙල් දෙනවා. මේ රජයෙන් කරගෙන වැඩ පිළිවලට මේ කොහේවත් යන සංවිධින අකුල් හෙලනවා. රජයේ සේවකයන්ට ගහන්න යනවා. දැනටමත් මේ අය මෙහි අයිතිවාසිකම් අරගෙන. අපට ඉදිරියේදී ගරු සභාපතිතුමනි, ඔබතුමා ගෙන ආවා වගේ ව්‍යාපෘතියක් කරන්න අපට මේ අය අවසර දෙයිද? අඩු ම ගණනේ මෙහි එක වලක් හරන්නවත් මේ අය අපට ඉඩ දෙයිද? අපිට දෙයිද? දෙන්නේ නැහැ. අනිත් එක ගරු සභාපතිතුමනි මා ඉල්ලා සිටිනවා. මේවා එක පැත්තකට දමන්න කියා. අර අපේ සරත් මන්ත්‍රීතුමා කිවූ පරිදි ඔය ඇළ මාර්ග දිගේ තිබෙනවා රක්ෂිතය අඩි 20ක් විතර. සමහරක් උදවිය අඩියක්වත් තියා නැහැ. ඔය ඇළ අයිනට. අර මැෂින් එකෙන් මල්ටික කඩලා , පැල ටික කඩලා දමන්නේ එක පැත්තකට. ගෙවල් තිබෙන පැත්තට වැටුණාම තමයි ඒ අය කියන්නේ එකතු වෙලා දමන්න කියා. ඒ අයට එහෙම නෙමේ කරන්න තිබෙන්නේ. දැන් බලන්න මාදම්පා ගඟේ මෑතකදිත් මා දුටුවා ගඟ ගොඩ කරනවා. සිලින්ඩර් බස්සවා තිබෙන්නේ. මේවාට විරුද්ධ වෙන්නේ නැහැ. මාත් දුටුවා දින දෙකක්ද තුනක් තල්ගස්ගොඩ ගඟේ බෝට්ටු දෙකක්ද තුනක් ද ? එහි යනවා එනවා. ඒ අයට ඒවා පෙනෙන්නේ නැහැ. මේ අහිංසක මනුෂයකු නිවසක් ඉදි කළහොත් කවුරු හරි දෙයක් කරගතහොත්, ගහක් වවා ගත්තොත්. පසුගිය දිනයකදි මා දුටුවා කොහේ හරි ඇළ ඉවුරක කෙසෙල් ගස් වගයක් වගා

කර තිබෙනවා. ජනතාව රණ්ඩු වෙලා තිබෙනවා. මේ තෙත්බිම් උරුමය කියන සංවිධානයට මාගේ බලවත් විරෝධය ප්‍රකාශ කරනවා. ඉදිරියේදි අපි වගේ මේ රාජ්‍ය ආයතනයකින් කරන වැඩ කටයුතු , සංවර්ධන වැඩ කටයුතු කිසිවක් කර ගැනීමට ඉඩ ලැබෙන්නේ නැහැ. එමනිසා මාගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට පොඩ්ඩක් කතා කිරිමට අවශ්‍යයි. ගරු පළාතේ මන්ත්‍රීවරිය විදියට ගරු නගර සභා මන්ත්‍රි නිලානි මෙනවියටත් පැමිණ කියා තිබුණා. මටත් අද අද උදේ පාන්දරම කිව්වා. මානිම්මුල්ල පැත්තේ රට තමයි මේ ගහ ගොඩ කරනු ලබන්නේ. අපේ කෙනෙක්. ඔබතුමාත් දන්න. මේක මෙතැන ප්‍රසිද්ධියේ කියන්න කැමති නැහැ. රාත්‍රියට තමයි ගල් ගෙනියනවා කියන්නේ. රට ඇඳිරි නිතිය අස්සේ තමයි ගල් ගෙනවිත් දමන්නේ. දැන් අද මාත් ගරු නගර සභා මන්ත්‍රි නිලානි මෙනවියටත් , මටත් ගිහින් බලන්න වෙනවා. මා හිතන්නේ මාදම්පා ගමයි අම්බලන්ගොඩයි යා වෙන්න තව පොඩ්ඩයි තිබෙන්නේ. පොඩ්ඩයි තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කොතනද ඔය?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

නිවාස යෝජනා ක්‍රමයේ. නිවාස යෝජනා ක්‍රමය පිටුපස්සේ. මාදම්පේ පැත්තට තව අවුරුද්දක් විතර යන විට පයින් යන්න පුළුවන් වෙයි. වෙනදා අපි ඔරුවලනේ ගියේ. එමනිසා ගරු සභාපතිතුමනි, මෙයට මොකක් හරි පියවරක් ගන්න. ඔය සංගමයෙන් මොකක් හරි දෙයක් ඉල්ලා තිබෙනවා. අපි එකපාරට ඒ අය උපහාසයට ලක් කරන්නත් හොඳ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ. එකනිසා තමයි මා යෝජනා කරලා . අපි දෙපැත්තම දකින දෙයක් සිදු කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කොහොම නමුත් මේ අපේ අම්බලන්ගොඩ තිබෙන පරිසරය සුරකින්න. ස්භාවික සෞන්දර්ය සුරකින්න. මොකද මා ගරු උප සභාපතිතුමාට කියන්න ඕන. තවමත් මගේ වත්තේ අර කෙරවක්කෝ , සුටික්කෝ එනවා. තව මොනරු එනවා. ඌරෝ, ඉත්තෑවෝ එනවා. ඇවිත් යනවා. නැහැ දැන් ගරු උප සභාපතිතුමා කිව්වාට ඒ පැත්තේ නැති වුණාට අපේ පැත්තේ ඉන්නවා. එමනිසා ඒ ස්වාභාවික සෞන්දර්ය සුරකින්න කියා ඉල්ලමින් මෙන්න මේ ගොඩ කරන එකට මොකක් හරි පිලියමක් ගන්න. ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතා කිවු පරිදි දූව ප්‍රදේශයේ ගොඩ කිරිම සම්බන්ධව අපි පියවරක් ගත්තේ නැහැ කියා අපට ගමේ ජනතාවට හරියට දොස් කියනවා. ඒ අවස්ථාවේ එය සභාවට දැමූ විට ඔබතුමා කිව්වා එය නාගරික සංවර්ධන අධිකාරියෙන් කරන්නේ කියා. අපි එම ප්‍රශ්නයේදි එහෙම කිව්වාට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔය කියන අවස්ථාවේ අපේ ගරු ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමාටත් කියන්න ඔනේ. නීතිය ක්‍රියාත්මක කිරිමේ බලය තිබුණේ නාගරික සංවර්ධන අධිකාරිය සතුව. අපේ බලතල ඒ අය පවරාගෙන තිබුණේ. එතකොට ඒගොල්ලන් ඒ කාලයේ කටයුතු කළා. එක තමයි කැඩුවේ නැත්තේ. අපිට ක්‍රියාත්මක කරන්න බලයක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, දැන් පුළුවන්ද ? අපිට එකට බලයක් තිබෙනවාද? අපට පුළුවන්ද පියවරක් ගන්න. නැහැ අපිට සැලසුමක් දමන්න කියා අනුබෙදුමක් දමන්න කියා එහෙම කරන්න බැරිද? දඩයක් ගහන්න මොනවාහරි පුළුවන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

පුළුවන් . අපි බලන්නම්. අපි සභාවෙන් යැව්වා . දැන් මෙහෙම දෙයක් වෙනවා. නීතිය ක්‍රියාත්මක කරන්න කියා. ඇළක් ගොඩ කිරිම, ගහක් ගොඩ කිරිම වගේ දෙයක් නඩු පැවරිම සිදු කරන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසිනි.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඔබතුමාට පුළුවන් නම් මානිමුල්ල ප්‍රශ්නය ගැන අද ගිහින් බලන්න. නැතිනම් අපිට හරි කරදරයක් මේක. මා අදාළ තැන්වලට දැනුම් දුන්නා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඊ අදිනවා නම් අපිට එයට මොනවා හරි පියවරක් ගන්න පුළුවන්.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

නැහැ. ඔබතුමා ගිහින් බැලුවාම. දැනුත් තිබෙනවා ගල් දාලා. ඔහොමම බලන්න පුළුවන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඉල්ලිමක් තිබෙනවා. දැන් අර ඇළවල් හරන එක නැවතිලා තිබෙන්නේ පෝරඹ . එක ක්‍රියාත්මක කරන්න. ඒ වගේම පනියන්දුවේ තිබෙනවා ඇළවල් දෙකක්. හල්වතුරෙන් එන ඇළයි. සභාවෙන් තෙල් දිලා එම ඇළවල් දෙකම සුද්ද කර දෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමා , දැන් මෙහෙම ගැටළුවක් තිබෙනවා. සියළුම දෙනා දැන ගන්න. දැන් අපි සභාවෙන් තෙල් දිලා මේ කාරණය කරන්න කියා කිවුවාට අර වාරිමාර්ගයේ සිටින තාක්ෂණසේවා නිලධාරින් නම් කැමතියි. ඉහළ සිටින ඉංජිනේරු මහත්වරු මේ දෙයට කැමති නැහැ. ඒ අය කියන්නේ මෙය කොන්ත්‍රාත් මඟින්ම කළ යුතුයි කියා. ඒ වගේ ගැටළුවකට මුහුණ පා සිටිනවා. ඒ මහත්වරු කියනවා අපේ මට්ටමින් විසඳන්න බැහැ. මිට වැඩියේ කොන්ත්‍රාත් දෙන්න තමයි ඉල්ලන්නේ. බලන්නම් අපි සටන් කරලා මැෂින් ටික ගන්නම්. දැනට කියන්නේ මැෂින් ටික මාතර දිස්ත්‍රික්කයේ තිබෙනවා කියා.

ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මා පොඩි ඉල්ලීමක් කරනවා. අර පනියන්දුවේ කුලරත්න විද්‍යාලයට යන පොඩි මුත්තයියා ඇළ තිබෙන්නේ . එහි ගල් හිරවෙලා වතුර බහින්නේ නැතුව පොඩි තටාකයක් හැදුවා නේ . එම තටාකයට සම්බන්ධ කරලා තිබෙන පොඩි ඇළ ටිකක් සුද්ද කර දෙන්න.

**තීරණය -**

**වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව සිදුකරන මාදම්පවිල අභය භූමියේ සත්ව හා ශාක විනාශය පිළිබඳව සොයා බලන්න** යන මැයෙන් තෙත්බිම් උරුමය ආයතනයේ ලේකම් විසින් එවා ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කළ අතර, ලිපියේ සඳහන් කරුණු සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා එම ආයතනයට සාකච්ඡාවකට පැමිණෙන ලෙස දන්වා යැවීම සුදුසු බවට යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.08 අම්බලන්ගොඩ නගර සභා බල ප්‍ර දේශය තුළ රතන සූත්‍ර දේශනාව සිදු කරමින් පිරිත් පැන් ඉසීමේ කටයුතු සිදු කිරීම සඳහා පූර්ණ අනුග්‍රහය ලබාදෙන ලෙස ඉල්ලා පටබැඳිමුල්ල සිරිණිකේතාරාම මහා විහාරයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

පටබැඳිමුල්ල සිරණිකේතාරාම විහාරයේ විහාරාධිපති සෝභිත ස්වාමීන් වහන්සේ ලිපියක් එවා තිබෙනවා. ජංගම පිරිත් රථයක් සඳහා අනුග්‍රහය ලබා ගැනීම පිණිස. කොරෝනා වෛරසය හේතුවෙන් මුළු රටේම ජනතාව භීතියට පත්වී ඇති මෙම අවස්ථාවේ ඔවුන්ගේ බිය පහකිරීමට , අපට කළහැකි දෙයක් කිරීමට අදහස් කර ඇත. එබැවින් අම්බලන්ගොඩ නගර සභා බල ප්‍ර දේශය තුළ රතන සූත්‍ර දේශනාව සිදු කරමින් පිරිත් පැන් ඉසීම සඳහා සුදුසු මෝටර් රථයක් ලබා දෙමින් ඒ සඳහා පූර්ණ අනුග්‍රහය ලබා දීම නගර සභාව මගින් සිදු කරදෙන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා. මෙය ලබා දී තිබෙනවා. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

එය ලබා දෙන්න.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ රතන සූත්‍ර දේශනාව සිදු කරමින් පිරිත් පැන් ඉසීමේ කටයුතු සිදුකිරීම සඳහා පූර්ණ අනුග්‍රහය ලබාදෙන ලෙස ඉල්ලා පටබැඳිමුල්ල සිරිණිකේතාරාම මහා විහාරයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් එවා ඇති ලිපිය අනුව ඒ

සඳහා අනුග්‍රහය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.09 නුරාවි සංගීත ප්‍රසංගයේ විනෝද බදු මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ ගා/පී. ද .එස්. කුලරත්න විද්‍යාලයීය ගුරු සුභසාධක සංගමය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගෙඩ ගා / පී, ද. එස් . කුලරත්න විද්‍යාලයේ සුබ සාධක සංගමය. සුබ සාධක සංගමය 2020.02.23 දින පවත්වල ලද උක්ත ප්‍රසංගයෙන් ලද ආදායම පහත ගුරු සුබසාධක සංගමයේ කාර්යය සඳහා යොදවන බවත් එම මුදලට අදාල චෙක්පත සභාපති ගුරු සුබ සාධක සංගමය , ගා / පි . ද . එස්. කුලරත්න විද්‍යාලය ලෙස රේඛණය කර ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

1. පාසල් නිවාඩු කාලය තුළදි අමතර විෂය ප්‍රතිපෝෂණ ඉගැන්වීම් කටයුතු සඳහා පැමිණෙන ගුරු භවතුන්ට ප්‍රවාහන දිමනාවක් ගෙවීම.

2. ගුරු භවතුන්ගේ හෝ ඔහුගේ මව / පියා වැනි සමීපතම ඥාතියෙකුගේ අභාවයකදි මුල්‍ය ආධාර ලබාදීම.

3. ගුරු භවතෙකුගේ හෝ කලත්‍රයාගේ රෝගී අවස්ථාවල සිදු කරනු ලබන සැත්කම් ආදියෙහිදි ආධාර මුදල් ලබා දීම.

4. ගුරු භවතෙකුගේ දරුවෙකුගේ විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබීම් ශිෂ්‍යාත්ව , ක්‍රිඩා ආදි කටයුතු සඳහා විදේශ ගතවන අවස්ථා වල ආධාර ලබා දීම.

5. සෑම වර්ෂයකම අඩුවෙන්ම නිවාඩු ලබා ගනිමින් දරුවන්ට සේවය කරන ප්‍රාථමික අංශයේ ගුරු භවතුන් 05ක් සහ ද්විතියික අංශයේ ගුරු භවතුන් 05ක් වශයෙන් ගුරු භවතුන් 10 දෙනෙකු තෝරා ඔවුන්ට ත්‍යාග ලබා දි ඇගයිමකට ලක් කිරිම.

6. සෑම වර්ෂයකම විශ්‍රාම ලබන සහ ස්ථාන මාරු වී යන ගුරුභවතුන්ට වර්ෂ අවසානයේ ත්‍යාග සහ සිහිවටන ලබා දී ඔවුන්ගේ සේවාව ඇගයිමකට ලක් කිරිම.

යන කාරණා මත මෙම විනෝද බදු සඳහා ගෙවන ලද මුදල් වැය කරන බව සඳහන් කරනවා. එමනිසා එම මුදල නිදහස් කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

එය ලබා දෙන්න.

**තීරණය**

නුරාවි සංගීත ප්‍රසංගයේ විනෝද බදු මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ ගා/පි.ද.එස්.කුලරත්න විද්‍යාලයීය ගුරු සුහසාධක සංගමය විසින් එවා ඇති ලිපිය අනුව රු.312750/- ක මුදල ගෙවීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**03.10 නුරාවි සංගිත ප්‍රසංගයේ මුද්‍රා තැබු ඉතිරි ටිකට්පත්වල මුදල් ඉල්ලා අම්බලන්ගොඩ ගා / පි/ ද එස්. කුලරත්න විද්‍යාලයීය ගුරු සුබසාධක සංගමයේ ලේකම් හා භාණ්ඩාගාරිකගේ අත්සනින් යුතුව එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

නුරාවි සංගීත ප්‍රසංගයේ මුද්‍රා තබන ලස ප්‍රවේශ පත්‍ර නැවත භාර දීම. අම්බලන්ගෙඩ ගා / පි . ද. එස්. කුලරත්න විද්‍යාලයීය සුබ සාධක සංගමයට ආධාර පිණිස 2020.02.23 දින අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයිය රංග ශාලාවේදි පවත්වන ලද නුරාවි සංගිත ප්‍රසංගයේ අලවිය සඳහා මුද්‍රණය කරන ලද ප්‍ර වේශ පත්‍ර වලින් මුදා තැබු ප්‍රවේශ පත්‍ර අතරින් ප්‍රවේශ පත්‍ර ගොනුවක් අලවි නොවි ඉතිරිවන ලදී. මෙම ප්‍රවේශ සඳහා විනෝද බදු මුදල් නගර සභාවට ගෙවා ඇති හෙයින් එම මුදල් නිදහස් කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒ අනුව රු.289,000/= ක විනෝද බද්දක් ගෙවා ඇත. එම මුදල නැවත ගෙවීම සඳහා අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

එය ලබා දෙන්න.

**තීරණය**

නුරාවි සංගීත ප්‍රසංගයේ මුද්‍රා තැබූ ඉතිරි ටිකට්පත්වල මුදල් ඉල්ලා අම්බලන්ගොඩ ගා/පි.ද.එස්.කුලරත්න විද්‍යාලයීය ගුරු සුහසාධක සංගමයේ ලේකම් හා භාණ්ඩාගාරිකගේ අත්සනින් යුතුව එවා ඇති ලිපිය අනුව මුද්‍රා තැබූ ඉතිරි ටිකට්පත්වල මුදල් වන රු.72250/- ක මුදල ගෙවීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.11 2020.03.29 දින පැවැත්වීමට නියමිතව තිබු ප්‍රසංගය කෙරෝනා වසංගත හේතුවෙන් නොපැවැත්වු බැවින් ඒ සඳහා ගෙවන ලද මුදල් නැවත ඉල්ලා අහුංගල්ල , තොටවත්ත පාර පදිංචි ඩී.ආර්.එල් .කේ. ද සිල්වා මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ඩී.ආර්.එල් .කේ. ද සිල්වා. පැවැත්විමට තිබු ප්‍රසංගයක් කොරෝනා වසංගතය හේතුවෙන් නවත්වා දැම්මට දැනුම් දීම සහ ගෙවු මුදල් නැවත ලබා ගැනීම සඳහා. 2020.03.29 දින දූමාරේ ප්‍රසංගය පැවැත්විමට නියමිතව තිබු අතර හදිසියේ ඇති වූ කෙරෝනා වසංගතය

හේතුවෙන් මෙම ප්‍රසංගය අප සම්පූර්ණවම නවත්වා දැම්මට තීරණය කල තිබෙව බව අප කනගාටුවෙන් දන්වා සිටි. මේ සඳහා අප ටිකට් ඇප මුදල් සහ ප්‍රචාරණ ගාස්තුද ගෙවා තිබේ. අපට දැන්වීම් ප්‍රචාරණ සිදු කර ගැනීමටද නොහැකි විය. මෙම වසංගතය නිසා 2020.03.15 දින සිට සියලු කටයුතු අත්හිටවූ බව ඔබ අප සියල්ලෝම දන්නා කරුණකි. එමනිසා හැකි පමණින් අපහට ටිකට් සඳහා ගෙවූ ඇප මුදල් හා ප්‍රචාරණ ගාස්තු වශයෙන් ගෙවූ මුදල් ද නැවත ලබා දෙන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටි. මෙය පැවැත්වුයේ නැති නිසා එම ගෙවූ මුදල් නිදහස් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන්න.

**තීරණය**

2020.03.29 දින පැවැත්වීමට නියමිතව තිබූ ප්‍රසංගය කොරෝනා වසංගත හේතුවෙන් නොපැවැත්වූ බැවින් ඒ සඳහා ගෙවන ලද මුදල් නැවත ඉල්ලා අහුංගල්ල, තොටවත්ත පාර පදිංචි ඩී.කේ.එල්.කේ.එස්. ද සිල්වා මහතා විසින් එවා ඇති ලිපිය අනුව එම මුදල් ගෙවීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.12 අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර හා තාවකාලික දැන්වීම් පුවරු සවිකිරිම පිළිබඳව විෂය නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර හා තාවකාලික දැන්වීම් පුවරු සවිකිරිම පිළිබඳව දැනට කාර්යාලය තුළ මුදල් ගෙවා බිල්පතෙහි වෙන්කරන ලද අංකය පමණක් ඔවුන්ට ලබා දෙන අතර එම අංකය එම දැන්වීම් පුවරුවේ හෝ එම බැනරයේ ප්‍රදර්ශනය වන පරිදි සටහන් කරයි. නමුත් මෙම සටහන් කිරිම සාර්ථක නොවන අතර ප්‍රදර්ශනයට අවසර ලබා ගන්නා ප්‍රමාණයට වඩා ප්‍රමාණයක් ඔවුන්ද එසේ සටහන් කර ප්‍රදර්ශනය කිරිමට හැකි හෙයින් අම්බලන්ගොඩ නගර සභාවට අවේණිකවූ ලාංඡනයක් මේ සඳහා ලබා දීමට සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එක හොඳයි .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය අනුමතයි.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර හා තාවකාලික දැන්වීම් පුවරු සවිකිරීමේදී එම පුවරු අම්බලන්ගොඩ නගර සභාවේ බවට තහවුරු කරගත හැකි වන පරිදි ලාංඡනයක්

(ස්ටිකරයක්) බැනරයේ සවිකිරීමට ලබාදීම පිළිබඳව විෂය නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.13 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය මගින් ලබා දුන් එළවළු සඳහා රු.289,290/= ක මුදලක් ගෙවීමට සහ ඒ වෙනුවෙන් නගර සභාවට දැරිමට සිදු වූ රු.20600/= ක මුදල ගෙවීම සඳහා අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අලෙවිය සඳහා එළවළු තොග වල වටිනාකම රු.289,290/=. අලෙවි කරන ලද එළවළු වටිනාකම රු.294,593/=. දළ ලාභය රු.5293/= කි. විනාශ වූ තොග සඳහා පාඩුව රු.69861.55/= අලෙවිය වෙනුවෙන් නගර සභාවට දැරිමට වූ වියදම රු.20,600/=කි. ප්‍රචාරණ කටයුතු සඳහා රු.4500/=,බෙසම් 08 රු.760/=, ආහාර සඳහා රු.7800/=, බොල්පොයින් පෑන් වලට රු.1340/=, ෂොපින් කවර රු.6200/=. ඒ අනුව විකුණා තිබෙන්නේ මෙවායි. තක්කාලි කිලෝ ග්‍රැම් 818. වටිනාකම රු.550,080/=,ක් වශයෙන් විස්තර කර තිබෙනවා. ඒ අනුව සම්පූර්ණ එකතුව රු.289,290/=. ආර්.එම්.තුෂාර සම්පත් මහතා විසින් එළවළු බෙදා හැරිම සඳහා නොමිලේ ලොරි රථය ලබා දි තිබෙනවා. එම ලොරි රථයට ඉන්ධන සැපයීම වෙනුවෙන් ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා විසින් තමන්ගේ වියදමින් සිදු කර ඇත. මෙය සියළු දෙනාගේම දැන ගැනීම සඳහා දන්වා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා මෙයට අදහසක් යොමු කරන්න ඕන. මෙය හොඳ වැඩක්. මා එදත් කිවුවා. හැබැයි බොහොම කනගාටු වෙන වැඩකුත් ඔබතුමා අතින් කෙරුණා. මොකද මට අවස්ථාවක් නැහැ වෙන ඉතිං කතා කරන්න. මා මෙහෙම කතා කරන්නේ . ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා පසුගිය දිනවල රු.5000/= අයදුම් පත්‍ර වගයක් අරගෙන හොඳ වැඩ කරන ගමන් ඔබතුමන්ලා එම රු.5000/= අයදුම්පත් දේශපාලනිකරණය කර ගත්තා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා විරුද්ධයි එයට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා , විරුද්ධ ඇයි? මට අදහසක් දක්වන්න දෙන්න. නැහැ මට කතා කරන්න ඕනේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙයාට කතා කරන්න දෙන්න බැහැ. මේ කතා කරන්නේ එළවළු ගැන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මා අදහස් දැක්වුවාම . ඔබතුමා එයට උත්තර දෙන්නකෝ

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එහෙම නැහැ. දේශපාලනීකරණය කර ගත්තා කියා. එහෙම කියන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මා කතා කළාම උත්තරයක් දෙන්නකෝ. හා මට වෙනත් කරුණු යටතේ කතා කරන්න ඉඩ දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් . සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

එතුමියට කතා කරන්න ඉඩ දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වාඩිවෙන්න. දැන් මේ කරුණ යටතේ නෙමේ . මේ එළවළු සම්බන්ධව කතා කරන්නේ. වෙනත් කරුණු යටතේ ඔබතුමිය කතා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තටම විශේෂ සභාවක් තිබුණ දිනයේ තමයි මේ එළවළු ගෙනවිත් තැන්පත් කර තිබුණේ දේවානන්ද විද්‍යාලයේ. ඒ සම්බන්ධව ගොඩක් විශේෂයෙන්ම ස්තුති වන්ත වෙනවා රජයටත් ඔබතුමාටත් එයට උදවු කරන ලද ගරු මන්ත්‍රිවරු සියළු දෙනාටම. ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා මා දැක්කා ගොඩක් රෑ වන තුරු එතන වැඩ කර තිබුණා. මගේ ගේ ළඟත් එළවළු විකුණන කොටත් එතැන හිටියා. ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා හා ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා එළවළු අඩුවන විට වාහනයෙන් ගොස් එළවළු ගෙනවිත් දැම්මා. එය ජනතාවට ලොකු සේවයක්. ජනතාව එයට ප්‍රසාදය පළ කළා. මොකද අර ඇඳිරිනිතිය සමඟ ජනතාවට යන්න බැරි අවස්ථාවේ විකුණුවේ. පොඩි පොඩි අඩපාඩුකම් වුණාද දන්නේ නැහැ. මටනම් එහි අඩුපාඩුවක් දකින්නේ නැහැ. අපට රු.20600/= ක පාඩුවක් වුණාට මිනිසුන්ට දුන්නා වු මානසික සුවය සහ ඒ අවස්ථාවේදි මිනිසුන්ට ඒ අවශ්‍යතාවය ඉෂ්ඨවීම සම්බන්ධව අපි සංතෝෂ විය යුතුයි. ඒ එළවළු එවීම ගැන රජයටත් , එළවළු ගෙන්න බැහැ. යන කට්ටිය නිරෝධනය විය යුතුව තිබුණා. අනික අවුරුදු කාලය. 10 වෙනිදා 11 වෙනිදා . එම නිසා විශේෂයෙන් ස්තුති වන්ත වෙනවා. එකට සහභාගි වු සියළු දෙනාට ස්තුතිවන්ත වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ තින්දුව ගනු ලැබුවේ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයෙන් එළවළු හමුදාව මඟින් ලබා දීලා කෙලින්ම පළාත් පාලන ආයතන මඟින් මෙය බෙදන්න. එය ඉතාමත් හොඳ කාර්යයකි. අඩු මුදලකට ඒ මහජනතාවට හොඳ එළවළු ගැනීම සඳහා තිබුණු හොඳ අවස්ථාවක් උදා වුණා. නමුත් මෙතැන ප්‍රශ්න ගැටළුව වි තිබෙන්නේ කොට්ඨාශ කිහිපයකට මෙය ගියා . කොට්ඨාශ කිහිපයකට මෙය ගියේ නැහැ. මෙම යෝජනාව ඔබතුමා විශේෂයෙන්ම දැම්මාම කිවුවා අපි වාහන සභාවෙන් හරි අරගෙන ගරු මන්ත්‍රිවරු කිවුවා සමසේ බෙදියන විදියට වැඩය කරන්න කියා. එක තමයි මෙතැන මේ ගැටළුව තිබෙන්නේ. මගෙනුත් දුරකථන ඇමතුම් ලබා දී ඇහුවා. ඔබතුමා හොඳ කාර්ය භාර්යක් කළා. ඔබතුමා ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා අපි එය

අභය කරනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් අර බෙදීමේ ක්‍රමවේදයේ ගැටළු සහගත තත්ත්වයක් තිබෙනවා. මා හිතන්නේ පොල්වත්තට ගියේ නැහැ. ඕකන්දට ගියේ නැහැ. හෙප්පුමුල්ලට ගියේ නැහැ.කෙරමිණිය පින්නදූවට ගියේ නැහැ. එදා ක්ෂණිකව කළානම් එම වාහන ගැන ගරු මන්ත්‍රීවරු කිවුවානේ මේක. ගියානම් සභාවේ තින්දුව හොඳම කාර්යයක් වෙනවා. සමහර එළවළු නොගෙන හිටියා බලාගෙන. අපිත් කිවුවා. එළවළු එනවා . මෙහෙමයි කියා. බලාගෙන හිටියා. එළවළු ගන්න. සමහරු ඇවිත් අපට ඊට පසු දොස් කිවුවා. එවා ආවේත් නැහැ. අපිට ගන්න බැරි වුණා. ඇඳිරිනීතිය තත්ත්වය තුළ . එහෙම තමයි වුණේ. ඔබතුමලාගේ වැඩ සටහන ඉතාමත් හොඳයි. කවුරුවත් ගරු මන්ත්‍රීවරු කිසිම කෙනෙක් දොස් කියන්නේ නැහැ එකට. මිට පසු වැඩක් කරන විට සමසේ යන විදියට වැඩ පිළිවළක් සාදා කරන ලෙස තමයි අපි ඉල්ලා සිටින්නේ. මන්ත්‍රීවරු අපහසුතාවයට පත් වෙනවා. ඉදිරියට වැඩ පිළිවළක් ආවොත්. එක තමයි වෙන්න ඕන. මොකද හැම දෙයකටම විපක්ෂ මන්ත්‍රීවරු සහායෝගය දෙනවා. දෙනකොට ඔබතුමලාගේත් ඒ සහායෝගය දෙන්න ඕන. මොකද මේ කොරෝනා වසංගතය පක්ෂ පාට භේදයක් නැහැ. හැදුනොත් එහෙම ඔය තනතුරු, රජ්ජුරුවෝ කියලා වත් වැඩක් නැහැ. ඇමරිකාවට පෙන්නේ නැද්ද. ඒ වගේ තත්ත්වයන් තිබෙනවා. එමනිසා ඉල්ලා සිටිනවා සමසේ යන විදියට වැඩ පිළිවළක් සකස් කරන්න කියා. රු.20600/= ගරු මන්ත්‍රීවරු නොගෙවා ඉන්නේ නැහැ. මොකද මෙය යම් සේවයක් කරන්න මේවා කරපු නිසා. එක ගැටළුවක් නැහැ. හැබැයි අර වගේ තත්ත්වයන් ඇති කරන්න එපා කියා තමයි ඉල්ලා සිටින්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහි මා මතක් කරන්න ඕනේ. අම්බලන්ගොඩ නගර සභාව සතුව අපට වාහන තිබුණේ දෙකයි. එම දෙක අපි පාවිච්චි කළා. ඊට අමතරව මේ සත් ක්‍රියාව දැකලා ගරු නගර සභා මන්ත්‍රී ආර්. එම්. ලසන්ත මහතාගේ සොහොයුරා තමන්ගේ වාහනය නොමිලේ ලබා දුන්නා. ඇත්තටම වාහන තුනකින් ගියාම අපට සාමාන්‍යය වෙළෙන්දෙක් විකුණනවා වගේ විකුණන්න බැහැ. බිලක් නිකුත් කරන්න ඕනේ. ඊළඟට එය විගණනයට ලක් වෙන ආකාරයට කටයුතු කරන්න ඕනේ. එමනිසා මෙය සමහර ගම්වලට පැය දෙකකට ගියොත් එහෙම එකකට පැය හයක් යනවා වැඩයට. ඉතිං එක තමයි වුණේ. මෙතැනට පැමිණිච්ච සියළුම ගරු මන්ත්‍රීවරු ඒ උත්සාහය ගත්ත තමන්ගේ වැඩටික කොහොම කොහොම හරි කටයුතු කළා. මහන්සි වෙච්ච කට්ටිය කොහොම හරි කළා. එයට මහන්සි වෙච්ච සියළු දෙනාම. මේ එළවළු එනකොට වුණත් අපිට කිවුවේ එදා පාන්දර 4 5 වෙනකොට එළවළු එනවා කියා. නමුත් එළවළු ආවේ රාත්‍රී 12.00 ට විතර. රාත්‍රී 12.00 වනතුරුම හිමාල් මහතා ඇතුළු එම සේවක සංඛ්‍යාව සිටියා. එතකොට ගෙවල් වල සිට අපි රාත්‍රී 12.00 ට අපි ආවා. ඒ අවිල්ලා අපිට මේ එළවළු දමන තැන පිළිබඳ ප්‍රශ්නයක් වුණා. එහිදි අපි දේවානන්ද විදුහලේ විදුහල්පතිතුමා සමඟ සාකච්ඡා කරලා එම පාසැල අපි ඉල්ලා ගත්තා. අපි එතුමාට සභාව විශේෂව ස්තුති වන්ත විය යුතුයි. එමනිසා මා සභාවේ අනුමැතියකුත් ඉල්ලා සිටිනවා. අපිට කරපු උපකාරය මත දේවනන්ද විදුහලේ ඒ එළවළු තැන්පත් කරපු ශාලාව තීන්ත අලේප කරලා නව තත්ත්වයට පත් කරලා කැත කුණු එහෙම වැටිලා තිබෙනවා නම් එයත් සාදා එය ජීවානුහරණය කරලා පාවිච්යට සුදුසු ආකාරයෙන්. ඒ කියන්නේ උපරිම ආකාරයෙන් අපි කරලා තිබෙනවා. අලුත් දෙයක් බවට පත්කිරිමට සභවේ අනුමැතියත් ඉල්ලා සිටිනවා. මොකද මෙය අපි කළ යුතුයි. මොකද අපිට ඒ වේලාවේ පැමිණි ලොරිය මේ නගර සභාවේ කිසිම තැනක බාන්න තැනක් නැහැ. ඉතිං කවදාවත් අපිට එළවළු වෙළඳාම පිළිබඳ අත්දැකිමක් තිබ්බේ නැහැ. ඒ අනුව කටයුතු කළා. ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතාගේ උපදෙස් මත තමයි අපි මේ සියළු දේ

කරනු ලැබුවේ. නැතිනම් එතුමා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් නොසිටියා නම් අපට ඒ උපදේශය ලැබෙන්නේ නැහැ. එය අපි වැදගත් ලෙස සලකනවා. ඒ වගේම ස්වේච්ඡාවෙන් අපේ ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා , ගරු උප සභාපතිතුමා, ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා , ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා , ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා පැමිණ ඇත්ත වශයෙන්ම පැමිණ ඒ මහජනතාවට දෙන්න ඕන උපරිම ආකාරයෙන් එම කටයුත්ත කළා. අපට ලැබුණු එළවළු ප්‍රමාණය ප්‍රමාණවත් මදියි. මිට වැඩියේ ලොරි 10ක් පැමිණියත් විකුණන්න පුළුවන් තත්ත්වයට ආවා. අපට පෙනෙන්න තිබුණ දෙයක් තමයි මෙතෙක් කල් වෙළඳුන් විසින් කොපමණ ගසා කෑමක් කර තිබෙනවාද කියන එක අප ඇස් කනා පිටම අපට තේරුම් ගියා. එළවළු කිලෝ එකක මිල සමහර වේලාවට වෙළඳපොළොන් 250ක් ගන්න මුදලට තමයි අපි වික්කේ. දැන් ගෝවා මල් කිලෝ එකක් රු.800/=ක් වෙනවා. නමුත් අපි වික්කේ රු.100/=. ලොකු සහනයක් ජනතාවට සිද්ධ වුණා. ඇත්ත වශයෙන්ම. අපිට පොඩි මහන්සියක් සිදු කළා. අපි නිවෙස් වලට එන විට රාත්‍රී 2.00 විතර ඇති. නිවෙස්වලින් බැණුම් අහගෙන තමයි මේ කටයුතු සිදු කළේ. එහෙම තමයි ඒ වැඩ කටයුතු ටික සිදු කළේ. යම් යම් අඩුපාඩු සිද්ධ වුණා. ඒක නැති වුණේ අපට වාහන ප්‍රමාණවත් ලබා දිම් නැති වු නිසා තමයි සිද්ධ වුණේ. හැබැයි කළුවඩුමුල්ල අපේ ගරු මන්ත්‍රීතුමා ගෙදරට ගෙනහින් වික්කා. ඕකන්ද ප්‍රදේශයටත් එක්ක තමයි ගෙනගියේ. මොකද එක මන්ත්‍රී කොට්ඨාශයනේ. එමනිසා අඩුවක් නම් එතැන සිද්ධ වුණේ නැහැ. යම් අසාධාරණයක් කෙරමිණිය , පොල්වත්ත වගේ තැන් වලට සිද්ධ වුණා. යන්න හම්බ වුණේ නැහැ. එතකොට ඉවර වුණා. එමනිසා එයට ස්තූතිය පුද කිරිම සිදු කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා කනගාටුව ප්‍රකාශ කරනවා. මා ඇත්තටම ප්‍රමාද වෙලා පැමිණියේ අත්‍යවශ්‍ය කටයුත්තක් නිසා. මා හිතන්නේ සිංහල අවුරුද්දට පෙර 10 වෙනිදා හෝ 11 වෙනිදා තමයි මේ එළවළු ලැබිලා විශේෂ මහ සභාව දවසේ තමයි මේ එළවළු වෙළඳාම පටන් ගත්තේ. අපි කියන්න ඕනේ ඉන් සුවිශේෂී ක්‍රියාවක් ජනතාවට සිදු වුණා කියා. අවුරුද්දට දවසක් තිබේද්දි රු.60/= කට එළවළු කිලෝ එකක් හම්බ වෙයි කියන එක ඉතිහාසයේ ප්‍රථම වතාව. ඉතිහාසය පුරා අපි අරගෙන බැලුවොත් රු.100/=කට එළවළු කිලෝ එකක් හම්බ වෙනවාද කියන එක. අවුරුදු ගණනාවක් ගියත් ආපස්සට ඇද්දාත් අපට එහෙම හිතන්න අවකාශ නැහැ. එනතත් අපි ජනතාවට සේවයක් වෙලා තිබෙනවා. හැබැයි අපි ගරු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අදහසට ගරු කරන්න සිද්ධ වෙනවා.ඔවුන්ගේ අදහස් අනුව ජනතාවට සේවයක් වුණා වගේම අපහැදිලි කමක් මෙතැන තිබුණා. එයට අපි කාටවත් දොස් නගන්න බැහැ. ක්ෂණිකව වෙන දේවල්. මේ වගේ දේවල් ක්ෂණිකව වෙන දේවල්. නගර සභාවකට කරන්න පුළුවන් වීම ගැනත් අපි සංතෝෂ වෙනවා. අපි ගරු මන්ත්‍රීවරු විදියට හැමදෙනාටම මෙයට දායකත්වය ලබා දිලා සහභාගී වෙන්න බැරි වුණේ ඇත්තටම ශබ්ද විකාශන යන්ත්‍ර වල පහසුකම් මදිකම සහ වාහන වල පහසුකම් මදිකම නිසා. අපි දෙවැනි වටයේදි අපි ඒ අඩුපාඩුකම් හාදාගෙන වාහන සපයාගෙන ශබ්ද විකාශන යන්ත්‍ර සපයා ගෙන කරන්න හිටියේ. හැබැයි පලවෙනි වටයෙන්ම එළවළු ලබා දීම නතර කළ නිසා ඒක එතනින් ඉවර වුණා. එම කාර්යයේදි ගරු සභාපතිතුමා විශාල කැපකිරිමක් කළා. ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු නගර සභා මන්ත්‍රී ආර්. එම් ලසන්ත මහතා ඇතුළු අය ඒ කරපු සේවාවත් එක්ක අපි අමතක කරන්න නරකයි අපේ සේවකයනුත් හිමාල් මහතා ඇතුළු එම කණ්ඩායම විශාල සේවාවක් කළා. ඔවුන් දිවා රාත්‍රී නිදි මරාගෙන මේ කාර්ය කළා. එළවළු විකුණන්න සහභාගී වුණා. පොදු බස්නැවතුම්පොළේ දමා මේ එළවළු වික්කා. ඔවුන්ගේත් සාර්ථකත්වය නොතිබෙන්නට අපට මෙය සාර්ථක කර ගැනීමට හැකි වෙන්නේ නැහැ. ඒ අයටත් අපි මේ අවස්ථාවේ ගරු

මන්ත්‍රීවරු විදියට ස්තුතියක් පුද කරන්න කැමතියි. අවසානයේදි අපට මේ කටයුත්තෙදි සුළු හෝ පාඩුවක් වුණොත් ගරු සභාපතිතුමනි, ජනතාවට සේවයක් වුණා කියන එක අපි ප්‍රකාශ කරන්න කැමතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ගෙනඑනු ලැබූ එළවළු වලින් ගොඩක් ජනතාවට සේවයක් වුණා. එතකොට අම්බලන්ගොඩ එළවළු අධිකාරියක් ලෙස තමයි පැවතුනේ පොදු වෙළඳපොළ . කිලෝ එක රු 200/= රු.250/= ට වගේ ගියා සමහර අවස්ථාවල. මෙතැන උපරිම රු.100/= ට ගියේ ගෝවා මල් විතරයි. දැන් ඒ වගේම තවත් ජනතාවට සේවයක් වුණා. පාරිභොගිකයන්ට. දැනටත් තිබෙනවා පාර දෙපැත්තේ තියාගෙන ඉන්නවා. එළවළු සැහෙන්න දමා තිබෙනවා. ලාභායි. මෙය කිරිමේදි එක අතකින් පාරිභෝගික ජනතාවට සේවයක් වෙනවා. මා දැනගන්න කැමතියි මේ දිගින් දිගටම මේ පාරේ එළවළු වෙළඳාම සිද්ධ වෙනවාද කියන එක. මේක දැන ගන්න කැමතියි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නිත්‍යානුකුල නොවන ලෙස හැසිරෙන අය ඉවත් කරන්න ඕනේ. නමුත් මේ තිබෙන තත්ත්වය මත තොග ලැබිම කියන හරි ගැටළුවක් තිබෙනවා . ඒ කියන්නේ අප සියළු දෙනා ඉවත් කරනවා නම් ඒ කලින් කරන ලද තොග කරන අයගෙන් ප්‍රමාණවත් ප්‍රමාණයක් බඩු සැපයීම කර තිබෙන්න ඕන. සැපයුමක් නැතිව මේ අයින් කළොත් එහෙම එන මිනිසුන් සංඛ්‍යාවට එහෙම දෙන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සැපයුමේ අඩුවක් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සැපයුම අඩු නැති වුණාට ඊට වඩා සෙනඟක් එනවා මේ දවස්වල . අන්න එතනයි ප්‍රශ්නය තිබෙන්නේ. අපි එය අයින් කරනවා. ප්‍රමාණවත් කාලයකදි අපි අයින් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඕන තරමක් ඒ අයට ගෙන්වන්න පුළුවන්. බඩු ලොරි 10ක් ඕන කිවොත් එය ගෙන්වන්න ඕන ඒ ශක්තිය ඒ අයට තිබෙනවා. එක කිසි ප්‍රශ්නයක් නැහැ. මේ සිටින්නේ ඔක්කොම අනවසර වෙළඳුන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා දන්නවා. මේක පටන් ගන්න දිනවල එළවළු ගෙන්න මිනිහෙක් අම්බලන්ගොඩ හිටියේ නැහැ. අපි මුලින්ම එළවළු මුදලාලිට කතා කරලා සුරියවැව ගරු සභාපතිතුමාට කතා කළා. ඒ අය සම්බන්ධ කර මේ අයට පොලිසිය හරහා බලපත්‍ර හදා දිලා යවලා තමයි එළවළු ගෙන්වා ගත්තේ . එහෙම කළේ නැතිනම් එළවළු නැහැ කොහෙත්ම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සතියට දෙපාරක් එළවළු එන අය ඉන්නවා. අපට ඒ අය මුණ ගැහුනානම් කරගන්න තිබුණා. අපි ගණන් වලට එළවළු ගෙනත් දෙන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය කියන වෙළන්දෙක්ගෙන් මමත් අපේ නෝනා කිව්වා තක්කාලි ටිකක් ගන්න ඕන කියා. කිලෝ දෙකක් වගේ . දැන් අපි තක්කාලි වික්කේ රු.80/= යි. ඔය කියන ලොරි ගණන් ගෙන එන වෙළෙන්දාගෙන් ගත්තේ කිලෝ එක රු.300/= කි. එතකොට කිලෝ 2 ගත්තේ රු.600/= කි. අපි නගර සභාවෙන් වික්ක කිලෝදෙකක් ගත්තානම් රු.165/= මෙකෙදි එම වෙළඳුන් සාධාරණ විය යුතුයි. මේ කාලේ වෙළඳාම් කරන වෙළඳුන්ගෙන් මාගේ නිවසට හාල්මැස්සන් කිලෝ එක ගෙනාවම රු.1100/= කි. එතකොට සමුපකාරයේ රු.600/=. මටත් හම්බ වුණේ රු.500/= ක් වැඩියෙන් තමයි. එමනිසා විශාල ගැටළුවක ජනතාව ඉන්නවා. එක අපි තේරුම් ගන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, තව එකක් කියන්න ඕනේ. කොට්ඨාශවලට එළවළු ගියේ නැති එක ගැන. අර විශේෂ සභා රැස්වීම තබා අවසන් වි අපි එළියට බහින විට මේවා එළියට ගිහින් අවසන්. එකක් ගිහින් තිබුණේ පොලිසිය පැත්තට . අනිත් එක පටබැදිමුල්ල පැත්තට ගෙනහින් පොල්වත්ත පැත්තට ගියා. අපට ඊට පසුව තිබුණේ වරුවක් පමණයි. අපේ හිමාල් මහතා ඇතුළු සේවක මඩුල්ල නොනගතය වේලාවේත් වැඩ. ඇත්ත වශයෙන්ම ස්තුති වන්ත විය යුතුයි ඒ සියළු දෙනාටම. අපට එම කාර්ය කර ගැනීමට නොහැකි වුයේ කාල වේලාව මදි වු නිසා. ඒ වගේ ප්‍රශ්න තිබුණා. පොඩි පොඩි. ගරු නගර සභා මන්ත්‍රී ධර්මදාස මහතාගේ පැත්තට යන්න හම්බ වුණේ නැහැ. පොල්වත්ත පැත්තට ගියේ නැහැ. ඕකන්ද පැත්තට ගියේ නැහැ. පින්නදුවට ගියේ නැහැ. පුළුවන් විදියට අපි ඔක්කොම ආවරණය කර ගත්තා. නමුත් පොඩි පොඩි අඩුපාඩුකම් වුණා. අර කාල වේලාව මදි නිසා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට මේ ලොකු ව්‍යාපාරිකයන් ගැන අදහසක් කියන්න ඕනේ. ලොකු ව්‍යාපාරිකයන් ගැන කතා කරනවා වගේම පොඩි ව්‍යාපාරිකයන් ගැනත් අප කතා කළ යුතුයි. මොකද මේ අහිංසක මිනිසුන් කොරෝනා ප්‍රශ්නය නිසා ගෙවල් වල හිරවෙලා අසරණ වෙලා ඉන්නේ. ඒ අයට මෙහි මොනවා හරි විකුණා ජීවත්වෙන්න දෙන්න ඕනේ. පාර අවහිර නොකර එළවළු කොහේ වික්කත් කමක් නැහැ. නගර සභාවෙන් ඒවාට විරුද්ධත්වය ප්‍රකාශ කරන්න එපා. මොකද ඒ අය රු.1000/= ක් රු2000/= ක් හම්බ කරගෙන ගිහින් කන්න දෙන්නේ ඒ අයගේ ආදරණීය දරුවන් බිරිඳ තමයි පෝෂණය කරන්නේ. එහෙම නැතිනම් මංකොල්ල කයි. නැතිනම් හොරකම් කරයි. ගෙවල් වලට පනියි. ඒ පාර ජීවිතය විනාශ වන දේවල් වෙනවා. එමනිසා ඒ අයට හිරිහැර කරන්න එපා. ඒ අයට ව්‍යාපාරය කරන්න දෙන්න. මේ හේතුව නිසා. මේ අවස්ථාවේ. මේ අවස්ථාවේ කිසිම හිරිහැරයක් කරන්න එපා. ලොකු ව්‍යාපාරිකයා රකින්න කියා පොඩි ව්‍යාපාරිකයා නසන්න එපා. ගස්ලබු ගෙඩියක් ගෙනවිත් පාරේ විකුණුවත් කමක් නැහැ හම්බ කර ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , එළවළු වෙළදාම ගැන වැඩිපමණක් දේ කියනවා නෙමේ. අපේ ප්‍රදේශයටනම් මේ එළවළු ලොරිය ආවේ නැහැ. නමුත් අමනාපයක් නැහැ. මොකද මේ නගර සභාවේ තිබෙන අවම සම්පත් මත කළ කී දේ පමණටත් වඩා කළා කියා මා හිතනවා. ඒ වගේම දැනට මේ මහා මාර්ගයේ තබාගෙන විකුණන එළවළු ගැන කතා කරද්දි යම් පරිවාස කාලයකට අපි ඔවුන්ට අවසර දිය යුතුයි. නැතිනම් අපේ ගරු මන්ත්‍රීවරිය කියන විදියට අපේ ජනතාවට එළවළු මාපියාවට නතු වෙන්න සිද්ධ වෙනවා. එමනිසා ඒ අසරණ අය ගැනත් හිතා යම් කාලයක් තව දිර්ස කළ යුතු බවයි අපේ අදහස.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ ගරු නගර සභා මන්ත්‍රී ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය ප්‍රකාශ කළ පරිදි මේ වසංගත තත්ත්වය නිසා ජනතාවට හොරකම් කරන්න බැහැනේ. රැකියා අහිමි වෙච්ච නිසා මේ අවස්ථාව මේ කොරෝනා වසංගතය පවතින තෙක් ලබාදෙන ලෙස මාත් ගරු සභාවට යොමු කරනවා. ඒ වගේම මේ දඹුල්ල ආර්ථික මධ්‍යාස්ථානයෙන් මේ එළවළු ගෙනවිත් සුමාන ගණන් තියා ගන්න බැහැ. ඇත්තටම කෙටි කාලයයි තිබුණේ. මේ අපේ ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා ගොඩක් මහන්සි වුණා. මන්ත්‍රීවරු දෙන්නා තුන්දෙනාම. ඒ ගත්ත උත්සාහය ගැන අපි අවංකම සතුටු විය යුතුයි. මමත් සම්බන්ධ වුණා. මටත් තව ටිකකින් ලැජ්ජාවක් වෙනවා පැය දෙකකට හරි අරගෙන නොගියානම් මාගේ පෝරඹ කොට්ඨාශයට. මුළු නගර සභාවේ කොට්ඨාශ 13ටම ආරංචි වෙලා තිබුණා නගර සභාවෙන් එළවළු බෙදනවා කියා . ඇත්තටම අපේ ගරු මන්ත්‍රීවරු සඳහන් කරන පරිදි කොට්ඨාශ වල ජනතාව ඡන්දය දුන්නා. දැන් ඔබතුමාටම හොඳ නැහැ. වැඩය සාර්ථකයි. ඇත්තටම අපි අභය කළ යුතුයි. ඒ වුණාට නගරයේ ජීවත්වන පුරවැසියෝ විදියට ලොකු ගැටවවක් තිබෙනවා මොකද මේ කොට්ඨාශ තුන හතරකට විතරක් යන්නේ කියා. චෝදනා කරනවා නෙමේ ගරු ලසන්ත මන්ත්‍රීතුමා. තිබුණු කාලයයි , ලැබුණු එළවළු ප්‍රමාණයත් එක්ක. තවත් එකක් කොට්ඨාශයේ ගරු මන්ත්‍රීවරයා ඇත්තටම කාර්ය ශිල විය යුතුයි. යම්කිසි ත්‍රිරෝද රථයකින් හරි ගෙනගිහින් එළවළු ටික ගමට දෙන්න ඕන. මා පැය ගණනක් සිට ගරු ලසන්ත මන්ත්‍රීතුමාට කියලා ගියේ මට පෝරඹ කොට්ඨාශයට පැයකට දෙකකට හරි දෙන්න කියා. එතුමා එම අවස්ථාව ලබා දුන්නා. අතුරු පාරවල් වල ගියේ නැහැ. මගෙත් අතුරු පාරවල් වල ගියේ නැති චෝදනාව තිබෙනවා. පනියන පාරේ. අතුරු පාරවල්වල ආවේ නැහැ කියා. යන්න බැහැ. මිනිසුන් එක තේරුම් ගන්නේ නැහැ. අපි අභය කළ යුතුයි එළවළු විකිණීම සම්බන්ධව එතුමා ගත් උත්සාහය සම්බන්ධව . ඒ එතුමා දන්න විෂයක්. තව එකක් අපි විශේෂයෙන් ස්තුතිවන්ත විය යුතුයි දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා එම ස්ථානය ලබා දීම සම්බන්ධව. විශේෂයෙන්ම ඒ එළවළු දමා එම ස්ථානය අපිරිසිදු වෙලා තිබෙනවා නම් එය පිරිසිදු කර ලබා දිය යුතුයි. මා කෙලින් කතා කරනවා. ඉදිරියට අපේ ගරු මන්ත්‍රීවරු අපහසුතා නොවන විදියට මොන දේ කළත් නගර සභාවේ අපේ මන්ත්‍රීවරු සභාවක් විදියට අපේ සභාපතිතුමාට ගරු මන්ත්‍රීවරු සියළු දෙයට ඒ දායකත්වය ලබා දෙනවා. අදහස් ප්‍රකාශ කරනවා. එක හරි. යම් යම් අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. කොට්ඨාශවල

මන්ත්‍රීවරුන්ගේ ගෞරුත්වය තිබෙන විදියට ඒ වැඩටික කළ යුතුයි. මේ එළවළු ගෙන එම සම්බන්ධවම නෙමේ . ඉදිරියට කරන වැඩ කටයුතු සම්බන්ධව. අපට වුණත් මා නම් කොහොම හරි මහන්සිවෙලා ඒ වැඩටික කර ගන්නවා. කොට්ඨාශ මන්ත්‍රීවරයාගේත් උත්සාහය තිබිය යුතුයි. ත්‍රිවිල් එකක් අල්ලාගෙන ගිහින් හරි එළවළු ටික අඩුම ගණනේ දුප්පත් මිනිසුන්ට හරි ලබා දෙන්න. ඒ කැපවීම ගරු මන්ත්‍රීවරයාගේ තිබිය යුතුයි. ඒක අනිවාර්යෙන්ම කළ යුතුයි. අපි අඩුපාඩු හොයන එක හරි. අඩුපාඩු අපි හදාගත යුතුයි. ඒ වගේම මෙයට දායක වෙච්ච අපේ නිලධාරින් වැඩ පරිපාලක ඇතුළු සෞඛ්‍ය අංශයේ , කර්මාන්ත අංශයේ සියළුම නිලධාරින් හා සේවකයන් විශාල කැපකිරිමක් කළා. අන්තිමට නොනගතය තිබුණේ පස්වරු 1.00ට විතර. ඒ වනවිටත් අපි පෝරඹ කැල්ලේ එළවළු ටික බෙදනවා. ඒ ස්තුතිය පුද කරනවා ඒ සියළුම නිලධාරින් ඇතුව සේවකයන්ට.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, නගර සභාව කියන්නේ එළවළු විකුණන ආයතනයක් නෙමේ. නමුත් ඒ අවස්ථාවේ නගර සභාව ගත් අභිත පියවර අපි අගය කරනවා. ඊට එහා ගිය නගර සභා සේවකයන් ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා සහ සම්බන්ධ වූ අනිත් සියළු ගරු මන්ත්‍රීවරුන් මා අගය කරනවා. ඔවුන්ට ස්තුතිය පුද කරනවා. ඒ වගේම එළවළු ගැන ඊට වඩා මා කතා කරන්න යන්නේ නැහැ. හුඟ දෙනෙක් අදහස් ප්‍රකාශ කළ නිසා. දැන් මොහොතකට පෙර සිදු වූ සිදුවීම ගැන අපිට සභාපති කෙනෙක් සිටිනවා නේ අපේ ගරු මන්ත්‍රීවරියක් නොගැලපෙන දෙයක් ඒ කියන්නේ මාතෘකාවෙන් පිට කතා කරනවා නම් ඔබතුමා සිටිනවා අපිව හසුරුවන්න. ඔබතුමා කියන්න ඔයා වාඩිවෙන්න කියා. මා කිහිප වතාවක් වාඩි වුණා ඔබතුමා කිවුවාම. ඔබතුමා කිවුවාම මගේ අවස්ථාවේ මා කතා කළා. ඔබතුමා කියන්න ඔයා ඉන්න . මාතෘකාවෙන් පිට කතා කරන්නේ. ගරු මන්ත්‍රීවරයෙකුට බැහැ නැගිටලා අපිව නවත්වන්න. ගරු සභාපතිවරයෙක් ඉන්නේ අපිට එකට. එමනිසා කරුණාකරලා අපේ සභාව හැසිරවිමේදි ඔබතුමා ඔබතුමාගේ බලය පාවිච්චි කරන්න. ඔබතුමාට ඕන වේලාවක අප නිහඬ කරන්න පුළුවන්. අපි ගරු කරනවා ඔබතුමාට.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, උද්ගත වි ඇති තත්ත්වය හමුවේ අපේ පදික වේදිකා දෙපස එළවළු වෙළඳාම හා අනෙකුත් වෙළඳාම කරන්න අවසර දුන්නාත් මෙය නිත්‍යානුකූල නොවන බව අප සියළු දෙනාම දන්නවා. ඒ වගේම අපේ අම්බලන්ගොඩ නගරයේ වෙළඳුන් ගැන කතා කළහොත් ඒ ස්ථාවර ස්ථානයක වෙළඳාමක් කිරිමේදි රජයේ අනපණත් වලට අනුව ආයතන විස්සකට වඩා අවසර ගත යුතුයි. බදු ගෙවන ඒවා, සේවකයන් පිළිබඳව, කිරුම් මිනුම් ආදිය . ඒ එළවළු කඩයක් පවත්වා ගෙන යාමේදි ඔහු ආයතන විස්සකට වැඩියේ බැඳි සිටිනවා. මේ නිතිරිති වලට යටත්ව තමයි එළවළු වෙළඳාම කරන්නේ. ඒ සියළු දෙයින් අවසර අරගෙන. ගෙවිම් කරලා. ඒ පැත්තෙන් බැලුවාම අපි එළවළු වෙළෙන්දා ආරක්ෂා කර ගත යුතුව තිබෙනවා. හැබැයි ක්ෂණිකව ඕනැම තත්ත්වයක් අපිට බලාපොරෝත්තුවෙන් තමයි අපි ජීවත් වෙන්නේ . එකනිසා කඩේ පිලේ මිනිසුන් එළවළු ටිකක් ගෙනවිත් එළවළු වෙළඳාම කලාම මිනිසුන් අතේ තිබෙන මුදලින් ඒ ඒ තැන්වලින් එළවළු ටික ගෙන යනවා. එමනිසා අපට එකට සංතෝෂ වෙන්න පුළුවන්. විරුද්ධ වෙන්න බැහැ. හැබැයි මා වෙළඳපොළේ සිටින මනුස්සයා වශයෙන් මා දැකපු දේ උදාහරණ දෙක තුනක් දෙන්නම්. ඊයේ දිනයේ කාගිල්ස් ආයතනයේ අමුමිරිස් කිලෝ එක රු.160/= කි. තක්කාලි කිලෝ එක රු.60/=. එතකොට මාගේ කඩය

ඉස්සරහා ඉන්න වෙළෙන්දා ගෙනවා කිලෝ තුන තුන අමුමිරිස් බෑග් එකට. ගෙනවිත් පදික වේදිකාවේ දමනවා. කිලෝ එක රු.400/= ඒ කියන්නේ ග්‍රෑම් සියය රු.40/= . පොර කකා ගන්නේ. කඩයේ සියය රු.40/=. කාගිල්ස් එකේ කිලෝ එක රු.160/= . ඒ මනුස්සයා තුන් හතර වතාවක් ඒක කරනවා. මේ ඉතාම සරල උදාහරණයක් මා දුන්නේ. හැබැයි මා කතා කරන්න යන්නේ ඒ ගැන නෙමේ. රජයේ ප්‍රතිපත්තිය රජයට උවමනා වේලා තිබෙන්නේ ජනතාවට එකවර නගරයට එන එක වලක්වා ගන්න. එතකොට අපි කරන්නේ එම කුඩා වෙළඳපොළට ගමේ ජනතාව එකරාශි කරන එක. අපි ටිකක් දුරට කල්පනා කළහොත් අපිට මෙය සරල කර ගන්න ක්‍රමයක් තිබෙනවා. හල්වතුර ප්‍රදේශයට සියළුම එළවළු වෙළඳුන් ස්ථානගත කරන්න. එතකොට නගරයට එන පිරිස භාගයට භාගයක් අඩු වෙනවා. එතකොට නගරයෙන් එළවළු ගන්න කෙනා කාගිල්ස් ආයතනයෙන් හරි ඒ අදාළ ආයතනයෙන් ගනිවි. හැබැයි එදා වේල හම්බ කර ගන්න ඉන්න මනුස්සයා කියක් හරි අඩුවෙන් ගන්න ඉන්න කෙනා අතනට යාවි. ඒ හා සමානව අපේ ආදායම් පරික්ෂකවරු මහත්වරු මෙතැනට පැමිණ තිබෙනවාද? මා ඉල්ලා සිටිනවා මේ සියළුම වෙළඳුන් මිල පෙන්නුම් කළ යුතුයි. මා දන්නේ නැහැ එය අයිති පාරිභෝගික සේවා අධිකාරියට තමයි. නගර සභාවට එයට මැදිහත් වීමේ ක්‍රමවේදයක් තිබෙනවාද කියන එක එල්ලේ මා දන්නේ නැහැ. හැබැයි එය විය යුතුයි. නැතිනම් මේ අනවසර වෙළඳාමට කොහොමත් දෙන්න එපා . මොකද මේ දෙවැනි උදාහරණය මා දෙන්නේ කැගහලා විකුණනවා මාලු මිරිස් ග්‍රෑම් 500 රු.60/= , එතකොට කිලෝ එක රු.120/= කි. අනිත් සෑම එළවළුක්ම රු.200 ට වැඩියි. අරක කැගහලා ගෙන්නා ගන්නවා. මෙතැන කඩයක් තිබෙනවා. පිපිඤ්ඤා රු.60/= , ලීක්ස් රු.350/= , කාගිල්ස් එකේ රු.220/=. එතකොට ගරු සභාපතිතුමනි , මේ ජනතාව තමයි ගසා ගෙන කන්නේ. කවුරු කොහොම කළත් මිළ ප්‍රදර්ශනය කිරිම කරවන්න. එතකොට පුළුවන් අපට ජනතාවට අවංක වු සේවයක් ලබා දෙන්න. එතකොට ඔය එළවළු දෙනා සියළු දෙනා එළවළු වෙළඳාම කරන්නෙත් නැහැ. එතකොට ඒ තරහයේදි ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා සාක්කි දරයි. හැමෝම රු.100/= න් පහළට දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ මිලට වඩා රු.30/=ට 40/= මිලට එළවළු විකුණයි. ඔබතුමා හොඳටම දන්නවා පළතුරු ජානක මහතා එළවළු ගෙනවිත් වික්කේ කොහොමද කියා. එතකොට ඒ හා සමාන ස්ථානයක් අපට හල්වතුර ප්‍රදේශයේ හෝ ඒ ඇතුළට හෝ අපට යම් මට්ටමකට තාවකාලිකව ස්ථාන ගත කරලා අර නගරයේ තදබදයත් බේරා ගෙන ජනතාවට යම් කාර්ය භාර්යයක් කරන්න පුළුවනි. ඔබතුමා කල්පනා කරලා හොඳ තින්දුවක් ගන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, හල්වතුරේ දමන්න කිවුවාට ගරු සරත් මන්ත්‍රීතුමා මෙය ලියාපදිංචි වෙයිද දන්නේ නැහැ. අන්තිමට මෙය පොළක් බවට පත්වෙයිද දන්නේ නැහැ. ඔය ඔක්කොම පදික වේදිකා වල බඩු දමා තිබෙන්නේ පොළවල් වල යන මිනිසුන්. ඒ මිනිසුන් සමහර අය මීටියාගොඩ, සමහරු මාදම්පේ. පොළට යන්නේ නැහැ. මෙතැන දමා ගන්නවා. වැඩි ගණනට විකුණන්න ඕන නිසා. පොළට ගියොත් තරහයක් වැඩියිනේ එතැන. හැමෝම විකුණන නිසා අඩුවෙන් විකුණන්න වෙන්නේ. එකම ගණනට විකුණන්න වෙන්නේ. දැන් මෙතැන එහෙම නෙමේනේ. මෙතැන විකුණනවා එක එක ගණන් වලට බඩු . හිතුන හිතුන ගණන් වලට. මා දැක්කා. හිරේවත්තේ ගරු මන්ත්‍රී සෝභිත මහතාගේ හිරේවත්තේ. මා හිතන්නේ එම එළවළු ගෝනි ගණනට ගෙන්න ඇත්තේ. ගෝනිය රු.100/= ට රු.200/= හලලා මාළු මිරිස් පාට වැටිලා. තෝරලා අහුල අහුලා ගත්තේ මිනිසුන්. ග්‍රෑම් 500 රු.40ට අරේ මෙහේ. මා දැක්කා

ගෝනි 20ක් විතර. ඒවා මේ කෑමටවත් සුදුසු එවා නෙමේ. ඒවා කොළඹ පොදු වෙළඳ සැලෙන් ගෝනි ගණනට ගෙනාවේ. හලලා තමයි වික්කේ. ඒවා තමයි සුපින්. ඒවා ගෙනවිත් තමයි වික්කේ. මිනිසුන් තෝරා තෝරා ගත්තා. කිලෝ එක රු.40/= වෙනකොට මිනිසුන් ගන්නවා. ඒවත් පොඩ්ඩක් බලන්න. මේවා මෙතැන හලලා රෝගයක් බෝ වුණොත් එහෙම ඊට වඩා කරදරයක් වෙනවා. ගරු සභාපතිතුමා හල්වතුරේ දැම්මාට කමක් නැහැ. අම්බලන්ගොඩ මිනිසුන් නම්. මේ පොළවල් වල යන මිනිසුන් දැම්මාම මෙය පොළක් බවට පත්වෙයි. ඊට පස්සේ අස් කරන්න වෙන්නේ නැහැ. ඒ ගැනත් පොඩ්ඩක් අවධානය යොමු කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ කියන කතාව බැලුවාම මුලික වශයෙන් බැලුවාම සෞඛ්‍ය ආරක්ෂිතව බැලුවාම සෞඛ්‍ය ගැන මුලිකව බලන්න ඕන. ඕන කෙනෙකු ඇවිත් විකුණයි. එදා මා දුටුවා පෝරඹ හංදියේ එළවළු විකුණලා හෙන ගොඩක් ජාරාව එහෙමම දමා ගිහින් තිබෙනවා. අයිනකට ඔහේ දමා තිබෙනවා. අතුගාන්නේත් නැහැ. ඊට පස්සේ ගමේ ජනතාව බනිනවා නගර සභාවටත් . අර සේවකයන්ට කරන්න දෙයක් නැහැ ඒ තත්ත්වය තුළ. අනිත් එක දැන් නිතිරිති මාලාවක් දි තිබෙනවානේ රජයෙන්. ඒ හැම තැනම දැම්මාම

- **පෙරවරු 11.42 ට පමණ ගරු සභාපතිතුමා සභාවෙන් නික්ම ගිය අතර ගරු උප සභාපතිතුමා සභාවේ මුලාසනය හෙබ විය.**

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

දැන් නගරයේ තත්ත්වයක් පෙනෙන්නේ නගරයේ ජනතාවට. ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා ඔය නගරයේ නිතරම ගැවසෙනවා. ඔය වෙළඳාම සම්බන්ධයි. ඔහොම කිවුවාට . ඔය සංචාරක වෙළඳුන් ඇවිත් විකුණනවා. මා දැක්කා කැරට් කිලෝ එක රු.520/=ටත් විකුණනවා. හිතු හිතු ගණන් වලට. දැන් ඔයාගේ මුහුණ දැක්කාම එක ගණනක්. ලික්ස් එකේ එක ගණනක්. ඒ විදියට තමයි යන්නේ. එහෙම යන් බැහැ. අනිත් එක තමයි අපේ සෞඛ්‍ය ආරක්ෂිතව බඩු විකුණන්න ඕන. අපේ මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා ගන්න ඕන තීරණ ගන්නවා අප දැක තිබෙනවා. එතුමාට ස්තුති වන්ත වෙනවා. අනිත් එක බිත්තර විකුණන්න ගියත් එහෙමයි. පිටින් එය මිනිහාට මෙය කියට වික්කත් ප්‍රශ්නයක් නැහැ. ගත්තා ගියා. පැමිණිල්ලක් දෙන්න විදියක් නැහැ. කඩයක් එහෙම නෙමේ. ගරු සරත් මන්ත්‍රීතුමා කිවු පරිදි එතැන ස්ථාපිත වෙලා තිබෙනවා. මොනවා හරි ප්‍රශ්නයක් ගැටළුවක් ආවොත් අල්ලා ගන්න පුළුවන්. මොකද නගර සභාව දන්නේ නැහැනේ. සංචාරක වෙළඳුන් පැමිණ හැම තැනම දමනවා. දැන් අපි හිතන්න ඔතැන කොරෝනා වෛරස් තත්ත්වයක් ඇති වුණා. කොහොමද හොයන්නේ. බුද්ධි අංශ නෙමේ මොනවා තිබ්බත් හොයන්න බැහැ. මොකද නිලධාරින්ට කරන්න දෙයකුත් නැහැ. එකනිසා මෙය පාලනයක් වෙන්න ඕන. පාලනයක් වෙන්න ඕන කියන්නේ මනුස්සයන්ට මේ වෙළඳාම එපා කියනවා නෙමේ. නගරයේ යම් නිතිරිති මාලාවක් තිබෙනවා. දැන් නිතරම කියනවානේ නිරෝධානය වෙන්න කියා. දැන් බොහොම බලගතු තත්ත්වයක් තිබෙන්නේ. අපිත් වගකිව යුතු නගරයේ පරිපාලන ආයතන වශයෙන් මේ ගරු මන්ත්‍රීතුමන්ලා කියන අදහස් අරගෙන සාධාරණ විදියට හැම දේම නීති රාමුවක් තුළ කටයුතු කරන්න කියන තමයි ඉල්ලා සිටින්නේ. මොකද පාරිභෝගිකයන්ට සාධාරණයක් වන විදියට කරන්න. සමහර විට අම්බලන්ගොඩ ගණන ඇහුවාම මාළු හෝ ඔය කොයි දේ වුණත් පිට ගියාම  අඩුවෙන් තිබෙන අවස්ථා තිබෙනවා. එතකොට කියන්නේ අන්න අම්බලන්ගොඩ මෙහෙමනේ විකුණන්නේ. පළාත් පාලන ආයතන මේවා ගැන බලන්නේ නැහැ. එතකොට මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරු නිලධාරින්ටත් දොස් කියනවා. ඒක නිසා එය අවම කර ගන්න. හැබැයි ඔබතුමා හිටියා නම් මෙය පාලනය වෙනවා කියා අපි දන්නවා එක. මේක මේ

පළාත් සභා ඔලුවේ තියාගෙන කරන්න බැහැනේ මේ වැඩය. එමනිසා ඔබතුමා මෙය බලා ඔබතුමා හරි මෙයට මැදිහත්වෙලා මෙය කරන්න. මන්ත්‍රීවරුන්ගේත් අදහස් අරගෙන සාධාරණ විදියට සෞඛ්‍ය ආරක්ෂිත විදියට කරන්න. මොකද මෙහි ප්‍රධානම තැන වෙන්නේ සෞඛ්‍ය . මේ ඇදිරිනීතිය දමන්නෙත් එකටනේ. අපි මේ හැම දේම දාන තැන ගන්න නෙමේ ගිහිල්ලා. අනිත් එක අපේ ගරු සභාපතිතුමාගේ දුර්වලතාවයක් තමයි ඇහුම්කන් දීමක් නැහැ. තමන්ගේ ගරු මන්ත්‍රීවරයා කියන දෙය ඇහුම්කන් දීමක් නැහැ. එක තමයි තිබෙන දුර්වලතාවය. පෞද්ගලිකවම නැහැ. අපි ව්‍යාපාරිකයෝ. එක වෙනම කතාන්දරයක්. නමුත් මෙය යම් ක්‍රමවේදයකට යන්න ඕන. සැලසුමක් තිබෙන්න ඕන. ඔබතුමා හරි මෙයට මැදිහත් වෙන්න. ඔබතුමා සාමාන්‍යයෙන් වැඩක් කරන කොට හරියට බලා කරනවා කියා අපි දන්නවා. ගරු සභාපතිතුමා එච්චර ගණන් ගන්නේ නැහැ. මොකද ඉන්නවා. යන්න බලාගෙනනේ ඉන්නේ. ඒක නිසා. එමනිසා මෙය කරන්න ක්‍රමයකට. ක්‍රමයකට කරන්න ඉන්න මනුස්සයකු ඉන්නේ ඔබතුමා. අපේ තව ඉන්නවා තව කට්ටිය. පෝලිමේ ඉන්නවා. ඒ අයට බලයක් නැති වුනාට කරන්න දෙයක් නැහැ. තමුන්නාසේලාගේ මන්ත්‍රීවරු හරි කියන දෙය අසා එතුමන්ලා හොඳ අදහස් දෙන්නේ. ඒවාට ඇහුම්කන් දීලා ක්‍රමවේදයකට අදාලව වැඩය කරන්න කියා ඉල්ලා සිටිනවා.

- **පෙරවරු 11.50 ට පමණ නැවත ගරු සභාපතිතුමා සභාවට පැමිණියහ.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එහෙනම් අපි මෙය අනුමත කරන අතර දේවානන්ද විදුහලේ ශාලාවත් තීන්ත ගාලා දීලා ඒ අවශ්‍ය කටයුතු සිදු කර දෙන්න.

**තීරණය**

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය මගින් ලබාදුන් එළවළු සඳහා රු.289290/- ක මුදලක් ගෙවීමට සහ ඒ වෙනුවෙන් නගර සභාවට දැරීමට සිදු වූ රු.20600/- ක වියදම ගෙවීම සඳහා අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.14 2020 පෙර පාසැල් මුද්‍රිත ග්‍රන්ථ ලබාදිම සඳහා වන ඉතිරි මුදල් සිහිනි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් ආයතනයට රු.210000/= ක් ගෙවීම සඳහා සාධාරණීකර වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

පෙර පාසැල් මුද්‍රිත කට්ටල සැපයිම සඳහා ගෙවීම් කිරිම. 2020 වර්ෂයේ පෙර පාසැල් දරුවන් සඳහා මුද්‍රිත පොත් කට්ටල ලබා දීම සඳහා 2019.11.11 දිනැතිව මා විසින් පහත පරිදි පොත් 800 ක් ඒ ඒ වර්ගවලින් ලබාදෙන ලෙස ඉල්ලීම් කොට ඇත.එහි තිබෙනවා පෙර ලිවිමේ හුරුව ගණිත සංකල්ප අනුව වර්ග කිරිම 100 ඒවා දෙකක්, භාෂා හැකියාව 100 ඒවා දෙකක්. පොඩි පංතියට හා ලොකු පංතියට English Class කියන ඒවාට ලොකු පංතියට හා පොඩි පංතියට 100 ඒවා එකක්. මේ සඳහා 2019.10.03 දිනැතිව අංක 10.03 සහා තීරණය යටතේ රු.240,000/= ක් වියදම් කිරිම සඳහා අනුමැතිය ලැබී ඇත. එමෙන්ම එම මුදල සඳහා ගරු

ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියද ලැබී ඇත. 2019.11.25 දිනැති ටෙන්ඩර් කමිටු තීරණ පරිදි ඉහත සඳහන් පොත් 7ම ඇතුළත් කට්ටලයක් සඳහා රු.2250/= බැගින් වන පරිදි මිළදි ගැනිමට තීරණය වි ඇත. එක් ළමයෙකු සඳහා ලබා දෙන්නේ ග්‍රන්ථ 4ක් බැගින් වන අතර ග්‍රන්ථ 7ක් ඇතුළත් කට්ටලයක් මිලදි ගැනීමට තීරණය විම අවශ්‍යතාවයට වඩා මිලදි ගැනිමට හේතු වේ. ඒ අනුව 2020.01.22 දරණ අම්බලන්ගොඩ නගර සභාවේ අංක 2355 ඇණවුම පරිදි පොත් 7ක් සහිත පොත් කට්ටල 200ක් රු.2250/= බැගින් රු.450000/= ක් වටිනාකමින් යුක්තව සපයන ලෙස ඇණවුම් කර ඇත. ඉහත ඇණවුම් කර ඇති පොත් 400 ක ප්‍රමාණයෙන් පෙර පාසැල් දරුවන් සඳහා ලබා දීමට ඉල්ලීම් කර ඇති පොත් ප්‍රමාණයට වඩා 600 ක අතිරික්තයක් පවතී. ඒ අනුව ඉහත පරිදි 1-7 දක්වා ඇති පොත් කට්ටල 200 ගබඩාවට 2020.01.22 දින අංක 901 දරණ රිසිවින් නෝට් මඟින් ලැබි ඇති බව සනාථ කරයි. ඒ අනුව මේ ග්‍රන්ථ 1400 සඳහා 2020.03.03 දරණ බිල්පත මඟින් රු.450,000/= ක් ගෙවිම් කරන ලෙස සිඟිති ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් ආයතනය විසින් ඉල්ලීම් කරයි. ඉහත බිල්පතට අදාල ගෙවිම් කිරිම වශයෙන් ඉල්ලීම් කර ඇති පරිදි ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලැබි ඇති රු.240,000/= ක මුදලට 2020.03.13 දින ගෙවිම් කර ඇත. අම්බලන්ගොඩ නගර සභාව වෙත ග්‍රන්ථ 600ක් වැඩිපුර ලැබි ඇති අතර එම ග්‍රන්ථ 2021 වර්ෂයේ නගර සභා පෙර පාසැල් දරුවන් වෙනුවෙන් අධ්‍යාපන කටයුතු සඳහා ලබා දීමේ හැකියාව පවති. මෙම ග්‍රන්ථ සඳහා වන වියදම් දැරිම පෙර පාසැල් අධ්‍යාන කටයුතු වෙනුවෙන් ඉදිරි වර්ෂයේ භාවිතා කළ හැකි බැවින් මෙම ග්‍රන්ථ සඳහා ගෙවීම් කිරිම සුදුසු කියා එම ග්‍රන්ථ සැපයිමේ ඉතිරි මුදල වන රු.210,000/= ක  මුදල අදාළ පාර්ශවයට ගෙවිම් කිරිම සඳහා නිසි අනුමැතිය පතනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

දැන් මෙහි බඩු අරගෙන තිබෙන්නේ. ඒවා ගෙවන් එපැයි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , බඩු අරගත්තානම් එය ගෙවන්න එපැයි. අවුරුද්දක ඒවා අවුරුදු දෙකකට අරගෙන. එයට එම පුද්ගලයා වැරදි නැහැ. එම පුද්ගලයා ව්‍යාපාරයක් කරන නිසා එය ගෙවන්න . මේ වනවිටත් මාස ගාණක් ගතවෙලා තිබෙන්නේ. එමනිසා එම ගෙවීම කරන්න. ඒ අය අමාරුවෙන් ව්‍යාපාර කරගෙන යන මිනිසුන්. එමනිසා එම ගෙවීම කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මේක ගෙවන්න . මෙය යවන විට අනුමැතිය එන විදියට හරියට හදා යවන්න. මොකද හේතුව එහි අඩුපාඩු තිබිලා . ලේකම්තුමිය ඔය නිලධාරින්ට උපදෙස් දෙන්න. අපිටත් එක තමයි තිබෙන ගැටළුව. ඔය යම් යම් දේවල් අඩුයි. යම් ක්‍රමවේදයක් නැහැ. සමහර ඒවාගේ ලිඛිතව දෙන්න එපායි. මේක මේවා කියා. දැන් කට වචනයට දුරකථනයෙන් කියනවා. යම් ක්‍රමවේදයකට යන්න. නැතිනම් ඒ මහත්මයාත් අමාරුවේ වැටෙනවා. ඒ මහත්වරුත් සමහර වේලාවට ණයට අරගෙන ඔය මේවා කරන්නේ. මේක තුළ ප්‍රශ්නයක් නැහැ. ඒය ගිහින් අදාළ අනුමැතිය අරගෙන ගෙවිම් කරන්න කටයුතු කරන්න. හැබැයි අර නිලධාරින්ටත් උපදෙස් දෙන්න වැඩක් හරියට කරන්න කියා. ඒ අයගේ අඩුපාඩු නිසා මේ සභාවත් අපහසුතාවයට පත්වෙනවා. ගරු සභාපතිතුමාත් අපහසුතාවයට පත්වෙනවා. ගරු මන්ත්‍රිවරුත් අපහසුතාවයට පත්වෙනවා. ඒ මුදල් ගෙවන්න ගියාම.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

හරි ගෙවන්න තින්දු කරනවා.

**තීරණය**

2020 පෙර පාසැල් මුද්‍රිත ග්‍රන්ථ ලබාදීම සඳහා වන ඉතිරි මුදල් සිහිනි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් ආයතනයට රු.210000/- ක් ගෙවීම සඳහා ඉදිරිපත් කර ඇති සාධාරණීකරණ වාර්තාව අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමෙන් පසු එම මුදල ගෙවීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.15 2020 පෙබරවාරි හා මාර්තු මාසවල නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තා සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020 පෙබරවාරි හා මාර්තු මාසවල නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව මාර්තු මාසයේ විවෘතව තැබූ දින ගණන 11 ½ , රෝගීන් සංඛාව 313, වැයවූ මුදල රු.28,033.14 පෙබරවාරි මාසයේ විවෘතව තැබූ දින ගණන 18 ½ , රෝගීන් සංඛාව 503, වැයවූ මුදල රු.46,159.17 කි . මෙය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**තීරණය -**

2020 පෙබරවාරි හා මාර්තු යන මාසවල නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තා ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් ගරු සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.16 ශරීර උෂ්ණත්ව මැණිම සඳහා Infrared Themometer ලබා ගැනීම යන මැයෙන් අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි. උෂ්ණත්ව මැනිම සඳහා ලබා ගැනීම. දැනට කොරෝනා වසංගතය හේතුවෙන් එහි පාලන කටයුතු කිරිම සඳහා අවශ්‍ය කරන ඒ උෂ්ණත්ව මානක 05ක් අම්බලන්ගොඩ නගර සිමාව තුළ රාජකාරි කටයුතු කරන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි , යසවර්ධන මහතා අම්බලන්ගොඩ නගර සභාව , හන්සික නදිල් මහතා අම්බලන්ගොඩ උතුර, අබේවර්ධන මහතා අම්බලන්ගොඩ දකුණ යන අයට ලබා දෙන්න කියා 05ක් ඉල්ලා සිටිනවා. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සීමාව තුළ රාජකාරි කටයුතු සිදුකරන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී , අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, නගර සභා මහජන සෞඛ්‍ය පරීක්ෂක යසවර්ධන මහතා, අම්බලන්ගොඩ උතුර මහජන සෞඛ්‍ය පරීක්ෂක හන්සක නදීල් මහතාට සහ අම්බලන්ගොඩ දකුණ මහජන සෞඛ්‍ය පරීක්ෂක අබේසිරිවර්ධන මහතාට ලබාදීම සඳහා ශරීර උෂ්ණත්ව

මැණීමේ Infrared Thermometer 05 ක් ඉල්ලා අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් එවා ඇති ලිපිය අනුව උෂ්ණත්වමාන 05 ක් ලබාගැනීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

04. යථා පරිදි කල් දි ප්‍රශ්න නැත

05. යථා පරිදි කල් දී යෝජනා

**05.01** **ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

**05.01.01** **තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත අනුව පත්කරන ලද තොරතුරු නිලධාරින් මේ වන විට ස්ථාන මාරුවි ගොස් ඇති බැවින් නව තොරතුරු නිලධාරියෙකු පත් කිරිම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

පණත අනුව මේ වන විට පත්කරන ලද නිලධාරි මේ වන විට ස්ථාන මාරු ලබා ඇති අතර නව තොරතුරු නිලධාරියෙකු පත්කර ගැනිම සුදුසු බවට යෝජනා කරනවා. මේ සඳහා පරිපාලන නිලධාරි යූ.ආර්.ගුණවර්ධන මහත්මිය පත්කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය -**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත අනුව පත්කරන ලද තොරතුරු නිලධාරීන් මේ වන විට ස්ථාන මාරුවී ගොස් ඇති බැවින් නව තොරතුරු නිලධාරී ලෙස පරිපාලන නිලධාරී ආර්.යූ.ඩබ්.ගුණවර්ධන මහත්මිය පත් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.02** **අම්බලන්ගොඩ බස් නැවතුම්පල පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ බස් නැවතුම්පල පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.03 අම්බලන්ගොඩ නගර සභා වාහන නැවතුම් අංගනය ඉදිකිරීමට හල්වතුර නගර සභා ඉඩම වටා තාප්පය ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභා වාහන නැවතුම් අංගනය ඉදිකිරීමට හල්වතුර නගර සභා ඉඩම වටා තාප්පය ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.04 අම්බලන්ගොඩ නගර සභාවේ දැනට පවතින වාහන අංගනයේ බිම් මහල අලුතින් ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාවේ දැනට පවතින වාහන අංගනයේ බිම් මහල අලුතින් ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.05 අම්බලන්ගොඩ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගේ ඉල්ලීම මත හල්වතුර කසළ අංගනයේ කසළ වැසීම සඳහා පස් දමා තුනීකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගේ ඉල්ලීම මත හල්වතුර කසල අංගනයේ කසල වැසීම සඳහා පස් දමා තුනීකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.02 ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.02.01 කොරෝනා වසංගත භීතිකාව හමුවේ තම දිවි දෙවෙනිකොට අම්බලන්ගොඩ පුරවරයේ සුවපැවැත්ම වෙනුවෙන් විවිධ කැපවීම් කළ නගර සභා සෞඛ්‍ය හා**

**කර්මාන්ත අංශවල සේවක පිරිසට ප්‍රශංසා කළ යුතු බවට කරන ලද යෝජනාව සහාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

කොරෝනා වසංගත භීතිකාව හමුවේ තම දිවි දෙවෙනිකොට අම්බලන්ගොඩ පුරවරයේ සුවපැවැත්ම වෙනුවෙන් විවිධ කැපවීම් කළ නගර සභා සෞඛ්‍ය හා කර්මාන්ත අංශවල සේවක පිරිසට ප්‍රශංසා කළ යුතු බවට ගරු සභාවට යෝජනා කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අද නගර සභාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය කියන්නේ සභාවේ ජීවය. මොකද මේ අයට තමයි අද සභාව රැකගෙන යන්න වෙලා තිබෙන්නේ. අද මේ රටේ තිබෙන උග්‍ර ප්‍රශ්නය නිසා කොරෝනා නිසා මේ අය තමයි සභාවේ කීර්තිය රැක ගන්න සිටින අය. මොකද මේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ පොඩි අඩුපාඩුවක් වුණොත් එය මහ විනාශයක් වෙනවා. එමනිසා මේ අය ආරක්ෂා කර ගැනීම අපි පලමුවෙන්ම කළ යුතුයි. මේ අයට අවශ්‍ය නිල ඇඳුම් ලබා දීම, අවශ්‍ය මේ අයගේ පහසුකම් සපයා දිම , මේ අයට අවශ්‍ය අත්තිකාරම් මුදල් ලේකම්තුමිය ලබා දිලා අඩුපාඩු ගන්න සකස් කර දීම අප සභාව සතු යුතුකමක් වෙනවා. විශේෂයෙන්ම මේ අය ආරක්ෂා කර දීමට මේ නිල ඇඳුම් ලබා දීමට යෝජනා කිරිම හොඳ දෙයකි. එය අනිවාර්යෙන්ම කළ යුතු දෙයකි. මේ සෞඛ්‍ය අංශයේ කම්කරුවාගේ සිට පාලකයා දක්වා මෙය තිබිය යුතුයි. මා දුටුවා සමහර ආයතන වල කම්කරුවා වැඩියෙන්ම ආරක්ෂා කර තිබෙනවා. මොකද කම්කරුවා තමයි සියළුම අප ද්‍රව්‍යයන් අයින් කරන්නේ. ඒ අය ආරක්ෂා කර ගැනීම අප කළ යුතුයි. ඒ වගේම මා ඉල්ලා සිටිනවා . අප හැමටම උදවු උපකාර කරනවා. අපේ සභාවේ කාර්ය මණ්ඩලයට පුළුවන් තරම් විශේෂ මුදලක් ලබා දීමට කටයුතු කරන්න. අත්තිකාරමට අමතරව වෙනත් දිමනාවක් ලබා දෙන්න පුළුවන් නම් ඒ අය දිරිමත් කරන්න. එවිට අම්බලන්ගොඩ නගර සභාවේ කීර්තිය , අම්බලන්ගොඩ නාමයේ කීර්තිය රැක ගන්න පුළුවන් . ඔවුන් ආරක්ෂා කර ගන්න පුළුවන්. එතුමන්ලා තමයි අම්බලන්ගොඩ නගර සභාවේ ජීවය ලෙස සැලකිය යුත්තේ. මොකද ඔවුන් තමයි ඔබතුමා දෙන උපදෙස් පිළිඅරගෙන අම්බලන්ගොඩ නගර සභා කොට්ඨාශ රකිනු ලැබුවේ. ඒ අය මේ රාජකාරිය හරියට කළේ නැතිනම් අම්බලන්ගොඩ රැක ගැනිමට බැරි වෙනවා. අද ලංකාව පුරාම බැලුවාම ලංකාව පුරාම මෙය දියත් වෙලා ඉවරයි. ඇත්තටම අපේ මහජන සෞඛ්‍ය පරික්ෂකතුමාට සභාවේ සහෝදර ගරු මන්ත්‍රීවරයක් විදියට එතුමාට ස්තුතිය පුද කළ යුතුයි. එතුමා කළ සේවයට. ඒ වගේම අපගේ සෞඛ්‍ය සේවය මෙහෙයවන සෞඛ්‍ය පරිපාලක මහත්මයන්ට , සෞඛ්‍ය සේවක කම්කරුවන්ට ස්තුතිය පුද කළ යුතුයි. මොකද එතුමන්ලා තමයි මෙය රැක ගන්නේ. ඇත්තටම ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ කීර්තිය රකින්නේ ඒ අයයි. එමනිසා උපරිම ලබා දිය හැකි දිමනාවක් ලබා දී ඒ අය දිරිමත් කරන්න. තවත් ඉදියට වැඩ කරන්න කියා මා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් . සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කාර්මික අංශායේ සේවකයන්ගේ ගරු උප සභාපතිතුමා යෝජනා කළ පරිදි ඔවුන්ගේ සියළුම කටයුතු පහසුකම් සපයා දෙන්න . එය තමයි මා මේ අවස්ථාවේදි කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේ සෞඛ්‍ය අංශයේ සේවයේ නියුතු සියළුම නිලධාරින්ගේ හා සියළුම සෞඛ්‍ය සේවකයන් ගැන මේ අවස්ථාවේ අපි ප්‍රමුඛවම අවධානය යොමු කළ යුතු වෙනවා. මොකද අපි දන්නවා ජාඇල සුදුවැල්ල ප්‍රදේශයේදි කොරෝනා වෛරසය නාවික හමුදාවේ විරෝධාර රණවිරුවන්ට බෝ වුණේ ඒ අවස්ථාවේ ඔවුන්ට ආරක්ෂිතව කටයුතු කිරිමට නොහැකි වු නිසා. මොකද ඒ අය තමයි දිවි පරදුවට තබා මේ කටයුත්තට ඉදිරිපත් වුණේ. ඉතිං ඒ වගේම අපේ සෞඛ්‍ය අංශයේ සේවක මහත්ම මහත්මින් කැළි කසළ එකතු කිරිමේදි හැමතැනටම යනවා. මේ අවස්ථාවේදි ඔවුන්ගේ ධෛර්ය ශක්තිය වැඩි කරලා ඔවුන්ට යම්කිසි දිමනාවක් තිබෙනවා නම් එය ලබා දිලා එය වැඩිකර හරි ලබා ඔවුන්ගේ සනීපාරක්ෂක කටයුතු සම්බන්ධයේදි කටයුතු කිරිමට මේ අවස්ථාවේදි අපි ප්‍රමුඛස්ථානය දිය යුතු වෙනවා. අපි දන්නවා නගර සභාවේ මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරු ප්‍රමුඛව සිදු කරනු ලබන මේ කටයුත්ත ඉතාමත් හොඳ කටයුත්තකි. ඔබතුමන්ලාට හා කාර්ය මණ්ඩලයට මේ අවස්ථාවේදි එම සිදු කරනු ලබන කාර්යයට ස්තුතිය පුද කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම අපේ සෞඛ්‍ය සේවකයන් ඇගයිම අපේ කළුවඩුමුල්ලේ ජනතාවට නම් අලුත් දෙයක් නෙමේ. අපි වසර ගණනාවක සිට ඔවුන්ගේ එම ක්‍රියාව අපි අගයනවා. සිරි විජයරාම විහාරස්ථානය මුලික කරගෙන. එහිදි එම කවියේ අන්තිම කොටස මට මතකයි. ඒ කියන්නේ අපේ දුගධ නුමට නුඹේ සුවඳ අපට. එහෙම කියලා තමයි අපි ඔවුන්ව අගයන්නේ. දහම් පාසැල් දූ දරුවන් ඔවුන්ට බුලත් අතක් දි වැඳලා ඔවුන් පිළි අරගෙන අපි ඔවුන්ව අගයනවා. නිරන්තරයෙන්ම ඔවුන් අගයනවා. මේ අවස්ථාවේදි ඔවුන් වැදගත් වෙලා තිබෙනවා. මේ රටේ පවතින තත්ත්වයක් එක්ක. එමනිසා මාත් ඒ සියළු යෝජනා වලට මේ අවස්ථාවේ පක්ෂපාතිව අදහස් ඉදිරිපත් කරනවා. මා හිතන්නේ ඔවුන්ට කළ යුතු උපරිම දේ අපේ සභාවෙන් කළ යුතුයි. එයට සභාවෙන් බැරි නම් අපේ වැටුපෙන් හරි යම්කිසි දෙයක් දිලා ඔවුන්ව අගයන්න ඕන කියන යෝජනාව මා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම සියළුම ගරු මන්ත්‍රිවරු ප්‍රකාශ කළ පරිදි සෞඛ්‍ය අංශයේ සේවකයන් ගැන කතා කරන විට පසුගිය දිනවල අවමංගල්‍ය අවස්ථා සිද්ධ වුණා. මේ ව්‍යාසනය අවස්ථාවලත් ගම්වල. නමුත් ඒ සඳහා නගර සභාවෙන් අපි ක්‍රියාත්මක වන්නේ කර්මාන්ත අංශයේ අය. නමුත් අපි දෙයක් කිවුවාම කර්මාන්ත අංශයෙන් නොකෙරුණත් මා දැක තිබෙනවා සෞඛ්‍ය අංශයේ පරිපාලක වශයෙන් කටයුතු කරන සාරාංග මහතා කර්මාන්ත අංශයෙන් කෙරෙන්නේ නැතිනම් තමන්ගේ සෞඛ්‍ය අංශයේ සේවකයන් යොදවා හරි එය කර දි ලොකු සේවාවක් ඉටු කරනවා. මගේ සහෝදර ගරු මන්ත්‍රිවරුන් ප්‍රකාශ කළා වගේ අපි අගය කළ යුතුයි. පිදිය යුත්තන් පුදන්න ඕන. එමනිසා තමයි මේ යෝජනාව මේ අවස්ථාවේ

දමා තිබෙන්නේ. අපි අද ශ්‍රී ලංකාවේ ජනතාව විශේෂයෙන් ශ්‍රී ලංකීය ජනතාව අම්බලන්ගොඩ ජනතාව මේ උවදුර අවස්ථාවේ සෞඛ්‍ය පරික්ෂකවරු , සෞඛ්‍ය පරිපාලක මහත්වරු ඇතුළු සෞඛ්‍ය අංශයේ සියළුම සේවකයින් ඒ වගේම නගර සභාවේ ලේකම්තුමිය ඇතුළු නගර සභාවේ අනෙකුත් කාර්ය මණ්ඩලයටත් මේ අවස්ථාවේ ස්තුතිය පුද කරමින් ඔබතුමා විසින් යම්කිසි සෞඛ්‍ය සේවකයන් සඳහා කළයුතු යුතුකමක් ඉෂ්ඨ කිරිම සඳහායි අපි මේ අවස්ථාව යොදවමින් ඔවුන් වෙනුවෙන් කළයුතු සියළුම දේ කරමින් ඔවුන් අඟයමින් , මා ඇතුළු මාගේ සියළුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහායෝගය ප්‍රකාශ කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ සෞඛ්‍ය කම්කරුවන් අම්බලන්ගොඩ නගරයට මේ කොරෝනා වෛරසය නිසා සැහෙන සේවයක් කළා. ඔවුන් නොසිටියානම් මුළු අම්බලන්ගොඩ නගරයම කැළිකසළ වලින් පිරි පවතිනවා. අපට ආසන්න බලපිටිය නගරයේ කැළිකසළ අදින්නේ නැතිව ප්‍රශ්නයක් ඇති වුණා. ඒ වගේම මේ ආරක්ෂිත ඇඳුම් කට්ටල අත්‍යවශ්‍යයි. සමහර නිවාස නිරෝධනා ක්‍රියාවලිය සඳහා දින 14ක කාලයක් වසා තබනවා. ඔවුන්ගේ නිවාස වලින් බැහැර කරන කැළිකසළ තමයි ඔවුන්ගේ ගෙන එනු ලබන්නේ. යම් හෙයිකින් එම නිවෙස් වලින් බැහැර කරන එම කැළිකසළ වල මේ කොරෝනා රෝගයේ විෂබීජ ඇතුළු වී එක් අයෙකු හෝ රෝගී වුවහොත් එය මුළු අම්බලන්ගොඩ නගරයටම කැළලක් වෙනවා. එමනිසා නගර සභාවේ සෞඛ්‍ය අංශයේ සේවකයින්ට මේ අත්‍යවශ්‍ය සේවාව දිවා රෑ නොබලා ඉටු කළා. පසුගිය කාලයේ අපේ රජයෙන් එළවළු ලබා දුන්නා. ඔවුන් රාත්‍රී 12.00 , 1.00 වනකම් අප වෙනුවෙන් මේ නගරය වෙනුවෙන් සේවය කළා. ඊට පසුදිනත් පැමිණ සේවය කළා. අපිට හැකි අයුරින් ඔවුන්ට දිමනාවක් හෝ අතිකාල ලබා දෙන ලෙස මා මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා අද උදයේ දැන ගත්තේ මේ කනගාටුදායක සිද්ධිය. මා වෙනත් කරුණු යටතේ කතා කරන්න හිටියේ. මේ අවස්ථාවේ කතා කළානම් හොඳයි කියන අදහස මට ආවා. මේ අවස්ථාව වන විට අපේ ආරක්ෂක අංශයේ යෙදි සිටි සේවකයන් ඒ අයගේ ආයතනය විසින් පැමිණ ඒ අය ගෙනගොස් තිබෙනවා. මේ වනවිට ආරක්ෂක අංශයට යොදවා ඇත්තේ අපේ කර්මාන්ත අංශයේ සේවකයින් කොටසක් පමණයි. නමුත් ඊයේ දිනයේ අපේ කර්මාන්ත අංශයේ සේවකයෙකු එම බස්නැවතුම්පොළේ ආරක්ෂක සේවයේ යෙදි සිටියදි ත්‍රි රෝද රථයක් බස්නැවතුම්පොළ තුළ ගැසිමට එපා කිවු නිසා එම සේවකයාට පහරදීමට පැමිණ තිබෙනවා. ගහන්න ඇවිත් තිබෙනවා කියා තමයි මට ආරංචිය ආවේ . ගහලාද මන්දා . හැබැයි එම සේවකයා ගරු ලේකම්තුමිය දැනුවත් කර තිබෙනවා. මේ වනවිට කිසිම ක්‍රියාමාර්ගයක් ගෙන නැහැ. හරිම කනගාටුයි. පාලකයන් වශයෙන් අපේ සේවකයෙකුට ඒ වගේ සිද්ධියක් සිදු වුණාම මේ වනවිට ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද? මොකද අපට ගැසුවාත් එකයි . අපේ සේවකයෙකුටත් ගැසුවාත් එකයි සභාවේ . එමනිසා මෙයට දැඩිසේ ක්‍රියාමාර්ගයක් ගන්න කියන්න. ගරු ලේකම්තුමියගේ වගකීම වෙනවා ආයතන ප්‍රධානියා වශයෙන්. ඒ වගේ සේවකයෙකු පැමිණ පැමිණිල්ලක් කළානම් එයට විරුද්ධව රාජකාරි කරන්න. නමුත් මා හිතනවා මේ වනකම් එය සිදු වි නැහැ. හදිස්සියේවත් මේ සේවකයන් වෙනත් ක්‍රියා මාර්ගයක් ගත්තානම් අම්බලන්ගොඩ නගර සභාව පත්වන තත්ත්වය පාලකයෝ වශයෙන් අපට තමයි ඒ

සිද්ධියට මුහුණ පාන්න සිද්ධ වෙන්නේ.එමනිසා මා විශේෂයෙන් ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමාගෙන් මෙවන් සිද්ධීන් මේ කාලයේ ඇතිවෙන්න දෙන්න බැහැ. මොකද මේ නගරය වෙනත් පුද්ගලයන්ට ඕන විදියට පාලනය වෙන්න දෙන්න බැහැ. පාලකයෝ ඉන්නේ ගරු සභාපතිතුමා ඇතුළු අපියි. එමනිසා එම සිද්ධියට ඉතා කඩිනමින් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ලිපිය අනුව සනීපාරක්ෂක ඇඳුම් කට්ටල විතරයි ඉල්ලා තිබෙන්නේ. තවත් විෂබීජහරණය කරන දේවල් තිබෙනවා නම් ඒවා අරගෙන දෙන්න. හැබැයි මේ ගරු උප සභාපතිතුමා කිවු කාරණය ගැන ඉතාමත්ම ප්‍රශ්න සහගත ගැටළුවක් තිබෙනවා. මමත් දන්නේ මේවෙලේ. ලේකම්තුමිය එයට අදාල නිත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන තිබෙනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක මම පැහැදිලි කරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, දැන් මෙහෙමයි. දැන් මෙහෙමයි. මේ වගේ දේවල් වලට මැදිහත්වෙනවිට නගර සභාව සිටින්නේ පරිපාලන වශයෙන් හැම දෙයකටම මැදිහත් වෙනවා. උප්පතියේ සිට මහජනතාවගේ මරණය දක්වා. යන නිලධාරීන් තමයි මෙය පාලනය කරන්නේ. අපි වශයෙන් යම්කිසි තීන්දු තීරණ ගන්නවා. නිසි වශයෙන් එය පාලනය කිරීම සඳහා නිලධාරීන් එයට යනවා. ඒ යන නිලධාරීන්ට මේ වගේ තත්ත්වයක් ඇති වෙනවා නම් කොහොමද අපි නගරය පාලනය කරන්නේ. ඔබතුමාට දොස් කියනවා නෙමේ. ඔබතුමා මීට වඩා අවධානයෙන් සිටිය යුතුයි. දැන් නගරයේ ගියාම හතර වටේම ත්‍රිවිල් ද අනිත් වාහන ගසා තිබෙනවා. කිසිම ක්‍රමවේදයක් නැහැ. මේකට දැක්මක් එක්ක යන වැඩ පිළිවළක් අපි සාදා තිබෙනවා. නමුත් මේවා ක්‍රියාත්මක නැහැ. ඇත්තටම අපි ගරු උප සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ ත්‍රිවිල් කමිටුව පැවැත්වීම පිළිබඳව. මේ හේතුව නිසා තමයි මේ ප්‍රශ්න ගැටළු ඇති වෙන්නේ. ඇයි මෙහෙම වෙන්නේ. ඔබතුමා එකට නායකත්වය ලබා දෙන්න. අපි තීන්දු තීරණ අරගෙන තිබෙන්නේ. අපි කමිටුවලටත් සහභාගී වෙනවා. අපි අවධානම නොගෙන. හැම දෙයකටම. වගකීමක් තිබෙනවා. නමුත් ක්‍රියාත්මක වෙලා නැහැ. ඇයි ආරාක්ෂක අංශය යන්න හේතුව. මොකක්ද හේතුව. එතකොට අපේ නිලධාරීන් ගිහින් කරන්න ගියාම එක එක්කෙනාට ඕන විදියට මේක පාලනය කරන්න දෙන්න බැහැනේ. ඔබතුමා ඔය පුටුවේ ඉන්න එකත් වැඩක් නැහැ. එහෙම යනවා නම්. අපි කියන්නේ නගරේ සැලසුමක් අනුව ක්‍රියාත්මක කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ මන්ත්‍රිතුමා, කඩයක බඩු කිරනවා වගේ නගර සභාවේ වැඩ කරන්න බැහැ. එමනිසා කරුණාකර ඔබතුමාගේ දෙන පිළිතුරක් දෙන්නම්. අරගත්ත ක්‍රියාමාර්ග තිබෙනවා. කඩයක ඇණ කිරනවා වගේ දෙයක් නෙමේ මේක.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා ගත්ත ක්‍රියාමාර්ග කියන්නකෝ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගත්ත ක්‍රියාමාර්ග කියන්නම්. දැන් සම්පූර්ණම මා මතක් කරන්නම්. දැන් වැදගත් වු කාරණයකදි අවැදගත් වු කතාවක් නිසා වැදගත් වු පිරිසකට අවමානයකට ලක් කිරිමට මා කැමති නැහැ. මා ඉතාමත්ම මේ අවස්ථාවේදි ස්තුතිවන්ත විය යුතුයි සෞඛ්‍ය අංශයේ සියළුම දෙනාට. මේ නගරය තුළ යම්කිසි වැඩ කොටසක් ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන්. අපි විශේෂයෙන් ස්තුතිවන්ත විය යුතුයි. අපට ඇඳිරිනිතිය කියන දෙය අපට එකපාරටම ලැබිච්ච දෙයක්. අපි පලවෙනි කිසිම දෙයක් කළේ නැහැ. දෙවැනි දිනයේත් අපි කිසිම කුණු ඇදිමක් කළේ නැහැ. අපි පාරට ගිහින් බලන කොට මහවිදිය දිහා බලන විට කුණු ගොඩක්ම තමයි දුටුවේ. අපේ පාරිපාලක වන මහජන සෞඛ්‍ය පරික්ෂක යසවර්ධන මහතා ඉතා දක්ෂ නිලධාරියෙකු වශයෙන් ඒ වනවිට ක්‍රියාකරමින් සිටියා. එතුමාට කතා කරලා සෞඛ්‍ය පරිපාලකයකු වශයෙන් සෞඛ්‍ය සේවකයන්ට ගතයුතු ත්‍රියා මාර්ග ගන්න අවශ්‍ය ගත යුතු ආරක්ෂික දේවල් ගැනීම සඳහා ටෙන්ඩර් කිරිමක්, මුදල් වියදම් කිරිමේ රජයේ නීති කිබෙන බව ඇත්ත. රජයේ නීති වලට අනුව සේවකයන් ආරක්ෂා කරන්න බැරි නිසා ඒ අවස්ථාවේදි මමත් , ලේකම්තුමියත් , ගණකාධිකාරිතුමියත් සාකච්ඡා කරලා අපි එතුමාට රු.20000/= වවුචර් එතුමාට ලබා දුන්නා. අවශ්‍ය අයුරින් ඕනෑම කටයුත්තක් කරන්න කියා. ඒ අනුව මුලින්ම මේ මුඛ ආවරණ එතුමා ලබා ගත්තා. මේ මුඛ ආවරණ නැතුව ගියා කියා අපේ ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතා කිවුවාට අවශ්‍ය මුඛ ආවරණ ගෙනවිත් තමයි මේ වැඩය එතුමා ආරම්භ කළේ. එදා සිට ඇත්තටම මහජන සෞඛ්‍ය පරික්ෂක මහතාගේ උපදෙස් පරිදි , සෞඛ්‍ය පරිපාලක මහත්වරු වන සාරාංග මහතා හා හිරාන් මහතාගේ උපදෙස් පරිදි ඒ සියළුම දෙනා මහන්සිවෙලා වැඩ කළා. ඇත්ත වශයෙන්ම ඇස්දෙකට දුටුවා. ඒ අය වැඩ කරපු නිසා තමයි කොරෝනා කියන බියත් එක්ක දුගඳ නැති කරලා වෙනත් රෝග වලින් වැලැක්වීමට අම්බලන්ගොඩ සෞඛ්‍ය සේවකයන් විශාල සේවයක් ශක්තිමත්ව ඉටු කළා. එ වගේම අපට ඇතිවු ප්‍රශ්නයක් තමයි දිගින් දිගටම ඇඳිරිනිතිය ක්‍රියාත්මක වීම . මහජනතාව නගරයට එක්රැස්වන එක වලක්වන එක. ඒ වැලැක්වීම සඳහා අපි මුහුණු පොතේ දමා තිබුණා. අපි මෙහි කඩ සාප්පුහිමියන්ට දුරකථනයෙන් කතා කර කියා සිටියා ඔබලාට දුරකථනයෙන් කතා කර ඇණවුම් කරන බඩු නොමිලේ ප්‍රවාහනය කර දෙන්නම් කියා. ඒ සඳහා අපි කර්මාන්ත අංශයේ අයට තමයි මෙය පැවරුවේ. අපේ පාරිපාලක මහතුන් වන ජානක මහතා හා හිමාල් මහතාගේ මෙහෙයවිම් යටතේ. ඒ සියළු දෙනාගේම භාණ්ඩ ටික ඇණවුම් කළාම නිවෙස් වලටම ගෙනහින් දුන්නා. අපට දුරකථන රාශියකින් කතා කර ප්‍රශංසා කළා. බොහෝවිට මේ අවස්ථාවේදි ප්‍රශංසා කළේ වැඩිහිටි අය. ඒ අය කියා සිටියේ අප බඩුවක් ගන්න ගියත් පෝලිමේ ඉන්න ඕන පැය දෙකක් විතර. අපිට දුරකථනයෙන් බඩු ටික ලැබුණා. බොහොම ස්තුතියි කියා කිවුවා. සෞඛ්‍ය අංශය වගේම කර්මාන්ත අංශයේ අයත් සුවිශාල කාර්යයක් මේ කාලය තුළ සිදු කරනු ලැබුවා. ඒ වගේම අපි මේ සමහම මෙහෙයවුවා අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය. ඒ සමුපාකාර සමිතියට අවශ්‍ය සේවය අපේ කර්මාන්ත අංශයේ හා සෞඛ්‍ය අංශයේ නිලධාරි මහත්වරුන් විසින් ඔවුන්ට ලබා දුන්නා. මේ අවස්ථාව සිදුවන කාලය තුළ අපට එළවළු ලොරියක් ආවා. කිලෝ පන්දහස් ගණනක වගේ එළවළු ලොරියක්. එම ආපු එළවළු වල කිලෝ එකක් රු.10/=ත් රු.20/=ත් අතර ප්‍රමාණයක් තබා අපි මහජනතාව අතර බෙදා දුන්නා. ඇත්ත වශයෙන්ම ඉතාමත් සහනදායි තත්ත්වයකට එළවළු වෙළදාම ජනතාව ඉතාමත් අඩු මුදලකට ලබා දීමට හැකිවුණා. රජය මඟින් එම ලබා දුන් එළවළු ටික. ඉන් ජනතාව දැන ගත්තා ඇත්ත වශයෙන්ම එළවළු පිළිබඳ වෙළඳපොළවල් වල තිබෙන මිළ ගණන් කොපමණද ? වෙළඳුන් අපට විකුණන්නේ කොපමණ ගසා කෑමක් කරලාද කියන එක ජනතාව දැන ගත්තා. ඒ අනුව එළවළු මිළ යම්තාක් දුරට අම්බලන්ගොඩ තුළ අඩු කිරිමට පුළුවන් වුණා . එය සිදු කරනු ලැබුවේ අපේ සේවකයන් තමයි. එළවළු ටික පැමිණියේ රාත්‍රි

12.00 ට පමණ . අපි එය බාලා අවසන් කරන විට රාත්‍රි 2.30 විතර වුණා. අපේ ගරු නගර සභා මන්ත්‍රි ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කමාර මහතා ඇතුළු තව ගරු මන්ත්‍රිවරු කිහිපදෙනෙකු අපි එළවළු ටික බාලා පසුදා අපි එය විකුණුවා. අපට උදවු කළා ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා , ගරු නගර සභා මන්ත්‍රි අතුල මහතා , ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා පැමිණ ස්වේච්චාවෙන් පැමිණ මේවා ජනතාව අතර බෙදා දීමට යම්කිසි වැඩ කොටසක් සිදු කරනු ලැබුවා. මේ ගරු මන්ත්‍රිවරු දන්නවා අපට නරක් වෙලා විසිකරන්න වු එළවළු ප්‍රමාණය කොපමණ ද කියා. නමුත් අපට රජයෙන් දුන් මුදලටත් වඩා රු.5000 ගණනක මුදලක් අපිට ලැබී තිබුණා. අපි වැඩිපුර රු.10/= ගණනේ විකුණලා. අද අපි අවසර ඉල්ලා සිටනවා එම මුදල රජයට යවන්න. එවැනි ආකාරයේ වැඩ කොටසක් තමයි සිදු කළේ. එහිදී මා මෙහි ඉල්ලා සිටින ප්‍රධානම දෙය තමයි මේ Overal Kit එක . මෙම ඇඳුමේ වටිනාකම තිබෙන්නේ රාත්‍රි කාලයේ සේවයේ යෙදෙන විට මෙහි අපි යොදා තිබුණා පටි 4ක් වගේ . එම 4 ලුමිනෙක්ස් පාට නිසා අලෝකයක් වැටුණාම මේ අය දිලිසිලා එම පාර මැද සිටින පුද්ගලයා හඳුනා ගැනීමට පුළුවනි. රාත්‍රි කාලයට එහාට මෙහාට පනින විට අපේ සේවකයන් කළුපාට ඇඳුම් තමයි හුඟාක් අඳින්නේ. පෙනෙන්නේත් නැහැ. මේ අය හැපි සමහර වේලාවට තුවාල වෙන්න පුළුවන්. එමනිසා මෙය ඉතාමත්ම වැදගත් ඇඳුමකි. එමනිසා අපි මෙය ලබා දිලා මේ අයගේ සෞඛ්‍ය වගේම මේ අයගේ ආරක්ෂාවත් සැලසිය යුතුයි. යන වාහනයක ගැටිලා , බයිසිකලයක ගැටෙන්න පුළුවන්. එ සියල්ලම අප කරන්න පුළුවන් කියන කිව යුතුයි. මෙහිදි මතුකළා ඊයේ දිනයේ සිදු වු සිද්ධියක් සම්බන්ධව ගරු උප සභාපතිතුමාත් ගරු නගර සභා මන්ත්‍රි රහුල ලලිත වික්‍රම මහතාත්. ගරු උප සභාපතිතුමා දන්නේ නැහැ . අද උදේ වෙනකොට තමයි මමත් ඕක දැනගත්තේ. මා එවේලාවේම අම්බලන්ගොඩ පොලිසියට කතා කර කිවුවා. මෙහෙම සිද්ධියක් සිදු වෙලා තිබෙනවා. දැනට තිබෙන සියළුම ත්‍රිවිල් ඉවත් කරන්න කියා. එයට රථවාහන අංශයේ ස්ථානාධිපතිතුමා ගිහින් එයට අවශ්‍ය වැඩ කටයුතු සිදු කරනවා කියා තිබෙනවා. එවැනි අවස්ථාවක ලේකම්තුමිය පැමිණිල්ලක් ආවාම පොලිසියේ පැමිණිලි කරන්න. පැමිණිල්ලක් නැතුව අපට පොලිස් නිලධාරියා වගේ ගහගන්න විදියක් නැහැ. අපේ නිලධාරින්ට. පොලිසිය තමයි මේ රටේ නීතිය හසුරුවන්නේ. අපි මෙහි නගරාධිපති වුණා කියා පුටුවේ හිටියා කියා ඔබතුමිය ලේකම්තුමිය වුණා කියා අපිට ආයුධ දිලා නැහැ. අඩු ගානේ මිටියක්වත් දිලා නැහැ. ඉතිං මිටියක්වත් නොදි මිටිය අතේ තිබුණ මිනිසුන් කියනවා ගිහිල්ලා ගහපන් කියා. අපට මිටි නැහැ. කඩේ වැඩ කරන කොට මිටි තිබුණ මිනිසුන් සිටිනවා. අපි යහපත් සමාජයක මිනිසුන් ගුණ ගරුක මිනිසුන් මිසක කවදාත් ගණන්කාරයන් නෙමේ. මෙතැන සිටින සභාපතිතුමාවත් මන්ත්‍රිවරුවත්. අපිට මිටියක් නැහැ. මිටිය තියාගෙන හිටියේ ඔයයි. ඇණ ගසා හිටිය මිනිහා ඔතැනට ගෙනැල්ලා. ඒක තේරුම් ගන්න. ඔයා දැන් ගණන්කාරයෙකුත් නෙමේ දැන්. එමනිසා අපි අවංකවම එම වැඩ කොටස කරනවා. නිත්‍යානුකූලව හා අම්බලන්ගොඩ නගරයට ආඩම්බර වෙන්න වැඩ කටයුතු කරනවා මිසක අපි ගණන් කාරයෝ මිසක හැසිරෙන්න කැමති නැහැ. එමනිසා අපි එය නීතිය මඟින් පොලිසිය මඟින් වැඩ කටයුතු සිදු කරනවා කියන එක මතක් කරන්න කැමතියි.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, පැන පාවිච්චි කරන්න.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, යමක් සිදු වුණාම ලේකම්තුමිය අද වෙනකම් ඔබතුමාව දැනුවත් කර නැද්ද? මේ වනවිට. මා හිතන්නේ එය සම්පූර්ණ වැරදි ක්‍රියාවකි.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මා දැන ගත්වේලාවේ දුරකථනයෙන් දැනුම් දුන්නා. ඒ අවස්ථාවේ ගරු මන්ත්‍රීවරු තිදෙනෙකු සිටියා.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

හැබැයි මමත් ඊයේ සිටියා . නිකමටවත් මටවත් කිවුවේ නැහැ එම සේවකයා. ලේකම්තුමියට කියන්න ඇති. මට නිකම්වත් කිවුවේ නැහැ. නැතිනම් අනිවාර්යෙන් මා ක්‍රියාමාර්ගයක් ගන්නවා. හැබැයි මෙහෙම වෙන්න දෙන්න බැහැ. මෙහි ගරු මන්ත්‍රීවරු කාටවත් දොස් කියන එක නෙමේ සිදු විය යුත්තේ.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ගරු මන්ත්‍රීතුමා කියපු ටිකට කියන්න ඕන ආකාරයට කිවුවේ .

ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මා දෙයක් කිව යුතුයි. ඔබතුමා කෙන්ති ගන්න එපා . ගරු මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරද්දි ප්‍රශ්න ඇති නොවෙන විදියට මේ සභාව අරගෙන යන ඉල්ලීම කරනවා. විශේෂයෙන්ම සේවකයෙකුට ගහපු විදියට තමයි ගරු මන්ත්‍රීවරුන්ටත් ගහන්නේ. දැඩි තීරණ ගන්න. මා ඉල්ලා සිටිනවා සියළු මන්ත්‍රීවරුන්ගෙනුත් මේ සම්බන්ධව සභාව දැනුවත් කරන්න.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

පහර දීමක් සිදු වෙලා නැහැ.

ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්

පහර දෙන්නෙත් ඔය වගේ තමයි. ගරු උප සභාපතිතුමාට ගිහින් ප්‍රශ්නයකදි ගසා තිබුණා. ගරු මන්ත්‍රීවරු අසරණයිනේ. ඒ නිසා මේ වගේ දේවල් සිදුවන විට එම සේවකයෝත් ඉතා අසරණයි. එමනිසා ඔබතුමා දැඩි ක්‍රියාමාර්ග ගන්න. මා කිව යුතු කාරණා කිහිපයක් තිබෙනවා. මේ කොවිඩ් වසංගතය හේතුවෙන් රටේ පවතින වතාවරණය.751 ක් අසාධිත වෙලා තිබෙනවා. ඒ වගේම මරණ 8ක් වාර්තා වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපි අපේ අම්බලන්ගොඩ නගරය ආරක්ෂා කරගත යුතුයි. විශේෂයෙන්ම ඔය සෞඛ්‍ය ඇඳුම් කට්ටල ටිකත් , සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් ගන්නා උත්සාහය පිළිබඳව අපි අභය කළ යුතුයි. විශේෂයෙන්ම අපි අම්බලන්ගොඩ රැක ගත යුතුයි. ඒ වගේම ඔබතුමා ගන්නා උත්සාහය පිළිබඳ ව අප සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ කොවිඩ් 19 පැමිණ දින සිට විෂබීජහරණය කරමින් ඒ අවශ්‍ය භාණ්ඩ සමුපකාරය හරහා ලබා දෙමින් , ඒ වගේම නගර සභාවේ වාහන ටික ලබා දෙමින් ඒ කරන ලද ක්‍රියාමාර්ගය අපි විශේෂයෙන්ම අභය කරනවා. ඔය පොඩි පොඩි දේවල් වලට කෙන්ති ගන්න එපා. මොකද ගරු මන්ත්‍රීවරුන්ට අදහස් ප්‍රකාශ කිරිමේ අයිතියත් තිබෙනවා. ගරුත්වය තිබෙන විදියට ඒ ගරු මන්ත්‍රීවරුන්ට කතා කරන්න. ගරු සභාපතිතුමාටත් ගරුත්වය තිබෙන විදියට කතා කරන්න. විශේෂයෙන්ම ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතාට ස්තුති වන්ත විය යුතුයි. විශේෂයෙන්ම ආර්ථික මධ්‍යස්ථාන හරහා

එළවළු කිලෝ 5000ක ප්‍රමාණයක් ලැබිමේදි සැම කොට්ඨාශයකටම එය අලෙවි කිරිමට නොහැකි වුනාට. මාගේ කොට්ඨාශයටත් මා පැය දෙකකට ගෙනගියා ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතතාට කතා කර. මොකද මා ඊට කලින් දිනයේ ප්‍රකාශ කර සිටියා නගර සභාවෙන් එළවළු එනවා. නොගියොත් එහෙම ජනතාව මට කැගසන නිසා මා ළඟ සිටම ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතාගේ වාහන රැගෙන ගියා. පැය දෙකකට මාගේ පෝරඹ කොට්ඨාශයට. පොඩි අඩුවක් තිබෙනවා. සභාවේ කොට්ඨාශ 13ටම මෙය යන්න බැරි වුණා. ඒ ගැන කනගාටුවක් තිබෙනවා අනිත් කොට්ඨාශවල මන්ත්‍රීවරුන්ගේ. යම්කිසි දෙයක් කරන විට මීට වඩා විනිවිදභාවයෙන් එය කරන්න. ඉතිං වාහන නැති අය ඉන්නවා. කොට්ඨාශවල ගරු මන්ත්‍රීවරුන්ට මුදල් නැහැ. ප්‍රශ්න තිබෙනවා. විශේෂයෙන්ම ස්තුතිවන්ත විය යුතුයි හිමාල් මහතා ඇතුළු අපේ නිලධාරින් මණ්ඩලයට හා සේවකයන්ට. එම ආහාර ටික ගම්වලට ගිහින් බෙදා හැරිම සම්බන්ධව. මේ වසංගතය ලෝකයේ අපි අගය කළ යුතුයි. අපි දේශපාලන කුහකත්වය නැතිව අපි දේශපාලනය දේශපාලන වේලාවට කරන්නම්. රටක් විදියට නගරයක් විදියට අපි පුළුවන් උත්සාහයක් ගෙන අපේ රටින් මේ වසංගතය තුරන් කිරිමට පළාත් පාලන ආයතන ගන්නා උත්සාහය පිළිබඳව අපි අභය කළ යුතුයි. මේ වසංගතයේ PCR පරික්ෂණ දැන් 1600ක් පමණ කරනවා. PCR පරික්ෂණ මුලදි වැඩි කළානම් මීට වඩා හොඳ ප්‍රතිඵලයක් ගන්න තිබුණා. ඇත්තටම දිනකට 1600ක් කියන්නේ රෝගින් වැඩි වුණොත් එහෙම ලොකු ගැටළුවක් ඇතිවෙනවා. අපි අම්බලන්ගොඩ නගරය ආරක්ෂා කරමින්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් ඇතුළු ඒ සියළු කම්කරු සේවකයන්ටත් සියළු දෙනටත්, මේ ආයතනයේ සිටින නිලධාරින්ටත් ඒ අවශ්‍ය කට්ටල ලබා දෙන්න කියා ඉල්ලමින් මේ වසංගතය අම්බලන්ගොඩ නගරයෙන් තුරන් කිරිමට අපි විශේෂයෙන් ඔබතුමාට එම සවිය ලබා දෙනවා. ලංකාවටත් මුළු ලෝකයටත් මේ වසංගතය දුරු කිරිමට හැකිවේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, හයක් හතරක් නොදන්න දිගක් පළලක් නොදන්න ඒ රෝග අපාදාවට ලක් වූ වේලාවේ අපේ නගර සභාව වෙනුවෙන් අභියෝග භාර ගන්නා කණ්ඩායම සෞඛ්‍ය කර්මාන්ත සේවක ප්‍රජාව කරන ලද ගොඩක් දේ කතා වුණා . මේ අවස්ථාවේ ඔවුන් පොදු ස්ථාන විෂබීජහරණය පමණක් නෙමෙයි ජනතාවගේ බඩගින්න නිවිමට ආහාර පාන සැපයීමට පවා ඔවුන්ට සිදු වුණා. ඔවුන් ඒ දෙය කළා. ඒ වගේමයි තක්කාලි පෙට්ටි කර ගහගෙන එළවළු මිටි බාන්න අපේ ගරු මන්ත්‍රීවරු සමඟ එකතු වූ එම සේවකයෝ වචනයෙන් අභයා නිම කළ යුතුයි. එමනිසා යම් දීමනාවක් දිමට හැකිනම් බොහොම වටිනවා. නමුත් ගරු සභාපතිතුමනි අප ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන් වටිනා වචන මාලාවක් සහිත ප්‍රසංශා ලිපියක් මේ රාජකාරි කැපවිම් කර සේවකයන්ගේ නිලධාරින්ගේ පෞද්ගලික ගොනුවලට දැම්මට කටයුතු කරන ලෙස. ඒ වගේම මොවුන්ට මේ අභියෝගය භාරගෙන යන අතර තුර මූර සේවයේ යෙදෙන්නත් සිද්ධ වුණා. ඔවුන් ඒ දෙයත් කළා. ඇත්තටම අම්බලන්ගොඩ නගර සභාවේ කිතුගොස නැංවීමයි ඔවුන් කළේ. ඒ කිර්තිය සුරැකපු එක්තරා සේවකයෙකුටයි අත උස්සා තිබෙන්නේ. තර්ජනය කර තිබෙන්නේ. අපි මේ මහ සම්භාවනිය සභාව මේ නගරවරය පාලනය කරන අප මේ අවස්ථාවේ අප කෙලින් සිටිය යුතුයි. ඒ රාත්‍රී ත්‍රිරෝද රථ කරුවා නිතිය ඉදිරියට පමුණුවා ඔහුට දඬුවම් ලබා දිය යුතුමයි. නොඑසේ නම් ත්‍රිරෝද රථ රියදුරන් මේ නගරය පාලනය කරන්න පටන් ගනිවි. එමනිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමලා නගර නායකයා විදියට අවශ්‍ය විධිවිධාන සලස්වා ගෙන ලේකම්තුමියට මෙවැනි ආයතනයක කටයුතු කර නොමැති නිසා එතුමියට යම් දෙයක් අතපසු වුණත් අපි ඉදිරියේදි එය හදාගෙන මේ සේවකයින් අභිමානයට අභිප්‍රේරණයට ලක් කරමින් මේ නගර සභාව පාලනය කරන

ලෙසට අදහස් දක්වන අතර මේ අවස්ථාවේ මේ සඳහා කැපවීම් කළ සියළුම සේවකයන්ට තුති මල් පුදනවා.

**තීරණය -**

කොරෝනා වසංගත භීතිකාව හමුවේ තම දිවි දෙවෙනිකොට අම්බලන්ගොඩ පුරවරයේ සුව පැවැත්ම වෙනුවෙන් විවිධ කැපවීම් කළ නගර සභා සෞඛ්‍ය හා කර්මාන්ත අංශවල සේවක පිරිසට ප්‍රශංසා කළ යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් කරන ලද යෝජනාව ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

06 කාරක සභා වාර්තා

**06.01 2020.04.12 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

2020.04.12 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය**

2020.04.12 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**06.02 2020.04.20 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

2020.04.20 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කරන ලදී.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය**

2020.04.20 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.03 2020.03.30 දින පැවති ආපදා කළමනාකරණය පිළිබඳ ස්ථාවර කාරක සභා කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2020.03.30 දින පැවති ආපදා කළමනාකරණය පිළිබඳ ස්ථාවර කාරක සභා කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය**

2020.03.30 දින පැවති ආපදා කළමනාකරණය පිළිබඳ ස්ථාවර කාරක සභා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

07 ටෙන්ඩර් හා මිළ ගණන්

**07.02.01 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය Infrared Thermometer සඳහා ඉදිරිපත් කර ඇති මිළගණන් සභාගත කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | CIRCA Technology Pannipitiya | Grilakgmic Drugs | Evergreen Colombo |
|---|---|---|---|---|---|
| 01 | Infrared | 05 | 10200/= වසර | 19475/= | 16950/= |

| | | | | | |
|---|---|---|---|---|---|
| | Thermometer | | දෙකක වලංගු කාලයක් ඇත . Chaina | | වගකීම වසර 01කි Chaina |

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය Infrared Thermometer (උෂ්ණත්වමාන) මිලදී ගැනිම සඳහා මිල ගණන් ඉල්ලන ආයතනයන්හි මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මහත්මිය , පරිපාලන නිලධාරී රණසි උත්පලා ගුණවර්ධන මහත්මිය, සෞඛ්‍ය විෂය නිලධාරී මහේෂි සංජීවනී මහත්මිය , මහජන සෞඛ්‍ය පරීක්ෂක අභයසිරිවර්ධන මහතා සහ අභ්‍යන්තර විගණන නිලධාරී ඩබ්.පී.සිල්වා මහත්මියගෙන් සමන්විත කමිටුවක් මගින් ලබාගන්නා තීරණය අනුව මිලදී ගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

08. **ගෙවීම්.**

08:01 ඇණවුම් අංක 2407 යටතේ ඇණවුම් කරන ලද ගෑස් සිලින්ඩර් 08 ක් ලබාගැනීම වෙනුවෙන් එස්.එච්.එන්.අරුණ ශාන්ත ද සිල්වා මහතා හට රු.48280/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:02 ඇණවුම් අංක 2410 යටතේ ඇණවුම් කරන ලද පොටි හා වැලිකඩදාසි ලබාගැනීම වෙනුවෙන් අතුල ප්‍රදීප් මහතා හට රු.33500/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:03 ඇණවුම් අංක 2405 යටතේ ඇණවුම් කරන ලද ගෑස් සිලින්ඩර් 08 ක් වෙනුවෙන් එස්.එච්.එන්.අරුණ ශාන්ත ද සිල්වා මහතා හට රු.48280/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:04 ඇණවුම් අංක 2406 යටතේ ඇණවුම් කරන ලද ගෑස් සිලින්ඩර් 08 ක් වෙනුවෙන් රු.48280/- ක් එස්.එච්.එන්.අරුණ ශාන්ත ද සිල්වා මහතාට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩප්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:05 පොල්වත්ත ශාඛා පුස්තකාලයේ පොත් බැඳ නිමකර භාරදීම වෙනුවෙන් එස්.ඩබ්.හරිස්චන්ද්‍ර මහතාට රු.22400/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:06 ඇණවුම් අංක 2378 යටතේ ඇණවුම් කරන ලද තීන්ත වෙනුවෙන් රු.25580/- ක් අතුල ප්‍රදීප් කුමාර මහතාට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:07 අඟුලු දෙකේ සේප්පුව විවෘත කරගැනීමට නොහැකිවීම මත එය විවෘත කර අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.17600.76 ක් ඩී.ඩබ්.උපාලි මහතාට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:08 2020 පළමු කාර්තුවේ රු.30424.91 ක මුද්දර ආදායම් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:09 සභාව සතු RF-0022 අංක දරණ ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.17500/- ක් නිහාල් ඉංජිනියර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:10 සභාව සතු සියලුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා 2020.02.15 දින සිට 2020.02.29 දින දක්වා ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් රු.148082/- ක් සී/ස. අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:11 ඇණවුම් අංක 2359, 2360, 2361,2362,2363,2364 හා 2365 යටතේ ඇණවුම් කරන ලද ඖෂධ සඳහා රු.351025/- ක් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධරිමදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:12 පෙර පාසැල් දරුවන් සඳහා මුද්‍රිත ග්‍රන්ථ සැපයීම වෙනුවෙන් රු.240,000/- ක් සිහිනි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:13 අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ 2020 අප්‍රේල් මස ගමන් වියදම් ලෙස රු.108000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:14 ඇණවුම් අංක 2368,2369 යටතේ ඇණවුම් කරන ලද ටයර්,ටියුබ් හා රිම් ටේප් වෙනුවෙන් සී/ස රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත රු.379242/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:15 2020 වර්ෂයේ අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් දරුවන් 160 ක් සඳහා නිල ඇඳුම් රෙදි ලබාදීම වෙනුවෙන් රු.85600/- ක් සරසි රෙදි ගෙදර ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:16 අභ්‍යාස පොත් බෙදාදීමේ උත්සවය ඡායාරූපගත කර ඇල්බමයක් සකස් කිරීම වෙනුවෙන් එන්.හෙන්දහේවා මහතා වෙත (ෆොටෝ ෆෝකල් ආයතනය ) රු.22445/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප්

මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:17 සභාව සතු බැකෝ යන්ත්‍රයේ අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කටයුතු සඳහා ඔයිල් සුපර් ප්ලස් 30 ලීටර් 16 ක් ලබාගැනීම වෙනුවෙන් රු.12040/- ක් ඩබ්.ලීලාරත්න මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:18 RA-3709 ට්‍රැක්ටර් රථයේ අලුත්වැඩියා කටයුතු හා අමතර කොටස් ලබාගැනීම වෙනුවෙන් රු.236049/- ක් රත්න මෝටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.19 ඇණවුම් අංක 2394 යටතේ A-4 මිලදී ගැනීම වෙනුවෙන් චාමර බුක්ෂොප් වෙත රු.65000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධර්මදාස කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:20 අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ දහම් පාසැල් දරුවන් සඳහා සමරු තිළිණ ප්‍රදානය වෙනුවෙන් සමාරා ප්ලාස්ටික් සහ ග්‍රැෆික්ස් ආයතනය වෙත රු.31365/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:21 පටබැඳිගෙදරවත්ත මාර්ගයේ කාණුව කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ 10% ක රඳවුම් මුදල් රු.30,489.55 ක් නිදහස් කිරීම කළුවඩුමුල්ල , සහජීවන ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප්

මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:22 හල්වතුර බී.ජී.සුනිල් මහතාගේ නිවස අසල කාණු පද්ධතිය ඉදිකිරීමේ කර්මාන්තයේ 10% ක රඳවුම් මුදල් රු.92,903.73 ක් නිදහස් කිරීම විලේගොඩ ප්‍රජා මණ්ඩල කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:23 පින්නදූව 4 වන හරස් මාර්ගය තාර දැමීමේ කර්මාන්තයේ 10% ක රඳවුම් මුදල් රු.38,932.59 ක් නිදහස් කිරීම කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:24 මහ අම්බලන්ගොඩ අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ 10% ක රඳවුම් මුදල් රු.42,390.29 ක් නිදහස් කිරීම කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:25 පටබැදිමුල්ල ප්‍රජා මණ්ඩල සඳහා කොරෝනා වසංගතය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා රු.50,000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සඳහා ඉදිරිපත් කර තිබූ ගෙවීම් වවුචරය 2020.04.12 දින පැවති මූල්‍ය කමිටුවට ඉදිරිපත් කර අනුමත කර තිබූ බැවින් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් එය ඉවත් කරන ලදී.

08:26 කෙරමිණිය ප්‍රජා මණ්ඩල සඳහා කොරෝනා වසංගතය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා රු.50,000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සඳහා ඉදිරිපත් කර තිබූ ගෙවීම් වවුචරය 2020.04.12 දින පැවති මූල්‍ය කමිටුවට

ඉදිරිපත් කර අනුමත කර තිබූ බැවින් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් එය ඉවත් කරන ලදී.

08:27 අම්බලන්ගොඩ බස් නැවතුම්පොල පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීම ( අදියර 01 ) වෙනුවෙන් රු.348764.42/- ක මුදලක් විලේගොඩ ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මේ 08.27 වැසිකිළිය සඳහා නිම කරන්න තිබෙන්නේ කොයි කාලයටද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය අවසන් වෙලා නැහැ. වැඩ නිමකරන ලද කොටසක ගෙවීමක් කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

තවම පටන් අරගෙන නැද්ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පටන් අරගෙන තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

කවදාද එය ඉවර වෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් වැඩ කරගෙන යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

දැඩි අපහසුතාවයක පත්වෙලා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වෙලා තිබෙන්නේ ඇඳිරිනීතිය වැටුණු නිසා.

08:28 පනියන්දූව අතුරු මාර්ගය කාණුව ඉදිකිරීම වෙනුවෙන් රු.437315.71/- ක් කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

මෙය ස්ථිර කරන ගමන්ම මා යෝජනා කරනවා අර කාණුව දමන්න තාර පාර කැඩිලා තිබෙන්නේ. අඩියයි අඟල් 6ක් වගේ පළලක්. එය නැවත ගොඩ කර අලුතෙන් තාර දමා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

හරි එය කර දෙන්නම්.

08:29 අම්බලන්ගොඩ මාදම්පා ගඟ අසල පිහිණුම් තටාකය අලුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ 10% ක රඳවුම් මුදල් රු.54,801.75 ක් නිදහස් කිරීම පෝරඹ ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී මගගගේ අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:30 මහජන ක්‍රීඩාංගනයේ ආපන ශාලාව පැත්තේ බැම්ම කපරාරු කිරීම වෙනුවෙන් රු.250,084.80 ක මුදලක් ඕකන්ද ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.31 මහජන ක්‍රීඩාංගනයේ බෝධි ප්‍රාකාරයේ තාප්පය බැඳීම වෙනුවෙන් රු.458,016.70 ක මුදලක් කළුවඩුමුල්ල සහජීවන ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:32 මහජන ක්‍රීඩාංගනයේ ලිඳෙහි යකඩ ආවරණය හා කොන්ක්‍රීට් පුවරුව ඉදිකිරීම වෙනුවෙන් රු.172,421.13 ක මුදලක් ඕකන්ද ප්‍රජා බල මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.33 නගර සභා ක්‍රීඩාපිටියේ දේවානන්ද විද්‍යාලය පැත්තේ තිබෙන කාණුවේ අලුත්වැඩියා කටයුතු කිරීම වෙනුවෙන් රු.440,344.60 ක මුදලක් කළුවඩුමුල්ල සහජීවන ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.34 මහජන ක්‍රීඩාංගනයේ නැරඹුම් වේදිකාව ඉදිකිරීම වෙනුවෙන් රු.1250000/- ක මුදලක් ඕකන්ද ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , එය ටිකක් බලන්න ඕන.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මේ 08.34 ගෙවිම මොකක්ද කියා බලන්න ඕනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

08.34 ගෙවීම් වාර්තාව දෙන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සාමාන්‍ය යෙන් මේ රු.1,250,000/= ක රවුම් ගණන් ගෙවිම ප්‍රශ්නයක්. ඒ නිසයි මෙය බැලුවේ. මේක කොහොම දාලා ද දන්නේ නැහැ. බිල ඇවිත් තිබෙනවා 1,330,927.14 ක මුදලක්. 90% කියා තිබෙනවා. 1,125,000/= ක මුදලක් කියා තිබෙනවා. මා එකයි බැලුවේ. එක මොකක්ද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේකේදි මෙහෙම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. දැනට එම ගොඩනැඟිලි ලිපිකාරිණියගේ ස්වාමි පුරුෂයා නාවික හමුදාවේ සේවය කරන පුද්ගලයෙක් බැවින් එතුමිය නිරෝධනයට පත්කරලා තිබෙන්නේ. එමනිසා මේ ලිපි ගොනු සම්බන්ධයෙන් අපට අවසාන මොහොත වනකම් පැමිණියේ නැහැ. දැනටත් නැහැ. එයා නිවාඩු පැමිණි ආපු නාවික සෙබළෙක්. වැලිසර කඳවුරේ සිටපු එක්කෙනෙක්. එමනිසා නිරෝධානයට ලක් කර තිබෙන්නේ. ලිපිගොනු අපට ලබා ගැනීමේදි අපට මෙහිදි ගැටළු සහගත වුණා. තාක්ෂණසේවා නිලධාරි මහත්වරු විසින් ලබා දෙන තත්ත්වය මත තමයි මේවා දමා තිබෙන්නේ. මෙතැන ගාන සංශෝධනය වෙලා එන්න ඔනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මෙය එකපාරටම බය වෙන්න ඇත්තේ රවුම් ගානක් පැමිණි නිසා. මෙහෙමයි ලේකම්තුමියණි. ලේකම්තුමිය තමයි නිර්දේශ කරන්නේ. එතකොට අධ්‍යනය කර එපායි නිර්දේශ කරන්න. එහෙම නම් පොඩි මේවා එකක් දමන්න ඔනේ මේ වගේ තත්ත්වයක් නිසා මෙය මේවා කරන්න කියා දැන ගත්තාම හරි. ගරු මන්ත්‍රීවරු ප්‍රශ්නයකට මුහුණ පානවා. අනිත් එක මෙහෙමයි කොන්ත්‍රාත් වැඩය කරලා ඒ මිනිහාත් ආමාරුවේ වැටෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
ඒ මනුස්සයාත් ආමාරුවේ වැටෙනවා. නැහැ ප්‍රශ්නයක් නැහැ. 1,300,000/= පැමිණ තිබෙනවා. 10% එකත් ඒ මනුස්සයාට අසාධාරණයක් වෙන්නේ. මෙහි අනුමත වෙලා තිබෙන්නේ 1,250,000 මේහි ගෙවන්න දමා තිබෙන්නේ

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්</u>**
ඒ කියන්නේ වැඩ නිමකරපු ආකාරයටද ?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
වැඩ නිම කර තිබෙනවා 1,330,927.14 ක මුදලක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා මහතා මෙයට පිළිතුරු දෙන්න. මෙය වැඩනිමකරන වැඩවල කොටසක් ගෙවීමයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
මා බැලුවා ඔයා 90% ක මුදලක් තමයි ගෙවන්න නිර්දේශ කර තිබෙනවා. අපි බැලුවේ මෙය සාමාන්‍යයෙන් රවුම් ගාණක් එන්නේ නැහැ. මෙතැන ගරු මන්ත්‍රීවරුත් බලනවා කොහෙන්ද ආවේ කියා. දැන් ආවාම තවත් එක්ලක්ෂ ගාණක් කොන්ත්‍රාත් කරුවාට අඩු වෙනවා. එකත් එතුමාට පාඩුවක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක අනුමත කරනවා.

09. ගිණුම් :-

**09.01 2020 පෙබරවාරි හා මාර්තු මාසයට අදාළ වියදම් වාර්තාව , පොදු ගිණුම් හා වියදම් වැය විශ්ලේෂණය සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි, පෙබරවාරි මාස වියදම් වාර්තාවේ තිබෙනවා. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩිය හා නඩත්තු කියා. එහි තිබෙනවා යුනයිටඩ් ග්ලාස් ප්‍රයිවඩ් ලිමිටඩ් කියා රු.130,000/= ක් ගෙවීමක් තිබෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේක මොකක්ද ? පෙබරවාරි මාසයේ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා කිරිම හා නඩත්තු . යුනයිටඩ් ග්ලාස් ප්‍රයිවඩ් ලිමිටඩ් රු.130,000/= ක් ගෙවිමක් තිබෙනවා. එය මොකක්ද ?

**තීරණය:-**

2020 පෙබරවාරි හා මාර්තු මසයට අදාළ පොදු වියදම් වාර්තාව , වියදම් වැය විශ්ලේෂණය හා 2020 පෙබරවාරි හා මාර්තු මස ලැබිම් විග්‍රහය පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රි ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

10 ඇස්තමේන්තු :-

**10.01 අම්බලන්ගොඩ බස් නැවතුම්පල පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකිරීම සඳහා (අදියර 01) රු.1,000,000/- ක ඇස්තමේන්තුව ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ බස් නැවතුම්පල පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකිරීම සඳහා (අදියර 01) රු.1,000,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.02 අම්බලන්ගොඩ නගර සභා වාහන නැවතුම් අංගනය ඉදිකිරීමට හල්වතුර නගර සභා ඉඩම වටා තාප්පය ඉදිකිරීම සඳහා වන රු.1,800,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා වාහන නැවතුම් අංගනය ඉදිකිරීමට හල්වතුර නගර සභා ඉඩම වටා තාප්පය ඉදිකිරීම සඳහා වන රු.1,800,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.03 අම්බලන්ගොඩ නගර සභාවේ දැනට පවතින වාහන අංගනයේ බිම් මහල අලුතින් ඉදිකිරීම(අදියර 01) සඳහා රු.15,000,000/-/- ක ඇස්තමේන්තුව ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාවේ දැනට පවතින වාහන අංගනයේ බිම් මහල අලුතින් ඉදිකිරීම(අදියර 01) සඳහා රු.15,000,000/-/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජ්.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.04 අම්බලන්ගොඩ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගේ ඉල්ලීම මත හල්වතුර කසල අංගනයේ කසල වැසීම සඳහා පස් දමා තුනීකිරීම සඳහා රු.900,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගේ ඉල්ලීම මත හල්වතුර කසල අංගනයේ කසල වැසීම සඳහා පස් දමා තුනීකිරීම සඳහා රු.900,000/-ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අර වෙළඳ සංකීර්ණයේ ඇස්තමේන්තුව පැමිණියේ නැද්ද? ගිය සභාවේත් පොරෝන්දු වුණා. ඊළඟ එකට දමනවා කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මොකක්ද ඒ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

දුම්රියපොළ අසළ වෙළඳ සංකීර්ණයේ අළුත්වැඩියාවක් තිබෙනවා. වතුර ගලන එකක්. ගිය සභාවේ පොරොන්දු වුණා. සභා වාර්තාවේත් තිබෙනවා. ඊළඟ වාර්තාවට දමනවා කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ දිනවල පොඩි ගැටළුවක් තිබෙනවා. සේවකයන්ගේ නිවාඩු ගැන්වීම් මත සමහර කට්ටිය පැමිණීම දුර්වලයි. ඊළඟ සභාවට දමන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අපි කියන දේවලුත් කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ . කරනවා. ඔබතුමා කියන දේවල් කරනවා. ඔබතුමා ඉල්ලන්නේ සාධාරණ ඉල්ලීමක් . ඒක කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

කවදාවත් අසාධාරණ ඉල්ලීමක් කරන්නේ නැහැ.

## 11. වෙනත් කරුණු

## 12. න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ වෙනත් කරුණු :

### 12.01 අම්බලන්ගොඩ ප්‍රා දේශිය සම්බන්ධිකරණ කමිටු තීරණ දැනුම් දිම සම්බන්ධව එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.02.11වන දින මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ ගරු රාජ්‍ය අමාත්‍ය මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවනාගාරයේ දී පැවැත්වූ අම්බලන්ගොඩ ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවේදි ගන්නා ලද තීරණ අනුව ඔබ සභාව වෙත වගකීම් පවරන ලද කරුණු පහත පරිදි වේ.

i අම්බලන්ගොඩ නගර සභාව තුළ පිහිටා ඇති ඇළ මාර්ග අවහිර විම හේතුවෙන් වර්ෂා කාලයේ දි ගංවතුර ගැලීමේ අවධානමක් ඇති වී ඇති බැවින් , ඔබතුමාගේ ද සහයෝගය ලබා දෙමින් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් එක්ව එම ඇළ මාර්ග ශුද්ධ කිරිම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

අර තෙල් ලබා ගැනීම සම්බන්ධව සභාවේ අවසරය ඉල්ලා සිටනවා.

ii අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට ඇති බිම් තිරුව කාර්යාලය වෙත පැමිණෙන මහජනතාවට තම වාහන නවතා තැබිය හැකි පරිදි ක්‍රමානුකූලව සකස් කිරිම. එය තාක්ෂණසේවා නිලධාරි මහතාණෙනි, එය ගිහින් ඇස්තමේන්තු කරන්න. මොකක්ද කියා. ප්‍රාදේශීය ලේකම්තුමිය මුණ ගැසි මොකක්ද කරන්න ඕනේ කියා එය කර දෙන්න.

Iii අයාලයේ යන සුනඛයන් වර්ධනය වීම තුළින් ජලභිතිකා රෝගය ව්‍යාප්ත වීමේ අවධානමක් ඇති බැවින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සහ ප්‍රාදේශීය සභාව එක්ව අයාලයේ යන සුනඛයන් වර්ධනය වීම පාලනය කිරිම සඳහා නිති ක්‍රමවේදයක් සකස් කිරිම.

සුනඛයන් හොඳට නාවා, කන්න බොන්න දිලා හොඳට බලාගත හැකි. සුද්දන් ඇවිත් සුනඛයන්ට කවයි. දැන් මෙහෙම එකඟ නැද්ද? පොඩි පොඩි සුනඛයන් සුරැකිමේ මධ්‍යස්ථාන තමන්ගේ කොට්ඨාශ තුළ පිහිටු වීම. කොට්ඨාශය තුළ සිටින සුනඛයන් අල්ලා එයට දමනවා. ඒ කියන්නේ පොල්වත්ත ප්‍රදේශයේ සුනඛයන් සිටිනවා ඒ අය එකට දමනවා. පටබැඳිමුල්ලේ සුනඛයන් ටික පටබැඳිමුල්ලේ සුනඛයන් සුරැකිමේ මධ්‍යස්ථානයේ දමනවා. එකඟද ? මේ සඳහා උදවු කරන රාජ්‍ය නොවන සංවිධාන රාශියක් සිටිනවා. සුනඛයන්ට කන්න බොන්න දිලා වියදම් කරන්න හදන්න කට්ටිය ඉන්නවා. මෙය කොච්චර වුණත් ප්‍රශ්නයක්නේ. දැනට සාමාන්‍ය ගණනය අනුව ජනතාවගෙන් අට දෙනෙකුට එක සුනඛයකු සිටිනවා කියා ගණනය කර තිබෙනවා. ඒ කියන්නේ අම්බලන්ගොඩ නගරයේ ජනගහනය 24000 නම් සුනඛයන් 300ක් සිටිනවා. අන්න එක තේරුම් ගන්න. සුනඛයන් 300ක් අවිදිනවා. ඉතිං අපි කොට්ඨාශ 10ට තැන් 10ක් හදලා දෙන්නම්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් . සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ඔය හල්වතුර එකේ දැම්මාම මොකද ප්‍රශ්නය වෙන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

හල්වතුරේ නෙමේ අපි දැන් දැම්මට යෝජනා කළේ තල්ගස්ගොඩ. අපි හදලා තිබු තැනක් තිබෙනවා. එතනයි මේවා කළේ. කොම්පොස්ට් මේක හදා තිබෙන්නේ. අනිත් එක පාශු වෛද්‍ය මේක එයට එකඟත්වය ආවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ඉතිං පාශු වෛද්‍ය කාර්යාලයේ අයට දමා ගන්න කියන්න සුනඛයන්ව.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

නැහැ තල්ගස්ගොඩ සුනඛයන් ටික වත් එකට දමන්න.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

තල්ගස්ගොඩ ප්‍රදේශයේ දමන්න . අනිත් ඒවා හදා ඉන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ගරු මන්ත්‍රිවරු තමන්ගේ කොට්ඨාශය ඇතුළේ සුනඛයන් සුරැකිමේ මධ්‍යස්ථානයක් හදන්න එකඟතාවය තිබෙනවාද?

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, තමන්ගේ කොට්ඨාශයේ සුනඛයන් විතරයි ගෙන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මුලින්ම පටබැඳිමුල්ල කොට්ඨාශයේ හදන්නම්. මා හදන්නම් . කන්න දෙන්න.

මිනිසුන් හොයා දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ බලය පාවිච්චි කරලා එය හදන තැන හදන්න. එක එක්කෙනාගෙන් අහා අහා ඉන්න ඕන නැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එහෙම කතා කරන්න එපා ඔබතුමා. එක එක්කෙනාගේ කතා කියන්නේ. අපි මහජනතාව වෙනුවෙන් මෙතනට ඇවිත් ඉන්නේ. එහෙම කතා කරන්න බැහැ. එහෙම කොහොමද කතා කරන්නේ. එහෙනම් ගරු මන්ත්‍රීවරු අවශ්‍ය නැහැනේ. බලය පාවිච්චි කරනවානේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

නිශ්චිත තැනක් තිබෙනවා තෝරලා . මගේ වචනය වැරදි වෙන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා මා සභාව දැනුවත් කරන්න එපා. අපිට තිබෙන්නේ අම්බලන්ගොඩ නගර සභාවත් පාශු වෛද්‍ය කාර්යාලයත් දැනට පාශු වෛද්‍ය කාර්යාලයටත් බලය පවරා තිබෙනවා ජලභීතිකා රෝගය සම්බන්ධයෙන් රෝග නිවාරණය කිරිම. ඒ අවස්ථාව වන විට පාශු වෛද්‍ය කාර්යාලය ගෙනවිත් තිබෙන්නේ ඒ අනුව අම්බලන්ගොඩ දඩවතේ යන සුනඛයන් සුරැකිමේ මධ්‍යස්ථානයකට රැස් කරලා මැරෙන තුරු කන්න බොන්න දිලා ඔවුන් රැක බලා ගැනීමේ මධ්‍යස්ථානයක් සැදිම සඳහා නගර සභාවත් අම්බලන්ගොඩ පාශු වෛද්‍ය කාර්යාලයත් එකඟතාවයකට ආවා අම්බලන්ගොඩ THW නිවාස යෝජනා ක්‍රමයේ ඇති කසළ බැහැර කිරිම සඳහා සාදන ලද කොම්පෝස්ට් අංගනය. හදන ලද ගොඩනැඟිලි ටික අතහැර දමා දැන් පාළුවට ගිහින් තිබෙන්නේ. එකට දමා මේ අය නිරෝධනය කරන්න කියා. නමුත් ඒ අවස්ථාවේ අපේ මන්ත්‍රීවරුන්ගෙන් පැමිණි විරෝධතාවය මත එක අපි අතහැරියා. ඒ සඳහා දෙපාර්තමේන්තුවෙන් වෛද්‍යවරයෙක් , කාර්ය මණ්ඩලය , ඒ සඳහා අවශ්‍ය සේවකයන් ඒ සඳහා අවශ්‍ය ගොඩනැඟිලි පහසුකම් සඳහා මුදල් ආදි සියල්ලම වෙන්කිරිමට එකඟතාවය ඇවිත් තමයි මුදල් වෙන් කළේ. නමුත් අපි කල්පනා කල යුතු වෙනවා. වෙනදා අපි කළේ සුනඛයන් මරන එක. දැනට රජය විසින් ජලභීතිකා රෝගය වැලැක්විමට බල්ලන් මැරිමට ගන්නා බෙහෙත් ලබා දෙන්නේ නැහැ. දැන් එමනිසා අපි දඩාවතේ යන බල්ලන් අල්ලා යම් සුරැකිමක් කරලා ඔවුන් මැරෙනතුරුම රැක බලා ගැනීමක් කරන්න වෙනවා. තමන්ගේ කොට්ඨාශයේ සිටින සුනඛයන් සුරැකිම සඳහා පොඩි ස්ථානයක් හදා දෙන්නම්. එතැන කන්න බොන්න දිලා ඒ අය සුරැකිමට හදා ගන්න. අදාල නාගරික මන්ත්‍රීවරයා එම සුනඛයන් සුරැකිමට වැඩ පිළිවළක් ඇති කර ගත යුතුයි.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, ඕක කෙරෙන්න ඕන දෙයක් අපි කතා කළාට. යම් ගැටළු සහගත තත්ත්වයන් තිබෙනවා. දැන් රැයකට මනුස්සයකුට පාරේ යන්න බැරි තත්ත්වයක් තිබෙනවා. එක ඇත්ත කතන්දරය. සුනඛයන් සිටිනවා පාරක 15ත් 20ක් විතර. යන්න තියා මිනිසුන් වටකර ගන්නවා. එහෙම ප්‍රශ්නයකුත් තිබෙනවා. විහිළුවකට නෙමේ. මොනවා හරි ක්‍රමවේදයක් එන්න ඕනේ. මොකක් හරි ක්‍රමවේදයක් එන්න ඕනේ. සුනඛයන්ට කෑම දීම ආදි එවත් බලන්න එපැයි. දඩාවතේ යනවිට කොහොන් හරි කාලා බිලා ඉන්නවා. නමුත් දැන් එක තැනකට දමා ගත්තායින් පසු එවත් බලන්න වෙනවා.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඒවා බලන්න ඕන. බෙහෙත් ටික දෙන්න ඕන. වද සැත්කම කරන්න ඕන. ඒවා සියල්ලම කරන්න ඕන.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

මේ අහන්නකෝ කොහොමත් අපට පිස්සුනේ. තල්ගස්ගොඩ තමයි හෙඳම ප්‍රදේශය. අර වතු තිබෙනවා. කවුරුත් යන්නෙත් නැහැ. ඔය වත්තක් සල්ලි වලට අරගෙන හරි එය නඩත්තු කළානම් හොඳයි.  ඔය රාජ්‍ය නොවන සංවිධාන හරි මුදල් දෙනවා නම් මෙයාගේ කොට්ඨාශය අයින් කරලා හරි හදන්න. එතකොට ප්‍රාදේශීය සභාව පැත්තට හරි එය හදන්න. ගරු සභාපතිතුමනි, ඒක බලන්න. එක හොඳයි. අපේනම් සුනඛයන් කොහොමත් සුසානභූමියේ ඉන්නේ.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

දැන් හරි අපි එකඟතාවය ලැබුණා. ඒ අවශ්‍ය තැන්වලදී මුදල් වියදම් කිරීමේ අයිතිය දැන් පැවරෙනවා. ඒ අනුව ඉදිරියට කටයුතු කරන්න.

ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්

මට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මට පොඩි පැහැදිලි කිරීමක් අවශ්‍යයි. ඔබතුමා කියන විදියට දැන් කන්න බොන්න කට්ටිය ඉන්නවා. එතකොට බෙහෙත් විදින්න ඉන්නවා. අපිට කොටසක් නැහැ නේද? අපි ගිහින් බෙහෙත් දෙන්න අරවා මේවා නැහැ නේද?

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඔබතුමා තමයි එහි සංවිධායකතුමා.

ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්

සංවිධායක වෙන්න පුළුවන්.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මටනම් බැහැ. මට බැහැ සංවිධායක වෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මට ඔබතුමා පැහැදිලි කරන්න. මේක වෙන්නේ කොහොමද කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ගමේ සිටින දඩාවතේ යන සුනඛයන් එකතැනකට එකතු කළාට පසු අපි පාශු වෛද්‍ය හරි මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ලවා හරි අනිවාර්යෙන්ම වඳ සැත්කම කළ යුතු වෙනවා. වඳ සැත්කම කළාට පසු අපට මරන්න බැහැ. එම සුනඛයා මැරෙනකම් කන්න බොන්න දීලා තියාගෙන ඉන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

කවුද ඒ කන්න බොන්න දෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක සංවිධානය කිරිම අප සතු වගකිමක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ඔබතුමා කලින් කිවුවානේ ඒ අය කැමතියි . කවුද කරනවා කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙම කරන්න රජයේ පාශු වෛද්‍ය දෙපාර්තමේන්තුව භාර ගෙන එකඟ වුණා. ඔබතුමලා එයට එකඟතාවය ඒ දවස්වල පල කළේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එතකොට දැන් එක ඉවරයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක ඉවරයි. දැන් මේ කියන්නේ තමන්ගේ කොට්ඨාශය තුල සිටින සුනඛයන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මට වෙන වැඩක් කරන්න වෙන්නේ නැහැ. සුනඛයන් බුරනවායි , සුනඛයන් මැරිලායි , ඌන් කුණු වෙලයි . දැනටත් මේ පාරේ යන සුනඛයන් මිය ගියාම කොළඹට දුරකථන ඇමතුම් දෙනවා අස් කරන්න කියා. ඕක දා ගත්තොත් අපිට වෙන වැඩක් කරන්න හම්බ වෙන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

රාජ්‍ය නොවන සංවිධානයක් මා සමඟ ඇවිත් සාකච්ඡා කර තිබෙනවා. මේ වගේ තැනක් දෙන්න. ඒ අය එම වියදම දරන්නම් කියා. එක දරයි. අපිට තිබෙන්නේ සංවිධානය කර හදන්න ඕනේ. ඒ අය සුනඛයන්ට කන්න දෙන එක නාවන එක ඔක්කොම කර දමයි.

**ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, පොල්වත්තේ නම් ඔය මධ්‍යස්ථානය හදන්න ඉඩක් නැහැ. එමනිසා අපි එක හදන්න දෙන්නේ නැහැ. ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා හා මාත්.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, සුනඛයන් සුරැකීමේ මධ්‍යස්ථානය කොට්ඨාශ මට්ටමින් කරන එක අසාර්ථකයි. මෙය එක ස්ථානයක කරන්න. අපේ අම්බලන්ගොඩ ඉඩම් තිබෙන්නේ තල්ගස්ගොඩ. මා තල්ගස්ගොඩ හදන්න කියන්නේ නැහැ. ඔබතුමා තීරණයක් අරගෙන සභාව දැනුවත් කරලා හොඳ තැනක් අපි මේවා කර ගන්න. එතකොට එක්කෙනෙක් අකමැති වුණා කියා නෙමේ. දැන් කොහොත්ම කරන්න බැරි කොට්ඨාශ තිබෙනවානේ. එමනිසා මේ සුනඛයන් සුරැකීමේ මධ්‍යස්ථානය අපි සභාවක් තැනක් තීරණය කර සාදා ගන්න. එක්කෙනෙක් විරුද්ධයි කියා එහෙම සද්දේ දාලා එහෙම කරන්න බැහැ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. මා කලින් සභාවෙත් ප්‍රකාශ කළා. තල්ගස්ගොඩ හදන්න එන්න එපා ඒක. තල්ගස්ගොඩට සුනාමි නිවාස දෙසිය ගණනක් ගෙනහින් දමා තිබෙන්නේ. එතැන හදන්න එන්න එපා. එමනිසා මා විරුද්ධතාවය ප්‍රකාශ කරනවා. පුළුවන්නම් හදන්න එන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, කොට්ඨාශ මට්ටමින් කළාට අපිට හිරේවත්ත කොට්ඨාශයේ ඒ වගේ දෙයක් හදන්න ඉඩක් නැහැ. ඔගොල්ලන් ඔය කියන විදියට ඔය පාලනය කෙරෙන්නේ නැහැ. ඔබතුමා තීරණයක් ගන්න. අපේ ඉඩම් තිබෙනවා හැම තැනම. මා මේ පුද්ගලිකව නමක් කියන්නේ නැහැ. ඔබතුමා ඉඩමක් ගන්න යෝජනා කරන්න. ගන්න අපි ඡන්දයකට යන්. එහෙම ඡන්දය විමසා එය කරන්න. මොකද හොඳ දෙයක්නේ කරන්නේ. හොඳ යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මා කියන්නේ එය කරන්න කියා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා කියන්නේ දැන් නගර සභාවට අත්පත් කරගෙන තිබෙනවා අක්කර 248ක්. ඔය වගේ තැනක් සොයා වට මායම් මේවා කර දමන්න. සභාවට දමන්න. යෝජනාව අපි ස්ථිර කරන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා නම් යෝජනා කරන්නේ ඔය ජනතාවටත් කරදරයක් නෙවෙන්න ඕනේ. මොකද සුනඛයන්ගෙන් කරදර වෙනවා. එමනිසා ජනතාව නැති තැනක ඇත්තටම නිදහස් තැනක. කොහොම හරි මෙය කෙරෙන්නත් ඕන. සුනඛයන් සුරක්ෂිත කරන එක අපි කළ යුතුයි. මොකද ඌන්ගෙන් කරදරයක් ඇති වුණොත් එහි වගකීමත් සභාව භාර ගන්න වෙනවා. එමනිසා මෙය කියවා කියවා ඉන්නේ නැතිව මෙය කරන්න. ජලභීතිකාව වැළදුනොත් ඒ වගකීමත් අපි සභාව භාර ගත යුතු වෙනවා. එමනිසා සුනඛයන් සුරැකීම ගැන කාටවත් ඇඟ බේර ගන්න බැහැ එකෙන්. එමනිසා ජනතාවටත් කරදරයක් නොවන ස්ථානයක ඕක හැදෙන්න ඕන. ඔය සුනඛයන් සුරැකින්න ගිහින් ජනතාවට ප්‍රශ්නයක් වුණොත් එහෙම ඊට වඩා ප්‍රශ්නයකි. එමනිසා නගර සභාවට නතු කර ගන්න පුළුවන් හුදෙකලා බිමක් සොයා ගන්න. සොයා ගෙන මෙය සංවිධානය කර මේ වැඩය කරන්න. කල් දම දමා ඉන්නත් එපා. මේ වැඩය තීරණය කරලා සභාවට දමා එය කරන්න. මෙය කරන්න ඕන වැඩක්නේ. නැතිනම් සුනඛයන් නිසා කරදර වුණොත් එහෙම මේ විදියට කතා කරන්න හම්බ වෙන්නේ නැහැ. අම්මා තාත්තා මතක් කර තමයි මිනිසුන්ගෙන් බැණුම් අහන්න වෙන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ඕක පාශු වෛද්‍ය නිලධාරිටත් , මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිටත් අයිති දෙයක්නේ. ඒ දෙන්නාගෙන් නිර්දේශයක් ගන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

වෙලා තිබෙන්නේ මෙහෙමයි. ජලභීතිකා රෝගය පැතිර වීම වැලැක්වීම අපේ පණතේ අඩංගුයි. එහිදි අර එන්නත් කිරිම කියන කොටස පවරා තිබෙනවා මේ කියන අවස්ථාව වන විට පැවරුවා රජයේ පාශු වෛද්‍යයට. ඒක දැන් නැවත පවරා තිබෙනවා මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිට.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ඒ දෙන්නා එක්ක සාකච්ඡා කර අපට සුදුසු ස්ථාන තුන හතරක නිර්දේශ දෙන්න කියන්න. මේ ගරු මන්ත්‍රිවරු කාගේවත් විරෝධතාවයක් නැති තැනක් තෝරලා ගන්න. කාගේවත් විරෝධතාවය මත කරන්නත් බැහැනේ. මන්ත්‍රිවරයා ගෙන එනු ලබන්නේ ජනතාවගේ විරෝධතාවයනේ. මන්ත්‍රිවරයා ලසන්ත මහතා හෝ මෙයා හෝ මම හෝ පුද්ගලික විරෝධතාවයක් නෙමේනේ. ජනතාවගේ විරෝධතාවයනේ මේ ඉදිරිපත් කරන්නේ. ආණ්ඩුවක් වශයෙන් අපිත් අපහසුතාවයට පත්වෙනවානේ. හැබැයි වෛද්‍යවරුන්ගේ නිර්දේශ අනුව කොහේ හරි තැනක් තිබුණොත් මෙය ස්ථාපනය කරන්න පුළුවන්නේ. මෙය අත්‍යවශ්‍ය කාරණයක් නිසා. උත්සාහයක් ගන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දැනට එක ස්ථානයක සුනඛයන් සුරැකීමේ මධ්‍යස්ථානයක සුනඛයන් රැඳවීමට ඉඩ මදි වන නිසා කොට්ඨාශ මට්ටමින් ඉඩ තිබෙන තැන් කිහිපයක් නියම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම හොඳයි. මේ වනවිට වන්ධ්‍යාකරණ සැත්කම සඳහා පාශු වෛද්‍ය නිලධාරියට බලතල පැවරි ඇති නිසා අපේ ගම්වල සංවිධානය කර දෙන්න සුදානම්. එමනිසා අපේ ප්‍රදේශවල වන්ධ්‍යාකරණය සංවිධානය කර දෙන්න පුළුවන්ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වද සැත්කම කරන්න පුළුවන්ද ? අර සුනඛයා අල්ලන එක්කෙනෙක් ඉන්නවා. එයා හැමෝටම පුරුදු නැහැ. එමනිසා එම සුනඛයන් අල්ලන ලංකාවේ දෙදෙනෙක් තුන්දෙනෙක් ඉන්නේ. අන්න එගොල්ලන් ගෙන්වා ඕනේ කරන්න. එය මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිණිය සමඟ සාකච්ඡා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

වාහනයෙන් ගිහින් සුනඛයා අල්ලාගෙන ඇවිත් වද සැත්කම කර නැවත සුනඛයා ගෙනත් දමනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ රාජ්‍ය නොවන සංවිධානයක්.

**තීරණය-**

2020.02.11 දින අම්බලන්ගොඩ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී ගත් තීරණ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවා ඇති ලිපිය අනුව නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ඇළ මාර්ග අවහිරවීම හේතුවෙන් වර්ෂා කාලයේදී ගංවතුර ගැලීමේ අවධානමක් ඇති බැවින් ඇළ මාර්ග ශුද්ධ කිරීම සඳහා අවශ්‍ය සහයෝගය (ඉන්ධන) ලබාදීම සුදුසු බවටත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට ඇති බිම් තීරුවේ කාර්යාලය වෙත පැමිණෙන මහජනතාවට වාහන නවතා තැබිය හැකි පරිදි ක්‍රමානුකූලව සකස් කිරීමට සභාවේ තාක්ෂණ සේවා නිලධාරී මහතාගේ සහයෝගය ලබාදීම සුදුසු බවටත්, අයාලේ යන සුනඛයන් වර්ධනය වීම පාලනය කිරීම සඳහා අදාළ සැත්කම් කිරීමට අවශ්‍ය කටයුතු සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සමග සාකච්ඡා කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.02 පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් තුමා විසින් එවා ඇති ඇති ලිපිය සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පාර්ලිමේන්තු මැතිවරණය 2020 . පාර්ලිමේන්තු මැතිවරණ අපේක්ෂයින් ලෙස ඉදිරිපත් වන පළාත් පාලන ආයතන ප්‍රධානීන් / සභිකයින් රාජ්‍ය දේපළ අවභාවිතාවෙන් වැළැක්වීමේ අවශ්‍යතාවය. මෙයට චක්‍ර ලේඛයක් නිකුත් කර තිබෙනවා. මේ චක්‍ර ලේඛණය ගොඩක් වැදගත් වෙන්නේ ඡන්දය ඉල්ලන අපේක්ෂකයින් දෙදෙනෙකුට. අපේ ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතාටත් , ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මියටත්

මෙහි පිටපත් යවන්න. ඒ අනුව මෙය සියළු දෙනාම දැන ගැනිමට අවශ්‍ය නැහැනේ. මෙය ඒ අයට යැව්වාම ඇති. මෙහි තිබෙන්නේ රජයේ දේපළ අවභාවිතයේ කරන එක වලක්වන එක. දැනට එක ගැටළුවක් නැහැ. මාගේ යුතුකමක් මේක දැනුවත් කිරිම. දැනුවත් කිරිම සඳහා මෙය යවනවා.

**තීරණය**

**පාර්ලිමේන්තු මැතිවරණ අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් වන පළාත් පාලන ආයතන ප්‍රධානීන්/ සභිකයින් රාජ්‍ය දේපළ අවභාවිතාවෙන් වැලැක්වීමේ අවශ්‍යතාව** යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය ගරු සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කළ අතර , 2020 පාර්ලිමේන්තු මැතිවරණ අපේක්ෂකයින් වන ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතාට සහ ගරු නගර සභා මන්ත්‍රිනී මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මියට එම ලිපියේ පිටපත් යැවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් තීරණය කරන ලදී.

## 12.03 නව කෙරෝනා වෛරසය හේතුකොට ගෙන, උද්ගත ව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධාරින්ට සහන සැලසිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නව කෙරෝනා වෛරසය හේතුකොට ගෙන, උද්ගත ව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධාරින්ට සහන සැලසිම.2020.0326 දිනැතිව නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 07/2020 හි 2 වගන්තිය ජනාධිපති විධානයකට අනුව පිහිටුවා ඇති නව කොරෝනා වෛරස් තත්ත්වය ශ්‍රි ලංකාවෙන් තුරන් කිරිමේ කාලය තුළ ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ භාණ්ඩ, සේවා හා අනෙකුත් පහසුකම් අඛණ්ඩව සැපයීම මෙහෙයවිම, අධික්ෂණය සහ පසු විපරම පිණිස පත්කර ඇති ජනාධිපති කාර්ය සාධක බලකායේ උපදෙස් අනුව පහත පරිදි සංශෝධනය කෙරේ. එහි දෙවැනි වගන්තිය සංශෝධනයකර තිබෙනවා. 2020 අප්‍රේල් මස වැටුව , අප්‍රේල් මස 08 දින ගෙවිමට කටයුතු කරන අතර, පවත්නා සුවිශේෂි තත්ත්වය සැලකිල්ලට ගෙන සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද සඳහා වන උත්සව අත්තිකාරම් අනියම් හෝ අදේශක පදනම මත සේවය කරන අයට පමණක් ගෙවිමට කටයුතු කරනු ඇති බවට කියා තිබෙනවා. එය සභාවේ දැනුවත් කිරිම පිණිස ඉදිරිපත් කරනවා.

**තීරණය-**

**නව කොරෝනා වෛරසය හේතුකොට ගෙන උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම** යන මැයෙන් රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් එවා ඇති ලිපිය ගරු සභාවේ දැනගැනීම පිණිස ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**12.04 2020 වර්ෂය සඳහා පරිගණක අලුත්වැඩියා උපාංග හා පරිගණක අලුත්වැඩියා සේවාව ලබා ගැනීම සඳහා මිළ ගණන් කැඳවීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

2020 වර්ෂය සඳහා පරිගණක අලුත්වැඩියා උපාංග හා පරිගණක අලුත්වැඩියා සේවාව ලබා ගැනීම සඳහා මිළ ගණන් කැඳවීම. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය-**

2020 වර්ෂය සඳහා පරිගණක අලුත්වැඩියා උපාංග හා පරිගණක අලුත්වැඩියා සේවාව ලබාගැනීම සඳහා මිලගණන් කැඳවීමට අනුමැතිය ඉල්ලා තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර එස්.රේණුකා නිලන්ති මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ඒ සඳහා අනුමැතිය ලබාදිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.05 පරිගණක ජාලකරණ පද්ධතිය ස්ථාපනය කිරිම සඳහා අවශ්‍ය උපාංග හා සේවාවන් සඳහා මිළ ගණන් කැඳවීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පරිගණක ජාලකරණ පද්ධතිය ස්ථාපනය කිරිම සඳහා අවශ්‍ය උපාංග හා සේවාවන් සඳහා මිළ ගණන් කැඳවීමටත් සභාවේ අවසරය ඉල්ලා සිටිනවා. මේ ආයතනය ඉහළ මහල සඳහා ගෙන යාමේදි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අර පරිගණක ජාලකරණය ස්ථාපනය කිරිමේදි සෑම මේසයකටම අවශ්‍ය ස්විච් ප්ලාග් අවශ්‍ය දේවල් දිගටම එනවානේ. බිත්ති කඩ කඩා නැවත ගහනවා. එහෙම නැතිනම් මේස උඩට ප්ලාග් ගහන විට පරිගණකය සුමානෙන් අවසන් වෙනවා. එමනිසා එම ප්ලාග් බෙස් හැම මේසයකම අයිනට වෙන්න සවි කරන්න. බිත්තියටම සවි කළහොත් උස්ස උස්සා ගෙන යනවිට ගලවා ගෙන යනවා. ආයතනයක් එහෙම පවත්වාගෙන යන්න බැහැනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>

එහෙම ප්ලාග් පොයින්ට් තිබෙන මේස තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒවා සියල්ලම අපි දැම්මා. අපි දැන් දැනුම් දීලා තිබෙනවා කාර්යාලයේ සැලැස්ම පිළිබඳව. ජාත්‍යාන්තර සැලසුම් ශිල්පියෙකුගෙන් උපදෙස් ගන්න කියා. ඒ සඳහාත් සභාවෙන් අනුමැතිය ඉල්ලා සිටිනවා. ඒ අනුව තමයි ක්‍රියා කරන්නේ. දැනට තිබෙන තත්ත්වය අනුව උඩ තට්ටුවට යාමේදි අපි කලින් සභාව තිබෙන රැස්වීම් ශාලාවේ මෙම රැස්වීම තැබීමට ඉඩ මදියි. එමනිසා අර පිටුපස කෑල්ල හදනකම් තවදුරටත් මෙතනට තබා ගන්න වෙනවා. එමනිසා අපි කල්පනා කළා. ඒ තුළ ගරු සභාපති, උප සභාපති, ලේකම් , ගණකාධිකාරි ස්ථාන ගත කරන්න ඇතුළත. එමනිසා කාර්යාලය තුළ තවත් ඉඩ කටයුතු වැඩි වෙනවා. ඒ අනුව කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එහි ගරු මන්ත්‍රීවරුන් පැමිණියත් වාඩිවෙන්න තැනක් තියන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දෙන්නම්.

**තීරණය-**

පරිගණක 35 කින් සමන්විත වූ පරිගණක ජාලකරණ පද්ධතිය අලුතින් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය උපාංග හා සේවාවන් ලබාගැනීම සඳහා මිලගණන් කැඳවීමට අනුමැතිය ඉල්ලා තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර එස්.රේණුකා නිලන්ති මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.07 ඩෙංගු ව්‍යාප්තිය වැඩිවීමේ ප්‍රවණතාව පිළිබඳව දැනුවත් කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ අනුව පසුගිය වර්ෂවලදි ඩෙංගු ව්‍යාප්තිය සලකා බැලිමේදි අවුරුද්දේ මෝසම් වර්ෂා කාලයෙන් පසු එනම් මැයි , ජුනි සහ ජුලි මාස වලදි සිඝ්‍ර වැඩිවිමක් දක්නට ලැබිණි. ඒ අනුව පවත්නා මෝසම් වර්ෂා තත්ත්වය සමඟ ඉදිරියේදි දිවයින පුරා මදුරු ව්‍යාප්තියේ සිඝ්‍ර වැඩිවිමක් දක්නට හැකි බව ජාතික ඩෙංගු මර්ධන ඒකකය මගින් පුරේකථනය කර ඇත. දිවයිනේ මේ වන විට පවත්නා කොවිඩ් 19 වසංගතය තත්ත්වය සමඟ ඩෙංගු රෝගය පැතිර ගියහොත් සෞඛ්‍යමය වශයෙන් රට මුහුණ දෙන ඉතාමත් අවධානම් දුෂ්කර තත්ත්වය පිළිබඳ සලකා

බලා තම පළාත් පාලන ආයතන සීමාවතුළ ඩෙංගු ව්‍යාප්තිය වැලැක්වීමට පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කරන මෙන් කාරුණිකව දන්වා සිටි.

a) මදුරු ව්‍යාප්තිය සඳහා බලපාන භාජන , වැහිපිලි, කාණු, වැනි දේ පවිත්‍ර කර තම නිවාස මදුරුවන් බෝ නොවන පරිදි පවත්වා ගෙන යන ලෙසට ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් මහජනතාව දැනුවත් කිරිම.

b) කොවිඩ් 19 වසංගත තත්ත්වය මත ජන ශූන්‍ය ව පවතින පොදු ස්ථාන ( පාසැල්, ආගමික ස්ථාන , බස් රථගාල , සුසාන භූමි, පොදු වෙළඳ පොළ , පොදු ක්‍රීඩාංගණ , වෙනත් ) අදාල පළාත් පලාන ආයතනය මැදිහත් වීමෙන් පිරිසිදු කිරිමට කටයුතු කිරිම.

c) තම පළාත් පාලන ප්‍රදේශ සිමාවන් තුළ පවතින ඉදිකිරිම් පරිශ්‍ර වල ඩෙංගු රෝග ව්‍යාප්තිය පිළිබඳ සොයා බැලිම සහ ඒවා පිරිසිදු කිරිම පිළිබඳව අදාල හිමිකරුවන් දැනුවත් කිරිම.

d) වැසි ජලය එකතු කිරිම සඳහා යොදා ගන්නා ජල ටැංකි නිසි පරිදි පිරිසිදු කිරිම පිළිබඳව ජනතාව දැනුවත් කිරිම.

e) තම පළාත් පාලන ප්‍රදේශ සිමාවන් තුල පවතින රාජ්‍ය ආයතන පරිශ්‍ර මදුරු ව්‍යාප්ත නොවන පරිදි පවත්වා ගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබා දීම. යන කරුණු කරන්න කියා තිබෙනවා. මේ සම්බන්ධයෙන් සභාව දැනුවත් කරනවා. අපේ මහජන සෞඛ්‍ය පරික්ෂකතුමාට ඒ සඳහා වැඩ සටහනක් ඉදිරිපත් කර එය කරන ලෙස අප ඉල්ලා සිටිනවා.

**තීරණය-**

**ඩෙංගු ව්‍යාප්තිය වැඩිවීමේ ප්‍රවණතාව පිළිබඳව දැනුවත් කිරීම** යන මැයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් එවා ඇති ලිපිය ගරු සභාවේ දැනගැනීම පිණිස ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කළ අතර, ඒ අනුව බල ප්‍රදේශයේ ඩෙංගු ව්‍යාප්තිය වැලැක්වීමට වැඩපිළිවෙලක් සකස් කර අවශ්‍ය කටයුතු සිදුකිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා හට දැන්විය.

## 12.07 නගර සභා ක්‍රීඩාංගණයේ ජල පොම්ප කුටීරය සඳහා ඇම්පියර් 63 තෙකලා විදුලි සැපයුම ලබාගැනිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

නගර සභා ක්‍රීඩාංගණයේ ජල පොම්ප කුටීරය සඳහා ඇම්පියර් 63 තෙකලා විදුලි සැපයුම ලබාගැනිම සම්බන්ධව. උක්ත කරුණට අදාලව ලංකා විදුලි පුද්ගලික සමාගමේ විදුලි ඉංජිනේරු මහතා ලබා දුන් උපදෙස් පහත පරිදිවේ. විදුලි උපාංග පද්ධතිය නිසි පරිදි සවිකර ඇති බවට Chartered Engineer වාර්තාවක් ලබා ගත යුතු බව පවසන ලදි. එසේම එම වාර්තාව සමඟ අම්බලන්ගොඩ විදුලි පුද්ගලික සමාගමට ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. ඒ

අනුව ගාල්ල විදුලි පුද්ගලික සමාගම ප්‍රධාන කාර්යාලයේ Chartered Engineer මහතා හෙට දිනයේ පැමිණ එම වාර්තාව ලබා දෙන බවට ප්‍රකාශ කරන ලදි. එම වාර්තාව ලබා දීමට ගාස්තු ලෙස රු.17000/=ක පමණ මුදලක් වැයවන බව දන්වන ලදි. එම වාර්තාව ලබා දුන් පසු අදාල මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන මෙන් ඉල්ලා සිටිනවා. නැතිනම් එක ගන්නේ නැතිනම් අපිට මෙය ගන්න බැහැනේ. එය අනුමතයි.

**තීරණය-**

නගර සභා ක්‍රීඩාංගනයේ ජල පොම්ප කුටීරය සඳහා ඇම්පියර් 63 තෙකලා විදුලි සැපයුම ලබාගැනීමට ගාල්ල විදුලි පුද්ගලික සමාගමේ ප්‍රධාන කාර්යාලයේ Charted Engineer මහතාගෙන් වාර්තාවක් ලබාගත යුතු බවත් ඒ සඳහා වාර්තාව ලබාදීමේ ගාස්තු ලෙස රු.17000/- ක මුදලක් ගෙවීමට සිදුවන බවත් සඳහන් කර තාක්ෂණ සේවා නිලධාරී සඳුන් ගුණවර්ධන මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම මුදල ගෙවීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.08 2020 කොවිඩ් 19 වසංගත හේතුවෙන් දැනට වසා ඇති බැඩ්මින්ටන් ක්‍රිඩාංගණයට අදාළ බදු මුදල් වලින් නිදහස් කර ගැනිමට කරනු ලබන ඉල්ලීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020 කොවිඩ් 19 වසංගත හේතුවෙන් දැනට වසා ඇති බැඩ්මින්ටන් ක්‍රිඩාංගණයට අදාළ බදු මුදල් වලින් නිදහස් කර ගැනිමට කරනු ලබන ඉල්ලීමයි. ඒ අනුව ඔවුන් ඉල්ලා සිටිනවා මේ කොවිඩ් 19 වසංගතය මත සහ ඇඳිරිනිතිය මත මෙය වසා තිබෙන්නේ. එම බදු මුදල් නිදහස් කරන්න කියා. ඒ අනුව ආදායම් පරික්ෂක මහතා විසින් නිර්දේශ කර තිබෙනවා. ඇඳිරිනිතිය ක්‍රියාත්මක වු දිනවල එම මුදල නිදහස් කරන්න කියා. එය සභාවේ අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය-**

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අම්බලන්ගොඩ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයේ කුලිය අයකිරීම නිදහස් කරන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය විසින් එවා ඇති ලිපිය අනුව, 2020.03.20 දින සිට 2020.04.20 දින දක්වා පමණක් කුලී අයකිරීම සම්බන්ධව සහනයක් ලබාදීමට (ඇඳිරි නීතිය පැවති හෙයින්) අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.09 රටේ පවතින කොවිඩ් 19 වසංගත හේතුවෙන් අම්බලන්ගොඩ කඩ කාමර වසා ඇති බැවින් අදාළ බදු මුදල් වලින් නිදහස් කර ගැනිමට කරනු ලබන ඉල්ලීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

රටේ පවතින  කොවිඩ් 19 වසංගත හේතුවෙන් 2020 මාර්තු මස 16 වන දින සිට ආයතනය වසා දැමීමට සිදු වු අතර නැවත රජයේ කාර්යාලවල වැඩ ආරම්භ වුයේ අප්‍රේල් මස 20වන දින සිටය.  මෙම හේතුව නිසා අප්‍රේල් මාසය සඳහා කඩකුලී ගෙවීමට හැකියාව ලැබුනේ අප්‍රේල් මස 20 වන දින සිටයි. එදින සිට කඩකුලි ගෙවීමට පැමිණි මහජනයා අප්‍රේල් මස සඳහා අය වීමට නියමිත දඩ මුදල පිළිබඳ විමසීම් සිදු කර ඇත. එම දඩ මුදල් අය නොකරන ලෙසද ඔවුන් වාචිකව පවසන ලදී. අප්‍රේල් මස 01 වන දින හා අප්‍රේල් මස 10 වන දිනට පෙර කඩ කුලී නොගෙවන්නේ නම් දඩ මුදල් අය කරයි. ඒ අනුව අප්‍රෙල් මාසය සඳහා වන කඩකුලී සඳහා අය කරනු ලබන දඩ මුදල සඳහා අප්‍රේල් මස 30 වන දින දක්වා සහන කාලයක් ලබා දිය හැකිද ? නොඑසේනම් ඒ සඳහා අය කිරිම කළ යුතු ආකාරය පිළිබඳ කරුණාකර නිර්දේශ හා අනුමැතියක් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටි. එය සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය  කතා කරමින්</u>**

එක සාධාරණයි. එය ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය අද අනුමැතියෙන් පසු ලබා දෙනවා.

**තීරණය-**

කොරෝනා වසංගතය හේතුවෙන් 2020 මාර්තු මස 16 දින සිට මුළු රටටම ඇඳිරි නීතිය පැනවීමත් සමග සියලු ආයතන වසා දැමීමට සිදුවූ බැවින් කඩකාමර බදුකරුවන් දඩ මුදල් ගෙවීම පිළිබඳව විමසන බැවින් අප්‍රේල් මස කඩකාමර කුලිය ගෙවීමට අප්‍රේල් මස 30 දින දක්වා සහන කාලයක් ලබාදීමටත් (ගිවිසුම්ගතව ඇත්තේ සෑම මසකම 10 වන දින හෝ ඊට පෙර ගෙවීමටය) කුලිය ගෙවීම ප්‍රමාද වීම නිසා අය කරන ප්‍රමාද ගාස්තු නිදහස් කිරීමටත් අනුමැතිය ලබාදීම සුදුසු බවට  ආදායම් පරීක්ෂක ටී.හංස ලක්ෂාන් මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව, ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් විසින් කළ යෝජනාව ගරු නගර සභා  මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

### 12.10 ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය විසින්  නිවාඩු ලබාදෙන ලෙස ඉල්ලා එවා  ඇති ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නිවාඩු ඉල්ලිම සම්බන්ධව. ඉහත නම් සඳහන් මම අද දින සභාවාරයට නොපැමිනෙන බව මෙයින් දන්වන අතර , මා මහ මැතිවරණයේ අපේක්ෂිකාවක ලෙස ඉදිරිපත් වන බැවින් මහ මැතිවරණය කල් තබා තිබුණද මා හට මහ මැතිවරණය පවත්වා ඡන්ද ප්‍රතිඵල නිකුත් කරන

තෙක් නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. එම ඉල්ලීමද අනුමත කරන ලෙස ඉල්ලා සිටනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එය ලබා දෙන්න.

- වෙනත් කරුණු

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ආරක්ෂක අංශය සම්බන්ධව මොකක්ද ගත් තීරණය. ඒ අය ගිහිල්ලාද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ආරක්ෂක සේවා සම්බන්ධයෙන් සිවිල් ආරක්ෂක සේවය ගත් තින්දුව පරිදි රටේම ඔවුන් ආරක්ෂක අංශයෙන් ඉවත් වුණා. ඒ අනුව නගර සභාවේත් පොදු තින්දුව මත ඔවුන් ඉවත් වුණා. ඒ තින්දුව අපට දැනුම් දුන්නා. එම තින්දුව අනුව අපි ආරක්ෂක සේවය ටෙන්ඩර් කිරිමට කටයුතු කළා. ටෙන්ඩර් කිරිමට පුවත්පත් වල පල කර ගැනීමට නොහැකි වුණා. මේ කාලය තුළ ඇඳිරිනිතිය පැවති නිසා. දැන් ඉදිරියට අපි ටෙන්ඩර් කර පුවත් පත් දැන්වීමක් දමා තිබෙන්නේ. ඊළඟ 18 වෙනිදා ටෙන්ඩර් එක විවෘත කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඒ කාලය තුළ ආරක්ෂක සේවය සපයන්නේ කවුද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපේ ආරක්ෂක අංශය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එකේ වගකිම දරන්නේ කවුද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වගකිම සභාව සතුයි. සභාවේ මුරකරුවන් ඉන්නවානේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

හදිස්සියේ වත් ප්‍රශ්නයක් ඇති වුණොත් එහෙම මොකද කරන්නේ. ඒ අයට බලය තිබෙනවාද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපේ මුරකරුවන් ඉන්නවා. එතකොට ඒ අය යොදවනවා. අවශ්‍ය වුණොත් සාමාන්‍ය සේවකයන් යොදවා ගන්නවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, රාත්‍රී වැඩ කර ඒ අය එතැන හොරු කැඩුවොත් එහෙම අපට දෝෂාරෝපණය කරයිද ? ඒ අය අපට දොස් පවරයිද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

රාත්‍රියට සේවකයන් යොදවන්න. මුරකරු සේවයේ යොදවන කට්ටිය යොදවන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , එය ප්‍රායෝගිකව නැති නිසා මෙය ටෙන්ඩර් කර හරි ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඇත්තටම මා අදහස් කරනු ලබන්නේ විටෙක මන්ත්‍රීවරු වශයෙන් සලක ඔබ විටෙක අපි මන්ත්‍රීවරු ලෙස නොසලකන කාලයකුත් උදාවෙලා තිබුණා. පසුගිය කාලයේ. රු.5000/= ව්‍යාජ අයදුම්පත් ටිකක් බෙදන විට සභාව. ව්‍යාජ අයදුම්පත්. හොර අයදුම්පත් බෙදුවේ. බය නැතිව කියනවා. හොර අයදුම්පත් වගයක් බෙදුවේ. එම අයදුම්පත්‍ර ගැන මා ප්‍රාදේශිය ලේකම්තුමියගෙන් විමසූ විට එතුමියට ඇත්තටම ස්තුතිය පුද කරන්න ඕනේ දේශපාලනීකරණය නැතුව , සාධාරණ ලෙස , උගත් ලෙස , වංචනික නොවන රාජ්‍ය නිලධාරිණියක්. ඉතාමත්ම අගය කරනවා කාන්තාවක් වශයෙන් එතුමියව අගය කරනවා රාජ්‍ය නිලධාරිණියක් වශයෙන් . මා එතුමාට දුරකථනයෙන් කතා කළා. මා ගරු සභාපතිතුමාට කතා කළා. එතුමා කිවුවා මා නෙමේ කරන්නේ චක්‍ර ලේඛයක් අනුව කරන්නේ ප්‍රාදේශිය ලේකම්තුමිය කියා. මා එතුමියට කතා කළා. එතුමිය රැස්වීමක සිටියේ. නමුත් මන්ත්‍රීවරියක් නිසා විනාඩි එළියට ඇවිත් කතා කරන්නම් කිවුවා. මා කොළඹ ඉන්නේ. මට මෙන්න මේ වගේ ගැටළුවක් ඇති වෙලා තිබෙනවා. මේ අයදුම්පත් බෙදන්නේ කවුද කියා. අපිත් ගරු මන්ත්‍රීවරු . මේ අයදුම්පත් බෙදන්නේ කවුද කියා. මා එහෙම අයදුම්පත් ලබා දී නැහැ කියා. මා එහෙම අයදුම්පත් ලබා දී නැහැ කිවුවා. අයදුම්පත් ටික මා ළඟ කිවුවා. ග්‍රාමනිලධාරින් මේ ප්‍රශ්නයෙන් ඉවත්විමේ කටයුත්තක් තිබෙනවා කිවුවා. අපි ප්‍රශ්නය විසඳාගෙන නැහැ කිවුවා. නමුත් මෙහෙමයි ගරු නගර සභා මන්ත්‍රී කොඩිකාර මහතාණෙනි , මා කවදාවත් ඔබතුමාට මෙහෙම කතා කරන්නේ නැහැ. මමත් මන්ත්‍රීවරයෙක්, රාහුල මහතාත් මන්ත්‍රීවරයෙක් . අපි

දේශපාලනිකව විවිධ මති මතාන්තර දරන්න පුළුවනි . දෙයියනේ මේ කොරෝනා පොදු පෙරමුණට විතරක් ආවේ නැහැ. එහෙම ආවා නම් අපි ඇවිත් ඔබතුමන්ලා නාවා හොඳා ගන්නවා. ඔවුන්නේ අපේ සේවකයෝ . නමුත් කළේ කරන්න තිබෙන අසික්කිත වැඩක්. මා ඇහුවාම මෙය දි තිබෙන්නේ දිනපු ගරු මන්ත්‍රීවරුන්ට. මා අසා නැහැ ලෝක ඉතිහාසයේ එහෙම මන්ත්‍රීවරු ඉන්නවාද කියා. පාර්ලිමේන්තුවෙත් එහෙම දන්නේ නැහැ. දිනපු මන්ත්‍රීවරු, ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීවරු කියා. එහෙම වැඩ කරන්නේ නැහැ. මේ අයදුම්පත් ටික බෙදලා මාගේ එක්සත් ජාතික පක්ෂයේ අය මගෙන් අහනවා ඔබතුමියලා මන්ත්‍රීවරු . කොහෙන්ද අපි අයදුම්පත් ලබා ගන්නේ. මා කිවුවා අපි අයදුම්පත් දුන්නේ නැහැ. කමිටුවක් මඟින් දෙන්නේ. ග්‍රාම නිලධාරියි , සමෘද්ධි නිලධාරියි , ගරු මන්ත්‍රීවරුන් ස්ථිර කරන කමිටුවක් මඟින් තමයි අපි මුදල් දෙන්නේ. උදේ ඉඳන් බෙදනවා කිවුවා . නොම්මර දිලා අයදුම්පත්. අංක 84 කිවුවා මට ලැබුණේ. කොඩිකාර මහතාගේ ගෙදර. මා ඉතිං ඇහුවා අංක දිලා පෝලිමේ ඉද අයදුම්පත් බෙදන්නේ පොදුපෙරමුණේ ගෙදර විතරද? ඇයි අපි මන්ත්‍රීවරු නෙමෙයිද? මේ වගේ සක්කිලි බලුක්කිත වැඩ කරන්න එපා සභාවේ. මා ඉතාමත්ම තරහායි මේ වගේ වැඩ වලට. අපි හැම දෙයකටම ඔබතුමාට ශක්තිය දුන්නා. හැමවේලාවේම ගරු සභාපතිතුමා මොනවා හරි කිවුවාම කරන්න ඕන දේවල් වලට අත් දෙක ඔසවා උදවු කරනවා කරන්න ඕන දේවල් වලට . නමුත් මේ වගේ කැත පහදිලි වැඩ වලටනම් මා කොහෙත්ම කැමති නැහැ. මොකද මම එහෙම කැමති නැහැ. මා තරහෙන් කතර කරන්නේ. එහෙම ප්‍රශ්නයක් ආවාම අපි මානසිකව කොච්චර පිඩනයට ලක් වෙනවාද? අපෙන් සාමාන්‍ය ජනතාව මේවා අහන කොට කොන්දක් පණනැති පෙන්දක් වගේ වෙනවානේ. මිනිසුන් අහනවා මොකක්ද මේ කරන්නේ. අපේ ගරු නගර සභා මන්ත්‍රී සරත් මහතාගෙන් අහන්න. මා කිවුවා සරත් මහතාට ලැබි නැහැ. මා ඇහුවා අනිත් පක්ෂ වලට ලැබිලාද කියා. අනිත් පක්ෂ වලටත් ලැබි නැහැ. පස්සේ බලන විට මේ දිනපු මන්ත්‍රීවරුන්ට විතරක් අයදුම්පත් දෙසිය දෙසිය දුන්නාලු. එතකොට මෙහි මන්ත්‍රීවරු කොටස් 2ක්. දිනපු මන්ත්‍රීවරු. එහෙමත් සභාවක් තිබෙනවාද? මා නම් දන්නේ නැහැ. අද ඊයේ තමයි ඔය වගේ සභා තිබෙන්නේ. ඒ කියන්නේ කොටසක් වෙන්කරනවා දිනපු මන්ත්‍රීවරු කියා. දිනපු අයයි සභායක මන්ත්‍රීවරුයි . වැඩ කරන කොට දිනපු අයයි නොදිනපු අයයි කියා නැහැ වැඩ කරන කොට ඔක්කොමගේම වැඩ කොටස කරන්න ඕන. අපි හැමටම ලැබෙන්න ඕන අයිතිවාසිකම් ලැබෙන්න ඕන. මේ සභාවේ තිබෙන හැම දිමනාවක්ම අපිට ලැබෙන්න ඕන. මේ සභාවෙන් වියදම් කරන හැම දෙයක්ම ලැබෙන්න ඕන සමහර විට ඔබතුමලා රජයෙන් කරන නිසා කාර්ය සාධන බලකායයි, දේශපානය නැති අය සභාපතිවරු වෙච්ච නිසා කියනවා ඇති අර අයදුම් පත මෙහෙම බෙදා ඡන්දය හසුරුවා ගන්න කියා. නමුත් මෙය ඡන්දයක් නෙමේ කරන්නේ. ඡන්දය කරන වේලාවට ඡන්දය කරන්නම්. ඔබතුමාත් කරයි , අපිත් කරයි.

වේදිකාවේ රණ්ඩ වෙනවා, ගහගන්නවා. නමුත් තාම කරන්නේ කොරෝනා 19 ව්‍යාසනය නැති කරන්න. ආදරණීය ජනතාව රකින්න. නගරයේ සිටින ආදරණීය අම්මලාගේ දරු දැරියන් රකින්න තමයි අපි මේ කටයුතු කරන්නේ. මෙතැන සිටින කිසිම කෙනෙක්. මේ සෞඛ්‍ය අංශයේ සිටින කිසිම කෙනෙක් දේශපාලනයට වැඩ කරන්නේ නැහැ. මෙය මේ අපේ ගම , අපේ සහෝදරයෝ , අපේ දරුවෝ , මේ අම්බලන්ගොඩ සිටින ඔක්කොම අපේ. අපේ කියන හැඟීමෙන් වැඩ කරන්නේ. එහෙම කරන්න එපා ගරු සභාපතිතුමනි, මා බොහොම කනගාටු වෙනවා. එහෙම කරපු එක ගැන. මා ඔයාලා ගැන දැඩි විශ්වාසයක් තියාගෙන හිටියා. මා සභාවේදි ඔබතුමාට කතා කළාම ඔබතුමා කිවුවා අන්න ඔබතුමියටත් එවා ඇති ලියුම් කවරය කියා. මට එවා තිබුණේ චක්‍රලේඛය පමණයි. මට චක්‍රලේඛය බලා ගන්න පුළුවන් . එමනිසා මට චක්‍රලේඛය විතරක් වැඩක් නැහැ. චක්‍රලේඛයේ දෙන්න තිබෙන එවාත් මා දන්නවා. අනු පවුල් වලට දෙන්නේ නැති එවා මා දන්නවා. ඇත්තටම මා ග්‍රාම නිලධාරින්ට ස්තුතිවන්ත විය යුතුයි. ග්‍රාම නිලධාරින් දේශපාලනය කළේ නැහැ. මා කතා කළාම ග්‍රාමනිලධාරිට. නැහැ මහත්මිය අපි දුරකථනයෙන් හරි කතා කර ඔක්කොම විස්තර ටික ලබා ගත්තා. ඕකන්දේ ග්‍රාමසේවක මහත්මියට මා ගොඩක් ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා කොට්ඨාශ මන්ත්‍රි කියා එක කොට්ඨාශයකට ගණන් ගත්තාට කොට්ඨාශ දෙකක් තිබෙනවා. කළුවඩුමුල්ල , ඕකන්ද කියා. එතනදි මා ඕක දුන්නා කියා කොඩිකාර මහතාණෙනි මා ඔබතුමා සමඟ පෞද්ගලික තරහාක් නැහැ. නමුත් අපි එතනදි අසරණ වෙනවා. මට එහෙම දිලා ඔබතුමාට නොදුන්නා නම් ඔබතුමා කොහොමද කතා කරන්නේ. දැන් මට දෙනවා අයදුම්පත් ටික. මා තමයි පොදුපෙරමුණේ මන්ත්‍රිවරිය. ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රිවරයෙක්. එතකොට මාගේ ළඟට මා ඔක්කොම ගෙන්වනවා. ශ්‍රී ලංකා එකේ අයත් ගෙන්වනවා. පොදු පෙරමුණේ අයත් ගෙන්වනවා. එතකොට කොන්දක් පණ නැති පෙන්දක් වෙනවානේ. රිති ප්‍රශ්න නිති ප්‍රශ්න ඕන දෙයක් කියන්න. මේ වගේ වැඩ කරන්න එපා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා රිති ප්‍රශ්නයක් අහනවා. ඔබතුමා ව්‍යාජ අයදුම්පත්ද දුන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

නැහැ නැහැ. එක අයදුම්පත්‍රයක් ඡායාරූප කරලා දෙන්නේ. නැහැ කියන්නෙ කොහොමද?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මේ මන්ත්‍රිතුමියට පොඩ්ඩක් කතා කරන්න ඉඩ දෙන්න. මා උත්තර දෙන්නම්. කාගේන්වත් නෙමේ මේ සභාපතිගෙන් අහන ප්‍රශ්න වලට පිළිතුරු දෙන්නම්. කවුරුවත් දෙන්න ඕනේ

නැහැ. මා දෙන්නම්. මන්ත්‍රීතුමිය පාසැල් ගිහින් තබෙනවාද? එහෙම නම් කොයි පාසලටද ගියේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මා පාසැල් ගිහින් තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා එවූ ලිපිය කියෙව්වාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ඕව් . ලියුම කියෙව්වා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කියෙව්වේ නැහැ වගේනේ කතා කරන්නේ. ඔයා පාසැල් ගිහින් නැහැ. ඔයාට තේරුම් ගන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ඔබතුමා මට අයදුම්පත් එව්වේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔයාට අයදුම්පත් එවන්න අවශ්‍ය නැහැ. මට ඒවා තිබෙන්නේ ජනාධිපති ලේකම්තුමා විසින් උපදෙස් මාලාවක් එක්ක චක්‍රලේඛයක්. එම චක්‍රලේඛණයේ පැහැදිලිව තිබෙනවා එම චක්‍ර ලේඛණයේ විස්තර කර තිබෙනවා මෙම කොට්ඨාශ මන්ත්‍රීවරයා කොට්ඨාශයේ සභාපති වන්නේය. මා මෙතන අපේ දිනපු මන්ත්‍රීවරු දහ දෙනායි විපක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙකුටත් යැව්වා. ගරු නගර සභා මන්ත්‍රී සෝභිත මහතාට හා ගරු නගර සභා මන්ත්‍රී අතුල මහතාටත් යැව්වා. එහෙම යැව්වේ නැතිනම් තමයි මෙහි අසාධාරණය තිබෙන්නේ. ඒ අයට යැව්වේ මුලින්ම . එම අයදුම්පත් ටිකේ මේ චක්‍රලේඛණය මාගේ දුරකථනයේ තිබෙනවා. එයට මෙය ලැබුණු ගමන්ම මා ප්‍රාදේශිය ලේකම්තුමියට කිවුවා අයදුම්පත් තිබෙනවාද කියා. එතුමිය කියා සිටියා අයදුම්පත් නැහැ කියා. මා ඇහුවා මෙහි අයදුම්පත්‍රය තිබෙනවා මා මෙය ගසා යවන්නද කියා. දැනට ආවේ නැහැ. එහෙනම් ඔබතුමා අයදුම්පත් ටික යවන්න. චාමර පොත්හලෙන් ගෙන්වාගෙන ඡායා පිටපත් ගසා කොට්ඨාශ වශයෙන් දිනාපු මන්ත්‍රීවරු 12ටම දෙසිය දෙසිය බැගින් යැව්වා. යවලා ඉවරවෙලා චක්‍රලේඛණයේ පිටපතක් මා යැව්වා මන්ත්‍රීවරුන්. ඒ මන්ත්‍රීවරුන්ට මෙහෙම දෙයක්

තිබෙනවා. මේ රු.5000/= අයදුම්පත් තෝරා ගැනීමේදී ඒ විරුද්ධ දේශපාලන පක්ෂ වල සියළුම මන්ත්‍රීවරුන්ටත් ඒ ඒ කොට්ඨාශවල පුද්ගලයන් මග හැරී තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් කරුණු දැක්වීමටත් අයිතියක් ඇති අතර ඔවුන්ද සහභාගී කර ගත යුතුවේ කියා දමා තිබෙනවා. ඒ අනුව ඔබතුමාලා දැනුවත් කරන්න මා චක්‍රලේඛණය යැව්වා. අනිත් මන්ත්‍රීවරුන්ට දැන් සෝභිත මන්ත්‍රීතුමාට , අතුල මන්ත්‍රීතුමාට නියම විදියට යැව්වා. දැන් ඔන්න මා අතුල මන්ත්‍රීතුමාට යවන්නේ නැතිව මාගේ ඡන්දය ඉල්ලපු මන්ත්‍රීවරයාට යැව්වා නම් වැරදියි. මම මේ චක්‍ර ලේඛණය යැව්වේ. එමනිසා තමයි මා ඇසුවේ පාසැල් ගිහින් තිබෙනවාද කියා. පාසැල් ගියාට හරියට ඉගෙන ගෙන නැහැ. මෙයට උත්තර දෙන්නේ මා කවුරුවත් උත්තර දෙන්න ඔනේ නැහැ. ඔබතුමිය පාසැල් ගිහින් නැහැ. එකනේ තේරුම් අරගෙන නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

එතකොට කාර්ය සාධන බලකායෙන් ඔබතුමාට චක්‍රලේඛණය එව්වේ දිනපු මන්ත්‍රීවරුන්ට දෙන්න විතරක්ද ?

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඔව්. එහෙම තමයි. ඔබතුමිය කියවලා නැහැ එය.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

බලන්න කොච්චර පහත් දේශපාලනයක්ද කියා. එතකොට බලන්න රජය කොච්චර පාදඩ දේශපාලනයක්ද කර තිබෙන්නේ කියා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

දැන් මෙහෙම දෙයක් තිබෙනවා. ඔගොල්ලන් දේශපාලනය කරන කොට කොහොමද කළේ. දැන් ඔන්න ඔය අය කතා කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

මෙහෙමයි රු.5000/= දුන්නා කියා මිනිසුන් ඡන්දය දෙන්නේ නැහැ. සැමන් ටින් එක රු.255/= යි . දැන් දෙයිද බලන්න ඡන්දය. ඔබතුමලා ඒ වගේ පහත් දේශපාලනය කරන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කර සිටියා . මන්ත්‍රීතුමියට හරි මන්ත්‍රීතුමිය එක රැස්වීමකටවත් සහභාගී වුනේ නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

නැහැ මා ආවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

එක රැස්වීමකට පැමිණියා. අපි සහෝදරව වැඩ කළා. මේ එක්කෙනෙකුටවත් කියන්න පුළුවන්ද මේ ශ්‍රී ලංකා , මේ ජනතා විමුක්ති පෙරමුණේ,මේ එක්සත් ජාතික පක්ෂයේ කියා එහෙම වෙන්කිරීමක් කලාද? අයදුම්පත් බෙදන එක වෙනම එකක්. අපි වැඩ කරන කොට කොයි වේලාවක වත් දේශපාලනයක් බැලුවේ නැහැ එතනදී. අපි බොහොම සුහදව එකතුවෙලා වැඩ කළේ. පුළුවන්නම් නැගිටලා කියන්න කියන්න ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාට හරි ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමාට හරි . එහෙම එකක් කළේ නැහැ. මේ අය අවංකවම දන්නවා වැඩ කළ විදිය. මේ මන්ත්‍රීතුමන්ට කතා කරන්න කියන්න වැඩ කළේ කොහොමද කියා. අපේ පාර්ශිකයෝ අපිත් එක්ක තරහා වුණා. ඕකන්දේදී මා ප්‍රසිද්ධියේ මා කිවුවා මට දේශපාලනයක් අවශ්‍ය නැහැ කියා. එහෙමයි අපි වැඩ කළේ. එක එක්කෙනෙක් ජනතා විමුක්ති පෙරමුණේ , එක්සත් ජාතික පක්ෂයේ , ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ කෙනෙක් කියනවා නම් අපි දේශපාලනව වැඩ කලා කියා මා ලැහැස්තියි මේ මන්ත්‍රී ධූරය දිලා යන්න. ඒ වගේ බොරු කතා කියන්න එපා. දේශපාලනය අපි කළේ නැහැ. ව්‍යාජ එකක් කිවුවා. දැන් ව්‍යාජ ඒවා නෙමෙනේ. එහෙම වැරදි විදියට වචන පාවිච්චි කරන්න එපා. නිකං මිනිසුන්ට මඩ වදින විදියට. කිසිම වේලාවක අපි දේශපාලනය බැලුවේ නැහැ. මෙතනදී. ආපු එක්සත් ජාතික පක්ෂයේ පාර්ශිකයන්ට මේවා නොලැබුණු අයට අපි අපේ අතින් පාර්සල් දුන්නේ. අපි එහෙම දේශපාලනයක් කළේ නැහැ. මිනිසුන් දන්නවා. ඕකන්දේ ජනතාවත් දන්නවා. කළුවඩුමුල්ලේ ජනතාවත් දන්නවා. අපි එහෙම කළේ නැහැ කියා. ඔබතුමියට අවාසියක් වුණාද දන්නේ නැහැ. ඔබතුමිය කොළඹ හිටිය නිසා. ඔබතුමියට දූරකථනයෙන් ඔක්කොම කරන්න බැහැ ඔබතුමිය කොළඹ ඉඳගෙන. ඔබතුමිය මන්ත්‍රී නම් ඔබතුමිය ගමේ ඉන්න ඕන. ඔබතුමිය මට කියපුවාට අදහසක් දක්වන්න ඕන. ඔබතුමිය කියපු ටිකට තමයි මා කිවුවේ මා මෙහෙම කළා කියා. මා එහෙම කළේ නැහැ. මා බොහොම සාධාරණව කළේ. මට හරිම කනගාටුයි මගේ සහෝදර මන්ත්‍රීතුමිය ඒ කතා කරපු විදියට. එහෙම දෙයක් මා නම් කළේ නැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මේ රු.5000/= ලබා දීමේදි ලොකු ගැටළුවක් වුණා. ප්‍රායෝගිකව දිමේදි ලොකු ගැටළුවක් වෙලා තිබුණා. මම ඇත්ත කතා කළ යුතුයි. අපේ ප්‍රජා මණ්ඩලය හරහා ලක්ෂ 5ක් ලබා දෙනවා කියන කතන්දරය තිබුණා. ලක්ෂ 5ට එහි ප්‍රජා

මණ්ඩලයේ සභාපති , ලේකම් , දැනුවත් කරලා කමිටුවට වාඩිවෙලා තමයි නම් ටික ගත්තේ. ඒ වේලාවේ තමයි අපිට ඔබතුමා කොට්ඨාශ වල මන්ත්‍රීවරුන්ට අයදුම්පත් 200 ලබා දුන්නේ. එය ලබා දීමේදි අර මන්ත්‍රීවරුන්ට තිබෙන වරප්‍රසාදය නැතිවීමේ ප්‍රශ්නයකුත් තිබෙනවා. අපි කොට්ඨාශයේ මන්ත්‍රවරුනේ. වේදනාවක් තිබෙනවා. සමහරක් ඒවාගේ කොට්ඨාශවල මන්ත්‍රීවරු දෙන්නා තුන්දෙනා සිටිනවා. මාගේ කොට්ඨාශයේ මා විතරයි. ඒ ප්‍රායෝගික ගැටළු අපේ කොට්ඨාශ වල නැහැ. මා ප්‍රායෝගිකයි. මා පොදුපෙරමුණේද , එකසත් ජාතික පක්ෂයේද , ජනතා විමුක්ති පෙරමුණේ කියා බලන්නේ නැහැ. මේ අයදුම්පත් 200 දිපු ගමන්ම මා ජනතාව දැනුවත් කරලා මේ ලබා දුන්නා. මෙය හම්බ වෙයිද නැද්ද දන්නේ නැහැ කියා . මා අවංකම කියනවා මා හේතුවක් ඇතිව තමයි යම් දෙයක් කරන්නේ. මා මොන දේ දෙන්න ගියත් මා මාගේ ගම්වැසියන්ට සියළු දෙනාට මෙය ලබා දෙනවා. කලින් කිවුවේ මෙය සමෘද්ධි සහානාධාර ලබා ගත් අයට දෙන්නේ නැහැ කිවුවා. නොදිපු අයට දෙනවා කිවුවා. එක එක විදියේ චක්‍රලේඛණ හතර පස් වතාවක් පැමිණියා. කමිටුවට සහභාගි වූ නිලධාරින්. විශේෂයෙන් ප්‍රජා මණ්ඩල නිලධාරින්. අපහසුතාවයට පත් වුණා. මන්ත්‍රීවරයාත් අපහසුතාවයට පත්වුණා. රාජ්‍ය නිලධාරිනුත් අපහසුතාවයට පත් වුණා. අපේ ගමේ 7ක් හිටියා. ගරු භාණ්ඩාගාරිකත් ආවා. එහිදි ගැටුමකුත් ඇතිවුණා. ලොකු ගැටුමකුත් ඇතිවුණා. සභාපති , ලේකම් දැනුවත් කරලා භාණ්ඩාගාරිකත් පැමිණියා එතනට. එ එක්කම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ආවා චක්‍රලේඛණයක් . ඒ එක්කම තමයි මෙයත් ආවේ. ලොකු ගැටළුවක් වුණා. මා ගියා . එතැන වැඩ කිරිමේදි ලොකු ගැටළුවක් වුණා . ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා නගර සභාව අතර. අපි අයදුම්පත් 200 ලැබුණාට 100 බෙදන විට අපි නතර කළා. දේශපාලනය නෙමේ . සමහරක් අයට දෙන්න බැරි වුණා. යම්කිසි වැඩක් කරන විට අපි දැනුවත්විය යුතුයි . අපිට නිලධාරින් ගැන විශ්වාසයක් තියන්න බැහැනේ. දේශපාලන යන්ත්‍රණයත් එක්ක සමෘද්ධි නියාමක ඒ වගේ විශ්වාසයක් තියන්න බැහැනේ. සියයට සියයක්. රජකාරිය කරන එක හරි. මා ගිහින් මේ විෂය සම්බන්ධව මා ගිහින් විමසුවා. නමුත් ප්‍රාදේශිය ලේකම්තුමිය හිටියේ නැහැ. සහකාර ලේකම්තුමිය හම්බ වුණා. ඊට පසු මා නැවත දවසක් ගිහින් ප්‍රාදේශිය ලේකම්තුමිය දැනුවත් වුණා. මා විමසුවා අපට ගරු සභාපතිතුමා රු.5000/= අයුදුම්පත් දිපු එක අපි සභාවෙන් දෙන එක ගැන කොහොමද? එවිට ප්‍රාදේශිය ලේකම්තුමිය කිවුවා ගරු මන්ත්‍රීතුමා මෙය එව්වා. ඔබතුමාට දිලා තිබෙනා කිවුවා. අපේ ළඟ තමයි කිවුවා නියම අයදුම්පත් තිබෙන්නේ. මෙච්චර විතර ගොඩක් තිබුණා. මා ගිහින් දැනුවත් වෙලා තමයි ඒ වැඩය කළේ. මා කලින් තිබුණු කමිටු ලේඛණ වාර්තාත් අරගෙන තමයි වාඩි වුණේ. ගියපාර සමෘද්ධි ලැයිස්තුවේ සමෘද්ධි ලැබිය යුතු අය 25ක් දෙනෙකු සිටියා. එම නම් 25 අරගෙන තමයි මා කමිටුවට වාඩි වුණේ. ඒ වගේම ප්‍රාදේශිය ලේකම්තුමියගෙන් දැනුවත් වෙලා තමයි මා

කමිටුවට වාඩි වුණේ. නිත්‍යානුකූල අයදුම් පත් මිටියක් තිබුණා. ඔබතුමලා ඒවා ගන්න කිවුවා. අන්තිමට එන්නේ අපි හරහායි කිවුවා. ඒ ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවන ලද අයදුම්පත ඡායා පිටපත් කර තමයි ඔබතුමා අපට එවා තිබුණේ. ඒවා තමයි 200 ගණනේ දුන්නේ. ඒ බෙදන ලද අයදුම්පතේ වලංගුතාවයක් නැහැ. මේ සත්‍ය කතාව. අපි අනිත් අයදුම්පත් 100ත් බෙදුවානම් අපි මිනිසුන්ගෙන් බැණුම් අහනවා. මොකද දේශපාලනයකින් තොරව බෙදන්නත් එපැයි. ඇත්තටම සිද්ධ වුණේ එකයි. ඊට පසු කමිටුවට කියා මාගේ ඉතිරි කොළ ටික මා දුන්නා. ගියාට පසු ලේකම්තුමිය එකතු කර ගත්තේ අභියවනා ටික පමණයි. මා කමිටුවට වාඩි වෙද්දිම කිවුවා . ප්‍රජා මණ්ඩලයේ නිලධාරින් එක්ක ගැටුම් ඇතිවෙලා ඒ අය ආවේ නැහැ. ඊට පස්සේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් එක්කනේ මෙහි අන්තිම එක සිද්ධ වුණේ. මා වාඩි වෙන විටම කිවුවා . මෙය අපි හරි සාධාරණව දේශපාලයකින් තොරව මෙය හරියට දැමිය යුතු බව. මාගේ ගමේ නිලධාරින් එක්ක කිසිම ගැටළුවක් ඇති වුණේ නැහැ. සියළු එක්සත් ජාතික පක්ෂ සමාජිකයන්ට හම්බ වුණා. සියළු පොදු පෙරමුණු හා ජනතා විමුක්ති පෙරමුණු සමාජිකයන්ට හම්බ වුණා. සාධාරණ හේතුව මත අපි කමිටුව තීරණය කරලා අපි මෙය කරගෙන ගියේ. සාධාරණ හේතු මත අපි කමිටුව තීරණය කළා. මොකද එය චක්‍ර ලේඛණයේ තිබෙනවා. සාධාරණ හේතු මත කමිටුව කැමති නම් ඒක දෙන්න පුළුවන්. ඉතිං වයසක අම්මලා . තාත්තලා ඉන්නවා. ඒ කොට්ඨාශයේ දිපු සභාවෙන් මන්ත්‍රීවරයා අසරණ වුණා. කොච්චර වුණත්. සභවේ මන්ත්‍රීවරයාට ලොකු තැනක් හම්බ වුණේ නැහැ. සභාවෙන් දුන්නාට එම අයදුම්පත් ටික රාජ්‍ය නිලධාරින් හරහා තමයි එම කටයුත්ත සිද්ධ වුණේ. අපි දේශපාලනය කරනවා කියා අපි ලොකු වට බොරුවට අපි ලොකු මිනිසුන් කියා නිලධාරින් අපහසුතාවයට පත් කරන්න කැමති නැහැ. ඒ පුටුවට වාඩි වුණාට පස්සේ අපි බලන්න ඕන ගමේ හැමදෙනාටම සාධාරණයක් ඉෂ්ඨ වුණාද කියා. දේශපාලනයෙන් තොරව අපේ ගමේ හැමදෙනාටම හම්බ වුණා. මා ඒ ගැන ඇත්තටම ආඩම්බර වෙනවා. ලොකු කලකිරිමක් තිබෙනවා. සභාපතිතුමාට දොස් පවරන්න බැහැ. එමනිසා අපි එම අයදුම්පත් ටික අපි බෙදුවා. මගදි අපි එය නැවැත්තුවා නැතිනම් අපි ලොකු අපහසුතාවයකට පත්වෙනවා. මොකද මා එක අයදුම්පතක් මාගේ ගෙදරට පැමිණ ගන්න තිබ්බේ නැහැ. මොන දේ වුණත් මා පොත්වලට අයදුම්පත් දුන්නාත් මොන දේ දුන්නාත් මගේ යුතුකම හැම නිවසකටම යනවා ඒවා දෙන්න. සියළු දේවල් ඒ විදියට කරනවා. මා දේශපාලනයෙන් තොරව ඒ දේවල් කරන්නේ. මේක සාධාරණ වුණා. මෙතැන පොඩි ගැටළුවක් තිබුණා. ගරු මන්ත්‍රීවරු විදියට අපි ලොකු තැනක් හිමි වුණේ නැහැ. ඒක තමයි ඇත්තම දේ. හැබැයි අපි නිළධාරින් එක්ක මගේ මන්ත්‍රීකම පෙන්වන්නගිහින් ඔබතුමලා පොහොට්ටුවේ කියා පෙන්වන්න ගියානම් කමිටුව මෙවා ඔක්කොම නැති වෙනවා . මොකද අපි එම වැඩ ටික ලස්සනට කළා. ඇත්තම කියනවා නම්

කළුවඩුමුල්ලයි ඕකන්දයි ගත්තොත් එහෙම ගරු මන්ත්‍රීවරු අපහසුතාවයට පත්වෙනවා. සාමාන්‍යාෙයන් දේශපාලනය කරන කොට මන්ත්‍රීවරු 4 ඉන්න කොට සාමාන්‍යයෙන් අපි නිහතමානිව පිළිගන්න ඕන ඒ අයගේ තිබෙන ගරුත්වය. ඔබතුමා දිනපු මන්ත්‍රීවරයෙක් විදියට ඔබතුමාට තිබෙන ගරුත්වය නැතිවෙනකොට එතැන ලොකු ගැටළුවක් තිබෙනවා. මොකද මා එක්සත් ජාතික පක්ෂයේ කියා මට සාධාරණයක් වුණා කියා පොදුවේ කාටත් සාධාරණයක් විය යුතුයි. ඕක මා හිතන්නේ පවුල් ඒකක අනුව දුන්නාම් හරි. තල්ගස්ගොඩ මා හිතන්නේ ගරු උප සභාපතිතුමාගේ පවුල් 800 ගාණක් ඉන්නවා. දැන් මගේ ගත්තොත් පවුල් 435කි. පවුල් ඒකක වශයෙන් අයදුම්පත් දිලා මේ කමිටුවට ඉදිරිපත් කරලා විනිවිදභාවයකින් කළාම ලොකු ගැටළුවක් ඇති වෙන්නේ නැහැ. ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතාණෙනි , මේ අයදුම්පත් දෙද්දිත් අනිත් මන්ත්‍රීවරුන්ටත් එන්න කියා දුරකථනයෙන් හරි දැනුම් දිලා කළානම් හරි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙන්න චක්‍රලේඛණය. චක්‍රලේඛණයේ තිබෙන්නේ මෙහි ලිපිනය තිබෙන්නේ සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශිය ලේකම්වරුන් ඔවුන්ට දි තිබෙනවා දැනටමත් පොරොත්තු ලේඛණයේ සිටින සෑම පවුලක්ම ආර්ථික ග්‍රාමිය කමිටුවේ ප්‍රතිලාභ ඉල්ලීම් කරන ලබන පවුල් ඒකක. ( උප ලේඛන ) ඔවුන්ට තමයි මෙය බෙදුවේ. පළාත් පාලන ආයතන වල පළාත් පාලන කොට්ඨාශ වල නියෝජිතයා නොහොත් කියා හිස්තැනක් දමා තිබෙන්නේ. කොට්ඨාශ නියෝජිතයන්ට අමතරව පළාත් පාලන ආයතනයක ඕනෑම නියෝජිතයෙකුට ඕනෑම පක්ෂ දේශපාලනඥයකුට ඕනෑම සිවිල් සංවිධානයේ නියෝජිතයෙකුට මෙම පවුල් ඒකක සඳහා ප්‍රතිලාභ ලබා ගැනීමේ සුදුසුකම් ලැබේ. එම හිමිකම් නොලැබීම පිළිබඳව ප්‍රමුඛතාවය ලබා දිමේ හිමිකම මත අවස්ථාව ලබා දිය යුතුය. මේ චක්‍රලේඛණයට අමතරව මා එවුවේ ඔබතුමා ඒ කියන්නේ කොට්ඨාශ නොවන මන්ත්‍රීවරුන් තමන්ගේ ජනතාව වෙනුවෙන් යුතුකම් ඉෂ්ඨ කර ලීම සඳහා කමිටුව ගිහින් එකත් සාකච්ඡා කරන්න. උදාහරණයක් වශයෙන් මගේ කොට්ඨාශයේ මා පේෂලා මන්ත්‍රීතුමියටත් කතා කර එතුමියත් වාඩි කරලා තමයි රැස්වීම තිබ්බේ. සම අයිතියක් එතුමියටත් දුන්නා. කිසිම එකක් නැහැ. අපි ගත්ත ඒවා ප්‍රශ්න ඇති වුණේ අපි ගත්ත එවා. අපි කියනවා මෙය දිය යුතුයි කියා. එගොල්ලන් කියනවා මෙය එපා කියා. එහෙමයි වුණේ. පස්සේ මේ චක්‍ර ලේඛණ මඟින් නිරවුල් කරලා ගියාට පසු තමයි අද වෙනකොට මෙය ලැබිය යුතු කිසිම කෙනෙක් නැහැ. අපේ ගමේ නම් එය ලැබිය යුතු කිසිම කෙනෙක් නැහැ. සියළු දෙනාට දිලා තිබෙන්නේ. මා හිතනවා ඔබතුමාගේ කොට්ඨාශයේත් සෝභිත මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේත් සියළු දෙනාටම දිලා තිබෙන්නේ. දැනට වෙලා තිබෙන්නේ අපේ කොට්ඨාශ මන්ත්‍රීවරයාට වෙලා තිබෙන්නේ ඒ තැන ග්‍රාමසේවක මහතාට

ලැබුණේ නැහැ කියන චෝදනාව තමයි දැන් තිබෙන්නේ. අන්න එකයි වෙලා තිබෙන්නේ. රජයෙන් නෙමේ කරන්නේ. රජය කොට්ඨාශ මන්ත්‍රිවරයාට බලය දුන්නා මෙයින් . ඔබතුමාගේ අත්සන නොතිබුණා නම් සතයක්වත් ගෙවන්න බැහැ. එහෙම තමයි කළේ. කාගේ නැති වුණත් කොට්ඨාශ මන්ත්‍රිවරයාගේ අවසර තිබෙන්න ඕනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

දැන් මෙතුමා කිවුවාම අපි තුන්දෙනාගේම අත්සන නැතිව ඕකන්දේ මුදල් ගෙව්වා

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලියලා දෙන්න . ඒ ගැන පැමිණිල්ලක් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තම කියනවා නම් සිද්ධ වුණේ මේකයි. අපි කොච්චර ලොකු ලොකු දේවල් කතා වුණාත්. මා මා දැනුවත් වුණා ප්‍රාදේශිය ලේකම්තුමියගෙන් . මා සියළුම දේවල් දැනගෙන තමයි කතා කරන්නේ. ඇත්තම කියනවා නම් නිලධාරින් මා එකතු කරන ලද කොළ ටිකෙන් ගත්තේ අභියාචනා කොළ ටික විතරයි. මා ඊට පස්සේ මාගේ ගොණුවේ ඉතිරි අයදුම්පත් ටික දමා තිබ්බා. තව අයදුම්පත් 100ක් විතර බෙදන්නත් තිබෙනවා. ග්‍රමානිළධාරිතුමිය, සමෘද්ධි නිළධාරිතුමිය සංවර්ධන නිලධාරි, ඒ තුන්දෙනාම එකතුවෙලා මා සමඟ ඡනද් නාමලේඛණයේ එකේ සිට අරගෙන එම නම් ලැයිස්තුව ගසා ප්‍රාදේශිය ලේකම්තුමියට යැව්වා. එතුමිය අයදුම්පත් ටික පුරවලා අන්තිමට මුදල් දෙන දිනයට තමයි අත්සනයි මේකයි ගත්තේ. ඔය විදියට තමයි සිද්ධ වුණේ. එකතමයි අපිට හිතට ආමරු. අපි කොළ ටික බෙදලා . නිකං හරි අනිත් කොළටික බෙදුවානම් අපි බැණුම් අහනවා. බෙදනකොට ඔක්කොම බැණුම් අහනවා. ඉතිං ඇත්තටම සිද්ධ වුණේ අපේ මන්ත්‍රිවරු හැල්ලුවට ලක් වීමයි. අයදුම්පත බෙදිම ගැන වැඩියේ තර්ක කර වැඩක් නැහැ. ඇත්තටම නිෂ්ඵල දෙයක් වුණේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමා ඒක බෙදුවේ නැත්නම් සාමාන්‍ය ජනතාවගෙන් භාගයක්වත් මේක දන්නේ නැහැ. එගොල්ලන්ට ඕන නම්ටිකට දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, තව එකක් තිබෙනවා. වැඩ සටහන පිළිබඳ ගරු අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන මැතිතුමා කතා කළා. වැඩසටහන පෙන්නුවා එදා තිබුණු . එතුමාගෙන් ප්‍රශ්නය යොමු කරනු ලැබුවේ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙක්. එතුමා මුලින් කිවුවේ අයදුම්පත් බෙදුවේ නැහැ කියා. පසුව කිවුවා අයදුම්පත් බෙදුවා කිවුවා සභාවල් වලින්. හැබැයි එම අයදුම්පත් ගියේ අභියාචනාවක් විදියට පමණයි. එහෙම කිවුවේ එම කතාව. අභියාචනාවක් විදියට බෙදුවා කිවුවා. ඇත්තම කියනවා නම් මෙයින් මන්ත්‍රීවරු සැහැල්ලුවට ලක් විමක් තමයි සිද්ධ වුණේ. ඕකට අයදුම් පත් බෙදුවා කියා මෙකක් නැහැ. සියළු කටයුතු මා දන්නේ නැහැ කළුවඩුමුල්ල ඕකන්ද කොහොම වුණාද කියා . අපේ කොට්ඨාශ වල මේක එක්සත් ජාතික පක්ෂයේ කෙනෙකුට දුන්නා නැහැ කියා , පොදුජන පෙරමුණේ කෙනෙකුට දුන්නේ නැහැ කියා මා නම් හිතන්නේ නැහැ චෝදනා එයි කියා. මේක සාර්ථකව සිද්ධ වුණු එකයි , අයදුම්පත් බෙදිමේදි එක එක්කෙනා අපහසුතාවයට පත්වන විදියට වැඩ කටයුතු සිදුවිම පමණයි මටනම් පෙන්නේ. නැතිනම් රු.5000/= බෙදා දිම සම්බන්ධව නම් කාටත් සාධාරණය ඉෂ්ඨ වුණා කියා තමයි මටනම් පෙන්නේ. ඒ ගැන විතරයි මට කියන්න පුළුවන්. මාගේ කොට්ඨාශය ගැන විතරයි මට කියන්න පුළුවන්.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

එහෙම තමයි හැම තැනම දුන්නා.

__ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත  මහතා කතා කරමින්__

මේ සම්බන්ධව අපි තර්ක කරන්න අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරනවා.

__ගරු නගර සභා මන්ත්‍රි දිනයාදූර ධර්මදාස  මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, රු.5000/= දිමනාව ගැන කතා කරන විට අපේ ගරු මන්ත්‍රිතුමිය කියන ආකාරයට එසේ සිදු වුයේ නැහැ. මා සමඟ ඡන්දය ඉල්ලු එක්සත් ජතික පක්ෂයේ පුෂ්පික මහතා හා ඒයාගේ සොහොයුරාටත් , එයාගේ මවටත් දුන්නා. පවුල් වල හැමෝටම එක්සත් ජාතික පක්ෂයේ ද පක්ෂ භේදයකින් තොරව හැමෝටම ලබා දුන්නා. ඊට ඉස්සර වෙලා සිද්ධ වෙච්ච එකතමයි , මේ කමිටුව පිහිටවු අවස්ථාවේ එතැන බලධාරියා වුයේ ග්‍රාමනිලධාරි.

එතකොට ප්‍රාදේශිය ලේකම්තුමිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය අපි නියෝජනය වුණාට කමිටුවේ අපි පස්දෙනා වුණාට අපි ගෙන්වුයේ නැහැ . චක්‍රලේඛණය ගැන කියන්න වත් මොහොකටවත් අපි ගෙන්නුවේ නැහැ. ගෙන්නුවේ ඒ අයට ගිහින් උපදෙස් දුන්නා. අපි නිකං සහභාගි කර ගත්තා . විස්තර ගන්න තමයි මට පේන විදියට අපි සහභාගි කර ගත්තේ. එහෙම සහභාගි කර ගත්තේ නැතිනම් ග්‍රාම නිලධාරි දන්නේත් නැහැ , සමෘද්ධි නිලධාරි දන්නේත් නැහැ . ගමේ විස්තර දන්නේ නැහැ. ගමේ නිවෙස්වලට ගිහින් නැහැ ඒ අය. එතකොට ඒ ගමේ විස්තර දැන ගත්තේ මාව ගෙන්වා මගෙන් තමයි. පසුව මට තේරුණා. මුලටම ගත් චක්‍රලේඛණයක හිටියා හැට ගාණක්. අනු පවුල් වලට දෙන්නේ නැහැ. ඒක ඉල්ලුවාට දෙන්නේ නැහැ. වෙනත් විදියක චක්‍රලේඛණයක් ගත්තා අනු පවුල් වලට දෙන්නේ නැහැ කියා. ඊට පසුදින තවත් චක්‍රලේඛණයක් ඇවිත් කිවුවා රට ගිහිපු අයට දෙන්න කියා. අනු පවුල් වලට දෙන්නේ නැහැ කිවුවා වෙනම අභියාචනා පරික්ෂණයක් පවත්වා තමයි දෙනවා කිවුවේ. එතකොට මේ අය වර්ජනය කළා. වර්ජනය කළාම ඔබතුමා ඊට පසුව තමයි අයදුම්පත් බෙදුවේ. බෙදුවාට පසු මේ අය ග්‍රාම නිලධාරින්ගේ වර්ජනය අවසන් වි පැමිණ නැවත අපිත් සමඟ සාකච්ඡා කර කිවුවා . ඒ ගොල්ලන් ජයග්‍රහණය කරලානේ ඇවිත් ඉන්නේ එම ග්‍රාම නිලධාරි මහතුන්. ඒ අය කිවුවා අනු පවුල්වලට දෙන්නේ වෙනම පරික්ෂණයක් කිරිමෙන් පසු බවයි. මා කිවුවා අපි දැන් අයදුම්පත් හැමෝටම දීලා තිබෙන්නේ පක්ෂ භේදයකින් තොරව. මේක මෙහෙම දෙනවා නම් මා මේ කමිටුවෙන් අයින් වෙනවා කියා මා ගියා. මා ගියේ 19 වෙනිදා අයින් වෙලා. අයින් වෙලා ගියාම ග්‍රාම නිලධාරි අපේ හිතවෙතෙකුට කියා තිබුණා ඔයාගේ පුතාට රු.5000/= දිමනාව දෙන්නම් . කාටත් හොරා මට ලිපියක් ගෙනත් දෙන්න කියා. ඒ කෙනා අපේම කෙනෙක් . මා නම සඳහන් කරන්නේ නැහැ. හොඳ හිතවතෙක්. අපේ පාශ්ශිකයෙක්. එයා මට දුරකථන ඇමතුමක් දි කිවුවා ග්‍රාම නිලධාරි මහත්මිය මට මෙහෙම කියනවා කියා. මා කිවුවා ඔයා ලිපියක් දෙන්න. ලිපියේ දිනය දමා දෙන්න. දිනය දමා මේ අය ලිපිය ගිහින් දුන්නා 19 වෙනිදා. 19 වෙනිදා ලිපිය ගිහින් දිලා 20 වෙනිදා මුදල් ගන්න එන්න කියා තිබෙනවා. මට හමුවුණා සවස මුදල් ගෙන ගියාට පසු . මා කිවුවා ලියුම දෙන විට විශේෂයෙන්ම දිනය දමා දෙන්න . පසුව මෙයා ගිහින් ලිපිය දුන්නා. ලිපිය දුන්නාම 19 වෙනිදා දිනය සමෘද්ධි නියාමක 19 දිනය 09 වෙනිදා කරලා. එතකොට මා කියු ආකාරයට මෙයා ගැහුවා දුරකථනයෙන් ඡායාරූප දෙකක් ලියුම් දෙකේම . වෙනස් කරපු 09 වෙනිදා එකයි 19 වෙනිදා එකයි. ඡායාරූප දෙකක් ගසා මට ගෙනත් පෙන්නුවා. මේ තිබෙන්නේ මගේන් ගත්ත ලිපිය මට මුදල් ගන්න ඕන කිවුවා. පසුව මෙයාට මුදල් ගෙවුවා. ඊට පසු අපේ අයදුම්පත් භාර ගත්තේ නැහැ මේ අය. පසුව මා ගමේ හැමතැනම 20වෙනිදා පොස්ටර් ගැහුවා. ඔබතුමා දැනුවත් කරලා. අපේ සුදුසුකම් තිබෙන පවුලකට මේ අය මුදල් දුන්නේ නැහැ. මා

ගියේ නැහැ. මා එදා මුදල් ගෙවන දිනයේත් සහභාගි වුයේ නැහැ. ඊට පසු සුදුසුකම් තිබෙන පවුලක් අසා තිබෙනවා අපට මුදල් අනුමත වුණාද කියා. එයාගේ මහත්තයා විදේශගත වෙලා. මෙන්න මේ කළුවඩුමුල්ලෙන් බැඳලා ඉන්නේ එම ළමයා. මේ ගෙයි වෙනම අනු අංකයකුත් තිබෙනවා. මැයට පවසා තිබෙනවා ඔයාට මුදල් ගෙවන්න විදියක් නැහැ කියා. පසුව මේ අය පැමිණ මට කිවුවා. මා ගිහින් ඇසුවා ග්‍රාම නිලධාරිතුමියගෙන් ඇයි මේ අසාධාරණය කරන්නේ කියා. ගොඩක් රණ්ඩු වුණා. මිනිසුන් පිරුණා. පොලිසියෙනුත් ආවා. හමුදාවෙනුත් පැමිණියා. මට මුකුත් කරන්න ආවේත් නැහැ. කිව්වේත් නැහැ. පස්සේ රණ්ඩු වෙලා එම නිවසට මුදල් ලබා ගත්තා. පසුව මම මෙයාගේ මේ අක්‍රමිතතාව කියා මහ දිසාපතිට ලිපියක් දැම්මා. මේ කරන ලද වංචාව ගැන. මා නැතිව හොර රහසේ දුරකථන ඇමතුම් ලබා දී ඒ අනු පවුලකට දෙන එක ගැන. චක්‍රලේඛණයේ අනු පවුල් වලට දෙන්න කියා නැහැ. මේගොල්ලන් දුන්නා. ඊට පසු 21 නැවත පැමිණියානේ අනුපවුල් වලට දෙන්න කියා. අනුපවුල්වලට දෙන්න කියා පැමිණි පසු හැමෝටම දෙන්න වුණා. ඊට පසු එතැනට බලෙන් ගියා. මා නොගියා නම් මෙය ලැබෙන්න ඕන මිනිසුන්ට ලැබෙන්නේ නැහැ. මේ අය තමයි එතැන බලධාරින් වශයෙන් කටයුතු කළේ. ග්‍රාම නිලධාරිණියයි, සමෘද්ධි නිලධාරිනියයි. අපි එතැන හිටියට අපි මන්ත්‍රිවරු වශයෙන් අපිට කිසිම බලයක් පාවිච්චි කරන්න විදියක් නැති වුණා . අන්තිමේදි පවුල් 200 ගාණකට විතර දුන්නා. පක්ෂ භේදයකින් තොරව. ප්‍රධාන එක්සත් ජතික පක්ෂයේ අයට මා ගිහින් කතා කරලා අභියාචනය මා අතින් ලිව්වේ. ඒ අයගේ අභියාචනය මා අතින් ලියා දුන්නේ. කිසිම පක්ෂ භේදයක් තිබුණේ නැහැ. තමුන්නාසේලාට හෙප්පුමුල්ල ප්‍රදේශයෙන් ගිහින් අහන්න පුළුවනි. මා කටයුතු කළේ කොහොමද කියා. මෙතැන අපිට කිසිම බලයක් පවරලා තිබුණේ නැහැ. ප්‍රාදේශිය ලේකම් එකෙන් අපිට බලයක් නැහැ. එගොල්ලන්ට ඕන විදියට ඒ අය වැඩකටයුතු කළා. සමෘද්ධි පොරෝත්තු ලේඛණයේ කිසිම ලිපියක් නොමැති අයට මේ අය මුදල් දි තිබුණා. මා ඇසුවා කොහොමද මේ මුදල් ගෙවුවේ කියා. ලියුම් 16ක් තිබෙනවා. නම් තිබෙන අයට ගෙව්වේ නැහැ. නැති අයට ගෙවා තිබෙනවා. ඒ පාර සමෘද්ධි නියාමක කියනවා නිහාල් මහතා තමයි කිවුවේ ගෙවන්න කියා. මා නිහාල් මහතාට දුරකථන ඇමතුමක් දි ඇසුවා කොහොමද ඔබතුමා ගෙවුවේ කියා. ඒ කාලේ දිපු ලැයිස්තුවක නම්වලට ගෙවුවා කිවා. එතකොට අභියාචනයක් නැහැ. ග්‍රාමසේවක මට පොරෝත්තු ලේඛණය කියා පෙන්නුවා එහි තිබුණේ 12කු පමණයි. නමුත් ඔක්කොටම දිලා. නමුත් නැහැ මුකුත් නැහැ . ඔක්කොටම දිලා. මගේ පරික්ෂණයක් තිබෙනවා. ඔබතුමා දන්නවා. මහ දිසාපතිටත් ලියා මා ජනාධිපතිලේකම් කාර්යාලයටත් දුරකථන ඇමතුමක් ලබා දුන්නා. දැන් ග්‍රාමනිලධාරිට මාරු වීම ඇවිත් තිබෙනවා. ග්‍රාම නිලධාරිට ඉල්ලා අස්වෙන්න කියා කියනවා. මා හිතන්නේ අපේ ධෛර්යෙන් තමයි ජනතාවට තමයි මෙය අරගෙන දුන්නේ. අපේ උනාන්දුවෙන් තමයි.

බලෙන් තමයි ඒක ගත්තේ. අද වනතුරු ප්‍රාදේශිය ලේකම්තුමිය අපි සමඟ මේ ගැන කතා කළේත් නැහැ. එහි ගසා තිබුණා. මා සමෘද්ධි නිලධාරි මහත්මියගෙන් ගොනුව ඉල්ලා බැලුවා. එහි තිබුණා පොරෝත්තු ලේඛණයේ අභියාචනා 16ක් තිබුණා. එහි අභියාචනා 08ක තිබුණා පුෂ්පික කියා. සමහර අයදුම්පත් 08ක විතර. එක්සත් ජාතික පක්ෂයෙන් ඒ වේලාවේ දිපු අභායාචනා. එතකොට අපේ ඔය කියන කෙනාටයි හරස්චන්ද්‍ර මහතාගේ දිමුතු තරංග කියන එයාටත් ප්‍රියන්ත කියා තව එක්කෙනෙකුටයි එක දිනයේ භාර දි තිබෙන්නේ. අරයාගේ අභියාචනා ලිපිය තිබෙනවා. මෙයාගේ අභියාචනා ලිපිය නැහැ. ඒ අනුව තමයි මා ග්‍රාම නිලධාරි එය අවුස්සන කොට කිවුවේ ඔයා හොරාට ලිපියක් ගෙනත් දෙන්න කාටවත් කියන්න එපා කියා. එතකොට ඒ අපේ පාක්ශිකයෙකුට තමයි දිනය වෙනස් කරලා ලිපිය දුන්නේ. එක දුන්නේ මුකුත් නෙමේ ගමේ ආරංචි කරවන්න ඔන්න ධර්මදාස තමන්ගේ හිතවතෙකුට මුදල් අරගෙන දුන්නා අනු පවුලකට . අනිත් අනු පවුල් වලට දුන්නේ නැහැ කියා පෙන්වීමට තමයි අපිට මඩ ගහන්න. අපි අපහසුතාවයට පත් කරන්න ගමේ. ඒ වැඩපිළිවල කරන්න ගියේ. එකතමයි මා ඒ මනුස්සයා සමඟ රණ්ඩුවක් ඇල්ලුවේ. ග්‍රාම සේවක පිරිමියෙකු වුණානම් මා එදා ගහනවා. ගැහැණු කෙනෙක් නිසා නොගහා හිටියේ. නොගහ ගැහුවා මං එයාට. අන්න ඒ වගේ කටයුතු සිද්ධ වුණා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රිවරු දැන ගන්න ඕන මේ සුන්දර කතන්දර සිදු වුයේ නැහැ. සියළුම මන්ත්‍රිවරු පක්ෂ භේදයකින් තොරව ග්‍රාම නිලධාරින් සමඟ සමෘද්ධි නිලධාරින් සමඟ රණ්ඩු වෙලා තමයි මේ රු.5000/= දීමනාව ගත්තේ. මුළු ගමේම මිනිසුන්ට අරගෙන දිලා තිබෙනවා. එමනිසා කවුරුවත් වරදක් කරයි කියන එක කතා කරන්න එපා. ඔලොල්ලන් උත්සාහ කර ඔය මුදල් ලබා දි තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි. ගරු අයිරාංගනී මන්ත්‍රිතුමිය ගොඩක් ප්‍රකෝපකාරිව අවේගශිලිව කතා කරනවා මා අද දැක්කාමයි. මුහුණත් කළුවෙලා ගිහින් කැත වෙලා. දැන් මා මිට වසර 10කට කලින් මන්ත්‍රිමිය වැඩසටහන් වලට ගිහින් අඳුනනවා. අද මොකක්ද වෙලි තිබෙනවා. විපරිතයි එය. එකට එච්චර කැමති නැහැ මා. එහෙම හොඳ නැහැ. එම නිසා සත්‍ය දැනගෙන කතා කරන්න. අපිටත් මේ අයදුම්පත් බෙදනවා කියා ආරංචි වුණාම මා ගරු සභාපතිතුමාට කතා කර ඇහුවා මේ අයදුම්පත් දෙනවාද කියා. ගරු සභාපතිතුමා කිවුවා ඔව් කියා. මා තකහානියක් ත්‍රි රෝද රථයක් ගෙන පැමිණියා නගර සභාවට. ඊට පසු නගර සභාව වහලා. ගරු සභාපතිතුමා කිවුවා මට ගෙදරට එවන්නම් කියා. එම අයදුම්පත් මට එව්වා. එවා එවු හැටියේම මා මාගේ

කොට්ඨාශයේ ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය කතා කළා. මෙහෙමයි මේ අයදුම්පත් එවා තිබෙනවා කියා. මා එම අයදුම්පත් ටිකකුත් එතුමිය කැමති අයට දෙන්න දුන්නා. පස්සේ මේක දැන ගත්තා මේක බොරුවක් කියා. ඊට පස්සේ මා මෙය  නතර කළා. ඊට පසු අපි කමිටුව රැස්වුණා. ඒ රැස්වෙන වේලාවේ අපි අතර කිසිම ගැටළුවක් තිබුණේ නැහැ. එතකොට ආර්ථික සංවර්ධන නිලධාරි , සමෘද්ධි නිලධාරි , සංවර්ධන නිලධාරි ,කෘෂි සංවර්ධන නිලධාරි , ග්‍රාම නිලධාරි කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. අපි ප්‍රජා ශාලාවේ සිට යන විට රාත්‍රී 12.30 පමණ වෙලා. එතකොට ඒ අය අපෙන් අහනවා. ඔබතුමියලා කැමති නැතිනම් මේක නොදී ඉන්න.  මා අපේ කොට්ඨාශයේ එම නිලධාරින්ට ස්තුතිවන්ත වෙනවා. ඊට පස්සේ ඒ අය කියනවා මෙය දිය හැකිනම් දෙන්න. ඒ අය අපට බලපෑමක් නම් කළේ නැහැ. අත්සන් ලේඛණයේත් මුලින්ම අත්සන් කරන්න දුන්නේ මටත් නිලානි මන්ත්‍රීතුමියටත් . අලුත් නමක් එහෙම දානවා නම් අපිට දුරකථන ඇමතුමක් දී අහනවා කමිටුව තියන්න ඕන නැහැ නේද ? පිළිගත හැකිනම් පිළිගන්න කියා. කිසිම ගැටළුවක් වුණේ නැහැ. අපි අපේ කොට්ඨාශයේ එම නිලධාරින්ට ස්තුති වන්ත වෙනවා. අපි ඔක්කොටම දුන්නා. හැම පුද්ගලයන්ටම දුන්නා. අපි තනි පුද්ලගලයන් සිටින පවුල් වලට දුන්නේ නැහැ. චක්‍රලේඛණය තිබෙන විදියට  දුන්නේ. කොරෝනා ව්‍යාසනයෙන් යම් හානියක් වෙලා තිබෙනවා නම් තමයි එය දෙන්න කියා තිබුණේ. ඊට පිටින් අපි කිසිවක් කළේ නැහැ. දෙන්න පුළුවන් හැමටම දුන්නා. ප්‍රාදේශිය ලේකම්තුමිය ඔය කරපු වැඩය නම් හොඳ  නැහැ . දැන් ඒ අයදුම්පත් බෙදන්න කියා අපේ සභාපතිතුමාට කියලා අපිට එය දිලා පසුව ජනතාව අතර එය ප්‍රශ්නයක් වෙනවානේ. එකෙන් මන්ත්‍රීවරු බාල්දු වෙනවා. අයිරාංගනී මහත්මිය මේ ගැන දැනගෙන සිටියේ නැති නිසා එච්චර අවේගශිලි වුණේ. දැන් එකෙන් වුණේ අපි බාල්දු වුණේ. මා එම අයදුම්පත් ටික ගොණුවක දමා තිබ්බා. මා එම අයදුම්පත් ටික අරගෙන කමිටුව ගියාම ග්‍රාම නිලධාරි මහත්මිය කියනවා එම අයදුම්පත් ගණන් ගන්නේ නැහැ කියා. මා බැලුවා මට දිපු අයදුම්පතුයි එම අයදුම්පතුයි හරිද කියා. සියල්ලම සර්ව සම්පුර්ණයි. ගැලපෙන්නැති වෙන්න ගැටළුවක් නැහැනේ. ඔබතුමිය එච්චර කලබල වෙන්න එපා. ඒ ගැන අමානපකම් ඇති කරගන්න එපා. අපි එම වැඩය කළා. අපි ජනතාවට රු.5000/= ලබා දුන්නා. මේ කොරෝනා ව්‍යාසනය නති වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>

ඔබතුමා දුන් අයදුම් පත් 200 ගෙන හැම නිවසකටම ගිහින් දුන්නා. මට ඡන්දය දෙනවා නම් හැම ගෙදරකටම ගිහින් මට අයදුම්පත දෙන්න පුළුවන් කමක් නැහැ. ඔබතුමිය කියනවා වගේ ගෙදරට පෝලිම් කරලා එහෙම දේශපාලනය කරන්නේ නැහැ. මොකද මා අතින් වියදම් කරගෙන මේ දේශපාලනය කරන්න. රුපියලක්වත් ලාභ ලබන්නවත් කොන්ත්‍රාත් කරන්න වත් නෙමේ. මට ඡන්දය දිපු නිසා මා හැම නිවසටම ගිහින් දුන්නා අයදුම්පත්. නමුත් ග්‍රාමසේවක මහත්මිය කියා තිබුණා. ත්‍රිවිල් එකකින් ගිහින් කොළ බෙදලා කියා කවුද? ගමේ මන්ත්‍රිවරයා ගියේ. අවුරුදු 32ක් හිටිය එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රිවරයා පරදා මා පත් කළේ ඕ වගේ දෙයක් කර ගන්න තමයි. නැතුව මට රක්ෂාවල් දෙන්න බැහැනේ. කාණුවක් සුද්ද කර දෙන්න පුළුවන්, කාණුවක් කපා දෙන්න පුළුවන් තාර ටිකක් දමා දෙන්න පුළුවන් , ඕවා තමයි ගමේ මන්ත්‍රිවරයෙක් විදියට කරන්න පුළුවන්. රජයේ රැකියා දෙන්න බැහැනේ කාටවත්. එකට තමයි වසර 32ක් හිටය මන්ත්‍රිවරයා පරදා මා පත්කළේ. එම ගෞරවය මා ඒ අයට තිබ්බා. ඒ අයදුම්පත් ගෙනවිත් එකතු කරලා ඊට පස්සෙන්දාම කමිටුව තියා ග්‍රාම නිලධාරි මහත්මිය කිවුවා. හැබැයි ග්‍රාම නිලධාරිතුමිය යෝජනා කළේ මා අරගෙන ආව අයදුම්පත්වල තිබුණු නම්. මා ගෙනා අයදුම් පත් 200ම නම් ගත්තා. ගරු සභාපතිතුමනි මා යෝජනා කරනවා මේ ප්‍රාදේශිය ලේකම්තුමිය මුදල් ගෙවන ලද නාම ලේඛණය අපට අරගෙන දෙන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මා ගෙන්වා තිබෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රි ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>

අපි නම් දාපුවා එතනදි කපලත් දන්නේ නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රිවරු සියළු දෙනාටම කිව යුතුයි මා සිඩි තැටියකට ගෙනත් තිබෙනවා සම්පූර්ණම විස්තර . තව අලුතෙන් අභියාචනා මගින් දැන් දෙන ඒවා වෙන සීඩි තැටියකින් ගෙන්වන්න ඕන. මා එය ගෙන්වා ගත්තේ අපි ලක්ෂ 65ක මුදලක් වෙන් කළා සභාවෙන් මුදල් ගෙවන්න. මට ගරු ආණ්ඩුකාරතුමා උපදෙස් දුන්නා සභාපතිතුමා රජයෙන් මුදල් දෙනවා එමනිසා සභාවෙන් මුදල් වියදම් කරන්න අවශ්‍ය නැහැ කියා. දැන් අපි මෙය අනුමැතියට යන්න ඕන නිසා ඒ කතාව සත්‍යයි කියා තහවුරු කර ගැනිමට මා අම්බලන්ගොඩ එම මුදල් ලබා දිපු ලැයිස්තුව මා හැම දෙනාටම ලබන සභාවට ලබා දෙන්නම්. කොට්ඨාශ මට්ටමට ගන්න පුළුවන්.

ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්

ඇත්තටම ලබා දෙන්න. මොකද ග්‍රාම නිලධාරිතුමියට චක්‍රලේඛණය එනවිට අපේ මේ දුරකථන වලට චක්‍රලේඛණ ලැබි තිබුණේ. මේ වෙනස් කරන චක්‍රලේඛණ මේ දුරකථනයට එනවා. එතකොට ග්‍රාම නිලධාරිතුමිය අපිට මේ චක්‍රලේඛණය පෙන්නුවේ නැහැ. නමුත් පක්ෂයෙන් අපට එවා තිබුණා චක්‍රලේඛණය. අපේ දුරකථනයට එවා තිබුණා. මේ කොට්ඨාශ වලින් යෝජනා කරන ලද නම් හරියට ගෙවා තිබෙනවාද කියා අපි බලන්න ඕනේ. සමහර ඒවා නම් කපා ඒ අයට ඕන නම් දමා තිබෙනවා කියා ආරංචියි. ඒකනිසා අපිට ඒවා බලන්න ඕන. මොකද මා අපේ කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි මහත්මිය සමඟ පැටලිලා තමයි මේ මුදල් ගෙව්වේ. මා එක්සත් ජාතික පක්ෂයේද , නිදහස් පක්ෂයේද , ජනතා විමුක්ති පෙරමුණේද ඒවා බැලුවේ නැහැ. මට වැඩක් නැහැ. මට ඡන්දය දුන්නාත් එකයි නැතත් එකයි . මට වැඩක් නැහැ. හැමෝටම දුන්නා ගිහින්. 260 ගණනකට මා ගෙවා තිබෙනවා. 260 ගණන අනු පවුල් එක්ක මා ගෙවා තිබෙනවා. විලේගොඩ කොට්ඨාශයේ. ඒ ප්‍රාදේශිය ලේකම්තුමියගෙන් ඒ ලැයිස්තුව අපිට අරගෙන දෙන්න. අනිත් එක මෙතුමිය කිවුවා මේ ග්‍රාමසේවක නිලධාරින් ගැන කොට්ඨාශයක් ඉන්නවා හොඳ.අනිත් කොට්ඨාශ දේශපානය කර තිබුණේ. ඔබතුමා දන්නේ නැති වුණාට අම්බන්ගොඩ නගරයේ සමෘද්ධි දෙන විට රු.30000/=ක අදායමක් තිබෙන කෙනෙකුට සමෘද්ධි සහානාධාරය ලබා දි තිබෙනවා. එතකොට ඒ දේශපාලනීකරණයක් නෙමේද? හරි අහිංසක මිනිසුන් ඉන්නවා සමෘද්ධිය ගන්න පුළුවන්. ඒ ජනතාවට සමෘද්ධිය හම්බ වුණේ නැහැ. අම්බලන්ගොඩ නගරයේ රු.30000/=ක් කඩ කුළි ගෙවන මනුස්සයාට සමෘද්ධිය දි තිබෙනවා. එහෙමයි ඔය දේශපාලනය කියන එක. අපි ඒවාට කතා කළේ නැහැ. අපි ඒවාට ගෞරව කරනවා. ඔබතුමිය කතා කළ විලාශය වැරදියි. හැම මනුස්සයාම මනින්න එපා ඒ විදියට. කොට්ඨාශ මන්ත්‍රි කියන්නේ කොට්ඨාශයේ ජනතාව පත්කළ මන්ත්‍රිවරයා. හැමෝටම ඒ ගෞරවය හිමි වෙනවා. ඒ වුණාට ඔබතුමිය කතා කළේ වෙන විදියකට.

ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්

ගෞරවය ලැබෙනවානම් දෙන්න එපැයි අයදුම්පත්.

ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්

ඔබතුමියට කිසිම අගෞරවයක් වුණේ නැහැ. මන්ත්‍රිතුමිය අපේ අයදුම්පත් වලට කිසිම අගෞරවයක් වුණේ නැහැ. මා අයදුම්පත් 200ම බෙදුවා. එම 200ටම මා මුදල් අරගෙන දුන්නා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ප්‍රාදේශිය මහ ලේකම් තැන සමඟ ඇතිකරගත් ඒ රහස් ගිවිසුම කණ්ඩනය කරලා අපේ මේ දේශපාලන නියෝජිතයන් හැල්ලුවට ලක් කරලා. මා ඒ ගැන කනගාටු වෙනවා. ඔබතුමා තව දුරටත් හිතා බලන්න ඒ පිළිබඳව.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙම කණ්ඩයක් සිදු වුණේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

එතුමිය එහෙනම් අපේ මන්ත්‍රීතුමියට කියා තිබෙන්නේ බොරු අයදුම්පත් කියා. මෙන්න මෙවායි ඇත්ත ඒවා. මොකක්ද මේ කොළ . ඒ විදියට කියා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මා කිවුවේ එතුමිය අයදුම්පත් දුන්නේ නැහැ කියා. ව්‍යාජ අයදුම්පත්නේ ඔගොල්ලන් දිලා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ අවස්ථාවේ කතා කරන්නේ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් මහතා. මන්ත්‍රීතුමා ඔබතුමා අපිව සම්බන්ධ කරලා ප්‍රාදේශිය ලේකම්තුමියට කටයුතු කරන්න එපා. එතුමිය බොහොම නිත්‍යානුකූල වෙන විදියට වැදගත් විදියට කටයුතු කළා. එමනිසා කරුණාකර ප්‍රාදේශිය ලේකම්තුමිය සම්බන්ධව ඔබතුමාට ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔබතුමිය විසඳා ගන්න. දැන් අද උදේත් මට එවා තිබෙනවා ආපු ප්‍රශ්නයක්. ඉතිං ඒවා බේරා ගන්න. ඒවා මේ වගේ සභාවලදි කතා කරන්න එපා. රාජ්‍ය නිලධාරින්ට විරුද්ධව එහෙම කියන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි කිවුවේ ඇය එලිකරපු වැඩියමක් දෙයක්. මේ වන විටත් අපේ ග්‍රාමයේ මේ දිමනාව නොලැබුණු අසරණ වූ පවුල් 10ක් 12ක් සිටිනවා. ඒ සම්බන්ධයෙන් අපි ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද කියා අහනවා. අභියාචනා දෙක තුන දමනවා. නැවත නැවත එය ප්‍රතික්ෂේප වෙනවා. මෙන්න මේ ග්‍රාම නිලධාරින්ගේ අමනෝපතික ක්‍රියාව නිසා තමයි මේ තත්ත්වය ඇතිවෙලා තිබෙන්නේ. එමනිසා අපි මේ මන්ත්‍රීතුමියට කියනවා සක්කිලි පාදඩ කියන වචන පාවිච්චි වුණා. අපේ මන්ත්‍රීවරු ඒ විදියට කටයුතු කළේ නැහැ. පිවිතුරු සිතින්මයි

කටයුතු කළේ. අපි සියළු දෙනාට ලැබී තිබෙනවා නම් ඔබතුමිය කියන විදියේ පහත් තත්ත්වයට අපි පත්වුයේ නැහැ. අපි කොහොමද මේ දිමනාව නොලබපු අයට කටයුතු කරන්නේ කියා අප අසා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අභියවනා දමලාත් ලැබුණේ නැද්ද? එහෙනම් දිසාපතිතුමාට දමන්න. ඒ කියන්නේ ඔබතුමාගේ තිබෙන සමහර ඒවා සම්බන්ධයෙන් මා සමඟ කතා කර තිබෙනවා. ඒ කියන ඒවා සියයට සියයක්ම සාර්ථක නැහැ. මට මෙතැන කියන්නත් බැහැ ඒවා. මා ඔබතුමාට පෞද්ගලිකව කියන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, කොරෝනා පැමිණියේ පක්ෂයක් පාටක්, උගත් නූගත්, උසස් , පහත් කිසිම දෙයක් බලන්නේ නැතුව. එමනිසා මේ අවස්ථාවේදි මේ මුදල් ලබා දුන්නේ. අපි දන්නවා අපේම මුදල් තමයි මේ ලබා දෙන්නේ. සමෘද්ධි අධිකාරියේ තිබෙන මේ මුදල් තමයි මේ නිකුත් කරන්නේ. ඉතිං එමනිසා සාර්ථක උත්සාහයක් මේ රජයෙන් කරලා අසාර්ථක කාර්යක් කරන්න ගිහින් තමයි මේ  අපේ මන්ත්‍රිවරුන්ට මේ ප්‍රශ්නයට මුහුණ පාන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ගරු මන්ත්‍රිතුමියට මේ ප්‍රශ්නය එන්න ඇත්තේ මෙය කොට්ඨාශයෙන් ආවාද , ලැයිස්තුවෙන් ආවාද කියා තිබෙන එක මත තමයි මේ ප්‍රශ්නය ඇවිත් තිබෙන්නේ. මොකද අපි දන්නවා පාර්ලිමේන්තුවේ සිටිනවා ලැයිස්තුවෙන් පත් කරන මන්ත්‍රිවරු. කොට්ඨාශයෙන් අනුපාතිකව පත් වෙන මන්ත්‍රිවරු ඉන්නවා. නමුත් ප්‍රතිපාදන ලබා දීමේදි එම සියළු දෙනාටම සමානව තමයි මේ ප්‍රතිපාදන ලැබෙන්නේ. එමනිසා මේ ගැන ඔබතුමා කතා කළහොත් එහෙම මේ පිළිබඳව කතා කරන්න ඔබතුමා හොඳ දක්ෂයි. එමනිසා මටත් මේ චක්‍රලේඛණය. ඔබතුමා එවා තිබුණා. එය ඔබ සියළු දෙනාටම ලැබිලා තිබෙනවා. මටත් තිබුණා මෙහි ඡායාරූප කරලා ඕන පදම් බෙදන්න. නමුත් මට මාගේ කොට්ඨාශයේ ලක්ෂ්මි මන්ත්‍රිතුමිය ඒ වේලාවේ මගේ කොට්ඨාශයේ සිටින මන්ත්‍රිතුමිය වශයෙන් මා ඒ දේ කරන්න ගියේ නැහැ. නැතිනම් මා දන්නවා ඇත්තෙන්ම මහ අම්බලන්ගොඩ වනසන විදිය . මාත් දක්ෂයි ඔබතුමා වගේ ගේම්වලට. නමුත් ගරු සභාපතිතුමනි, අර මන්ත්‍රිතුමිය ප්‍රකාශ කළ ආකාරයට කොට්ඨාශයට මේ අයදුම්පත දිමෙන් වැඩක් වුණේ නැහැ. ග්‍රාම නිලධාරිතුමියත් , සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමියත් ඒ වගේම ආර්ථික සංවර්ධන නිලධාරිතුමියත් , කෘෂි සංවර්ධන නිලධාරිතුමියත් එකතුවෙලා අපි කමිටුවෙන් ඒ වැඩටික සාර්ථක අයුරින් සිදු කළා. මේ අයදුම්පතේම තිබෙනවා . මෙහි අත්සන් කිරිමට තිබෙන්නේ ග්‍රාම නිලධාරි හා සමෘද්ධි සංවර්ධන නිලධාරි. එහෙමනම් මේ අයදුම්පතක් බෙදලා මන්ත්‍රිවරුන්ට මොකක්ද තේරුම.

එයට වගකියන්නත් ඕන ඔබතුමා. මෙහි කාර්ය සාධන බලකායේ සභාපති කෙනෙක් පත්වෙලා ඉන්නවා. එම සභාපතිතුමා තමයි ඔබතුමාට කියන්න ඇත්තේ මේ චක්‍රලේඛණය සමඟ මේ අයදුම්පත යවන්න සලස්වන්න කියා. ඉතිං අපිට බලයක් නැතිව මේවාට අත්සන් කරන්නේ කොහොමද? කමිටුවේදි විතරයි අපිට එයට සහභාගි වෙලා ඒ වන වැරදි නිවැරදි කිරීමට අවස්ථාව ලැබුණේ. ඒ ජනතාවට ව්‍යාසනයකදි අපෙන් විය යුතු සේවාව සැපියීමට සිටිනවා. අපේ ජනතාව අතර සිටින මහජන නියෝජිතයෝ . එමනිසා මේ වගේ බොරු දේවල් කරන්න එපා. රජය ඇත්තටම කළේ ලොකු දෙයක්. අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත විය යුතුයි . මේ වගේ වේලාවට ව්‍යාසනයක් සිදු වූ වේලාවක ජනතාවට සහන සැලසීම ගැන. පසුගිය දිනවල අපි දුටුවා ඔබතුමා පාසැල් ළමුන්ට පොත් ලබා දීමේදි ඔබතුමා ඔය කාර්ය කළා. ඔබතුමා දැන් සුදන වගේ කතා කළාට ඔබතුමා ඒ දේ කළා. ඔබතුමා තිබෙනවා එක් පුද්ගලයෙකුට එක හැන්දකින් බෙදිමක් තවත් පුද්ගලයෙකුට තවත් හැන්දකින් බෙදිමේ පුරුද්ද ඔබතුමාට තිබෙනවා. සංවර්ධන වැඩක් කිරිමේදි තිබෙනවා. අපි දෙයක් කිවුවාට කෙරෙන්නේ නැහැ. ගරු ලේකම්තුමියණනි , මා ඔබතුමියට කියනවා ගරු මන්ත්‍රිවරුන්ගේ වරප්‍රසාද සම්බන්ධයෙන් කටයුතු කළ යුත්තේ ඔබතුමියයි. එමනිසා ඔබතුමිය අපි ගැන බලා ගත යුතුයි. ගරු සභාපතිතුමාගේන් ඒ දේ වෙනවානම් අපේ අයිතිවාසිකම් වෙනුවෙන් ඔබතුමිය කටයුතු කළ යුතුයි. පසුගිය දිනවල අභ්‍යාස පොත් බෙදන වේලාවේ පොදුජන පෙරමුණේ අපේක්ෂක අපේක්ෂිකාවන්ට අයදුම්පත් ලබා දුන්නා. එහෙම කටයුතු කළා. ගරු සභාපතිතුමනි, මා හැමදාම කියන දෙයක් තමයි ඔබතුමා හැමදාම මේ පුටුවේ වාඩිවෙලා ඉන්නද බලාපොරෝත්තු වෙන්නේ. ඔකට මේ නිතිඥ ලක්ෂ්මි මන්ත්‍රිතුමිය ඉන්නවා, ගරු උප සභාපතිතුමා ඉන්නවා, ගරු සරත් ශ්‍රී ලාල් මන්ත්‍රිතුමා ඉන්නවා ඔය පුටුවේ වාඩිවෙන්න. එමනිසා ඔබතුමා බොහොම දරදඩු විදියට ඒකාධිපති විදියට යන්න එපා. සහායෝගයෙන් අපිත් එක්ක වැඩ කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මට මතක් වෙනවා ඔබතුමියයි මාත් එකට ඉන්න කාලේ ඔබතුමිය දෙනු ලැබූ උපදෙස් ටික. අන්න ඒවා තමයි දැනුත් මා කරන්නේ. ඒ කාලේ ගරු රහුල මන්ත්‍රිතුමලා කිව්වේත් තදින් ඉන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.ඒ. නිලානි මෙනවිය කතා කරමින්</u>**

මා කොයි වේලාවේත් ඒ කාලයේත් සංවර්ධන වැඩ කටයුතු වලදි ඔබතුමාට සහායෝගයෙන් වැඩ කළා. එමනිසා දිර්ඝව කතා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ව්‍යාසනයක් වෙච්ච වේලාවේදි අපි ජනතාව සමඟ සිටිනවා. ගරු මන්ත්‍රිතුමිය දන්නවා ජනතාව අතරට යන එක ටිකක් අඩුයි මොකද එතුමියට කාලවේලාව නැති නිසා වෙන්නත් ඇති. නැතිනම් ඒ එතුමියගේ හැටි වෙන්නැති. නමුත් මම එහෙම නෙමේ ඡන්දය දිනුවත් එකයි නැතත් එකයි මා සිටින්නේ

මහජනතාව සමඟ. කවුරු පැමිණ ඒ ජනතා සේවය කරන්න සූදානම් වුණත් මා මාගේ මහ අම්බලන්ගොඩ කොට්ඨාශයේ එම හයිය තියාගෙන තමයි වැඩ කරන්නේ. එමනිසා ගරු සභාපතිතුමනි , මීට වඩා අපේ සහෝදර මන්ත්‍රීවරුන්ගේ සහායෝගය අරගෙන සාර්ථක නගර සභාවක් සාර්ථක සේවයක් අම්බලන්ගොඩ නගරයට කරන්න සූදානම් වෙන්න කියන අභියාචනය ඔබතුමාට කරනවා. අපේ අයිරාංගනී මන්ත්‍රීතුමිය ඔබතුමාට සැහෙන්න සහායෝගයක් දෙනවා. අපිටත් වඩා සහායෝගය දෙමින් කාන්තා වැඩ මුළුවලදී ඔබතුමාට සහායෝගය දෙමින් අඩුම ගණනේ එතුමියට මේ අයදුම්පත් 10ක්වත් ලබා දෙන්න තිබුණා. මට නම් අවශ්‍ය නැහැ. එහෙම දුන්නා නම් ඔය ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ. නමුත් එම අයදුම්පත්‍රය ගැන එතරම් ප්‍රශ්න ඇති කර ගැනීමට වැඩක් නැහැ. ඔබතුමියගෙනුත් මා යම් අඩුපාඩුවක් දකිනවා. ඇත්තටම ඔබතුමිය මහජන නියෝජිතයක් විදියට කොළඹ ප්‍රදේශයේ පදිංචිව නොසිට මේ වගේ අවස්ථාවක ඔබතුමිය සිටිය යුත්තේ ගමේ ජනතාව සමඟ. තමන්ගේ කොට්ඨාශයේ ගරු මන්ත්‍රීවරිය බලය දෙන්නේ නැති නම් බලය ගන්නා හැටි පෙන්වමින් කටයතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශයේ කොට්ඨාශ දෙකක මේ කමිටු සඳහා මා සහභාගී වුවා. එහිදී අපි මන්ත්‍රීවරු ඉතාමත් සහායෝගයෙන් එකම මතයක ඉඳගෙන සමෘද්ධි හෝ ග්‍රාම නිලධාරි හෝ යන අයට විරුද්ධව අපි තනි පැත්තක සිට මිනිසුන්ගේ අයිතිවාසිකම් ලබා දෙන්න පුළුවන් වුණා. එතනදී මේ අයදුම්පත් බැලුවේ නැහැ. එතනදී කොටින්ම මේ අයදුම්පත් අදාළ වුයේ නැහැ. මට කනගාටුවකුත් ඇතිවුණා. ගරු ධම්මික කොඩිකාර මන්ත්‍රීතුමා එම අයදුම්පත් ගෙනවිත් පොඩි මහන්සියකුත් දරා ඒවා පුරවා වෙහෙසක් දරා තමයි එතුමා මේ ටික රැගෙන ආවේ. නමුත් එක නොතිබුණා කියා අපේ මිනිසුන්ගේ නම් දාන්න බැරි වුණේ නැහැ. එතකොට එහි වටිනාකමක් මා දැක්කේ නැහැ. එහෙම සිදු වීමක් වුණා. ඇත්තටම ඔබ කළ දෙයින් ඔබගේ මන්ත්‍රීවරු තමයි හැල්ලුවට ලක් වුණේ. මා නිහතමානිව කියනවා. මා රණ්ඩු කරන්නේ නැහැ. ඒ වගේම මා ඔබතුමාට ඔය සිද්ධිය සිදු වූ දිනයේ උදේපාන්දර කතා කළා. මට ඒ වේලාවේ ටිකක් අවේගයක් ආවා. මා කිවුවා මොකක් හරි ඉදිරියට බලාගන්න කියා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මා එකයි කිවුවේ මේ චක්‍ර ලේඛණය අනුවයි කළේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ඔබතුමා මොකක්ද චක්‍ර ලේඛණයක් ගැන කිවුවා . මට තේරුණෙත් නැහැ.ඔබතුමාට තේරුණෙත් නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඔබතුමාලා වගේ කට්ටිය 1980 ගණන් වලට සිට අපට ගොඩක් දේවල් කර තිබෙනවා. ගෙවල් ගිනි තියා තිබෙනවා. බෝම්බ ගසා තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

නැහැ. නැහැ. මා කිවුවේ සභාවේදි කියා. අපි එක බය නැතුව කියනවා. අනික මේ ලංකාවේ මේ නගර සභාවේ විතරයි මේ අයදුම්පත් බෙදා තිබෙන්නේ. මා බැලුවා අම්බලන්ගොඩ බටපොළ ප්‍රාදේශිය සභාවේ. එම මිනිසුන් දන්නේත් නැහැ. බලපිටියෙන් ඇහුවා ඒ අය දන්නේත් නැහැ. එතකොට මේය ඇවිත් තිබෙන්නේ අම්බලන්ගොඩ නගර සභාවට විතරයි. එතකොට මේ කෙහෙල්මලෙන් වුණේ ඔබතුමාගේ මන්ත්‍රීවරු හැල්ලුවට ලක් විම විතරයි. මා නිහතමානිව කියනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමා මෙහෙමයි. සමස්ත ජනතාවට මෙය ලබා දෙන්න පුළුවන් වුණේ අම්බලන්ගොඩ නගර සභාවේ විතරයි. එකත් සොයා බලන්න. නැතිනම් කිසිම පක්ෂ භේදයකින් තොරව දුන්නේ. නැතිනම් සමහර ගම්වල දන්නේත් නැහැ. මොකක්ද වුණේ කියා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මාගේ ළඟ අයදුම්පත් තිබුණේ නැහැ කියා ලැබිය යුතු අයට ලබා දෙන්න අපට නොහැකි වුණොත් නැහැ. ඒ අභියෝගයත් මා කරනවා. මා අයදුම්පත් ගැන කරදර වෙන්නේ නැහැ. මට අයදුම්පත් අවශ්‍ය නැහැ. අවශ්‍ය නම් මටත් තිබුණා ඡායරූප ගසා දෙන්න තිබුණා. මට මේ අයදුම්පත රැගෙන ගිහින් අපි තමයි මේ රු.5000/= ලබා දෙන්නේ කියා බොරු සෝබන කිරිම වැඩක් නැහැ .

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඒ වුණාට බොරු සෝබනය දමන්න මගෙන් අයදුම්පත් ටිකක් ඉල්ලුවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

එතනින් කාටත් දෙනවා නම් අපි බෙදන්න ඕන. එහෙම දෙයක් තිබෙනවා. අපි මනුස්සයෝ අපිට තරහා යනවා. අනික මේ අයදුම්පත් මුද්‍රණය කරන්න මේ ගෙනාවේ පුද්ගලික මුදල් වලින් ද නගර සභා මුදල් වලින් . අනිත් එක මුද්‍රණ ගාස්තු , තින්ත සඳහා යන වියදම්, සේවක කුළි මට තෙරෙන විදියටනම් නගර සභා මුදල්. අනිත් එක තමයි අභියාචනා ප්‍රතික්ෂේප වීම ගැන අපේ ගරු මන්ත්‍රීවරයෙක් කියා සිටියා. ඔබතුමා කිවුවා මා එය පසුව කියන්නම් කියා . මා දන්නවා හේතුව. එම අභායාචනා ඉදිරිපත් කර තිබෙන්නේ ඒ අදාල පුද්ගලයින් විසින් නෙමේ. එගොල්ලන් නගරයේ නැහැ. පිටත් ප්‍රදේශවල පදිංචි වෙලා තිබෙන්නේ. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට යන්න බැරි තත්ත්වයක් තමයි ඒ අයට තිබෙන්නේ. සමහර මන්ත්‍රීවරුන්ට. එමනිසා තමයි මා ඔය ප්‍රශ්නය ගොඩ නගන්නේ. මා මෙන්න මේ මාතෘකාව ගැන කතා නොකර ඉන්න හිටියේ. නමුත් අද ඇතිවූ තත්ත්වය උඩ අපි මේ හැමෝම වැටිලා සිටින්නේ මේ ආධාර බෙදා දිම කියන මේ වළේ. නමුත් මා එයින් පිට සිට මේ ප්‍රශ්නය දුටුවා. දින දෙකක් ඇඳිරිනිතිය දැම්මාට පසු මිනිසුන් සියළු දෙනාම එනවා නගරයට හෝ කඩ විදියට බඩු ගන්න. ඒ මිනිසුන්ට දින දෙකකට වඩා කන්න බඩු නැහැ. හාල් පොල් පරිප්පු සිනි ඇවිත් නැහැ. ඒ

හින්දා ඒ මිනිසුන් කඩාගෙන එනවා කඩ මණ්ඩියට. එහෙමනම් ඒ මිනිසුන් දුප්පත්. ඒ මිනිසුන්ට බඩු ගෙනහින් මාසයකට කන්න ඒ අයට වත්කමක් නැහැ. ඒ කියන්නේ ඒ මිනිසුන් දුප්පත්. ඇයි දුප්පත් වෙලා තිබෙන්නේ. එක්කෝ රැකියාවක් නැහැ. එක්කෝ කරන රැකියාවෙන් අපිට නොතෙරෙන විදියට 30%ක් 40% ක් රජයෙන් බදු ගහනවා. ලක්ෂයක පඩියක් ගත්තාත් රු. 60000/= වියදම් කරන්න පුළුවන්. රු.40000/= නැවත නොයොක් ආකාරයෙන් වක්‍රව බදු ගහනවා. මා මේක කියන්න නෙමේ හිටියේ මට පක්ෂයෙනුත් අවවාද කළා මෙය කියන්න එපා කියා. නමුත් මට මෙය තව දුරටත් දරා ගෙන ඉන්න බැහැ. එතකොට මේ දුප්පත්කම ගොඩ නැගුවේ කවුද ? 1948 නිදහස ලැබුවා නම් අවුරුදු 72ක් තිබුණා මේ රට ගොඩ නගන්න. මෙතෙක් පාලනය කළ සියළු පාලකයන් මෙයට වගකිව යුතුයි. මේ දුප්පත් කමට. මේ කොරෝනා - 19 කියන එක අතුරු සිද්ධියක් තමයි. මිනිසුන් දුප්පත් වෙලා තිබෙන්නේ අතිත පාලකයන්ගේ නොහැකියාව මත. අන්න එම කාරණය ඉස්මතු කරමින් නිහඬ වෙනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු නිලානි මන්ත්‍රීතුමියත් , ලක්ෂ්මි මන්ත්‍රීතුමියත් , ඉන්ද්‍රා අයිරාංගනි මන්ත්‍රීතුමියත් කිවුවා ව්‍යාජ අයදුම්පත් කියා. ලක්ෂ්මි මන්ත්‍රීතුමිය හා නිලානි මන්ත්‍රීතුමිය කියා සිටියා බොරු අයදුම්පත් කියා. ඔබතුමියත් කිවුවා බොරු අයදුම්පත් නිසා බෙදුවේ නැහැ කිවුවා භාගයක්. ටේප් එක දමා බලන්න. දැන් අයිරාංගනී මන්ත්‍රීතුමිය කෙලින්ම කිවුවේ ප්‍රාදේශිය ලේකම්තුමිය කියා තිබුණා කියා මේවා ව්‍යාජ අයදුම්පත් කියා. මගේ කතාව මට කරන්න දෙන්න. මා ඔබතුමියලාට කරදර කළේ නැහැ. එමනිසා මා ඔබතුමාගෙන් අසනවා මේ අයදුම්පත් ව්‍යාජ එකක්ද නැතිනම් බොරු එකක්ද කියා. ඇත්ත එකක්ද බොරු එකක්ද කියා. ගරු සභාපතිතුමනි විශේෂයෙන් මා කියන්න ඕන ප්‍රාදේශිය ලේකම්තුමිය එහෙම ප්‍රකාශයක් කළානම් ඉතාමත් වැරදි ප්‍රකාශයක් බව මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ඔබතුමාත් ඔය විදියට අසන නිසා මා කියන්නේ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මගේ අවස්ථාව මට දෙන්න .

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

හා එහෙනම් කියන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මාගේ දුරකථනයටත් මේ චක්‍රලේඛණය ආවා. මා ගරු සභාපතිතුමාටත් කතා කළ ඇසුවා. ගරු සභාපතිතුමනි , මෙහෙම එකක් තිබෙනවා . අපි මොකක්ද කරන්නේ කියා. මා කාර්යාලයේ ඉන්නේ එන්න කිව්වා. මමත් ආවා . ඒ ටික වේලාවකට පසු ධම්මික මන්ත්‍රීතුමාත් පැමිණියා. ගරු සභාපතිතුමා කෙලින්ම කතා කළේ ප්‍රාදේශිය ලේකම්තුමියට. මුලින් කතා කරලා ප්‍රාදේශිය ලේකම්තුමියගෙන් ඇහුවා . මේ අයදුම්පත ඔබතුමිය මුද්‍රණය කරනවාද ? අපි සභාවෙන් මුද්‍රණය කරන්නද කියා. එතුමිය ප්‍රකාශ කළා අපිට තාම මෙය කරගන්න බැරි වුණා. සභාවෙන් මුද්‍රණය කරන්න කියා. ඒ වේලාවේ ගරු සභාපතිතුමා, මෙහි කොළ තිබුණේ නැහැ. අපේ කාර්යාල කාර්ය සහායක මහතා යවා අයදුම්පත් මුද්‍රණය කළේ. එක තමයි සත්‍ය කතාව. මා ඉදිරිපිට තමයි ගරු සභාපතිතුමා ප්‍රාදේශිය ලේකම්තුමියට කතා කරලා ඒ අවසරය අරගෙන මෙය සිදු කලේ. එමනිසා ප්‍රාදේශිය ලේකම්තුමිය එහෙම ප්‍රකාශයක් කළානම් මා දන්නේ නැහැ ඔබතුමිය කිව්වා කළා කියා . කළානම් ඉතාමත් වැරදි සහගත තත්ත්වයක්. අපි කනගාටු වෙනවා නගරයේ පාලකයා වශයෙන් මෙහෙම ප්‍රකාශයක් කළා නම් . එහෙම ප්‍රකාශයක් කළානම්. ඔබතුමිය කියන ආකාරයට. ඔබතුමිය තමයි කිව්වේ.

**ගරු නගර සභා ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

කරුණු ඉදිරිපත් කරන්න දෙන්න. එතුමිය කිව්වේ එතුමිය ළඟ අයදුම්පත් තිබෙනවා . බෙදුවේ නැහැ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

එතුමිය එහෙම ප්‍රකාශයක් කළානම් . එතකොට අයදුම්පත් මුද්‍රණය කර තිබුණේ නැහැ. ප්‍රාදේශිය ලේකම්තුමිය එහෙම ප්‍රකාශයක් කළානම් ඉතාමත් වැරදි සහගත ප්‍රකාශයක්. ඒ වගේම අපේ මන්ත්‍රීවරු කතා කළා වගේ දිගින් දිගටම මෙය යන විට මා ගරු සභාපතිතුමාට කතා කළා. ගරු සභාපතිතුමනි , මෙහෙම ප්‍රශ්නයක් ඇති වෙනවා . ප්‍රාදේශිය ලේකම්තුමිය කිව්ව නිසා තමයි බෙදුවේ . අපේ මන්ත්‍රීවරු දැඩි අපහසුතාවයකට පත්වෙනවා. ගරු සභාපතිතුමාට වගේම මටත් කතා කළා. අපි ඇත්තටම රට පාලනය කරන පක්ෂය. රට පාලනය කරන කොටස්කරුවන් වශයෙන් අපි මන්ත්‍රීවරු වගේම තමුන්නාසේලාත් සතුටු වෙන්න ඕන මේ ව්‍යාසනය යටතේ මුළු ගමේම ජනතාවට 760ක වගේ කොටසකට මේ මුදල් ලබා දීම. ගරු සභාපතිතුමා වගේම ඔබතුමලා කියනවා වගේම අපි අයදුම්පත් ලබා දුන්නා නම් අපේ කමිටුවේදි සාකච්ඡා කරලා මා නිලධාරින් පස්දෙනාට කිව්වා ඔබතුමලා මෙය ප්‍රතික්ෂේප කරනවා නම් දෙන්න බැරි කාරණය අයදුම්පත අනිත් පැත්තේ ලියන්න. ලියන්න මෙයාට මේ හේතුව නිසා දෙන්න බැහැ. එහෙම කියා එම නිලධාරින් පස්දෙනාම අත්සන් කළ පසු තමයි මා

එම අයදුම්පත් ගත්තේ. මා දන්නේ නැහැ ඒ අයදුම්පත් වලටම ආපසු ගෙව්වාද කියා. ඒ අයදුම්පත් වලට මුදල් ගෙවුවා. හැබැයි කොටස්කරුවන් වශයෙන් පක්ෂ භේදයකින් තොරව ඔය හැමෝම දිනුවා කියා කියන්න ඕන. අපේ ගරු ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතාත් නම් 15ක් ගෙන ගොස් බැලුවා. එතුමාගේ එම නම් 15ම එම ලැයිස්තුවේ තිබුණා. එතුමා තල්ගස්ගොඩ ප්‍රදේශයට ගිහින් බැලුවා. එම නම් 15 තල්ගස්ගොඩ කොට්ඨාශයේ තිබුණා. එමනිසා පක්ෂ භේදයකින් මෙය දුන්නා කියා කාටවත් මෙය කියන්න බැහැ. මේ ගරු සරත් චන්ද්‍ර මන්ත්‍රීතුමා කියූ පරිදි මේ අයදුම්පත් මුද්‍රණය කිරිමට එහෙම සිද්ධියක් වුණානම් එයට මුල පිරුවේ මේ ප්‍රාදේශිය ලේකම්තුමියයි. එමනිසා ඒ සියළු වගකිම් ප්‍රාදේශිය ලේකම්තුමිය භාරගත යුතුයි. අපි නගර සභාවෙන් යම්කිසි මුදලක් වියදම් කළාම එක වියදම් වුණා . එකට ගරු සභාපතිතුමා වත් මන්ත්‍රිවරුවත් ඒ ව්‍යාසනය පැමිණි වේලාවේ වියදම් දරාපු එම කටයුත්ත ප්‍රාදේශිය ලේකම්තුමියගෙන් අසා කලේ. සම්පුර්ණයෙන් අහලා කළේ. රාජ්‍ය නිලධාරියෙක් වශයෙන් මේ රට පාලනය කරන එතුමාට අයිතියක් තිබෙනවා . එමනිසා ඒ දේ කළා. ඒ විටිනාකම නැති වුණානම් ඔබතුමලා කියනවා වගේ ඒ වටිනාකම ඒ ගිය සම්පුර්ණ වගකිම ප්‍රාදේශිය ලේකම්තුමිය දැරිය යුතුයි. මා විශේෂයෙන්ම කිව යුතුයි අපි මන්ත්‍රිවරු දිගින් දිගටම කතා කරනවා . මේ මන්ත්‍රිවරුන්ට අසාධාරණයක් වුණා. අපේ ධම්මික මන්ත්‍රිතුමාටත් මට දැනගන්නට ලැබුණා රාහුල මන්ත්‍රිතුමාටත් ලොක් අකරතැබ්බ වලට මුහුණ දෙන්න සිද්ධ වුණා. එතුමා සත්‍ය කතා කරන්න ගිහින් කමිටුවේ එතුමාගේ භාර්යාවට දෝෂාරෝපණයක් වුණා. මට ආරංචියේ හැටියට. ජනතාව වෙනුවෙන් එම සේවය කරන්න ගිහින් එම සේවය වෙනුවෙන් එහෙම වුණා නම් අපි ඒ පිළිබඳ කනගාටුව ප්‍රකාශ කරනවා. සභාව වෙනුවෙන් කතා කරන්නේ මන්ත්‍රිවරු. ග්‍රාම නිලධාරින් ගැන කිවුවා මෙතුමිය . ග්‍රාම නිලධාරින් ගැන කියන විට හැමෝම එකවගේ කලා කියා කියන්නේ නැහැ. යම්කිසි කොටසක් ඉතා ඉක්මනින් වැඩකටයුතු කළා. සමහර ග්‍රාම නිලධාරින් හිටියා තමන්ගේ ගෙදර ගිහිනුත් ලැයිස්තු හැදුවා. තමන්ගේ ගෙදර අරගෙන ගිහින් හැදූවේ ලැයිස්තු . ඉතිං එහෙම නිලධාරිනුත් හිටියා. මා ඇත්තටම කනගාටු වෙනවා. තමන්ගේ මන්ත්‍රිකම ගැන වගකිම ඉටු කිරිම. අපි ඒ කමිටුවේ සභාපති වශයෙන් පත් කර තිබෙනවා නම් එම චක්‍රලේඛණය ගරු සභාපතිතුමා ඔබතුමාලාට යැව්වා නම් එයට කමිටුවේ බලය ගන්න තමන් දැන ගත යුතුයි මන්ත්‍රිවරයෙක් වශයෙන්. එයට අපි මෙතැන දොස් කියලා වැඩක් නැහැ. මේක ගන්න බැරි වුණා. වැඩක් නැහැ කියා. එමනිසා මා සාමාන්‍යයෙන් මෙයට එකඟ වෙන්නේ නැහැ. දැන් මගේ 700 ගණක් දෙනවිට දෙන්න බැරිනම් හේතුව ලියා දෙන්න කිවුවා. මෙන්න මෙකයි හේතුව. මා එම ජනතාව දැනුවත් කළා මෙන්න මේ හේතුව නිසා දෙන්න බැහැ කියනවා කියා. හැබැයි කොහොම වුණත් මා දුන් ලැයිස්තුවේ මට දී ගන්න බැරි වුණේ එකම එක්කෙනාටයි.

එයා එම චක්‍රලේඛණය අනුව දිගන්න බැරි නමක් නිසා. අපි මන්ත්‍රීවරු 21 දෙනාම සමස්තයක් වශයෙන් තමන්ගේ කොට්ඨාශ වල මේ රු.5000/= දීමනාව ලබා දීමට හැකි වුණා. ඒ සම්බන්ධව අපේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට මේ අවස්ථාවේදි අපේ ගෞරවය පුද කරනවා. එතුමා තමයි මේ වගේ එඩිතර තින්දුවක් අරගෙන ඒ විතරක් නෙමේ මැයි මාසයේත් රු.5000/= ඊයේ සිට ගෙවීමට නියෝග කළා. අපේ රජයක් අපේ ජනාධිපතිවරයෙක් ඉන්නේ.එම නිසා අපේ ගෞරවය, අපේ ස්තුතිය පුද කර සිටිනවා මේ ගත්ත ක්‍රියා මාර්ගයට. මොකද විශාල මුදලක් වැය වුණත් තමන් ඒ ගත්ත ක්‍රියාව සම්බන්ධව. ශ්‍රී ලංකා පොලිසියට ත්‍රිවිධ හමුදාවට ඒ ආයතන වලටත් මේ රු.5000/= ලබා දි තිබෙනවා. ඒ වගේම විශ්‍රාමිකයන්ට තමන්ගේ විශ්‍රාම මුදල් ගැනීමට එම පහසුකම් ලබා දුන්නා. අදත් රජයෙන් එම පහසුකම ලබා දෙනවා විශ්‍රාමිකයන්ට එම පහසුකම ලබා ගැනීමට. බැංකුවට හා තැපැල් කාර්යාලයට එන්න. අපි මෙතැන භේද වෙන්නේ නැතුව අපි කවුරු කළත් මොන පක්ෂය කළත් මොන් ආණ්ඩුව කළත් හොඳ දෙයට හොඳයි කිව යුතුයි. එමනිසා තමයි කිවුවේ අපේ අතිගරු ජනාධිපතිතුමාට හා ගරු අගමැතිතුමාට අපේ ගෞරවය පුද කරනවා. මේ අවස්ථාවේදි මේ කොරෝනා ව්‍යාසනය වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ග වෙනුවෙන්. එමනිසා මා අපේ සරත් චන්ද්‍ර මන්ත්‍රීතුමාට විශේෂයෙන් දෙයක් කිව යුතුයි. එතුමා ප්‍රකාශයක් කළා සභාව පාලනය කරන්න යනවා කියා මන්ත්‍රීවරු . මා එතුමාට කියනවා එහෙම අපි සභාව පාලනය කරනන් යන්නේ නැහැ. 1997 වර්ෂයේ සිට මේ සභාව නියෝජනය කළ ගරු මන්ත්‍රීවරයෙක් වශයෙන් අපි සභා නිතිවලට යටත්ව තමයි මේ සභාව නියෝජනය කරන්නේ. මට යම්කිසි අවස්ථාවක මට රිති ප්‍රශ්නයක් අහන්න ඒ අවස්ථාව කර ගන්නවා. මොකද මා ගරු සභාපතිතුමාගෙන් ඒ ප්‍රශ්නය ඇහුවේ මෙය නිත්‍යානුකූලද නැද්ද කියන එක. එහෙම කවුරු හරි හිත් තැවුලක් වුණානම් මොකද මට එතුමා ප්‍රකාශ කළා සභාව පාලනය කරන්න යනවා කියා. සභාව පාලනය කරන්න ගියේ නැහැ. ඕනැම වේලාවක ගරු මන්ත්‍රීවරයෙක් වශයෙන් මාගේ අයිතිය වෙනුවෙන් කටයුතු කරනවා. අප සියළු දෙනාම එකතු වෙලා මේ ව්‍යාසනය වෙනුවෙන් ලොකු කාර්යයක් සිදු කළා. එම නිසා ඒ සියළු දෙනාටම අපේ ස්තුතිය පුද කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

මේක මම යෝජනාවක් විදියට හරි දාල කතා කරන්න තමයි හිටියෙ. මේ ඇතිවුණ සිද්ධිය තුළ ගරු මන්ත්‍රීවරුන්ගෙ ගරුත්වයත් අපි ආරක්ෂා කරන්න ඕන. ඒක තුළ ඕන අපි කටයුතු කරන්න. මං හිතන්නෙ අපි මුලින්ම ස්තූතිවන්ත වෙනව ඇත්තටම අතිගරු ජනාධිපතිතුමන් ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් මෙම කොරෝනා වෛරසය මැඩ පැවැත්වීම ඉතාමත්ම සාර්ථකව කළා. ඒ කරන අතරතුර එක පැත්තක් නෙමේ. මහජනතාවටත් ආධාර දෙන්න ඕන.

නීත්‍යානුකූල ක්‍රමවේදය තුළ ඒ ගත්තු තීන්දු තීරණ ගත්තා. නමුත් පොඩි අඩුපාඩුකම් මේ වක්‍රෙල්ඛය තුළ අපි දැක්කා. මොකද ඔබතුමා ගරු සභාපති හැටියට තාක්ෂණේ දියුණු නිසා ටක් ගාල ගන්නවා. හැබැයි වක්‍රෙල්ඛනයේදී ඒකෙ බලය දීල තිබුණේ ඒ පාලක පක්ෂයේ මන්ත්‍රීවරුන්ට. ඒ කොට්ඨාසෙ දිනපු මන්ත්‍රීවරුන්ට. කමිටුවට සහාගී වෙන්න පුළුවන් කොට්ඨාසෙ දිනපු මන්ත්‍රීවරුන්ට. වක්‍රෙල්ඛණේ ගහන්නෙ නගර සභාවට නෙමෙයිනෙ. ප්‍රාදේශීය ලේකම්ට එවනවා. ඒ හරහා ග්‍රාම නිලධාරීන් වශයෙන් ඒක දැනුවත් කරල හැබැයි කවුද සභාපති කමිටුවල කවුද ඒව මුකුත් නැහැ. හරි. මේ අර්බුද ගැටලු එන්නෙ ඒකයි.හැබැයි කාර්යභාරයක් පවරල තිබුණා වක්‍රෙල්ඛනය තුලින් කොට්ඨාසෙ දිනපු මන්ත්‍රීවරුන්ට. ඒක නිසා මං ගියේ නැහැ ඇත්තටම. මොකද මට අයිති නැති කාර්යභාරයක් මට කරන්න බැහැනෙ. හැබැයි මට ග්‍රාම සේවකයි, ආර්ථික සංවර්ධන නිලධාරියි මිනිස්සුත් ඇවිල්ල මට කිව්වා. ඇයි මේකට එන්නෙ නැත්තෙ. ඇවිල්ල කොහොම හරි මේකට සහභාගී වෙන්න කියල. අපිට උපදෙස් ගන්න ඕන කියලා. මෙතුමා හැබැයි ලියුමක් එවල තිබුණා මේ සම්බන්ධව එතකොට අපේ නගරෙ ගරු සභාපති හැටියට මහජනතාවගේ ප්‍රශ්න ගැටලු බලන්න ඕන නිසා මං ගියා ඒ පාර ධම්මික මහත්තයත් කතා කරා. ගරු සරත් මන්ත්‍රීතුමත් සහභාගී වුණා. මෙතුමිය ඇත්තටම අසරණ තත්ත්වයක හිටියෙ. මෙතුමියට අවසර දුන්නෙත් නැහැ එන්න. මෙතුමිය හිටියෙ මොරටුවෙ. රාජකාරි කරන නිසා. ක්ෂණිකව ඇති වෙච්ච තත්ත්වයන් තුළ සහභාගී වෙන්න බැරි වුණා. එතුමියගෙ කේන්තිය සාධාරණයි.මොකද එතුමිය මේ සම්බන්ධව වැඩිපුර දන්නෙ නැති වුණත් නමුත් අයදුම්පත් කොහේහරි මන්ත්‍රීවරයෙක් බෙදනවා කිව්වම එතුමියත් නියෝජනය කරන ජන කොට්ඨාසයක් ඉන්නවා. ඉතින් ඒ තුළ සාධාරණයක් ඉටු වේද කියන සැකය තියෙනවා. ඒක කාටත් තියෙනවා. හැබැයි ඕව මම නම් ගණන් ගන්නෙ නැති නිසා මොකද මට බේරිල්ලක් නැති කමට මම ආවා. ගරු සරත් මන්ත්‍රීතුමා හිටියා. ඉතින් මමත් සතුටු වුණා ඇත්තටම ඒ තත්ත්වය තුළ. හැබැයි එකක් තියෙනවා තමුන්නාන්සේලාගෙ පාලන තන්ත්‍රය තමයි තමුන්නාන්සේලා හැල්ලු කළේ. එක වක්‍රලේඛණයක් හරියට ගහගන්න බැරි වුණා. අහන්න අපි අහපු ප්‍රශ්නවලට ග්‍රාම නිලධාරිට උත්තර දෙන්න බැරි වුණා. ආර්ථික සංවර්ධන නිලධාරීට උත්තර දෙන්න බැරි වුණා. සමෘද්ධි සංවර්ධන නිලධාරිට උත්තර දෙන්න බැරි වුණා. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරිණියක් ඇවිල්ල හිටියා. ගොවි නියාමකත් හිටියා. කාටවත් උත්තර දී ගන්න බැහැ. මං කිව්වා එහෙනම් අපි තුන්දෙනා කතා කරා. අපි කියන විදියට ලැයිස්තු හදන්න. ඇයි නීතියක් නැහැනෙ. හැදුවා අපි කියන විදියට. අපි මුලින්ම අපි තමයි හැදුවේ අනු පවුල් වෙනමම. සමෘද්ධි පවුල් වෙනමම. අහන්න. ඔය වක්‍රලේඛ එකක්වත් එන්න ඉස්සෙල්ල සියලුම ලැයිස්තු අපි ගැහුවා සම්පූර්ණයෙන්ම ආවරණය වෙන විදියට. අපි දැම්මා සටහනක් එකක් එවෙලෙම මේ සියලු දෙනාට

ලැබෙන්නේ නැත්නම් අපි මේකට අත්සන් කරන්නේ නැහැයි කියල. ඒ පාර චක්‍රලේඛ අරක බලනවා මේක බලනවා. ප්‍රාදේශීය ලේකම් තුමියත් එක්කත් කතාකරා. මෙතුමා එක්කත් කතා කරා.මෙතුමා තර්ක කරාම ප්‍රාදේශීය ලේකම්තුමියට උත්තර දෙන්න බැරි වුණා. බැරිවුණාට පස්සෙ මේක අවුල් ඇති වුණාට පස්සෙ ඒ පාර අවා.අපිට කිව්වා මේ කට්ටියට තමයි මුලින් දෙන්න ඕන කියල. අපි කිව්වා ඔයගොල්ලො දීගන්න. අපි කමිටුවෙන් ඉවත් වෙනවා. හැබැයි අපිට නීත්‍යානුකූල බව එවෙලෙ තිබුණෙ නැහැ. පස්සෙ ඒක අනුමත වෙලා. ගරු ධම්මික මන්ත්‍රීතුමා කෙලින් හිටියා එවෙලේ. මෙතුමිය නැහැ. මෙතුමිය සති දෙකකට පස්සෙ තමයි සහභාගි වුණේ. වැඩේ කරල ඉවර වුණාට පස්සෙ. අපි කිව්වා මෙන්න ලැයිස්තු ටික අපේ. අපි ඕන වෙලාවක අත්සන් කරන්නම් සියලු දෙනාට දෙනවනම්. අපි ස්තූතිවන්ත වෙනව මොකද අපේ සියලු මන්ත්‍රීවරු එක මතේ හිටියා. ඊට පස්සෙ තමයි ඔය චක්‍රලේඛ මං හිතන්නෙ 20 කට වඩා ගැහුවා. උදේ ගහනව එකක්. දවල්ට එකක් ගහනවා. ඒ පාර හැන්දැවට ගහනවා එකක්. චක්‍රලේඛ ඔය විදියට වෙනස් වුණා. වෙනස් වෙලා අපි හදපු ක්‍රමවේදවලට අන්තිම මොහොත වෙනකොට සියූ දෙනාට දෙන්න වුණා. මොකද අපි මිනිස්සුත් එක්ක ගැවසිලා අපි දන්නවා මිනිස්සුන්ගේ කරන්න ඕන ක්‍රමවේදය මොකක්ද කියන එක. ඒකයි.අපිට හැබැයි මේ රාජ්‍ය මුදල් බෙදීමේ වගකිව යුත්තෝ  ප්‍රාදේශීය ලේකම්තුමිය , ග්‍රාම නිලධාරී ඒ නිලධාරීන්. අපිට බලෙන් අරන් දෙන්න බැහැ. නමුත් අපි සාධාරණ කරුණු ඉදිරිපත් කරල ඒක අරන් දෙන්න පුළුවන් ඉතින්. හැබැයි අපි ස්තූතිවන්ත වෙන්න ඕන. අපේ මේව එක වැටලුවා. මොකද අපි හදාපු ලැයිස්තුවට පිටින් ඒක කපල දාල මේව කරන්න ගියාම පොලිසියෙ හතර දෙනෙක් ආවා. හතර දෙනාට අපි උත්තර දුන්නා. මමත් ආව එතෙන්ට. ඒ ලැබිව යුතු ක්‍රමවේදය තුළ ලැබෙන්න ඕන. රජය ඊට පස්සෙ හැන්දැවෙම ගැහුවා චක්‍රලේඛයක් අනු පවුල්වලට දෙන්න කියලා. රැකියාව අහිමිවෙලා තියෙනවනම් ඔප්පු කරන්න පුළුවන් නම් ඒව ඔක්කොම හරි. කාර් එකක් ගෙදර තිබ්බත් ලක්ෂ ගානක් පොලියට දුන්නත් ඒක නීත්‍යානුකූලව ඔප්පු කරන්න පුළුවන් තත්ත්වයක් නැහැ. ඒ මනුස්සයගෙ රැකියාව අහිමිවෙලා තියෙන්නනෙ. ඒක තමයි අපි ගෙනාපු තර්කය. ඉතින් අපි ඉන්නව අපි ගම්වල ඒව කරා. ඒක අපේ ඒ හයිය තුළ කරා. හැබැයි සමහර කොට්ඨාසවල එහෙම බැහැ. මොකද හේතුව උදාහරණයක් ගත්තම කෙරම්ණිය. කෙරම්ණියෙ අපේ ගරු ශ්‍රේෂන් මන්ත්‍රීතුමා,ගරු චම්පා මන්ත්‍රීතුමිය හිටියෙ. නමුත් එතන ඉන්න ඔක්කොම ග්‍රාම සේවක හා සමෘද්ධි නිලධාරිතුමිය ප්‍රබලවත්ව කරුණු ඉදිරිපත් කරාම මේ ගොල්ලො ටිකක්  පස්සට යන තත්ත්වයකට පත්වුණා. අන්න ඒ වගේ වුණා. පොල්වත්ත හොඳට කෙරුණා මං හිතන්නෙ. පොඩ්ඩක් ගැටලුවක් ආවෙ එක්කෙනෙකුට නොදී ඒ තත්ත්වය තුළ ප්‍රශ්නයක් වුණා. ඒ වගේ තමයි හැබැයි මේ කොයි දේ කරත් මේ අයදුම්පත් බෙදීම කරන්න කියල තිබුණෙ ප්‍රාදේශීය ලේකම්ට. මොකක්ද සිද්ධ වුණේ අන්තිමට

ඔගොල්ලන් අයදුම්පත් කොච්චර ලිව්වත් ප්‍රාදේශිය ලේකම් නිලධාරින් දම්මවා එළිවෙන 7.00 වෙනකම් අයදුම්පත් ලියෙව්වා. මාගේ නෝනා වැඩ කරලා ගෙදර උදේ එනවිට 8.00 . ඒ ගොල්ලන්ට අයිති නැති විෂයයක් වුණත් ඒ හැම එකකටම යොදවා එය කළා. ඔගොල්ලන් දිපු අයදුම්පතට නෙමේ එය ගත්ත අභියාචනයක් වගේ. එක බොරුව කළේ. හැබැයි අපේ ග්‍රාමනිලධාරි ගත්තේ නැහැ මෙතුමාගේ එක . පස්සේ අපි තර්ක කළා මේක ගන්න කියා. පස්සේ මෙතුමා අපහසුතාවයට පත්වුනා ගමේ ජනතාවගෙන්. එක නිසා. අපි ඒ වගේ සාධාරණ විදියට වැඩ කළා. එතකොට මෙතුමියට ආව ප්‍රශ්නය තමයි ඒක. දැන් ප්‍රශ්න තුළ ගැටළු එනවා. එනකොට මෙතුමිය වුණත් විපක්ෂයේ අපි වුණත් සහායෝගය දෙනවා. හැම එකකටම. අපි 11ක් සිටිනවා . අපිට පුළුවන් ඕනනම් සහායෝගය නොදි ඉන්න. ඔගොල්ලන්ට කරන්න පුළුවන්ද? 11ක් සිටිනවා විපක්ෂයේ. නමුත් අපි එක එහෙම යන්නේ නැහැ. අපි වරදක් තිබෙනවා නම් පෙන්වා දෙනවා. නිවැරදි කරලා එය අනුමත කරනවා. නැහැ සභාව නෙමේ. ගරු සභාපතිතුමා කොහොමත් අහන්නේ නැහැ මා කියන ඒවා. එතුමා මහාචාර්යනේ. එතුමා තමයි මේ වැඩසටහන ගැහුවේ. නපුරු වැඩසටහනක්. එහෙන් ආවා ගැහුවා වැඩසටහන. අනිත් අයගේ ආත්ම ගෞරුත්වයත් නැති වෙලා යන විදියට. අපි යම් දෙයක් කරනවිට අපිට අයිති කාර්ය තමයි කරන්න ඕන. චක්‍ර ලේඛණය එනවා අපිට නෙමේ. ප්‍රාදේශිය ලේකම්ට එනවා. ප්‍රාදේශිය ලේකම්ගේ කාර්ය තුළ අපිත් එය අවබෝධ කරගෙන යනවා. හැබැයි මෙහෙම එකක් තිබෙනවා. ඔය ප්‍රශ්න ගැටළු මොනවා වුණත් අපිටත් දෝෂාරෝපණ ආවා. අපි අනිසි ලෙස බලපෑම් කරනවා කියා. අනිසි ලෙස නෙමේ බලපෑම් කළේ . සාධාරණව ඔය ගැටව මේවා කළා. දැන් මන්ත්‍රිතුමියට තිබෙන ගැටළුව දැන් පාලන තන්ත්‍රයට බෙදා යැව්වාම අපිටත් අසාධාරණයක් වුණා. එහෙම වුණොත් මා දන්නවා මෙයාගේ වැඩසටහනක් නිසා මා දන්නවා නිහඬව තමයි වැඩසටහන කළේ. මා කලබල වුණේ නැහැ. හැබැයි හොඳ වැඩක් කළා. අපිව දැනුවත් කළා මෙතුමා. ලිපියක් ගසා. චක්‍ර ලේඛණය සම්බන්ධව. අපි එය අභය කරනවා. එයා ගහන වැඩසටහන එයා ගහගත්තාවේ . කමක් නැහැ. එක ප්‍රශ්නයක් නැහැ. හැබැයි එම වැඩසටහන හදපු එක ටිකක් වැරදුනා අර තත්ත්වයන් තුළ . නමුත් අපේ පක්ෂයේ එහෙම කතන්දරයක් නැහැ. මෙතුමා ජනතා විමුක්ති පෙරමුණේ කියා එහෙම වෙන්න දෙන්නෙත් නැහැ. එයා එතනටම ගියාම මෙතුමියටත් එන්න දෙන්නේ නැහැ. යම්කිසි අසාධාරණ හේතුවක් තිබුණා. එයට සහභාගි වෙන්න. හැබැයි එකක් තිබෙනවා. මේ වගේ ප්‍රශ්න ගැටළු තිබෙනවා. මොකද අපි අත්සන් නොකළ ලේඛණයට මුදල් ගෙවුවා. ඉතිං අපිට ප්‍රශ්නයක් නැහැ. හැබැයි ඔබතුමාට තමයි බලය තිබෙන්නේ. අපිට නෙමේ. ඔබතුමාට බලය තිබෙනවා ඇයි මෙය ගෙවුවේ, කොයි ආකාරයට මෙය ගෙවුවේ. අපි කියා තිබුණා. අපි සටහනක් දමා තිබුණා මෙය මෙකයි කියා. ඒ තත්ත්වය තුළ කටයුතු කරන්න. මොකද හේතුව වැරදි කළොත්

වැරදි කළ ඕනෑම කෙනෙකුට දඩුවම් දිය යුතුයි. මාගේ නම් න්‍යාය එක. මේක තෙල් බෙහෙත් ගාගා කරන්න බැහැ. මගේ නම් තිතිය එක. අපි අපහසුතාවයට පත්වෙනවා. මන්ත්‍රීතුමා අපහසුතාවයට පත්වෙනවා. මා දන්නවා මෙතුමාට කෙලින්ම අවධානම දැම්මා. මේ සභාපතිතුමා කරන උප්පරවැට්ටි. මා කිවුවා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා ගන්න කියා අයදුම්පත් ටික ගිහින්. මා එයාටම තියා කපලා ඇරියා. මා බේරෙන්නත් එපැයි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අපි අතින් හරි ගෙවනවා. දැනට හම්බ වෙච්ච නැති කවුරු හරි සිටිනවා නම් අපි අතින් හරි ගෙවනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

මෙතුමා මේ අරෙහෙන් අරගෙන ගැහුවා. ගැහුවා නම් ගෙවන්න එපැයි. මෙතුමා ඉතිං නිතිඥ ගැට දානවා. ඉතිං ඒ පැත්තෙන් යනවා. ප්‍රශ්නයක් නැහැ අපිට. හැබැයි එකක් මතක තබා ගත යුතුයි. මේ සභාවේ අසන හිටගෙන වෙන්කළ යුත්තේ ජේෂ්ඨත්වය අනුව. මේකට පක්ෂ පාටක් නැහැ. පක්ෂ භේදයක් නැහැ වැඩ කරන කොට. විශේෂයෙන් මෙය ව්‍යාසනයක්. කොරෝනා ව්‍යාසනය පිළිබඳ බරපතලම කාරණයක් තිබෙන්නේ. හැබැයි පළාත් පාලන ආයතන ඇතුළෙන් රජය ගන්න වැඩ පිළිවළත් අඩුයි. එමනිසා තමයි අපි කියන්නේ ගරු ආණ්ඩුකාරතුමා මොනවා ප්‍රතික්ෂේප කළත් ඔය පාර්සලයක් එක ගෙදරකට එකක් දිය යුතුයි. රජයේ සේවයකන්ටත් ප්‍රමුඛව. අපේ නගර සභාවෙන් දිය යුතුයි. රජය විවේචනය කළේ නැහැ. රජය හොඳ දේ කළා. ඔයා කියන්න මා රජය කොහේද විවේචනය කළේ කියා. දැන් අපහසුතාවයට පත්කරලා අවසන්. අපි නෙමේ අපහසුතාවයට පත් කරලා තිබෙන්නේ ඔබතුමන්ලා. අපි කියන්නේ එක නිවැරදි කර ගන්න කියා. ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා එය නිවැරදි කර ගන්න. එකයි කියන්නේ අපිට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමලා වැටෙනවා නම් අපි සතුටුයි. මැරෙනවා නම් ඒත් සතුටුයි. මා කියන්නේ එකයි. මැරෙනවා කිවුවාට මැරෙන්න දෙන්නේ නැහැ. අපි කියන්නේ ඔබතුමාලාට සහායෝගයෙන් ඉන්න කියා. එමනිසා ඔබතුමා වරදවා වටහා ගන්න එපා. අපි මෙතනට එනවිට ඔය රජයත් එක්ක සම්බන්ධයක් නැහැ. මේ ඡන්දය ඉල්ලා ඔය ලැයිස්තුගත මන්ත්‍රීවරු හදලා. ඒකනේ අපිට ඔය මුකුත් හම්බ වෙන්නේ නැත්තේ. පාර්ලිමේන්තුවේත් මෙකක් නැහැ. හැබැයි අතිගරු ජනාධිපතිතුමාට අපි ඕන වේලාවක වැඩ කරනවා. ඒ කිසි ගැටළුවක් නැහැ. ගරු අගමැතිතුමාත් මේ වැඩපිළිවලට යම් තිරණ ගන්න ඇති. අමාත්‍යාංශ ලේකම්වරුන් කරන වැරදි නිසා සියළු දෙනා අමාරුවට පත්වෙනවා. වැඩියේ ඕන නැහැ. කොඩිකාර මන්ත්‍රීතුමාගෙන් අහන්න. ප්‍රාදේශිය ලේකම්තුමියගෙන් එදා ඇහුවාම එතුමියට පිළිතුරු දෙන්න පුළුවන් වුණාද චක්‍රලේඛණ ගැන. නැහැ. හැබැයි එකක් තිබෙනවා මේ කමිටුව පත් කළේ මේ කමිටුවට ඕන විදියට තීන්දු තීරණ ගන්න පුළුවන්. සාධාරණීකරණය කරලා. අන්තිමට කියූ දෙය අහන්න. කමිටුවක් පත් කර තිබෙනවා. ඔබතුමන්ලාට සුදුසු දෙය  කරන්න කිවුවා. ඉතිං අපි සුදුසු දෙය කළා. හැබැයි සුදුසු දේ කරපු එකෙන් අපි කියපු දෙය තමයි සාර්ථක වුයේ. ඔබතුමාත් මෙයට නම්‍යශිලි වෙන්න. මන්ත්‍රීතුමිය අවේගශිලිව කතා කළා. අවේගශිලි වෙනවා මොකද ඒ වගේ තත්ත්වයන් වුණාම. එමනිසා සියළු මන්ත්‍රීවරු අපි මේ කතා කළාට මෙතැන බැහැලා යන විට කිසි ප්‍රශ්නයක් නැහැ. මෙතන ඉතිං ගහගන්නත් පුළුවන්, මරාගන්නත් පුළුවන් . නමුත් මෙතනින් බැහැලා යන විට

අපේ කිසි ගැටළුවක් නැහැ. ඔබතුමා ඉතිං ගහන වැඩසටහන් අපි දන්න නිසා අපිට ගැටළුවක් නැහැ. නමුත් මන්ත්‍රීතුමියන්ලාට ඒක ටිකක් අලුත්. අලුත් මන්ත්‍රීතුමියන් නිසා ප්‍රශ්න ගැටළු එනවා. සියළු දේ ඔබතුමා සාධාරණ ඉෂ්ඨ කරන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ඒ කාලේ එකතුවෙලානේ ඔය හැමදේම කතා කළේ. මගේ උප සභාපති කලින්. මට සේවකයන්ට තදින් කතා කරන්න එහෙම කියපු මනුස්සයෙක් . එමනිසා මා දැන් මුකුත් කියන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ කොරෝනා කියන වසංගත තත්ත්වයක් පැමිණ ලෝකයේ කිසිම රටක නොකරපු දෙයක් තමයි අපේ රටේ අතිගරු ජනාධිපතිතුමා හා ගරු අගමැතිතුමා විසින් කරනු ලැබුවේ. මාගේ කොට්ඨාශයේ මා දන්නේ නැහැ දෙන්න ඕන හැම නිවසකටම දුන්නා. අනිත් කොට්ඨාශ වලට නම් කොහොමද දන්නේ  නැහැ. අපේ ග්‍රාම නිලධාරි මහතා , සමෘද්ධි නිලධාරි , ආර්ථික සංවර්ධන නිලධාරි ඔය දෙන්න පුළුවන් සෑම නිවසකටම දුන්නා. ඊයේත් දුන්නා අයදුම්පත්‍රයක් අත්සන් කරලා. එහෙම කිසිම ගැටළුවක් ඇති වුණේ නැහැ. මගේ කමිටුවේ මෙතුමියත් වාඩි වුණා. විපක්ෂ නායකතුමාත් පැමිණ වාඩි වුණා. එතුමත් නම් වගයක් ගෙනාවා . එතුමාගේ පවුලේ කට්ටියත් ගෙනාවා. අපේ කිසිම ගැටළුවක් සිද්ධ වුණේ නැහැ. සාධාරණ විදියට බෙදුනා. අපි ඊයේ වෙනතුරුත් අයදුම්පත් භාර ගත්තා රු.5000/= ලබා දෙන්න. අපේ අතිගරු ජනාධිපතිතුමා දැන් දෙවැනි අදියර දෙන්න සූදානම් වෙනවා. මොකද මා හිතන්නේ නැහැ කිසිම රටකින් අපේ රටට මුදල්මය ආධාර ලැබිලා කියා. ඕය වගේ වසංගත රෝගයක් මුළු ලෝකයටම ඇතිවූ. සමෘද්ධි රක්ෂාවල් නැති මේ සියළු දෙනාටම මේ රු.5000/= දීමනා ලබා දිලා දෙවැනි වතාවටත් මුදල් ලබා දීමට ස්තුතිවන්ත වෙමින් ගරු අගමැතිතුමාටත් ස්තුතිවන්ත වෙමින් සියළු  දෙනාටත් ස්තුතිවන්ත වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල්  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ රු.5000/= දීමනාව සම්බන්ධයෙන් මේ ගරු සභාවේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා කතා කළා. මට තිබෙන්නේ මීට වඩා හාත්පසින් වෙනස් ප්‍රශ්නයක්. මොකද රජයක් විදියට කොහොමද මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ කියා. ලංකාවේ ග්‍රාම සේවක වසම් 54000 කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා . අපි එක ග්‍රාම සේවක වසමකට ලක්ෂ 6කට වැඩි ප්‍රමාණයක් අපි නම් දිලා මුදල් බෙදා දිලා තිබෙනවා. ඊට ආසන්න හෝ ඊට වැඩියි. ලක්ෂ 6කට වැඩි මිසක් අඩු නැහැ. එතකොට ලක්ෂ 6 රු.54000න් වැඩිකළහොත් බිලියන 3ත් 4ත් ගාණක් වෙනවා.  මේ බෙදපු මුදල් ප්‍රමාණය. බිලියන 3ක් 4ක් ප්‍රමාණයක් ගෙවන්න රජයට තිබෙන ආදායම මේ කාල වකවානුව තුළ. රජය ඉතාම අසිරු තත්ත්වයකින් මේ මුදල්

ගෙවන්නේ. සියළුම ආදායම් මාර්ග වැසි තිබෙන එකම පුද්ගලයා තමයි රජය. අනිත් අය සුළුවෙන් හෝ මොකක් හරි රැකියාවක් කරගෙන මුදල් උපයනවා. එතකොට රජයක් විදියට මේ ජනතාවට වෙච්ච පොදු ව්‍යාසනයේදි මේ දුක සැප බලා ගෙන රජයක් වශයෙන් මේ ජනතාව බලා ගැනීමම ඉතාමත්ම ප්‍රසංශනියයි. ඉතාමත් වැදගත්. අපි මන්ත්‍රිවරුන්ට විවිධාකාර මතිමතාන්තර තිබෙන්න පුළුවන්. අපට මේ සභාවක වාද විවාද කරන්න විවිධාකාර වූ මතිමතාන්තර තිබෙන්න පුළුවනි. හැබැයි අවසානයේ මා දැක්කේ මේ මන්ත්‍රිවරු 21ම කතා කළේ ඡායාරූප පිටපතක් සම්බන්ධව තමයි. මෙ ගරු සභාපතිතුමා ගසා එච්චත් , ප්‍රාදේශිය ලේකම්තුමිය ගසා එච්චත් ග්‍රාම නිලධාරිතුමිය ගසා එච්චත් මේ එකම ලියවිල්ල. අකුරු පාපිල්ලක්වත් වැරදි නැහැ. එතකොට මේ සියළුම අයදුම්පත් මන්ත්‍රිවරුන්ට දිම හරහා චෝදනවක් තිබුණා. හැබැයි ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රිතුමනි ,තුමියණනි ඇත්ත කතාව මේ ගරු මන්ත්‍රිවරු මෙයට සහභාගි නොවුණානම් ඒ කමිටුවේ නොසිටියා නම් මේ ප්‍රතිලාභ ලබන පිරිස මිට වඩා අඩුවෙන් පුළුවන්. එතකොට ප්‍රතිලාභ නැතිවෙන්න පිරිසක් නැති වෙන්න තිබුණා. එතකොට රජයක් විදියට මේ ගත්ත ක්‍රියාමාර්ගය ගැන අපි ප්‍රශංසා කළ යුතු වෙනවා. යම් යම් අඩුපාඩු ඇති. හැබැයි රජයක් විදියට දේශපාලන අධිකාරිය මෙයට සහභාගි කරවා ගන්නවාද කියන එක විශාල ගැටළුවකි. විශාල අභියෝගයකි. හැබැයි රජය එකත් කළා. එකේදි යම් යම් කාරණා යම් යම් මාධ්‍යවලින් උලුප්පා පෙන්නුවාත් සමස්තයක් විදියට පක්ෂයක් පාටක් නැතිව තමන්ගේ ගම්බිම්වලට මේ රු.5000/= ලබා අඩුවක් නැතුව ලබා දුන්නා කියන එක ප්‍රකාශ කරනවා. එතකොට මේ සභාවේදි අසාධාරණයක් වුණා කියා අසවලාට ගෙවුවේ නැහැ කියා මේ ගරු සභාවේ කිවුවේ නැහැ. එවත් තාම අභියාචනා විමසිම් තත්ත්වයේ පවතිනවා. ඊයේත් අත්සන් කලා . අභියාචනා කළ සමහර ඒවා. රජයක් විදියට ඉතාමත් අසිරු අවස්ථාවක්. රජයත් ඉතාමත් අසිරු තත්ත්වයේ ඉන්දෙද්දි ජනතාවට මේ මුදල් ප්‍රදානය කරන්නේ ජනතාව මේ ව්‍යාසනයෙන් මුදවා ගන්න. එතකොට මේ මාසයේ විතරක් නෙමේ ඊළඟ මාසයේත් මේ ප්‍රතිපාදන ගෙවන්න සැලසුම් කර තිබෙන්නේ. අපි කොච්චර ක්‍රියාත්මක වුනාද කියනවා නම් ගම්වල මේ මන්ත්‍රිවරු මගේ කොට්ඨාශය තුළ අපි කමිටුව විසින් නිර්දේශ කළ රු.5000/= ලබා ගන්න පැමිණියේ නැහැ. ඒ අයට මානසික ගැටළුවක් වෙලා තිබුනා මේ රු.5000/= ගන්නවාද නැද්ද කියා. මා එහෙම කතා කරන්නේ ලංකාවේ ගම් නියම්ගම් හතර දිබ්බාගේ බැලුවාම ඇත එපිට නියාගම සදලංකාර ඇත එපිට ගම්මාන බැලුවාම ගම්වල දස දහස් ගණන් ඉන්න කොට මේ හැමෝටම මෙය ලැබුණේ නැහැ. හැබැයි අපේ පළාත් වල යාන වාහන තිබෙන රාම්‍ය සුරාම්‍ය තිබෙන අයටත් අපි මෙය ලබා දුන්නා. මොකද රජයේ චක්‍රලේඛණය අනුව රජය දැක්කේ මේ ආදායම අහිමි වෙච්ච සියළු දෙනාටම මෙය ලැබිය යුතුයි කියා. චක්‍රලේඛණ වලදි යම් යම් අඩුපාඩු ඇති වුණාත් අඩුවැඩි නැතිව සමස්ත ජනතාවටම රජය මේ මුදල් ලබා දුන්නා. එමනිසා අපි සංතෝෂ වෙනවා. අපි අභය කළ යුතු වෙනවා ජනතාව වෙනුවෙන් රජය ගත් මේ ක්‍රියාදාමය. මහජනතාව ආරක්ෂා කරගෙන ජනතාව සුඛිත මුදිත කර ගැනීමට රජයකට මේ අශිර්වාදය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන් ත්‍රිවිධ හමුදාව , සෞඛ්‍ය අංශය , රජයේ සේවකයන් සියළු දෙනා නඩත්තු කරමින් සිටියදි මෙවැනි දේ කිරිමට රජයකට ඒ වාසනාව ලැබිමම උපකල්පනය කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ රු.5000/= දිමනාව ලබා දිමේදි පොල්වත්ත කොට්ඨාශයේ නම් ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතාටත් , මටත් ඕන විදියට තමයි ග්‍රාම නිලධාරි හා අනිත් නිලධාරින් කටයුතු කළේ. කිසිම අර්බුදයක් මොකක්වත් නැතුව පොල්වත්ත ප්‍රදේශයේ

නිලධාරින් වැඩ කෙරුවා හරියට. මා හිතන්නේ නගර සිමාවේ කිසිම අර්බුදයක් නැතුව නම් කැපෙන්නේ නැතුව වැඩය සම්පූර්ණ කෙරුවේ අපි මන්ත්‍රිවරු දෙදෙනා සමඟ. රාත්‍රි 10, 11වනතුරු එතැන සිට තමයි ඒ වැඩ පිළිවල කරනු ලැබුවේ. එකම සිද්ධියක් සිදුවෙලා තිබුණා . මා හිටියේ නැහැ ඒ වේලාවේ. නන්දන රාජපක්ෂ මන්ත්‍රිතුමාට එක්සත් ජාතික පකෂයේ මන්ත්‍රිවරයෙක් තර්ජනය කර තිබුණේ. මා එදා හිටියා නම් එත් එදා එක වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමා කතා කරලත් තිබෙනවා අපේ මන්ත්‍රිතුමා හිටියේ නැද්ද කියා. මොකද මා ගියේ නැහැ එතනට. මා මුදල් ගෙවන වේලාවට ගියේ නැහැ එතනට. අපේ මන්ත්‍රිතුමා ගිහින් තිබුණා. මට ඒක උදේ කිවුවා නම් මා උදේ එනවා. එහෙනම් ඔය කිසිම මේකක් වෙන්නේ නැහැ. වෙන කිසිම සිද්ධියක් වුණේ නැහැ. 170 ගණනක් පොල්වත්තේ ලබා දුන්නා. කිසිම ප්‍රශ්නයක් නැතුව අපි වැඩ පිළිවල හොඳට කෙරුවා. කොහොමත් පොල්වත්තේ වැඩ කරන්න දෙන්නේ නැහැ අපි දෙන්නා. ඒ නිලධාරින් අපි කියන විදියට හරියට වැඩ කෙරුවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, පලමුවෙන්ම මා මෙතුමියට සුබ පතනවා. එතුමියගේ උපන් දිනය වෙනුවෙන්. පළමුවෙන්ම මා එතුමියට සුබ පතනවා. මා කියන්න කැමතියි මේ රු.5000/= දිමනාව ලබා දුන්න නිසා මේ කමිටු වලින් හරියටම වැඩය කළ නිසා මා දන්නවා ඕකන්ද ප්‍රදේශයේ හැමෝටම මෙය ලැබුණා කියා. මා ඒවා නොදැන නෙමේ කතා කළේ. මොකද මා හැමදාම ග්‍රාමනිලධාරිගෙන් මේ ලැයිස්තුව ගත්තා. මා අහනවා අර ගෙදරට දුන්නාද කියා මේ ගෙදරට දුන්නාද කියා. මා පැමිණියා කිහිප වතාවක් . මා පැමිණි දුවලාගේ නිවසේ සිටියා. මොකද ගමේ අය මට කිවුවා කොළඹ ඉන්න නිසා එන්න එපා කියා. මේ අවස්ථාවේ මට කිවුවේ ගමේ අය ඉල්ලා සිටියා ගමට එන්න එපා කියා. නැතිනම් මා එදත් පැමිණ එළවළුත් අරගෙන ගියා. ගමට තිබෙන ආදරය නිසා තමයි මා ගමට නොගියේ. නමුතු මට මෙතුමා කිවුවා ගමට එන්න කියා. එමනිසා මා කමිටුවට ඇවිත් ගියා. එහෙත් ග්‍රාම නිලධාරි ඇහුවාලු ඇයි කමිටුවට එතුමිය ගෙන්වා ගත්තේ කියා. මා අත්සන් කරන්න එතැනට ගියා. මා හිතනවා එම වැඩය හරියට කෙරුණා කියා. නමුත් මාගේ ප්‍රශ්නය තිබුණේ අර අයදුම්පත් බෙදිමේ අර ප්‍රශ්නය වෙච්ච එක. ගරු සභාපතිතුමා මා ඇත්තටම කනගාටු වෙනවා. ඔබතුමා මගෙන් ඇහුවා මා පාසැල් ගියා ද කියා. ගරු සභාපතිතුමනි , මා ඉගෙන ගෙන නැතිනම් කොහොමද රැකියාවක් කරන්නේ. මා අට සමත් පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙක්. එකනිසා එක හොඳට හිතන්න. මා හොඳට ඉගෙන ගෙන රැකියාවක් කරන කෙනෙක්. එහෙම අපහාස කරන්න එපා. මා ඔබතුමාට ගරු කරනවා ගොඩක් . නිතරම ඔබතුමාගේ සිනා මුසු මුහුණට මා ගොඩක් කැමතියි. නමුත් මා කනගාටු වෙනවා ඔබතුමා ඒ වගේ ප්‍රශ්නයක් මගෙන් ඇසිම ගැන. ඒක වහාම ඉවත් කර ගන්න. මොකද මා නූගත් කෙනෙක් නෙමේ. මා හොඳට ඉගෙන ගෙන පරිපාලන නිලධාරිණියක් වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කරනවා. එහෙම අවතක්සේරුකර කතා කරන්න එපා. මා ඇත්තටම කනගාටු වෙනවා. දැඩි ආදරයට කිවුවාත් සභාවකදිනේ කියන්නේ. එතකොට මිනිසුන් හිතනවා මා නූගත් කෙනෙක් කියා. ඒ මගේ උගත් කමට නිගාවක් කරන්න එපා. ඔබතුමා උගත් වගේම අපිත් උගත්. මා අවේගශිලිව කතා කළාට මට ඇත්තටම ඒ වේලාවේ දුකයි. ඇත්තටම මට කොඩිකාර මහතා කතා කළ කිවුවා නම් මන්ත්‍රිතුමිය මා ළඟ අයදුම්පත් 200ක් විතර තිබෙනවා. ඔයාගේ කට්ටියත් එවන්න කියා . මා එහෙනම් කියනවා මා කියලා එවුවේ කියා. අපේ අය මගේන් අහනවා මාගේ නොම්බර 84. බලන්න අපි ගිහින් පෝලිමේ ඉඳලා නේ අයදුම්පත ගත්තේ. එතකොට මට මාර වේදනාවක් වෙනවා. මාත් මන්ත්‍රිවරියක්නේ. යම් කිසි දෙයක් කරන විට කොට්ඨාශ වල අපි ඒ තත්ත්වයට

පත් විය යුතුයි. එකයි මා කියන්නේ. සභාවෙන් කරන දෙයක්. පිටින කරන එකක් නෙමේ සභාවෙන්. අපි හැමෝම මන්ත්‍රිවරු . එක පොඩ්ඩක් හිතන්න ඕන. එකයි මා ඒ විදියට කතා කළේ. ගරු සභාපතිතුමා එක්කෝ කියන්න ඔනේ. ඔයාගේ අයදුම්පත් ටික පස්සේ දෙන්නම් කියා. ව්‍යාජ අයදුම්පත් වෙලා තිබෙන්නේ පස්සේනේ. දැන් ඕක බෙදන විට ප්‍රශ්න වුණා. මා නැවතත් කියනවා ඔබතුමා එහෙම අවලංගු කර අවතක්සේරු කර එහෙම කරන්න එපා. අපි හොඳ පන්නරයක් ලබා, වසර ගණනාවක් සමාජ සේවා කටයුතු කරලා , කාන්තා සේවය කරලා තමයි මේ සභාවට ආවේ. එකනිසා හොඳට මතක තබා ගන්න . වැරද්ද දැක්ක තැන කතා කරනවා. සාධාරණ තැන හොඳට අත ඔසවා කතා කරනවා. අසාධාරණ තැන බෙල්ල ගියත් කතා කරනවා. ඒ තමයි මගේ හැටි. එමනිසා ඔබතුමා මට නුගත් කියා කියපු සංකල්පය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ හිරේවත්ත කොට්ඨාශයේ රු.5000/= දීමනාව දෙන්න ලැහැස්ති කරලා ග්‍රාම නිලධාරි මහත්මියත් සමෘද්ධි නිලධාරි මහත්මියත් කිවුවා ධිවර යාත්‍රා හිමියන්ට රු.5000/= ආධාර ලබා දෙන්න බැහැ කියලා. වාහන තියෙන කට්ටියටත් දෙන්න බැහැ කියා. මා ඒ වේලාවේ නැඟිටලා ආවා කමිටුවෙන්. පසුදින මා ප්‍රාදේශිය ලේකම්තුමිය මුණ ගැසි එම රු.5000/= ලබා දුන්නා. එය ලබා දිලා මට චෝදනාව ආවා එක දිනයට. අපි සාමාන්‍යයෙන් දේශපාලනය කරන්නේ කාගෙන්වත් බැණුම් අහන්න නෙමේ. මට ඇත්තටම දේශපාලනය ගැන කලකිරිමක් ඇති වුණා. මේ වගේ ප්‍රශ්න අපට දැම්ම සම්බන්ධව. මේවා රජයෙන් කළ යුතු දේවල්. අපි මන්ත්‍රිවරු මේවාට පැටලුවාම අපිට ගම්වලින් ප්‍රශ්න ඇති වෙනවා. මාගේ කොට්ඨාශයේ 6කුට මට දිගන්න බැරි වුණා. පක්ෂ පාට නොබලා ලබා දුන්නා. මා ඔබතුමාගෙන් ඡන්දය ඉල්ලූ රාම්‍යා මහත්මයා මගෙන් ඉල්ලිමක් කළා . මා කිවුවා ඔබතුමියගේ නම්ටික මට ඉදිරිපත් කරන්න කියා.එන හැමෝටම එක හා සමානව දුන්නා. මා මේ අවස්ථාවේ රු.5000/= සහානාධාරය ලබා දිමගැන රජයට ස්තුති වන්ත වෙනවා. මා හිතන්නේ ගරු සභාපතිතුමනි, රු.5000/= නෙමේ රු.25000/= ක් වුණාත් ලබා දෙන්න පුළුවන් මේ ආධාර ලැබුණු විදියට. මා රජයට හා ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, හිරේවත්ත ප්‍රදේශයේ අර ගල්වැටිය දමා දෙන ගම්වාසින් මගෙන් ඉල්ලා සිටියා. ඒ සඳහ එය දමා දෙන ලෙස වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලිමක් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒක උස්සන්ද ඕනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්</u>**

ගල්වැටිය උස්සා ප්‍රතිසංස්කරණය කරදෙන ලෙස තමයි ගම්වාසින් ඉල්ලා සිටින්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි ඒක ඉදිරිපත් කරන්නම්. දැන් දිස්ත්‍රික් කමිටු රැස්වීම් නැති නිසා මේ වෙලාවේ අපිට ඉදිරිපත් කරන්න තැනක් නැහැ. නැතිනම් කමිටුවට දමන්න තිබුණා. මා බලන්නම් කතා කරලා. එය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දෙන්න. අපි ඉන්ද්‍රා මන්ත්‍රිතුමියට අපි එහෙම කියන්නේ නැහැ. අපි දෙන්නා හොඳ යාළුවෝ. මා එහෙම කිවුවේ මේ චක්‍ර ලේඛණය බලලා තමයි. ඇත්තටම මා සෝභිත මන්ත්‍රිතුමාටයි අතුල මන්ත්‍රිතුමාටයි මේක දුන්නා කියා මාගේ පක්ෂයෙන් බැණුම් අහගෙන තමයි මා මෙය දුන්නේ. අන්න එක මතක තියා ගන්න. අනිත් මන්ත්‍රිවරුන්ට මෙය යැව්වා සාමාන්‍ය ජනතාවට සාධාරණය ඉෂ්ඨ කරන්න කියා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මට ලියුම් දෙකක් ගෙනවිත් දුන්නා අපේ නිවසට. කේ.එල් ගයාත්‍රිකා ද සිල්වා, මානිම්මුල්ල , අම්බලන්ගොඩ. කඩ කාමර බදු කුළිය සඳහා සහන ලබා ගැනිම සම්බන්ධයෙනි. කොරෝනා වෛරසය හේතුවෙන් මාගේ ව්‍යාපාරය වසා දැමීමට සිදු වු බැවින් බස්නැවතුම්පොළ දෙවන මහලේ අංක

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔක කතා කළා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්**

මෙකේ එයා කියන්නේ බද්ද සඳහා සහනයක් ඉල්ලනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් ඔය ගැන තින්දුවක් ගත්තානේ. දඩ අයින් කිරිම අයින් කළා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්**

මෙහි තව එකක් තිබෙනවා. එයා කියා තිබෙනවා මේ තත්ත්වය මග හැරෙන තෙක් නගර සභාව විසින් කඩ කුළිය අයකර ගැනිමට හිමිකම් සහනයක්

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි තින්දුව අරගෙන තිබෙන්නේ දඩ අයකරන්නේ නැහැ. එයාට ඕන නම් මේ කාලය අතර භාර දිලා අපි බදු මුදල හොයා ගන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්**

නැහැ ඉතිං කඩ වසා තිබෙන නිසා. හිනාවට ලක්කරන්න එපා ඒ අයගේ ඉල්ලිමක්. අපි එහෙම ප්‍රතික්ෂේප කරනවාද මෙයකඩ හිමියන්ගේ සංගමයෙන් එවා තිබෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් මේ ඔය සම්බන්ධව කතා කරලා මේ සභාවේ තින්දුව ගත්තා. ඔබතුමා ඒ අවස්ථාවේ කතා කරන්න ඔනේ. හරි ඉතිං අනුමත කළා දුන්නා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

කඩහිමියන්ගේ සංගමයෙන් එවා තිබෙන්නේ. ඉල්ලීම කර තිබෙන්නේ ලේකම්තුමිය සභාපතිතුමා. ඊට පස්සේ ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුවෙන් ලිපියක් එවා තිබෙනවා අම්බලන්ගොඩ මහජන ක්‍රිඩාංගණයේ මැටි ඉවත් කර ගැනිම සම්බන්ධව පස්පිරවිමේ ව්‍යාපාතිය. මෙකේ මුදල් ගෙවන්න කියා වැඩය කර තිබෙනවා කියා ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. මුදල් ගෙවන් කියා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

එක අපේ රාහුල මන්ත්‍රිතුමාගේ වැඩක් එමනිසා ගෙවන්න විදියක් නැහැ. ඔතන සභාව කල්පනා කරන්න ඕන . ඔතන වතුර රැදෙනවා කියා තිබුණත් අද වනවිට ඒ තත්ත්වයක් නැහැ. එමනිසා අපි එදා සභාව ගත් තින්දුව වැරදියි කියන තේරුම් ගන්න. එමනිසා එම මුදල ගෙවීම වඩා සුදුසුයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

එක තමයි මා එය ඉදිරිපත් කළේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

එකට විරුද්ධද කවුරුවත්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

තත්ත්ව පරික්ෂණ වාර්ථා ලබා ගැනීමට යවලාද තිබෙන්නේ. ඒය යවලාද තිබෙන්නේ. අන්න එක බලන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ඉංජිනේරු මහතා සාම්පල් ගන්න ඇවිත් නැහැලු.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමා , දැන් ඔබතුමා දුන් කඩවලටත් කුළිය දෙන්නේ නැහැනේ. එමනිසා ඒ අයටත් සහන දෙන්න

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් . සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ඔය ක්‍රිඩාංගණය හැදිමේ කලාව අපි දැනගෙන හිටියේ නැහැ. අපිත් එක් ඉගෙන ගත්තේ ඔබතුමා සමඟ මේ පිට්ටනියට ගිහිල්ලා. එතකොට ඒ ක්‍රිඩාංගණය හදන මහතා කියනවා මේක අඩියක් හෝ දමා අඩි එකහාමාරට දමා අහල් ගානට තලනවා. එකට

වතුර උරා ගන්නේ නැහැ කියා. නමුත් දැන් අපිම කියනවා එකට වතුර උරන්නේ නැහැ කියා. ඔය දෙකම එකයිනේ. මට තේරෙන්නේ නැහැ මොකක්ද මේ ප්‍රශ්නය කියා. අඩිය අගලට තැලුවාම එතකොට හයි වෙනවා. එතකොට වතුර උරන්නේ නැහැලු.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ මහතා මේ මන්ත්‍රීවරු ඉදිරිපිට කිවුවා. වැටෙන වතුර මේකට උරන්න නෙමේ තිබෙන්නේ . වැටෙන වතුර කාණුවට එන්නයි. අඩි 300කට අඩියක් පහළට දමා තිබෙන්නේ. එක පැහැදිලිව පෙන්න තිබෙනවා. දැන් මඩවිමක් යටවිමක් කොච්චර වැස්සත් වෙන්නේ නැහැ. දැන් අපි මන්ත්‍රීවරු ඉදිරිපත් කරපු තර්කය මත නතර කර තිබෙනවා. ඇත්තටම මේ ගෙවිම නතර කර තිබ්ම සාධාරණ නැහැ කිය එය බැලුවාම ඕන කෙනෙකුට පෙනෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් . සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

එහෙම වෙන්න පුළුවන්. මේ පිට්ටනි හැදිමේ කළාව දැනගෙන හිටියේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔකේ ඔය ප්‍රශ්නය ආවේ අර ලියුමක් දමා තිබුණා. මේ පැත්තේ කිරිමැටි තිබෙනවා ඉවත් කරලා පස් පුරවන්න කියා පස් කියුබ් 65ක් කොහේ කියලා. එතනින්නේ ප්‍රශ්නය ආවේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ . සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අර හිරේවත්ත පුස්තකාලයේ වතුර ටැංකිය කඩා දමා තිබුණානේ . ඒ තාප්පය කඩා වැටිලා. චම් මහතා එය කරනු ලැබුවේ. එතැන අනවශ්‍ය දේවල් සිද්ධ වෙනවා කිවුවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ සඳහා තාක්ෂණසේවා නිලධාරි මහතාගෙන් වාර්තාවක් ලබා ගන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ . සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

එතකොට චම් කොන්ත්‍රාත් එක කරන කොට තමයි කඩන් වැටුනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එතකොට කොන්ත්‍රාත් කරන කෙනාද හදන්න ඕනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ . සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ඔව් මා එයාට කිවුවා. එයා හදන්නම් කිවුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා අවස්ථාවක් කර ගන්නවා මේ කොරෝනා වසංගතය නිසා රු.5000/= දිමනාව ගෙවීම සම්බන්ධව රාජ්‍ය නිලධාරින්. විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා එම

නිලධාරින් හතර පස්දෙනාටම. ලොකු අවධානමක්. දැන් දෙවැනි අදියරේ ඒ අය අයින් වෙනවා කියනවා. මේ කොරෝනා වසංගතය දැනගෙන මේ නිලධාරින් හතර දෙනා සහායෝගයට රට පුරාම. අපි එය අගය කළ යුතුයි. විශේෂයෙන් ප්‍රාදේශිය ලේකම්තුමිය. මොන රජය ආවත් රජයට වගකිව යුතු නිලධාරින්. එමනිසා මේ රු.5000/= රැස්වෙච්ච නිලධාරින්ට වගකීමක් තිබෙනවා. විගණන විමසුම් වලට ගියොත් එහෙම. ලොකු බලපෑම් කරන්න හොඳ නැහැ. ඔක්කොම පුළුවන් විදියට සහායෝගය දුන්නා. අපි මන්ත්‍රිවරුන් එතුමන්ලා රාජ්‍ය නිලධාරින්. එමනිසා අපි ඒ ගැන සලකා බලා අපි ඔවුන්ට සහායෝගය දිය යුතුයි. අපි අඟය කිරිමක් කළ යුතුයි මුළු ලංකාවේම එම නිලධාරින් අගය කිරිමක් කළ යුතුයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ඔය නිලධාරින් ගැන කිවුව හින්දා අපි අම්බලන්ගොඩ පටබැඳිමුල්ලේ සිටින නිලධාරින් ගැන වචනයක්වත් කතා කළේ නැහැ. මමත් පේෂලා මන්ත්‍රිතුමියත් දෙදෙනාම සහභාගි වුණේ. ඒ සියළුම නිලධාරින් නම් අපිට බාධාවක් වුණේ නැහැ. මිනිසුන්ට කරන්න පුළුවන් සේවාවන් ටික ඒ හැම නිලධාරියෙක්ම ඉටු කළා. හොඳ නිලධාරින් පිරිසක් කියා තමයි අපිට කියන්න ඕන.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මා චුටි අදහසක් දක්වනවා. දැන් අපේ නගර සභාවෙන් මුකුත් දෙන්නේ නැද්ද කාටවත්. මේ ව්‍යාසනය ඉක්මනින් අවසන් වෙන්න කියා ප්‍රාර්ථනා කරනවා. ජනතාවට මුකුත් පාර්සලයක්වත් දෙන්නේ නැද්ද? ඉති නගර සභාවෙන් මුකුත් කළේ නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අපි ලක්ෂ 65 දෙන කොට ගරු ආණ්ඩුකාරතුමා කිවුවේ ආණ්ඩුවෙන් මේකට දෙනවා. එමනිසා නගර සභාවෙන් මෙයට මුදල් වියදම් කරන්න එපා කියා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

ගරු ආණ්ඩුකාරතුමාට පහදා කියන්න රු.5000/= ක වගේ මුදලකින් ජනතාවට ජිවත් වෙන්න බැහැ. ඉදිරියට ගියොත් මේක

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ගරු මන්ත්‍රිතුමිය අපිට දෙන්න පුළුවන් රුත1000/= ක රු.1500/= දීමනාවක්. අන්න එකයි ප්‍රශ්නය.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය  කතා කරමින්**

මොනවා හරි ලබා දෙන්න. නැතිනම් අපි මොනවත් කළේ නැහැ වෙනවා. ඉතිං ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් ඔබතුමාට නැවත කරන්න බැරිද?

**ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිත වික්‍රම  මහතා  කතා කරමින්**

ගරු සභාපතිතුමනි, හැබැයි ඕක ජනගත වෙලා තිබෙන්නේ. නැතිනම් දැන් ඕක නොදුන්නාම හිතාගෙන ඉන්නේ දුන්නේ නැහැ කියන මතය. එහෙම නම් මෙය ගරු ආණ්ඩුකාරතුමාට යවා මෙය මෙහෙමයි මෙය ගෙවන්න එපා කියන මතය. එතකොට අපිට නිදහසට කරුණක් තිබෙනවා කියන්න. වැඩය ඉවරයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

රැස්වීමේ වැඩ කටයුතු මෙයින් අවසන් කරනවා.

පස්වරු 02.25 ට ගරු සභාවේ වැඩ කටයුතු අවසන් විය.

ඩබ්.ඩී.ආර්.ජේ.රුදිගු මිය
ලේකම්
අම්බලන්ගොඩ - නගර සභාව

අරුණ ප්‍රදීප් මණිමෙල්වඩු
සභාපති
අම්බලන්ගොඩ - නගර සභාව

2020.05.22

වන දින

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදී.